Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

**E-Repository of Humanities and Social Sciences**
Publication Committee
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

# Author Consent Form

Please provide the following information of your book/publication (please note that one consent form needs to be filled for each publication if you have more than one).

1. Title of the publication : [illegible]
2. Author/ Authors : සඳගෝමි කෝපරහේවා
3. Publisher : [illegible]
4. Year of Publication : 2009
5. ISBN (if applicable) : 978-955-51523-7-2
6. Access option : Open Access

**Author/copyright owner consent:**

I/~~we~~ සඳගෝමි කෝපරහේවා (your name/names), as the author/s or copyright owner/s, would like to provide my/our consent for making available the above publication on the E-Repository of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura. I also would like to provide my consent to allow the E-Repository Management Committee to make the publication accessible to the students of University of Sri Jayewardenepura and public.

Signature of the Author/s or Copyright owner/s: [signature]

Date: 19/09/2023

# නිදහස් චින්තනය හා වීමංසනය

## ආගමික හා දාර්ශනික මූලධර්ම විග්‍රහයක්



පනහඩුවේ යසස්සි හිමි

# නිදහස් චින්තනය
# හා
# වීමංසනය

ආගමික හා දාර්ශනික මූලධර්ම විග්‍රහයක්

**නිදහස් චින්තනය හා වීමංසනය**

ආගමික හා දාර්ශනික මූලධර්ම විග්‍රහයක්

ප්‍රථම මුද්‍රණය : 2009

© පනහඩුවේ යසස්සි හිමි

ISBN 978-955-51523-7-2

පරිගණක අකුරුකරණය : ජයනි ශෂිකලා

පිටකවර අලංකරණය : බුද්ධීප රත්නායක

මුද්‍රණය : රුවන්පහරුව
තො. 14/10, පළමුවෙනි පටුමග,
පිළිකා රෝහල පාර, මහරගම.
දුර අං: 0112-840738

ප්‍රකාශනය : මාගධී MĀGADHĪ
පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය
Institute of Pali and Buddhist Studies
මීරිස්වත්ත, පුවක්පිටිය, දුර: 0718-401778, 0718-268693
Web: www.magadhi.net, E-mail: magadhi.inst@gmail.com

# නිදහස් චින්තනය
# හා
# වීමංසනය

ආගමික හා දාර්ශනික මූලධර්ම විග්‍රහයක්

පනහඩුවේ යසස්සි හිමි

අනුවිච්චකාරං ඛො ගහපති කරොහි අනුවිච්චකාරො
තුම්හ සදිසානං ඤාතමනුස්සානං සාධු හෝති

''ගැහැවිය විමසා කටයුතු කරව. එසේ කිරීම තොප වැනි ප්‍රසිද්ධ නැණවත් පුරුෂයන්ට යහපතක් ම වේ''

*- බුදුරජාණන් වහන්සේ -*

මජ්ඣිම නිකාය, මජ්ඣිම පන්නාසකය, ගහපති වග්ගය, උපාලි සූත්‍රය.

තාපාච්ඡේදාච්ච නිකෂාත් - සුවර්ණමිව පණ්ඩිතෛඃ
පරීක්ෂ්‍ය භික්ෂවෝ ග්‍රාහ්‍යං - මද්වචෝ න තු ගෞරවාත්

''නුවණැති රත්කරුවා රන් කැබැල්ලක් ගෙන එය තවා, කපා, උරගා, ඔපමට්ටම් කර රන් බව හඳුනාගන්නාක් මෙන් භික්ෂුව ද මාගේ වචනය පිරික්සීමෙන් මිස හුදු ගෞරවයෙන් පමණක් නොපිළි ගත යුතුය.''

*ආර්යදේව පාදයන්වහන්සේ*

*ඥාණසාරසමුච්චය*

# සංකාසනාව

මනෝ විද්‍යාඥයින් පවසන පරිදි මිනිසා සහජයෙන් ම ස්වරක්ෂණ ආකල්පයෙන් (Self-Protective attitude) යුක්ත ය. ඒනිසා ම විශ්වයෙහි ක්‍රියාකාරිත්වය කෙරෙත් අසරණ වූ මිනිසා එයට අදෘශ්‍යමාන බලවේගයක පිහිට අපේක්ෂා කළේය. එහි දී විශේෂයෙන් ම භක්ති පූර්වාංගමව ස්වභාව ධර්මයේ විවිධ වස්තූන් කෙරෙහි දේවත්වාරෝපණයෙන් යාඥාව හා යාගය ආරම්භ කළේය. එය ම ලෝක ආගම් සම්භවයෙහි මූලාවස්ථාව වශයෙන් විද්වතුන් පිළිගනී. මෙය පෙර අපර දෙදිග සියලු ශිෂ්ටාචාරයන්හි පැවැති මූලික තත්ත්වය වශයෙන් අද බොහෝ දෙනා පිළිගනිති. ඒ අනුව ආගම බිහිවීමේ ප්‍රාරම්භක හේතුව වන්නේ පුද්ගල මනසෙහි උපන් බිය හෝ අසරණකමයි.

පූර්වෝක්ත කාරණාවන්ට අනුව පැහැදිලි වන්නේ මිනිසා පළමුවත්, ආගම දෙවනුවත් බිහි වූ බවයි. එහෙත් දේවධර්මවාදී ආගම්වල මූලික පිළිගැනීම වන්නේ ආගම හෝ ආගමේ සර්වබලධාරී දෙවියන්වහන්සේ පළමුවත් දෙවනුව මිනිසාත් බිහි වූ බවයි. එයින් පෙනී යන්නේ කාලයාගේ ඇවෑමෙන් මිනිසා විසින් ම බිහිකළ ආගම ඔහු අභිබවා පෙනී සිටි බවයි. ඊට මූලික හේතුව වී ඇත්තේ ආගමේ ඒකාධිකාරය වඩාත් ප්‍රබල ලෙස තහවුරු කිරීමයි. ඒනිසා ම නිරායාසයෙන් මිනිසා ආගමට යටත් වූ නිදහස් චින්තනය ආගමට පාවාදුන් අයෙකු බවට පත් වී තිබේ. භාරතීය දේවධර්ම වාදයේ ක්‍රම විකාශය ප්‍රධාන කොටස් තුනකි. බහුදේවවාදී යුගය, ඒකෛකේශ්වරවාදී යුගය හා ඒකදේවවාදී යුගයයි. ඒ අතර දෙවියන්ගේ බලගතු ම පෙනී සිටීම ඒකදේවවාදී යුගය යි. ''ඊශ්වරානං පරමං මහේශ්වරං'' යනුවෙන් දේවාතිදේව වශයෙන් හඳුනාගන්නේ එහෙයිනි.

ඉහත කී ආගමික චින්තනයෙහි ක්‍රම විකාශයේ දී මිනිසා දුබල අයෙකු බවට පත්වන්නේ සියලු හිමිවීම් සහ අහිමිවීම් දෙවියන්

මත ම තීරණය වීම නිසයි. මෙමගින් මිනිසාගේ නිදහස් චින්තනයට හා විමසීමට කිසි අවකාශයක් හිමිවූයේ ද යන්න කල්පනා කිරීම අපහසු නොවේ.

ප්‍රාග් භාරතීය ආගමික පරිසරයෙහි පමණක් නොව බුද්ධකාලීනවත්, පශ්චාත් කාලීනවත් උපන් සියලු දේවධර්මවාදී ආගම් පූර්වෝක්ත තත්ත්වයෙන් වෙන් වූයේ යැයි විශ්වාස කිරීම අපහසු ය. විශේෂ වශයෙන් ම යුදෙව්, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම් පශ්චාත් කාලීනව මානව සමාජයට බලපාන ලද අතර ම වර්තමානයේ ද ලොව වඩාත් ප්‍රකට, ප්‍රචලිත ආගම් වන්නේ ඒවාය.

පෙරදිග ආගමික, දාර්ශනික චින්තනය වසර දහස් ගණනක් පුරා ලබන ලද අත්දැකීම් මත ආගමික ඒකාධිකාරයෙන් මිදීමට ගන්නා ලද උත්සාහය හෙවත් මිනිසා තමන්ට හිමිවිය යුතු සිතීමේ විමසීමේ නිදහස හඹායෑමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රි. ව. හයවන සියවස වනවිට විවිධ මානයන් ඔස්සේ ලෝකය හා සත්ත්වයා දෙස බලන ආගමික සම්ප්‍රදායයන් රාශියක් බිහිවිය. එය ඓතිහාසික තොරතුරුවලට අනුව බලන කල්හි යම් පමණකට පැරණි යුගයේ (මොහෙන්ජදාරෝ-හරප්පා) පැවැති තත්ත්වයට යළි උරුමකම් කීමකි. කෙසේ වෙතත් ඒ තුළ නව ආගම්-දර්ශන බිහිවීම සඳහා වන මානසික හා සාමාජික පසුබිම ඇතිවූයේ ය, යන්න අපගේ පිළිගැනීමයි. සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේට සම්මා සම්බුද්ධත්වය සඳහා වූ පරිසරය එයින් ම සකස් වුණි.

දාර්ශනික සංකල්ප ඔස්සේ ගොඩ නැගෙන බටහිර දර්ශන සම්ප්‍රදායය ක්‍රි. ව. මුල්භාගයේ පටන් දාර්ශනික වශයෙන් අඳුරු වී ගියේය. විශේෂයෙන් ක්‍රි. ව. 4 දී පමණ ආරම්භ වන මධ්‍යකාලීන යුගය වනවිට පල්ලියේ පූජකයා ම දාර්ශනිකයා වීමෙන් ක්‍රිස්තියානියට අයත් බයිබලය ප්‍රාමාණිකව සලකන්නට විය. ඒ අනුව මිනිසුන්ගේ නිදහස් චින්තනය ඇහිරී ගියා පමණක් නොව බටහිර චින්තනයට ඉමහත් ආගමික අධිකාරී බලපෑමක් ඇති කළේය, යන්න විද්වතුන්ගේ පිළිගැනීමකි (ග්‍රීක දාර්ශනික චින්තකයෝ, ඒ.ඩී.පී. කලන්සූරිය).

"නබි" නායක තුමන්ගේ වක්තෘත්වයෙන් ප්‍රචලිත වූ ඉස්ලාම් දහම ද දේවධර්මවාදී ආගම්වල පවත්නා මූලික සන්දර්භයෙන් දුරස් නොවෙයි. එය ද සෙසු එවැනි ආගම් සේම "අල්ලාහ්" දෙවියන්ගේ පරම අධිකාරී බලය අගයන්නේය. ඒ මත ම පුද්ගල ජීවන රටාව සේ ම විමුක්තිය හඳුන්වා දෙයි. කුරාණය නම් වූ ශුද්ධ ග්‍රන්ථය ඔවුන් විසින් දේවභාෂිතයක් සේ ප්‍රාමාණිකත්වයෙන් සලකනු ලැබෙති. ඉන් පරිබාහිර කිසිදු තත්ත්වයක් හෝ දෙයක් ඔවුන් විශ්වාස නොකරයි. එවැනි පරිසරයක කිසිදු නිදහස් චින්තනයකට අවකාශ ඇතැයි සිතීම ද අපහසු ය.

මානව වංශ කථාවේ උපන් යම් ආගමක් මිනිසාට පූර්වතර වූ යම් දෙයක් හෝ කෙනෙකු හඳුන්වා දුන්නේ ද, ඒ සියලු තැන්හි මිනිසා අක්‍රිය අයෙකු වී තිබේ. ඒ අනුව මිනිසාගේ සියලු ක්‍රියාකාරකම් සීමාසහිත කොට තිබේ. සියලු දේවධර්මවාදී ආගම්වල මූලික ලක්ෂණ විමසීමෙන් මෙය හඳුනාගත හැකිය.

* දෙවියන් වහන්සේ හෝ ඔහුගේ අධිකාරී බලය ලත් අයෙකු මිනිසාට වඩා පූර්වතර ලෙස සිතීම.
* යහපත (ස්වර්ගය) හෝ අයහපත (අපාය) තීරණය කරන්නා මිනිසා නොව වෙනත් බාහිර බලවේගයක් යැයි විශ්වාස කිරීම.
* සකලවිධ මානව ක්‍රියාකාරකම් ආගමික විෂය සීමාව ඉක්මවා නොයෑම.
* ආගමික භාෂිතයෙන් එහා ගිය චින්තනයට නිර්දය දඬුවම් හිමිවීම.
* සියලු සදාචාරයන් එම ආගමික සීමාවන්ට පමණක් අයත්වන අතර තමාට හිමිවීම හෝ අහිමිවීම අධිකාරී බලධාරියාගේ කැමැත්ත යැයි විශ්වාස කිරීම.

ආදී කාරණාවන් පොදුවේ දැකගත හැකිය. එකී තත්ත්වයන් තුළ මිනිසාට කවර තරමක හෝ නිදහස් විමසීමක් හෝ චින්තනයක් හිමි නොවන බව සුපැහැදිලි කරුණකි.

පැවැති ඒකාධිකාරයට සහමුලින් පටහැනි නවතම දර්ශනයක් හඳුන්වාදීමේ ගෞරවය බුදුදහමට හිමි වෙයි. ප්‍රාග් බෞද්ධ යුගයේත්, බුද්ධ කාලීනවත් පැවැති ආගමික පරිසරයෙහි අධිකාරී බලය සියතට ගත් බමුණු දහම තුළ පුද්ගලයාගේ ස්වච්ඡන්දතාව නොඇගැයුයේය. එහෙයින් සිතීමේ හා විමසීමේ නිදහසට අවකාශ නොවීය. ඊට ප්‍රතිවිරුද්ධ ආගම් රාශියක් පෙනී සිටි නමුත් ඒවායෙහි ද විනිවිද භාවයෙන් යුතු විවෘතබවක් පූර්ණ වශයෙන් පැවතියේ ද යන්න සැක සහිතය. එහෙත් බුදුදහම පැවති තත්ත්වය විවේචනය කළා සේ ම නවතම හඳුන්වාදීම් ද කරමින් නවතම ප්‍රවේශයක් දුන්නේය. වීමංසකාදී සූත්‍රවලට අනුව බුදුරජාණන් වහන්සේ තමන් සහ තමන්ගේ දර්ශනය පවා විමර්ශනාත්මකව බැලීමේ පූර්ණ නිදහස දී තිබේ. බුදුදහමේ චින්තන හා වීමංසන නිදහස හඳුනාගන්නට එය ම වුව ද ප්‍රමාණවත්ය. ඊට ප්‍රධාන හේතුව බුදුදහම මිනිසාට පෙරටු වූ අධිකාරීබලය සහිත දෙවියෙකු හෝ වෙනයම් බලවේගයකට පදනම් නොවීමයි. එමෙන් ම සදාචාරාත්මක ගමන් මගක අවසන් ඵලය ලෙස 'නිර්වාණය' අවබෝධ කරගත යුතු බව බුදුදහම අවධාරණය කරන නමුත් එය ආගමික සහනශීලී බව හා පුද්ගල අධිකාරීත්වයට බලපෑම් නොකරයි. බුදුදහම පුද්ගලයාගේ චර්යාධර්ම පාලනය කරන්නේ තමන්ට සහ අනුන්ට යන දෙපිරිසට ම හානිකර තත්ත්වයක චර්යා ධර්ම ප්‍රකට කරන්නේ නම් පමණි.

බුදුදහමේ සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳ පෙර අපර දෙදිග විද්වතුන් විවේචනාත්මකවත්, ඇගයුම්ශීලීවත් සාකච්ඡා කරනු බොහෝ සෙයින් දක්නට ලැබේ. ඒ අතරට ශාස්ත්‍රපති, පනහඩුවේ යසස්සි හිමියන් 'නිදහස් චින්තනය හා වීමංසනයː ආගමික හා දාර්ශනික මූලධර්ම විග්‍රහයක්' නමින් සපයන මෙම මහාර්ඝ පර්යේෂණාත්මක ග්‍රන්ථය මධ්‍යස්ථ විවරණයකි. ඒ තුළ අපගේ සාකච්ඡාවට බඳුන් වූ ආගමික හා දාර්ශනික කාරණාවන් විශ්වසනීය මූලාශ්‍රයයන් පරිශීලනය කිරීමෙන් තහවුරු කොට තිබීම ඇගයිය යුත්තකි. උන්වහන්සේ අධ්‍යයන ක්ෂේත්‍රයේ පර්යේෂණාත්මක කුසලතාවන් ප්‍රකට කිරීම නිසා ම දැනට ශ්‍රී ජයවර්ධනපුර

විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ නිබන්ධකවරයකු වශයෙන් සේවය කරති. උන්වහන්සේගේ මෙම කෘතිය බුද්ධදහම පිළිබඳව අවධානය යොමුකරන විද්වතුන්ට සේ ම අධ්‍යයන ක්ෂේත්‍රයේ නියැලෙන විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනය උදෙසා ප්‍රමාණවත් වටිනා ග්‍රන්ථයක් බව නොවක් සිතින් ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

**කේ.ඒ. වීරසේන**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.
02.10.2009

# උපකාරානුස්මෘතිය

විමංසනය, නිදහස් චින්තනය, ස්වච්ඡන්දතාව යනු වර්තමානයේ වඩාත් ප්‍රචලිත සංකල්පයන්ය. එසේ වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ නිදහසේ සිතා මතා ක්‍රියා කිරීමට සුදුසු පරිසරයක් ගොඩනැගී තිබීම යි. ලොව විද්‍යමාන බොහෝ ආගම් හා දර්ශනයන් හි සාකච්ඡාවට බඳුන්වන ප්‍රධාන මාතෘකාවක් ලෙස ද නිදහස් චින්තනය දැක්විය හැකිය. බුදුරජාණන්වහන්සේ භාරතයේ පහළ වූ සමයෙහි ප්‍රබලව පැවති ආගම් තුළ නිදහස් චින්තනයට හා විමසීමට ඉඩක් නොලැබුණේ සියල්ල ඊශ්වර නිර්මාණවාදී පදනමකට ආරෝපනය කිර තිබීම යි. එම ඉගැන්වීම් විවේචනය කරමින් නිදහස් චින්තනයට හා විමංසනයට ඉඩක් ලබා දියයුතු ය යන හැඟීමෙන් බිහි වූ ශ්‍රමණ සම්ප්‍රදායය තුළින් ද අපේක්ෂා කළ ආකාරයේ චින්තන නිදහසක් නොලැබුණි. මෙවන් පසුබිමක් තුළ භාරතයේ පහළ වූ බුදුදහම ඊට හාත්පසින් ම වෙනස් දර්ශනයක් ඉදිරිපත් කරමින් පුද්ගලයාගේ සිතීමේ හා විමසීමේ අයිතිය තහවුරු කරන ලදි. පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අගය කරමින් නිදහසේ සිතීමටත් විමසීමටත් ක්‍රියාකිරීමටත් ඉඩ ලබා දුන් බුදුදහම තමා කැමති ආගමක් ඇදහීමේ අයිතිය ද තහවුරු කළ අයුරු ත්‍රිපිටක සාහිත්‍යය දෙස අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වෙයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ විශේෂවේදී උපාධිය සම්පූර්ණ කිරීම වස් මා විසින් රචනා කරන ලද පර්යේෂණ නිබන්ධය සංසෝධන සහිතව ග්‍රන්ථයක් ලෙස මුද්‍රණය කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක් කොට සලකන්නේ මෙය මාගේ කුළුඳුල් ප්‍රයත්නය නිසාමය.

මෙම ග්‍රන්ථය සම්පාදනයේ දී අවවාද අනුශාසනා කරමින් හා පසුවදනක් සපයා දෙමින් මා දිරිමත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශාධිපති,

ආචාර්ය නායිඹබල ධම්මදස්සි හිමියන්ට ශිර්ෂ ප්‍රණාමයෙන් පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පුදකර සිටිමි. බොහෝ රාජකාරි මධ්‍යයේ වුව ද ඉතා කෙටි කාලයකින් පෙරවදනක් සපයා දුන් ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, කේ. ඒ වීරසේන ගුරුපියාණන්ට ද පුණ්‍යානුමෝදනා කර සිටිමි. මා දිරිමත් කරමින් අවවාද අනුශාසනා ලබාදෙන ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමියන්ට ද මාගේ පුණ්‍යානුමෝදනාව පුදකර සිටිමි. කෙතරම් අවිවේකීව සිටියද මා කෙරෙහි අනුකම්පාවෙන් මුළු ග්‍රන්ථයම කියවා සෝදුපත් පරීක්ෂා කළ කථිකාචාර්ය ගාමිණී රත්න ශ්‍රී ගුරුපියාණන්ට මාගේ කෘතඥතාව හිමිවිය යුතුය. අප අධ්‍යයනාංශයේ කථිකාචාර්ය එළමල්දෙණියේ සාරානන්ද, කුඹුකේ චන්ද්‍රාලෝක, මැස්ටියේ උපනන්ද යන හිමිවරුන් ද, තාවකාලික නිබන්ධකවරුන් වන කට්ටකඩුවේ චන්දවිමල, රත්මල්කැටියේ අරියනන්ද යන හිමිවරුන් ද, මහාචාර්ය ඥානදාස පෙරේරා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යාපාරත්න වීරසේකර, කථිකාචාර්ය අරුණ ශාන්ත වල්පොල, කථිකාචාරිණී ආශා නිමාලි ප්‍රනාන්දු යන ගුරු මහත්ම මහත්මීන් ද සිහිපත් කරනුයේ හදපිරි සතුටිනි.

මා පැවිදි කොට මග නොමග කියාදෙන බෝධිසත්ත්ව-ගුණෝපේත, ගුරුදේවෝත්තම වරායායේ අතුල නාහිමිපාණන් වහන්සේට ද, කුඩා කළ පටන් මා වෙත රැකවරණය ලබා දෙමින්, අවවාද අනුශාසනා ලබා දෙමින්, නිසි මග කියා දී ආශිර්වාද හා උපකාර කරන ගුරුදේවෝත්තම තුම්බෝවිල ධම්මරතන නාහිමිපාණන් වහන්සේට ද පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පුදකර සිටිමි. නිරන්තරයෙන් මා දිරිමත් කරමින්, අයෝමය ශක්තියක් වෙමින් උපකාර කළ මහමිතව පඤ්ඤාරතන හිමියන්ට ද, දෙහිපාගොඩ විජිතනන්ද, මඩිහේ සුගතසිරි, කුඩාකත්නොරුවේ විනීත යන ස්වාමින් වහන්සේලාට ද කථිකාචාර්ය අරුණ කේ. ගමගේ මහාත්මාට ද එදා මෙදාතුර ගුණ නැණ ලබා දුන් සියලු ම ගුරුවරුන්ට ද තුම්බෝවිල ප්‍රදේශවාසී සාධුජන පිංවතුන්ට ද පුණ්‍යානුමෝදනා කරනුයේ අත්‍යන්ත දයාවෙනි. නන් අයුරින් සහය දුන් මඩවලලන්දේ චන්දානන්ද, කරවිලයායේ සුදස්සි, පනාපිටියෙ

විජයරතන, කහවත්තේ සේනින්ද, කලල්ඇල්ලේ සෝමාලංකාර යන සහෝදර හිමිවරුන් ද, සූරියවැවේ විජිතනන්ද, උලහිටියාවේ විභාවි, වැල්ලේතොට ඉන්දානන්ද, විජයපුර ගුණානන්ද, හටන්ගල නන්දවංස, ඊරුවැවේ ගුණසෝම, වල්ගම සුමන යන හිතවත් ස්වාමීන්වහන්සේලා ද කෘතඥතා පූර්වකව සිහිපත් කරනු කැමැත්තෙමි. තිහගොඩ සාරද, ඇඹිලිපිටියේ ධම්මික යන සද්ධිවිහාරික හිමිවරුන් ද, ජයන්ත මංගල, තුවන්, මධුර යන මහත්වරුන් ද සිහිපත් කළ යුතුය.

මා කුඩා කාලයේ දී ම සදහට ම දෙනුවන් පියාගත් දයාබර පියාණන්වහන්සේට පුණ්‍යානුමෝදනා කරන අතර සුජීවත්ව සිටින මෑණියන්-වහන්සේට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමි. නිරන්තරයෙන් මා දිරිමත් කරන අබේරත්න බණ්ඩාර, අනුරුද්ධ බණ්ඩාර, අමිල රණසිංහ බණ්ඩාර, ජයන්ත යන සොහොයුරන් ද, ස්වර්ණතිලකා කුමාරි, ධර්මතිලකා කුමාරි, අනෝමා යන සොයුරියන් ද මෙහිලා සිහිපත් කළ යුතුය.

පරිගණක අක්ෂර සංයෝජනය කරදුන් ජයනි සශිකලා සොයුරියටත් ග්‍රන්ථය සැරසීම් කළ කුමාරි විජේවර්ධන සොයුරියටත් මුද්‍රණ කටයුතු කරදුන් රුවන්පහරුව ආයතනයේ අධිපති තුමා ඇතුළු කාර්යමණ්ඩලයටත්, ප්‍රකාශනය කළ 'මාගධී' පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනයටත් ස්තුතිය පුදකර සිටිමි.

මෙම ග්‍රන්ථය මාගේ කුළුඳුල් ප්‍රයත්නය වීම නිසා බොහෝ අඩුපාඩු තිබිය හැකිය.ඒවා බුද්ධිමත් සජ්ජනයන්ගේ කරුණාවට පාත්‍ර විය යුතු අතර එවැනි තැන් නිවැරදි කරදීම ඉතා අගය කොට සලකමි.

**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා**

**පනහඩුවේ යසස්සි හිමි**

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
E mail-;venpanahaduwe@yahoo.com/0714879654

# සමර්පණය

මා ලොවට ජනිත කර
රුහිරු කිරිකර පොවා
ජීවිතය එකළු කළ
දයාබර මෑණියනි....

ගතේ ඩහදිය හෙළා
වෙහෙස වී මා හදා
සදහට ම දෙනුවන් පියාගත්
දයාබර පියාණනි....

සසුන් කෙත දායාදය ලැබ දී
නිසි මග පෙන්වා වදාළ
පතළ ගුණ ඇති
අතුල නාහිමියනි....

නෙක රුවන් බඳු
ඔවා ලැබ දී
මග විවරකළ
දම්රුවන් නාහිමියනි....

ඔබ සැමට පුදමි මෙය
බැතිසිතින්....

# පෙළගැස්ම


| | පිටුව |
|---|---|
| සංකාසනාව | vii |
| උපකාරානුස්මෘතිය | xiii |
| සමර්පණය | xvii |
| 1. නිදහස් චින්තනය හා වීමංසනයඃ හැඳින්වීම | 21 |
| 2. වීමංසනය පිළිබඳ භාරතීය අන්‍යසාමයික මතවාද | 41 |
| 3. නිදහස් චින්තනය හා වීමංසනය පිළිබඳ දේවවාදී ආගමික ඉගැන්වීම් | 90 |
| 4. නිදහස් චින්තනය හා වීමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය | 120 |
| ආන්තික සටහන් | 154 |
| ආශ්‍රිත ග්‍රන්ථ | 171 |

# 1

# නිදහස් චින්තනය හා වීමංසනය

## හැඳින්වීම

මනුෂ්‍යයා බාහිර අධිකාරයක (Authority) බලපෑම මූලික වශයෙන් පිළිගෙන, ක්‍රියා කිරීමට නැඹුරු වූවකු බව පැරණි ආගමික ඉතිහාසය දෙස බලන විට පැහැදිලි ව පෙනෙන කරුණකි. එහෙත් බුදුසමය මේ තත්ත්වයෙන් මිදී මනුෂ්‍යයා සියලු අධිකාරයන්ගෙන් නිදහස් කර නිරවද්‍ය පිළිවෙතකට යොමු කරවයි. ඒ බව බුදුරජාණන්-වහන්සේ

**තුම්හේහි කිච්චං ආතප්පං**
**අක්ඛාතාරෝ තථාගතා**[1]

යනුවෙන් දේශනා කළහ. බුදුරජාණන්වහන්සේ හැඳින්වීමට මග්ගඤ්ඤු, මග්ගවිදූ, මග්ගකෝවිදෝ යන නම් භාවිත කර ඇත්තේ එබැවිනි. එසේ පෙන්වන ලද මාර්ගය මානව කේන්ද්‍රීය (Anthropocentric) පදනමක් මත පිහිටා තිබීම බුද්ධදහමේ ඇති විශේෂත්වය යි.

නිදහස (Freedom), ස්වච්ඡන්දතාව (Free will), වීමංසනය (Quest) වැනි සංකල්ප පිළිබඳ බෞද්ධ ස්ථාවරය සොයා බැලීම තුළින් බුද්ධදහමේ දාර්ශනික ප්‍රවණතාව සහ එහි වැදගත්කම මනාව

අවබෝධ කරගත හැකිය. ආගමික සත්ත්වයකු වූ මිනිසා ඈත අතීතයේ පටන් ම කිසියම් ආගමික විශ්වාසයකට නැඹුරුව සිටි බව පැහැදිලි වේ. එහෙත් එදා මෙදා තුර පහළ වූ ආගමික ඉගැන්වීම් තුළ විචාර පූර්වක ආකල්පයකට හෙවත් වීමංසනයට ඉඩක් ලැබුණා ද යන්න සැක සහිතය. මෙබඳු පසුබිමක් තුළ බුදුසමයේ ඉගැන්වෙන සුවිශේෂ වැදගත්කමක් ඇති සංකල්පයක් ලෙස වීමංසන සංකල්පය හැඳින්විය හැකිය. තව ද බෞද්ධ දර්ශනයට පමණක් ආවේණික විශිෂ්ට ඉගැන්වීමක් වශයෙන් වීමංසා සංකල්පය හඳුනාගත හැකිය.

බුදුරජාණන්වහන්සේ ධර්මය අවබෝධ කර ගත්තේ වීමංසනයෙනි. **කිංසච්චගවේසී. කිංකුසලගවේසී** යන වචනවලින් අර්ථවත් වන්නේ එය යි. වීමංසනයෙන් සත්‍ය සොයාගත් බුදුරජාණන්වහන්සේගේ චරිතයෙන් මෙන් ම බුදුදහමින් ද වීමංසනයට හිමිවන තැන අතිවිශිෂ්ටය. සත්‍යාවබෝධය ත් වීමංසනය ත් අතර ඇති අඛණ්ඩ සම්බන්ධතාව විමසීමට පෙර වීමංසනය යනු කුමක්දැ යි විමසා බැලීම වඩාත් යෝග්‍ය වේ.

වීමංසනය යනු කිසියම් පුද්ගලයකු යම් දෙයක් දුටු පමණින් හෝ ඇසූ පමණින් අන්ධානුකරණයෙන්, අන්ධ භක්තියෙන් (Blind Faith) නොපිළිගෙන ස්වකීය බුද්ධිය මෙහෙයවා සතර අගතියෙන් තොර ව විවේක බුද්ධියෙන් හා විවෘත මනසකින්, විචාර පූර්වක ව ඒ දෙස බැලීම යි. තථාගත ධර්මය බබලන්නේ විවෘත වූ තරමටය. එය වැසී තිබෙන තාක්කල් කිසිදු බැබලීමක් නැත.[2] එසේ විවෘත වීමට නම් නුවණින් විමසිය යුතුය. විමසීමකින් තොර ව එබඳු වූ බැබලීමක් අපේක්ෂා කළ නොහැකිය.

"වීමංසා" ශබ්දයෙහි නිරුක්තිය (Etymology) සොයා බැලීමේ දී සාම්ප්‍රදායික පාළි ව්‍යාකරණ ග්‍රන්ථ ආශ්‍රය කිරීම ඉතා වැදගත් වේ. සාම්ප්‍රදායික පාළි ව්‍යාකරණ ග්‍රන්ථ අතර නිරුත්තිදීපනී, කච්චායන, මොග්ගල්ලායන, සද්දනීති සහ පද රූපසිද්ධි යන ව්‍යාකරණ ග්‍රන්ථවල "වීමංසා" ශබ්දයට නිරුක්ති දක්වා ඇත. ඉහත සඳහන් ව්‍යාකරණ ග්‍රන්ථ අතර නිරුත්ති දීපනියේ සහ මොග්ගලායනයේ දැක්වෙන්නේ,

**මානස්ස වී පරස්ස ච මං**
**ද්විත්තේ පුබ්බස්ස මානස්ස වී හොති පරස්ස ච**
**සබ්බස්ස මානස්ස මං හොති.[3] යනුවෙනි.**

√මාන ධාතුවෙහි මාන ද්විත්ව වී ප්‍රථම මාන යන්නට 'වි' උපසර්ගය පූර්ව වී සිතීම යන අරුත දෙමින් අනතුරු ව මාන යන්නට මං ආදේශ වේ. එවිට වීමංසා යන වචනය සෑදෙන අයුරු මෙසේ දැක්විය හැකිය.

මාන + ස
මාන + මාන + ස
වී + මං + ස

සාම්ප්‍රදායික පාළි ව්‍යාකරණ ග්‍රන්ථයක් වන සද්දනීතිප්‍රකරණයේ දැක්වෙන්නේ ද මීට සමාන අදහසකි.

**මාන වීමංසායං වීමංසති වීමංසා[4]**

මාන යන ධාතුව විමසීම් අර්ථයෙහි යෙදේ. එම ධාතුවෙන් විමංසති යනුවෙන් ක්‍රියා පදයකුත් වීමංසා යනුවෙන් නාම පදයකුත් සෑදේ.

විමංසා ශබ්දයට නිරුක්ති සපයන පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ පාළි සිංහල අකාරාදියේ මෙසේ සඳහන් කරති.

**(මාන + සා මා-හට ද්විත්ව වේ, ප්‍රථම - මා - හට වී - ආදේශ වේ.**

**ඉතිරි මාන කොටසට මං ආදේශ වේ.[5] )**

යනුවෙන් දක්වයි. එම නිරුක්ති දැක්වීම මෙසේ පෙන්වා දිය හැකිය.

**මාන + ස**
**ම + මාන + ස**
**උපසර්ගය - වි + √මං + ස - ප්‍රත්‍ය**

පාළි ව්‍යාකරණ ග්‍රන්ථවලට අනුව "වීමංසා" යන වචනයට ඉහත සඳහන් ආකාරයෙන් නිරුක්ති සපයා ඇත. එයින් විමසීම, පරීක්ෂා කිරීම, නුවණින් බැලීම[6] යන අරුත් ලබා දෙන බව බුද්ධදත්ත හිමියෝ සඳහන් කරති.

වීමංසා යන වචනය පාළි ව්‍යාකරණ ග්‍රන්ථවල විවිධ අරුත්වල යෙදී ඇති බව පෙනේ. වීමංසා යන වචනය සෑදෙන්නේ √මාන ධාතුවෙනි. මෙම ධාතුවෙහි ගරු කිරීම, පිදීම, සම්මාන කිරීම අතිශය ගරු කිරීම යන අරුත් ගම්‍යමාන වේ. ඒ බව නිරුත්තිදීපනියේ මෙසේ සඳහන් වේ.

> "වීමංසායන්ති කිං? මාන පූජායං මානෙති
> සම්මානෙති, අභිමානෙති, පූජේතීති අත්ථො[7]

√මාන ධාතුව මං බවට පත් වීමෙන් "වීමංසා" යන පදය සෑදෙයි. √මිං යන ධාතුවෙහි අරුත වන්නේ සිතීම යන්න යි. මේ අනුව විමංස යනු විමසනු කැමති (Willingness to quest) යන අරුත් දෙන පදයකි. ඒ බව සද්දනීති ව්‍යාකරණ ග්‍රන්ථයේ සඳහන් වෙයි.

> මාන පූජායං පෙමනෙ වීමංසායං....

වීමංසා ශබ්දය වරනගා දක්වන වියරණ ඇදුරෝ කර්ම කාරකයෙහි වීමංසයති, වීමංසීයන්ති යන පද දෙක ලබා දී ඇත.[8] ක්‍රියා අර්ථය දැක්වීමට වීමංසති, වීමංසෙති, වීමංසයති, වීමංසාපෙති, වීමංසාපයති යන පද භාවිත කොට ඇත. වීමංසා, වීමංසියමානො වීමංසයන්තො යන පද කෘදන්තයට ද යෙදී ඇති බව පෙනේ.[9]

වීමංසනය යන්න මෙසේ නොයෙක් අයුරින් විග්‍රහ කර තිබීම අප අධ්‍යයනයට මහත් රුකුලකි. ඊට අමතර ව වීමංසනය යන්නට මෙවැනි නිර්වචනයක් (Definition) ලබා දිය හැකිය. ''සැකයක් (doubt) ඇති වූ විට එම සැකය පිරිසිඳ දැන ගැනීමට දරන උත්සාහය වීමංසනය නම් වේ. එසේ ම වීමංසනය යනු සැකය සහ ඥානය අතරමැදි වූවක් ලෙස ද හැඳින්විය හැකිය''. යමක් දෙස විමර්ශනාක්ෂියෙන් බැලීමට නම් ඒ පිළිබඳ ව සැකයක

ඇතිවිය යුතු ය. එසේ ඇති වන සැකය පදනම් කරගෙන සත්‍යය සෙවීමට උත්සාහ කරයි. මේ අනුව විමංසනයට බලපාන ප්‍රධාන සාධකය වන්නේ සැකය නමැති චිත්තවේගය යි (Emotion).

බුද්ධදහමේ දාර්ශනික සංකල්ප අතර එන වීමංසනය කෙබඳු එකක් ද යන්න ඉහත සඳහන් කරන ලද කරුණු තුළින් මනාව අවබෝධ කරගත හැකිය.

## ස්වච්ඡන්දතාව හා වීමංසනය පිළිබඳ වියත් මතවාද

**Scholars ideas of freewill and quest**

ස්වච්ඡන්දතාව සහ වීමංසනය යන සංකල්ප පිළිබඳ ව පෙර අපර දෙදිග ම වියතුන් විසින් කරුණු දක්වා තිබේ. ස්වච්ඡන්දතාව (Freewill) සහ වීමංසනය (Quest) යන සංකල්ප දෙක ම පදනම් වන්නේ නිදහස් චින්තනය මතයි. ස්වච්ඡන්දතාවක් පැවතිය හැක්කේ චින්තන නිදහසක් (Free thought) පැවතුනහොත් පමණි. චින්තන නිදහස හා ස්වච්ඡන්දතාව සමෝධානය වීමෙන් ගොඩනැගෙන ප්‍රධාන සංකල්පය වන්නේ විමංසන සංකල්පය යි. ඒ අනුව වීමංසනය යනු ස්වච්ඡන්දතාවයේ සහ චින්තන නිදහසේ අග්‍රඵලය ලෙස සඳහන් කළ හැකිය. චින්තන නිදහසකින්, ස්වච්ඡන්දතාවකින් තොර ව වීමංසනයක් ගැන කතා කළ නොහැකිය. යමක් නුවණින් විමසා බැලීමට නම් නිදහසේ සිතන්නට ඉඩක් තිබිය යුතුය. මෙම සංකල්පත්‍රය ම එක හා සමාන අදහස් දෙන එකට බැඳුණු සංකල්ප ලෙස හැඳින්විය හැකිය.

පාළි භාෂාව විග්‍රහ කරන වියතුන් අතර රීස් ඩේවිඩ්ස් (Rhys Davids) මහතාට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. එතුමා වීමංසා යන්නට Consideration, examination, test, investigation and The fourth of the Iddhipada[10] යනුවෙන් විග්‍රහ කර ඇත. වීමංසා ශබ්දයට අර්ථ දක්වන Gnānatiloka හිමියෝ සිය බෞද්ධ ශබ්දකෝෂයේ දී Investigation, Inquiry, Pondering, is one of the four roads to power (Iddhi-pada) and one of the four factors of predominance [11] යනුවෙන් සඳහන් කර ඇත. මේ අතර Ven. T. moscrop සහ B.A.

Mendis යන වියතුන් දෙදෙනා විමසනවා යන්නට To prove, to investigate to search into යන අරුත් ලබා දී ඇත.[12] Ven. B. clough විසින් ද "වීමංසා" ශබ්දයට අර්ථ දක්වා ඇත. ඔහුට අනුව To perceive, discussion investigation, Reasoning, Examining, Searching යන අර්ථ ඉදිරිපත් කර ඇත. [13]

පොල්වත්තේ බුද්ධදත්ත, විදුරුපොල පියතිස්ස යන හිමිවරුන් පාළි සාහිත්‍යයේ දියුණුව උදෙසා විශාල සේවාවක් ඉටුකළ පඬිවරුන් දෙදෙනෙකි. එවැනි උගත් පඬිවරුන් විසින් වීමංසා ශබ්දයට අර්ථ විවරණ දක්වා ඇති ආකාරය මෙහිලා දැක්වීම ද වැදගත් වේ. පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ Investigation යන ඉංග්‍රීසි වචනයට Anuvicāranā, Upaparikkha යන පාළි අර්ථ ලබා දී ඇති අතර Inquiry යන වචනයට Vimansa, Upaparikkha, Paripuccha යන අරුත් ලබා දී තිබේ. [14]

වීමංසා ශබ්දයට අර්ථ දක්වා ඇති උගතුන් අතර විදුරුපොල පියතිස්ස හිමියන්ට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. උන්වහන්සේ Inquiry යන වචනයට පුච්ඡා, පඤ්හො, අනුයෝගො, විචාරණා, වීමංසනා, පරික්ඛා... යන පාළි වචන ඉදිරිපත් කර ඇත. Investigation යන වචනයට ලබා දී ඇත්තේ වීමංසා, විචාරණා, සමන්නේසනා යන අරුත් ය.[15] එහෙත් මා විශ්වාස කරන පරිදි බෞද්ධ පදනමකින් විමංසනය පිළිබඳ ව කතා කරනවිට වඩාත් ම ගැලපෙන ඉංග්‍රීසි වචනය වන්නේ Quest යන්න යි.

වැලිවිටියේ සෝරත හිමියෝ ද වීමංසා ශබ්දයට විමසීම, සෙවීම, පරීක්ෂා කිරීම යන අර්ථ ලබා දී ඇත.[16] සිංහල ශබ්ද කෝෂයෙහි පරීක්ෂා කිරීම, සෝදිසි කිරීම, විමසීම යන අර්ථ දක්නට ලැබේ.[17] හරිස්චන්ද්‍ර විජේතුංග මහතාගේ අදහසට අනුව පරීක්ෂා කිරීම, විමසිලිමත්, පිරික්සුම් සහිත, සෝදිසි කර බැලීම, විමසීම යන අර්ථ යෙදේ.[18] මේ අතර බෝරුගගමුවේ රේවත හිමියන් දක්වන්නේ පරීක්ෂාව, සෙවීම, විමසීම යන අරුත්වල වීමංසා ශබ්දය යෙදෙන බවයි.[19]

බෞද්ධ ශබ්ද කෝෂයේ නිර්මාතෘ සිරි ලියනගේ මහතා විමංසා ශබ්දය විග්‍රහ කර ඇත්තේ ඉද්ධිපාද යන අරුතිනි. සෘද්ධිය ඇති කර ගැනීමට උපකාර වන ප්‍රඥාව, භාවනාවෙන් උපදවන ධ්‍යාන මාර්ගඵල ආදී මහාර්ග ධර්ම ඉපදවීමට හේතුවන ධර්ම සමූහයෙන් එකක් ලෙස වීමංසනය දක්වයි.[20] එහෙත් මෙතුමා විසින් රචිත නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂයේ දී වීමංසා ශබ්දයට අර්ථ දක්වා ඇත්තේ මෙසේ ය.

විමර්ශනය (සං-විමර්ශන) පරීක්ෂා කිරීම, සෝදිසි කිරීම, විමසීම.[21]

අප මුලින් සඳහන් කළා සේ ම චින්තන නිදහසකින් තොරව වීමංසනයක් ගැන කතා කළ නොහැකිය. ඒ නිසා ස්වච්ඡන්දතාව ගැන සාකච්ඡා කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. වීමංසනයේ පළමු පියවර චින්තන නිදහස යි. ඉන් අනතුරු ව එහි සාවද්‍ය නිරවද්‍ය බව තීරණය කරන්නේ වීමංසනයෙනි. මේ නිසා ස්වච්ඡන්දතාව හා වීමංසනය යන සංකල්ප දෙක එකට බැඳී ඇත.

ස්වච්ඡන්දතාව පිළිබඳ ව ද පෙර අපර දෙදිග ම වියතුන් අදහස් ඉදිරිපත් කොට ඇත. ඔවුන්ට අනුව බුදුදහමේ මානව කේන්ද්‍රියත්වය මනාව පිළිබිඹු කරන වැදගත් ම සංකල්පයකි ස්වච්ඡන්දතාව (Free will). යම්කිසි අරමුණක් පෙරදැරි කරගෙන ස්වතන්ත්‍රව අධිෂ්ඨානයකින් ක්‍රියා කිරීමට ඇති සක්‍යතාව ස්වච්ඡන්දතාව යන්නෙන් අදහස් කෙරේ. නියතිවාදීන් (Determinism) සපුරා ප්‍රතික්ෂේප කරන සංකල්පයක් ලෙස මෙම සංකල්පය හඳුන්වා දිය හැකිය.

ස්වච්ඡන්දතා සංකල්පයට නිශ්චිත නිර්වචනයක් ඉදිරිපත් කිරීම අපහසු කටයුත්තකි. ස්වච්ඡන්දතාව පිළිබඳ ව මෙතෙක් දක්වා ඇති නිර්වචනයන් හි සදොස් බව දක්නා ඇතැම් උගත්තු එය මෝක්ෂය නිවන යනාදී තත්ත්වයන් මෙන් නිර්වචනය කළ නොහැකි බව පවසති.[22] පැරණි යුරෝපීය දර්ශනයන් හි සදාචාරාත්මක නිදහස (Moral Freedom) යනුවෙන් හඳුන්වා ඇත්තෙ

ස්වච්ඡන්දතාව යි. ස්වච්ඡන්දතාව පිළිබඳ ව පැරණිතම නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ ග්‍රීක දාර්ශනිකයන් ය. පෛතගරස්, සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි ග්‍රීක දාර්ශනිකයන් ගේ නිර්වචන අධ්‍යයනය කිරීමෙන් බටහිර මතවාද පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකිය.

පෛතගරස් (ක්‍රි. පූ. 570) දක්වා ඇති ආකාරයට

**"ස්වච්ඡන්දතාව යනු යහපත කිරීම යි"**[23]

සොක්‍රටීස් ස්වච්ඡන්දතාව පිළිබඳ ව ඉදිරිපත්කොට ඇති අදහස් පෛතගරස් ගේ අදහස්වලට සමාන බවක් දක්වයි. යහපත (Good) යන සංකල්පය පදනම් කරගෙන ඔහුගේ නිර්වචනය ඉදිරිපත් කර තිබේ.

**"ස්වච්ඡන්දතාව යනු මිනිසාට යහපත් කටයුතු කිරීමට ඇති නිදහස යි"**[24]

සොක්‍රටීස් හා පෛතගරස් දක්වා ඇති අදහස් විචාරයට ලක් කරන පශ්චාත් කාලීන දාර්ශනිකයන් සඳහන් කරන්නේ ඔවුන් යහපත පිළිබඳ අදහසට යටත් කොට ස්වච්ඡන්දතාව විස්තර කිරීමට උත්සහ කිරීම නිසා එය අසාර්ථක වී ඇති බව යි. සොක්‍රටීස්ගේ ස්වච්ඡන්දතාව යහපත මගින් මෙහෙයවනු ලබන්නක් බවට පත් වී ඇති නෙයින් එය නියතියකට බර වූ බවක් පෙනෙන්නට ඇතැයි වැඩිදුරටත් පෙන්වා දෙති.

ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ (ක්‍රි. පූ. 427-348) අදහසට අනුව

**"ස්වච්ඡන්දතාව යනු මිනිසාට, පරිසරය, සිරිත් යනා දී බාහිර බලවේගයනට යටත්නොවී සිටීමට ඇති හැකියාව යි."**[25] එසේ බාහිර බලවේගවලින් මිදී ක්‍රියා කිරීමට නම් ඔහු තුළ බුද්ධිය හා සත්‍යවාදී බව තිබිය යුතු ය. පෛතගරස් හා සොක්‍රටීස් විසින් ඉදිරිපත් කරන ලද විග්‍රහයට ම බුද්ධිය හා සත්‍යවාදය එක් කිරීමෙන් දියුණු අදහසක් ඉදිරිපත් වුව ද ප්ලේටෝගේ අදහස ද යම් දුරකට සීමා සහිත වී ඇත.

ග්‍රීක දාර්ශනිකයන් අතර ස්වච්ඡන්දතාව සම්බන්ධයෙන් විධිමත් අදහසක් මුල්වරට ඉදිරිපත් කළේ ඇරිස්ටෝටල් විසිනි (ක්‍රි. පූ. 384-322) ඔහුට අනුව,

**"ස්වච්ඡන්දතාව යනු හොඳ හෝ නරක හෝ තෝරා ගැනීමට මිනිසාට ඇති නිදහස යි".[26]**

මුලින් ඉදිරිපත් කරන ලද නිර්වචන හා සංසන්දනාත්මකව බලන විට ඇරිස්ටෝටල්ගේ නිර්වචනය ඉතා උසස් මට්ටමක පවතී. ස්වච්ඡන්දතාව විග්‍රහ කිරීමට එවකට සිටි දාර්ශනිකයන් යොදාගෙන ඇති කැමැත්ත (Desire) සහ තෝරා බේරා ගැනීම (Choice) වැනි වදන් මෙවැනි දාර්ශනික අදහසක් ඉදිරිපත් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බව සඳහන් කළ මොහු ස්වච්ඡන්දතාව කිසියම් අදහසකට මුල් වූ සිතිවිල්ලට පදනම් වූවක් බවට සඳහන් කරයි.

ස්වච්ඡන්දතා සංකල්පයට විරුද්ධව අදහස් ප්‍රකාශ කළ පැරණි යුරෝපීය දාර්ශනිකයන් ද විය. ස්වච්ඡන්දතාව ග්‍රීක යුගයේ දී ම ප්‍රතික්ෂේප වූ බවට නිදසුන් අපට ස්ටොයික දර්ශනයෙන් ලබා ගත හැකිය. එසේ ප්‍රතික්ෂේප වූ නිසා පැරණි යුරෝපයේ ස්වච්ඡන්දතාව පිළිබඳ අදහස එතරම් විධිමත් ලෙස සාකච්ඡා වී නැත. ඔවුන් ස්වච්ඡන්දතාව ලෙස සැලකුවේ පොදු නිදහස යි.

මධ්‍යකාලීන යුරෝපීය දාර්ශනිකයන් ද විමංසන සංකල්පය පිළිබඳ ව අදහස් දක්වා ඇත. ස්වච්ඡන්දතාව යනු මිනිසා තුළ පවත්නා මූලික ශක්තීන් ක්‍රියාවට නැංවීමට ඇති හැකියාව ලෙස සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් ආදී ග්‍රීක දාර්ශනිකයන් විසින් ඉදිරිපත්කොට ඇති නිර්වචනයන් වෙනුවට දෙවියන් හා සම්බන්ධකොට ස්වච්ඡන්දතාව විග්‍රහ කිරීම මෙම යුගයේ මූලික ලක්ෂණය යි. විශ්ව නිර්මාතෘ (Creator) දෙවියන්වහන්සේගේ බලපෑම ස්වච්ඡන්දතා සංකල්පයට මෙම යුගයේ දී ඇතුලු වී ඇත.

"ස්වච්ඡන්දතාව යනු දෙවියන්වහන්සේගේ ප්‍රසාදය සඳහා යහපත් කටයුතුවල නිරතවීමට මිනිසාට ඇති නිදහස යි".

මේ අනුව ස්වච්ඡන්දතාව යනුවෙන් ඇක්වයිනාස් අදහස් කරනු ලබන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව කටයුතු කිරීමට මිනිසාට ඇති නිදහස යි.

මධ්‍යකාලීන දාර්ශනිකයකු වූ විලියම් ඔක්හැම් (1300-1349) ස්වච්ඡන්දතාව පිළිබඳ ව දක්වා ඇති අදහසට දෙවියන්වහන්සේ මුල් වී ඇත. ඔහුට අනුව දෙවියන්වහන්සේට හැර අන් කිසිදු බලවේගයකට මිනිසා තෘප්තිමත් කළ නොහැකිය. මක්නිසාදයත් දෙවියන්වහන්සේගේ නියමයකට පිටුපා කරන ලද කිසිදු ක්‍රියාවක් සෝකයෙන් පරිබාහිර නොවන බැවිනි. ඔක්හැම්ගේ අදහසට අනුව ස්වච්ඡන්දතාව වූ කලී සම්පූර්ණයෙන් ම දෙවියන්වහන්සේට යටත් වූවකි.

සමකාලීන අවධිය වනවිට ස්වච්ඡන්දතාව සම්බන්ධයෙන් දෙවියන්වහන්සේගේ බලපෑම හීන වී ගියේය. දෙවියන්වහන්සේගේ සර්වබලධාරිත්වය හා සර්වඥත්වය විශද කිරීමේ නොහැකියාව මෙයට හේතුව විය. දෙවියන්වහන්සේට මිනිස් ස්වච්ඡන්දතාව ආරක්ෂා කළ නොහැකි බවට තර්ක ඉදිරිපත් කළේය. එසේ ගොඩනැගූ නිර්වචන අතර හේගල්ගේ නිර්වචනය ඉතා වැදගත් වේ.

ස්වච්ඡන්දතාව යනු කිසිවකුගේ හෝ කිසිවක හෝ පෙළඹීමක් නොමැතිව මිනිසාට ක්‍රියා කිරීමට හෝ සිතීමට හෝ ඇති හැකියාව යැයි පවසතොත් එය මුලාවකි. මන්දයත් මිනිසාට එවැනි වූ ස්වච්ඡන්දතාවයක් අහිමි බැවිනි යනුවෙන් සඳහන් කරයි.

මිනිසා සිතන සිතිවිලි මෙන් ම කරන ක්‍රියා ඉබේ හටගන්නා ඒවා නොව කිසියම් හේතුවක් මුල්කොට ඇතිවන බැවින් මිනිසා සතු ස්වච්ඡන්දතාව ඔහු තුළ පවත්නා සිතුවිලි (Thoughts), අදහස් (Ideas) හා ක්‍රියා (Actions) ඇසුරින් විවරණය කළ නොහැකි බව තෝමස් හොබ්ස් සඳහන් කරයි.

මනෝ විද්‍යාඥයින් ස්වච්ඡන්දතාව පිළිබඳ ව ඉදිරිපත් කරන ලද අදහස් අධි භෞතිකවාදයන්ගෙන් තොරය. ජෝන් ඩිවි (John Dewy) ස්වච්ඡන්දතාව පිළිබඳ ව ඉදිරිපත් කරන්නේ මෙබඳු නිර්වචනයකි.

ස්වච්ඡන්දතාව යනු ආචාර විද්‍යාත්මක හා ප්‍රායෝගික දෘෂ්ටි කෝණයන්ගෙන් බලනවිට අධ්‍යාපනය අතින් අදහස් දියුණු කර ගැනීමටත් අත්දැකීම් ලබා ගැනීමටත් කාලානුරූපව සිය අදහස් අලුත් කර ගැනීමටත් මිනිස් වර්ගයා තුළ ඇති හැකියාව යි.[27]

ඉහත සඳහන් කරන ලද නිර්වචන සියල්ල දෙස අවධානය යොමු කිරීමේ දී කිසියම් නිගමනයකට එළඹිය හැකිය. ග්‍රීක දාර්ශනිකයන් විසින් යම් දුරකට ස්වච්ඡන්දතාව පිළිගත්තත් එය විමංසනය කිරීමේ තත්ත්වයට දියුණු වූයේ නැත. ස්වච්ඡන්දතාවයේ අග්‍රඵලය වන වීමසංනයට එතරම් ඉඩක් නොලැබුණත් චින්තන නිදහසට යම් දුරකට ඉඩ ලැබී ඇත. මධ්‍යකාලීන අවධිය වනවිට නිදහස් චින්තනයට සහ වීමංසනයට කිසිදු ඉඩක් නොලැබුණු බව පෙනේ. එයට හේතුව වූයේ සර්ව බලධාරී දෙවියන්වහන්සේ පිළිබඳ සංකල්පය යි. සියල්ල පාලනය කරන ගාමක බලවේගය දෙවියන්වහන්සේ ය. එබැවින් මිනිසාට සිතා මතා තීරණ ගැනීමේ අයිතියක් කිසිදු අයුරකින් ලැබී නැති බව පැහැදිලි වේ.

චින්තන නිදහස හා වීමංසනය පිළිබඳ ව අදහස් දැක් වූ බුද්ධිමතුන් අතර වල්පොල රාහුල හිමියන්ට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. හේතුඵලවාදී ඉගැන්වීම් මත පිහිටා බුදුදහමේ ස්වච්ඡන්දතාවක නිර්දේශ කර නොමැති බව කීමට උන්වහන්සේ උත්සාහ ගෙන තිබේ. ප්‍රතීත්‍ය සමුප්පාදයට අනුව මෙම ප්‍රශ්නය බුදුදහමේ ඇති නොවන බව පමණක් නොව ඇතිවිය නොහැකි බව ද වල්පොල රාහුල හිමියෝ සඳහන් කරති. තවදුරටත් අදහස් දක්වන උන්වහන්සේ,

"මෙම ඊනියා ස්වච්ඡන්දතාව ස්වච්ඡන්දතාවක් නොවනවා පමණක් නොව ස්වච්ඡන්දතාව ගැන අදහස පවා හේතු ප්‍රත්‍යයන්ට යටත්ය" යනුවෙන් සඳහන් කරයි.[28]

මහාචාර්ය, ගුණපාල මලලසේකර මහතා මේ සම්බන්ධයෙන් දක්වා ඇත්තේ මෙබඳු අදහසකි. ස්වච්ඡන්දතාව පිළිබඳ බුදුදහමට කියන්නට ඇත්තේ කුමක් ද? මෙම පැනය කිසි දිනෙකත් බුදුරජාණන්වහන්සේගෙන් විමසා නැත. උන්වහන්සේගෙන් මෙම පැනය විමසුවේ නම් එබඳු පැනයක් මතු නොවන බව හෝ එය වැරදි ලෙස නගන ලද පැනයක් යැයි කියා හෝ සමහර විට උන්වහන්සේ ප්‍රකාශ කළ හැකිව තිබිණි. ලෝකයේ ක්‍රියා සන්තතිය සෑදී ඇති හේතුඵලවාදී අනුක්‍රමයෙන් පිටස්තර ස්වච්ඡන්දතාව කියා යමක් නොමැත යනුවෙන් මලලසේකර මහතා සඳහන් කරයි.[29]

බුදුදහමට අනුව සියලු ම සංස්කාරයන් ප්‍රතීත්‍ය සමුත්පන්නය නියතිය පිළි නොගන්නා බුදුදහම පුද්ගල ස්වච්ඡන්දතාවට ප්‍රමුඛත්වය ලබා දී ඇත. සර්වබලධාරී දේව නියමයක් විශ්වාස නොකරන බුදුදහම වගකීම (Responsibility) හා වීමංසනය (Investigation) පුද්ගලයා මත ම පවරා ඇත. සියලු සංස්කාර ධර්ම අනිත්‍ය නම් ලොව කිසිවක් එම ධර්මතාවට යටත් නොවන බව ප්‍රකාශ කිරීම පිළිගත හැකි වුව ද මුල් බුදුසමයෙහි සඳහන් වන පරිදි ප්‍රතීත්‍ය සමුප්පන්නතාව සමග ම මිනිසා සතු නිදහස හා ස්වච්ඡන්දතාව පිළිබඳ සත්‍යය ද බුදුරජාණන්වහන්සේ විසින් ම දේශනා කර ඇති බව පිළිගත යුතු ය. මෙය හරිහැටි අවබෝධ කර නොගත් සමහර බටහිර වියතුන් බුදුදහම දෛවවාදයක් හෝ නියතිවාදයක් ලෙස හෝ හැඳින්වීමට උත්සාහ ගෙන ඇති බව කේ. එන්. ජයතිලක මහතා පෙන්වා දෙයි.

ස්වච්ඡන්දතාව පිළිබඳ ව තවදුරටත් අදහස් දක්වන කේ. එන්. ජයතිලක මහතා "අපගේ බල සීමාව ඉක්මවා සිටින සමහර සිද්ධීන් ඇත. ඒ සීමාවන් තුළ අපට කළ හැකි ක්‍රියාවන් ද ඇත. අප හැම දෙනා තුළ ම ඇත්තේ මේ ශක්තිය යි. එක්තරා සීමාවක් තුළ අයහපතින් වැලකී යහපත වැඩි වැඩියෙන් භාවිත කරනවිට වැඩි

වැඩියෙන් නිදහස හා ස්වයං සිද්ධතාව ලබා ගත හැකිය යනුවෙන් සඳහන් කරයි.[30]

ස්වච්ඡන්දතාව, විමංසනය, චින්තන නිදහස සහ වගකීම යන සංකල්ප පිළිබඳ ව අදහස් ඉදිරිපත් කර ඇති ශ්‍රී ලාංකික බුද්ධිමතුන් අතර ඩබ්ලිව්. එස්. කරුණාරත්න මහතා ප්‍රධානත්වයෙහි ලා සැලකිය හැකිය. ඔහුට අනුව,

"නිදහස යනු බාහිර බලයට අවනත නොවූ තත්ත්වයේ නිදහස යි. මේ අනුව නිදහස යනු ස්වාධීනත්වය යි. නැතහොත් පරාධීනත්වයෙන් තොර වූ ස්වභාවය යි. නිදහස නොමැති තැන වගකීමක් නොමැත. වගකීම නොමැති තැන නිදහසක් නොමැත."[31]

බාහිර බලවේගයක බලපෑමෙන් කරන ක්‍රියාව වගකිව යුතු ක්‍රියාවක් වශයෙන් සලකනු නොලැබේ. වගකීමකින් ක්‍රියා කිරීමට නම් නිදහස් චින්තනයට සහ විමංසනයට ඉඩ තිබිය යුතු බව කරුණාරත්න මහතා අවධාරණය කරයි.

ඊ. ජේ. තෝමස් මහතා ආධානාග්‍රාහිත්වයෙන් තොරව ස්වච්ඡන්දතාව පිළිබඳ ව මෙබඳු අදහසක් ලබා දී ඇත.

"ආර්ය මාර්ගයෙහි යහපත් ක්‍රියාවට හිමි තැන දැඩි සේ ප්‍රකාශකිරීම හැර බුදුසමය ස්වච්ඡන්දතාව පිළිබඳ විරුද්ධ මතය විසඳීමට යත්න දරා නැත".[32]

ට්‍රෙවර්ලිං සඳහන් කරන්නේ බුදුසමය සදාචාර චරණය හා මිනිසාට ක්‍රියා කිරීමේ නිදහස දී තිබෙන බැවින් මුළුමනින් ම බුදුසමය ආජීවක ඉගැන්වීමෙන් වෙනස් වන බව යි.[33]

දේව නිර්මාණවාදයට ගරු කරන දේවධර්මවාදීන් දේව ප්‍රසාදය වෙනුවෙන් කථා කිරීම පිණිස ස්වච්ඡන්දතාව බැහැර කර ඇත. සාන්ත ඔගස්තිනු එවැනි කෙනෙකි. එහෙත් දෙවියන්වහන්සේ සතුයැයි කියන සර්වබලධාරීත්වය, සර්වඥතා ඥානය, ස්වච්ඡන්දතාව සමග එක්ව නොසිටින බව ගුණපාල ධර්මසිරි මහතා සඳහන් කරයි. [34]

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද මිනිස් අයිතිවාසිකම් සුරැකීම සහ චින්තන නිදහස පිළිබඳ ව වගන්තියක් දක්වා ඇත.

(ඇ) සෑම පුරවැසියෙකුට ම සිතීමේ නිදහසට හා හෘදය සාක්ෂියේ නිදහසට ද, ආගමික නිදහසට ද, අයිතිය ඇත්තේය. මේ අයිතියට තමන් අභිමත ආගමක් ඇදහීම හෝ වැළඳ ගැනීමේ නිදහස ද තනිව හෝ අන් අය සමඟ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලික ව තම ආගම ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන් පිළිපැදීමෙන් ප්‍රගුණ කිරීමෙන් හා ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහස ද ඇතුළත් වන්නේය.

(උ) සෑම පුරවැසියෙකුට ම භාෂණයේ නිදහසට ද ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට ද අයිතිය ඇත්තේය. [35]

චින්තන නිදහසකින්, කතා කිරීමේ නිදහසකින් හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසකින් තොරව විමංසනයක් ගොඩ නැගිය නොහැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවා ස්වච්ඡන්දතාවට හා විමංසනයට ඉඩක් ලබා දී ඇත. පුද්ගලයා සතු එම අයිතීන් තහවුරු කර ඇත.

ඉහත සඳහන් කරන ලද පෙරදිග හා අපරදිග බුද්ධිමතුන් විසින් ඉදිරිපත් කරන ලද නිර්වචන හා අදහස් දෙස විමර්ශනාත්මකව බැලීමේ දී විමංසනය යනු කුමක් ද? යන්න මනාව අවබෝධ කරගත හැකිය.

## විමංසා ශබ්දය ත්‍රිපිටකානුසාරයෙන් නිර්වචනය කිරීම

බුදුරජාණන්වහන්සේ විසින් දේශිත ධර්මය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

(i) සූත්‍ර පිටකය

(ii) විනය පිටකය

(iii) අභිධර්ම පිටකය

යනු ත්‍රිපිටකය යි. ත්‍රිපිටකයේ ඇති ගැඹුරු තැන් විග්‍රහ කිරීමට අටුවා රචනා කරන ලද අතර අටුවාවන් හි ගැඹුරු තැන් විවරණය කිරීමට ටීකා රචනා කර ඇත. මේ සියලු ම දේ ත්‍රිපිටක සාහිත්‍යය ලෙස සැලකිය හැකිය. මෙම ත්‍රිපිටක සාහිත්‍යයෙහි වීමංසා ශබ්දය විවිධ අර්ථයන් හි විවරණයකර තිබේ.

**විමංසා නාම තුලනා රුච්චනා ඛමාපනා**[36] මෙහි වීමංසා ශබ්දය යෙදී ඇත්තේ තුලනය කිරීම හෙවත් සැසඳීම, කැමතිවීම හා ඉවසීම යන අරුත්වල ය.

**විමංසා නාම විචාරණා**[37] මෙහි වීමංසා ශබ්දය යෙදී ඇත්තේ විචාරය කිරීම, විවරණය කිරීම යන අරුත්වල ය. යම් දෙයක් අර්ථාන්විත ව විවරණය කිරීම යන අරුතෙන් ද වීමංසා ශබ්දය යෙදී ඇත.

**සා පනෙත්ථ අත්ථතො පඤ්ඤාපතිරූපකො**[38] මෙම පාළි පාඨයට අනුව වීමංසා ශබ්දය යෙදී ඇත්තේ ප්‍රඥාව යන අරුතෙහි ය. යමක් ඥානයෙන් පරීක්ෂා කිරීම වීමංසනය යි.

**විමංසා ඉධ පටිසංඛාතං**[39] යම් දෙයක් නුවණින් විමසා බැලීම, පරීක්ෂා කර බැලීම, වීමංසනය යි. පටිසංඛාත යනු ඥානයෙන් පරීක්ෂා කර බලා ලබා ගන්නා වූ තියුණු දැනුම යි.

**භාසිතත්ථ වීමංසා**[40] යනු කී දෙයෙහි අර්ථය පැහැදිලි කිරීම විමංසා යන්න යි. යම් කෙනෙක් විසින් කරන ලද ප්‍රකාශයක් අන් අයට අවබෝධ වන පරිද්දෙන් අර්ථය පැහැදිලි කිරීම, විවරණය කිරීම විමංසාව යි.

**පයෝජනත්ථ වීමංසා**[41] යමක් කිරීමට පෙර එහි යම් අර්ථයක් ඇත්දැයි විමසා බැලීම වීමංසා යන්නෙන් අදහස් කරයි.

**යා තත්ථ වීමංසා අයමස්ස අධිපඤ්ඤාසික්ඛා**[42] උසස් ප්‍රඥාව යන අරුතෙහි වීමංසා ශබ්දය යෙදී ඇත. විදර්ශනාව හෙවත් යථාභූතඥානදස්සනය සඳහා හේතුවන කරුණු තුනක් බුද්දහමේ ඉගැන්වේ.

(i) අධි සීල

(ii) අධි චිත්ත

(iii) අධි පඤ්ඤා

යනුවෙනි. එම කරුණු තුනෙන් ඉතා වැදගත් වන්නේ අධි පඤ්ඤාව යි. අධි පඤ්ඤා යන වචනයෙහි අර්ථය කුශාග්‍ර බුද්ධිය යන්න යි. විදර්ශනාවට හේතුවන ප්‍රඥාව අධි ප්‍රඥාව යි. එම අර්ථයෙහි ද වීමංසා ශබ්දය යෙදී ඇති බව පැහැදිලි වේ.

**සති ගීවා සිරො පඤ්ඤා වීමංසා ධම්ම චින්තනා**[43] ධර්මය පිළිබඳ හෙවත් ධර්ම චින්තනය යන අර්ථයෙහි වීමංසා ශබ්දය යෙදී ඇත. ධම්ම චින්තනා යන්නෙහි අර්ථ රාශියක් ඇත.

**සභාව පඤ්ඤා පුඤ්ඤ පඤ්ඤත්ති ආපත්ති පරියත්ති නිස්සත්තනා විකාර ගුණ පච්චය පච්චයුප්පන්නාදීසු දිස්සති.**

ඉහත පාඨයේ දී ධර්ම ශබ්දයට විවිධ අර්ථ ලබා දී ඇත. සභාව, නුවන, පින, පැනවීම්, ආපත්ති, පරියත්ති (ත්‍රිපිටකය දේශනා කිරීම) නිස්සත් විකාර (වෙනස්වීම) ගුණ (සංඝටකවල ස්වභාවය) පච්චය (යමක් ඇතිවීමට හේතුවන කාරණා) පච්චුප්පන්න (ඒවායෙහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන දේ) යන අර්ථ ධර්ම ශබ්දයට යෙදී ඇත. එම ධර්ම පිළිබඳ සිතීම ධම්ම චින්තාව යි. එම ධර්ම චින්තාව "වීමංසා" ශබ්දයෙන් විග්‍රහ ව ඇත.

**චිත්තස්ස එකග්ගතං වීමංසා**[44] චිත්ත ඒකාග්‍රතාව වීමංසනය යි. සිතෙහි එකඟ බව, සමාධිගත බව ඇති කර ගැනීම වීමංසාව යි. චිත්ත ඒකාග්‍රතාවකින්, සමාධියකින් තොරව වීමංසනය ගැන කතා කළ නොහැකිය.

**වීමංසා උස්සහනා තුලනා උපපරික්ඛා**[45] වීමංසනය යනු උත්සහ කිරීම, තුලනය කිරීම, සැසඳීම, යථා තත්ත්වය ගවේෂණය කිරීම හෙවත් පරීක්ෂා කිරීම යි. එසේ පරීක්ෂා කිරීම තුළින් සුතමය ඥානය ලැබේ. ඥානය ලබා ගන්නා ක්‍රම තුනකි.

i. සුතමය ඥානය

ii. චින්තාමය ඥානය

iii. භාවනාමය ඥානය

සුතමය ඥානය යනු ඇසීමෙන් ලබා ගන්නා වූ ඥානය යි. සුතමය ඥානයෙන් හෙවත් ඇසීමෙන් ලබා ගන්නා වූ දේ සිත තුළට පිවිසීමෙන් චින්තාමය ඥානය ගොඩ නැගේ. එම ඥාන මාර්ග දෙක අවබෝධ කර ගැනීම විමංසනය යි, යනුවෙන් අර්ථ විවරණ දක්වා ඇත.

සුත්තෙ විමංසා දේසනාභාරො[46] මෙය කුසලය, අකුසලය කියා හෝ සත්‍යය හෝ අඩක් සත්‍යය යැයි කියා හෝ විමර්ශනය කිරීම විමංසනය යි. මේ අයුරින් බුද්ධදහමේ ඇති සත්‍යාසත්‍යතාව ද විමසිය යුතුය.

අයං පුච්ඡා සුත්තේසු න යුජ්ජාතී යා තත්ථ විමංසා[47] යමක් ගැලපේ ද නො ගැලපේ ද යනුවෙන් සෙවීම විමංසනය යි.

විමංසා අයං විචයො[48] විචය යනු ද හොඳ නරක තෝරා බේරා ගැනීම යන අරුත්හි යෙදෙන වචනයකි. කාම සම්පත්තීන් සේවනය කරන්නා වූ යමෙක් වේද ඔහු පාප කර්ම කරයි. කාම සම්පත් සේවනය නොකරන පුද්ගලයා පාප කර්ම නොකරයි. යමෙක් මේ සත්‍ය දෙකින් පරතෙරට ගියේ ද, යම් ආකාරයකින් විමසීම සහිත වේද එය විචය යි. විචය යනු විමංසා යන්නට පර්යාය පදයකි.

විමංසාති චතුසච්ච ධම්ම විචින්තා පඤ්ඤා ච[49]

විමංසා යනු චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමේ ප්‍රඥාවම යි. එම චතුරාර්ය සත්‍ය නම්,

(i) දුක්ඛ ආර්යසත්‍යය

(ii) දුක්ඛ සමුදය ආර්යසත්‍යය

(iii) දුක්ඛ නිරෝධ ආර්යසත්‍යය

(iv) දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්යසත්‍යය

යන චතුරාර්යසත්‍යය අවබෝධ කර ගැනීමේ ප්‍රඥාව වීමංසනය යි.

**යථාසුතේ යථා පරියත්තේ ධම්මේ විමංසාති**[50]

අසන ලද යමක් වේද, ප්‍රගුණ කරන ලද යමක් වේද ඒ පිළිබඳ ව සිතසිතා සිටීම වීමංසනයයි.

**වීමංසා සා පද පදත්ථ විචාරණා පඤ්ඤා** [51]
**වීමංසා පද පදන්තරේන පදත්ථං පදත්ථන්තරේන විචාරණා පඤ්ඤා**[52]

පද පදාන්තරයන් වෙන්කර ගැනීමේ ප්‍රඥාව වීමංසනය යි.

**පච්චයෝ වීමංසා**[53] යමක් තියුණු ලෙස තේරුම් ගැනීම වීමංසනය යි.

**තත්ථ තත්ථ ඨානුප්පත්තික පඤ්ඤා වීමංසා**[54] ඒ ඒ අවස්ථාවල දී උපදින ප්‍රඥාව වීමංසනය යි. අවශ්‍ය අවස්ථාවල දී උපදින ප්‍රඥාව යි. බුදුරජාණන්වහන්සේට මෙම ඥානය තිබූ බව සඳහන් වේ. ධර්මය දේශනා කිරීමේ ක්‍රම හතරක් ඇත.

(i) අත්තජ්ඣාසය
(ii) පරජ්ඣාසය
(iii) පුච්ඡාවසික
(iv) අට්ඨුප්පත්තික

ඒ මොහොතේ උපත් කරුණක් හේතු කරගෙන ධර්මය දේශනා කිරීම මෙ නමින් හඳුන්වයි.

**වීමංසානුචරිතං සයං පටිභානං**[55] ඒ ඒ ධර්ම ස්වභාව විමසීම වීමංසනය යි.

ඉහත සඳහන් කරන ලද අදහස් සියල්ල සංක්ෂිප්ත කර බැලීමේ දී පැහැදිලි වන්නේ වීමංසනය යනු ප්‍රඥාව, ධර්ම චින්තනය, මෙනෙහි කිරීම, අත්හදා බැලීම, යන්න යි. ත්‍රිපිටකයේ වීමංසා

ශබ්දය නිර්වචනය කර ඇත්තේ එසේ ය. අටුවා විෂයයෙහි දී ඒ ඒ ධර්ම ස්වභාව විමසීම, ඒ පිළිබඳ ප්‍රඥාව, උප පරීක්‍ෂණය, තුලනය කිරීම, සැසඳීම, ආදී අරුත්වල යෙදී ඇත. සමස්තයක් ලෙස ගත්විට විචාර පූර්වක ව විමසීම, සැසඳීම, තුලනය කිරීම, පිරික්සීම යන අර්ථයන් හි විමංසා ශබ්දය ව්‍යවහාර කර ඇති බව පෙනේ.

විමංසා යන වචනයට යෙදෙන පර්යාය පද රාශියක් ත්‍රිපිටක සාහිත්‍යයේ ඇත. **පඤ්ඤා සංඛාතේ වීමංසා** යන තැන පඤ්ඤා යන වචනය වීමංසා යන්නට පර්යාය පදයක් ලෙස යෙදී ඇත. විචය, පච්චය, උස්සාහනා, තුලනා, උපපරික්ඛනා යන පද පරියාය පද ලෙස ගත හැකිය.

යමක් විමංසනයට බඳුන් කළ යුතු ආකාරය ද විග්‍රහ කර තිබේ.

**යථා පුරිසෝ යට්ඨියා උදකං වීමංසිත්වා ඕතරති** [56] දියට බැසීමට යන පුරුෂයෙක් යෂ්ටියකින් ජලයේ ගැඹුර විමසා බලා තීරණය කොට දියට බැස එය තරණය කරන්නේ යම් සේ ද ඒ අයුරින් යම් දෙයක් දුටුවිට එය සසඳා බලා තුලනය කොට, ඒ පිළිබඳ ව දෘෂ්ටියකට එළඹිය යුතු ය.

**හත්ථි නාගස්ස අග්ගසොණ්ඩා වීමංසා** [57] යමක් වීමංසනයට ලක් කළ යුතු ආකාරය උපමා භාවිත කොටගෙන පැහැදිලි කරන ලද දේශනාවක් ත්‍රිපිටක සාහිත්‍යයෙන් හමුවෙයි. ඇතාගේ විමංසනයට ප්‍රධාන වශයෙන් උපස්ථම්භක වන්නේ හොඬය යි. ඇතාට යම් ආහාරයක් ලැබුණු විට එකවර ම එය අනුභව නොකරයි. එහි තද බව, මෘදු බව විමසයි. කෑ යුතු ද? නැද්ද යන වග විමසයි. බැහැර කළ යුතු දේ බැහැර කරයි. ගත යුතු දේ පමණක් ම ගනී. යමක් ආහාරයට ගැනීමට පෙර මනා ලෙස විමසීමට ලක් කරයි. එපරිද්දෙන් ප්‍රඥාවන්තයා, හොඳ නරක, යහපත අයහපත, සදාචාරය, දුරාචාරය සොයා ගත්තේ වීමංසනයෙනි. හොඳ, යහපත, සදාචාරය ගත යුතු අතර නරක, අයහපත, දුරාචාරය බැහැර කළ යුතු ය.

යමක් වීමංසනයට ලක් කළ යුතු ආකාරය කරුණු හතරක් ඔස්සේ විග්‍රහ කර ඇත.[58]

(i) න ච අතිලීනා භවිස්සති
(වීමංසනය අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු නොවිය යුතු ය)

(ii) න ච අතිපග්ගහිතා භවිස්සති
(අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් විමසීම නොකළ යුතු ය)

(iii) න ච අජ්ඣත්තං සංඛිත්තා
(විමසීම සිත ඇතුලේ හැකිලීමට නොදිය යුතු ය)

(iv) න ච බහිද්ධා වික්ඛිත්තං
(වීමංසනය බාහිර ව විසිරෙන්නට ඉඩ නොදිය යුතු ය)

ඉහත සඳහන් කරුණු හතරට ම අයත් නො වී වීමංසනය මධ්‍යම ප්‍රමාණයෙන් පවත්වාගෙන යා යුතු ය. ඉර හඳ හැදුවේ කවු ද? ආදී වශයෙන් විමසීම අවශ්‍ය නැත. [59]

"වීමංසා" ශබ්දය ත්‍රිපිටක සාහිත්‍යයෙහි විවිධ අර්ථයන්හි යෙදී ඇති බව සනාථ කිරීමට මෙබඳු සාධක රාශියක් ඉදිරිපත් කළ හැකිය.

# 2

# වීමංසනය පිළිබඳ භාරතීය අන්‍යසාමයික මතවාද

## ප්‍රාග් බෞද්ධ සාමයික චින්තනයෙහි වීමංසනය

වීමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය මනාව අවබෝධ කරගැනීම සඳහා ප්‍රාග් බෞද්ධ භාරතීය ආගමික, දාර්ශනික හා සංස්කෘතික පසුබිම තුළ වීමංසනයට හිමි තැන සොයා බැලීම වැදගත් වේ. ප්‍රාග් බෞද්ධ ආගමික පරිසරය ප්‍රධාන වශයෙන් යුග හතරක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය.[1]

i. වෛදික යුගය

ii. බ්‍රාහ්මණ යුගය

iii. ආරණ්‍යක යුගය

iv. උපනිෂද් යුගය

වශයෙනි. මෙම යුග හතරින් උපනිෂද් යුගය සමකාලීන යැයි මතවාද පවතී. කෙසේ වෙතත් අධ්‍යයනයේ පහසුව හා වැදගත්කම සලකා උපනිෂද් ප්‍රාග් බෞද්ධ යුගය ඔස්සේ සාකච්ඡා කර ඇත. මෙම යුග හතරට අයත් දාර්ශනිකයන් කොටස් තුනකට බෙදිය හැකිය. [2]

i. සාම්ප්‍රදායික චින්තකයෝ

ii. බුද්ධිවාදී චින්තකයෝ

iii. අනුභූතිවාදී චින්තකයෝ

බෞද්ධ මූලාශ්‍රය සේ සැලකෙන සූත්‍ර පිටකයෙහි බොහෝ තැන්වල මෙම ඥාන මාර්ග තුන පිළිබඳ දීර්ඝ වශයෙන් විස්තර කර ඇත.


## i. සාම්ප්‍රදායික චින්තකයෝ

වීමංසනය ගරු නොකොට පාරම්පරික අදහස් වැදගත් ලෙස පිළිගත් මොවුහු අනුශ්‍රවිකයන් හෙවත් ශ්‍රැතිවාදීන් වශයෙන් හැඳින්විය හැකිය. මිනිසා සහ ලෝකය පිළිබඳ ව දැනුම ලබාගත යුත්තේ සාම්ප්‍රදායික මත අනුව ම බව මොවුන්ගේ විශ්වාසය විය. තම පරම්පරාවේ සිටි අය විසින් ප්‍රකාශ කරන ලද දෑ ඒ අයුරින් ම පිළිගත යුතු ය යන්න විශ්වාස කළ මොවුන් පරපුරෙන් පරපුරට පැවත ආ අදහස් ඒ අයුරින් ම පිළිගත්හ. ශ්‍රැතිය වඩාත් වැදගත්කොට සලකන ලදි. සාම්ප්‍රදායික චින්තකයෝ ඉහත සඳහන් යුග බෙදීමට අනුව මෙසේ දැක්විය හැකිය.[3]

i. වෛදික

ii. බ්‍රාහ්මණ

යන යුග දෙකට අයත් චින්තකයෝ සම්ප්‍රදායවාදීන් ලෙස සලකති. ඔවුහු තවදුරටත් කොටස් කර දැක්විය හැකිය. [4]



සාම්ප්‍රදායික අදහස් ම ගරුකළ මෙම චින්තකයෝ විමංසනය ගරු නොකළහ. ශ්‍රැතිය ප්‍රධානත්වයෙහි ලා සලකන ලදි.

## වෛදික යුගය

විද් (ඥානෙ) යන්නෙන් වේද ශබ්දය සෑදී ඇත. වේද යනු දැනුම. උසස් දැනුම, ආගමික දැනුම යන අර්ථයන් හි යෙදෙන වචනයකි.[5] වේදය ශත වර්ෂ ගණනාවක් තිස්සේ මුඛ පරම්පරාවෙන් ගෙන එන ලද සාහිත්‍යයකි. කිසිවකු විසින් නොනිපදවන ලද වේද ග්‍රන්ථ සදා කල්හි ම පවතී.[6] වේදයෙහි සඳහන් වන්නේ දේව භාෂිතයන් ය. එබැවින් ඒ පිළිබඳ ව විමසීමට හෝ ප්‍රශ්න කිරීමට කිසිවකුට අයිතියක් නැත. හින්දු බැතිමතුන්ගේ විශ්වාසයට අනුව වේදය සොයා ගන්නා ලද්දේ බමුණන් විසිනි. එබැවින් තවදුරටත් ඒ පිළිබඳ ව ප්‍රශ්න කිරීම අනවශ්‍යය. වේදයෙහි සඳහන් වන දේ ඒ අයුරින් ම පිළිගත යුතු ය.

වේදය යනු කාලාන්තරයක් තිස්සේ ඍෂිවරුන් විසින් පරපුරෙන් පරපුරට කට පාඩමෙන් ගෙන එන ලද ධර්මය යි. දේවභාෂිත වේදයෙහි සඳහන් බැවින් මුළු වෛදික සම්ප්‍රදාය ම ශ්‍රැතියක් ලෙස සලකන ලදි. වෛදික සූක්ත සියල්ල ම දේශනා කරන ලද්දේ මහා බ්‍රහ්මයා විසිනි. එසේ දේශනා කරන ලද වේදය කොටස් හතරකින් යුක්ත ය.[7]

i. ඍග් වේදය
ii. යජුර් වේදය
iii. සාම වේදය
iv. අථර්වන් වේදය

මහා බ්‍රහ්මයා විසින් දේශිත වේද ධර්මය කිසිදු ආකාරයකින් වැරදි විය නොහැකිය. එබැවින් වේදය පිළිබඳ ප්‍රශ්න කිරීමක් හෝ විමසීමක් නොකළ යුතු ය යන්න වෛදික ඉගැන්වීම යි. වේදය හැඳින්වීමට විවිධ නම් භාවිත කොට තිබේ. කර්ණ පරම්පරාවෙන් ගෙන එන ලද බැවින් ශ්‍රැති නමින් ද, පරපුරෙන් පරපුරට රැගෙන ආ හෙයින් ආම්නාය නමින් ද, ගීතයට නැඟූ හෙයින් ඡන්දස

නමින් ද, බ්‍රහ්මයා විසින් ම දේශිත බැවින් බ්‍රහ්ම නමින් ද, පුරුෂයකු විසින් නොනිපදවන ලද බැවින් අපෞරුෂේය නමින් ද, කාල නියමයක් කළ නොහැකි බැවින් අනාදිමත් යන නමින් ද හඳුන්වා ඇත.[8]

වෛදික යුගය වනවිට බහු දේවවාදයක් පැවති බවට සාධක හමු වේ. බොහෝ දෙවිවරුන් පිළිබඳ විශ්වාසය බහු දේවවාදය ලෙස සඳහන් කළ හැකිය. මුල් යුගයේ දී ස්වභාව ධර්මයේ විවිධ වස්තූන්ට දේවත්වයක් ආරෝපණය කර තිබුණු බව පෙනේ.[9] අහසේ දිනපතා නැග එන සූර්යයාට ද, සිය රශ්මියෙන් ලොව බබලවන චන්ද්‍රයාට ද, අහසේ සැනින් ඇති වී ආලෝකය සපයන විදුලි එළියට ද, මිහිමත දැල්වෙන ගිණිදැල්වලට ද, තාරකා ආදී වස්තූන්ට ද වන්දනාමාන කර ඇත. ස්වභාව ධර්මයේ පවතින මෙබඳු වස්තූන්ට දේව බලයක් ආරෝපණය කර ගත්හ. හිරු, සඳු, තාරකා, අග්නි, වායු, පෘථිවි, උෂස් හා මරුත් යන ස්වභාවික වස්තූන්ට වන්දනා මාන කිරීම ඍග් වේද යුගයේ පටන් ම පැවති බව පැහැදිලි වේ. එම ස්වභාවික වස්තූන්ට දේවත්වයක් ආරෝපණය කිරීම නිසා ඉන්ද්‍ර, මරුත්, වරුණ, මිත්‍ර, අදිති, විෂ්ණු, පූෂන්, රුද්‍ර, පර්ජන්‍ය, අශ්වින් ආදී වශයෙන් දේව මණ්ඩලයක් නිර්මාණය විය. එම දේව මණ්ඩලය ඇදහීම නිසා වෛදික යුගය බහුදේවවාදයක් පැවති යුගයක් ලෙස සඳහන් කළ හැකිය.

මෙම දෙවිවරුන් අතරින් විෂ්ණු සහ වරුණ යන දෙවිවරුන් දෙදෙනා ප්‍රධාන විය. ඔවුන් සර්වබලධාරී, සර්වව්‍යාපී, සර්වදර්ශී යන ගුණයන්ගෙන් සමන්විත විය. වරුණ දෙවියන්ට ලෝකය ආරක්‍ෂා කිරීමෙහිත්, ලෝකයෙහි සියලු සචේතනික හා අචේතනික වස්තූන් ක්‍රියාත්මක කිරීමෙහිත් වගකීම හිමි වී ඇත. මෙසේ මුල් යුගයේ බහුදේවවාදයක් පැවතියත් පසු කාලය වනවිට ඒකදේවවාදයක් බවට පරිවර්තනය විය. ඍග් වේදයේ දසවන මණ්ඩලයෙහි විශ්ව කර්ම (ලෝකය මවන) ප්‍රජාපතී නම් දෙවි කෙනෙක් පිළිබඳ ව සඳහන් වෙයි. වේද යුගයේ දෙවිවරුන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

i. ආකාශස්ත
ii. අන්තරීක්ෂ
iii. භූමාස්ථ වශයෙනි.

මිත්‍ර වරුණ යන දෙවිවරුන් ආකාශස්ත දෙවිවරුන් ලෙස ද, ඉන්ද්‍ර, මරුත් යන දෙදෙනා අන්තරීක්ෂ දෙවිවරුන් ලෙස ද, අග්නි, සෝම යන දෙදෙනා භූමාස්ථ දෙවිවරුන් ලෙස ද දැක්වේ. මෙසේ පැවති බහුදේවවාදය කල්යත් ම ඒකදේවවාදයක් බවට පත්විය. බුද්ධියේ ක්‍රම විකාශයත් සමග ම බහුත්වයක් තුළින් ඒකත්වයක් කරා පැමිණි බව මෙයින් පැහැදිලි වේ. ඍග් වේදයේ මධ්‍යතන යුගය වනවිට දෙවිවරු තිස්තුන් කෝටියක් අතරින් එක් දෙවියකු උසස් ලෙස තෝරා පත්කර ගත්හ. මොහු ප්‍රජාපතී හෙවත් විශ්වය නිර්මාණය කර පාලනය කරන්නා, විශ්ව කර්ම, මහා බ්‍රහ්ම යන නම්වලින් හඳුන්වා ඇත. එම සර්වබලධාරී එක ම දෙවියන්ගේ උසස් බව හුවා දැක්වීමට විවිධ කරුණු ඉදිරිපත් කර ඇත.

සහශ්‍ර ශීර්ෂඃ පුරුෂඃ
සහශ්‍රක්ෂඃ සහශ්‍රප්‍රශ්
සභූවිඃ මිශ්‍රතො භුත්වා
යති ලෝචන දසංගුලං[10]

දහසක් ශීර්ෂ ඇති, ඇස් ඇති, අත් ඇති, ඒ ආදී පුරුෂයා වූ මහා බ්‍රහ්මයා ලෝකය මැවීය යනුවෙන් සඳහන් වීම තුළින් ඒකදේවවාදයක් පැවති බව පෙනේ. ඍග් වේදයේ එන ශ්ලෝකයන්හි මහා බ්‍රහ්මයා ලෝකය මැවූ බව සඳහන් වෙයි.

බ්‍රාහ්මණෝස්‍ය මුඛමාසීත්
බාහු රාජන්‍යඃ කෘතඃ
ඌරු තදස්‍ය යද් වෛශ්‍යඃ
පද්භ්‍යාම් ශූද්‍රෝ අජායත[11]

මෙම ශ්ලෝකයට අනුව මිනිස් ප්‍රජාව නිර්මාණය කර ඇත්තේ මහා බ්‍රහ්මයාගේ ශරීරයේ විවිධ අංගවලිනි. බමුණෝ මහා බ්‍රහ්මයා ගේ මුඛයෙන් ද, ක්ෂත්‍රියයෝ දෙබාහුවලින් ද, වෛශ්‍යයෝ

දෙකලවාවලින් ද, ශුද්‍රයන් යටිපතුල්වලින් ද උපන් බව එහි සඳහන් වෙයි. මෙසේ මහා බ්‍රහ්මයාගේ අභිමතය පරිදි ප්‍රජාව නිර්මාණය කරන ලද බැවින් මහා බ්‍රහ්මයාට යටහත් පහත්ව කටයුතු කළ යුතු ය. මිනිසාට ස්වාධීනව ක්‍රියා කිරීමට කිසිදු නිදහසක් නැත. මිනිසා සතු පරම යුතුකම වන්නේ මහා බ්‍රහ්මයාට යටහත්ව ක්‍රියා කිරීමයි. මේ අනුව පැහැදිලි වන්නේ නිර්මාණවාදය තුළ විමංසනයට කිසිදු ඉඩක් නැති බව යි. පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අගය කොට නැත. ලෝකය නිර්මාණය කළ මහා බ්‍රහ්මයා පිළිබඳ ප්‍රශ්න කිරීමට කිසි ලෙසකිනුදු අවසරයක් නොදුන්හ. මහා බ්‍රහ්මයා විසින් ප්‍රකාශ කරන ලද දෛවී වාක්‍ය හෙවත් වේද මන්ත්‍ර ගැන සැක පහළ කිරීමට අයිතියක් නොවීය. මේ අනුව විමංසනයට කිසිදු ඉඩක් නොලැබුණු යුගයක් ලෙස වෛදික යුගය දැක්විය හැකිය.

## බ්‍රාහ්මණ යුගය

වෛදික යුගයෙන් පසු එළඹි යුගය බ්‍රාහ්මණ යුගය යි. මෙම යුගයේ සමාජාධිපත්‍යයට පත්ව සිටි බමුණන් විසින් සමාජ සම්භවය පිළිබඳ දක්වන ලද්දේ නිර්මාණවාදී ආකල්පයකි. වෛදික යුගයේ පැවති බහුදේවවාදය ඒකදේවවාදය බවටත් එය ම පරම දේවවාදය බවටත් පත්විය. එම පරම දෙවියන් මහා බ්‍රහ්මයා ය. ලෝකය හා සත්ත්වයා නිර්මාණය කරන ලද්දේ ඔහු විසිනි. නිර්මාණවාදය මත පදනම්ව පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අහිමි කර තිබේ. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව මහා බ්‍රහ්මයාගේ අභිමතය පරිදි මවන ලද සියලු දෙනා ම ඔහුට පක්ෂපාතීව ක්‍රියා කළ යුතු ය. නිර්මාණවාදය කේන්ද්‍රකොටගත් තවත් ඉගැන්වීම් රාශියක් බ්‍රාහ්මණ ආගමේ දැකිය හැකිය. එම සංකල්ප පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ බමුණු ඉගැන්වීම් තුළ චින්තනයට හා විමංසනයට ඉඩක් නොවූ බව යි. බ්‍රාහ්මණ ආගමෙහි එන ප්‍රධානතම ඉගැන්වීම් නම්,

i. නිර්මාණවාදය
ii. වර්ණ ධර්ම
iii. ස්ව ධර්ම
iv. ආශ්‍රම ධර්ම

vi. ආපද් ධර්ම
vii. යාගය
viii. කාන්තාව පිළිබඳ ආකල්පය

ඉහත සඳහන් කරන ලද සෑම ඉගැන්වීමකින් ම පුද්ගලයා සතු ස්වච්ඡන්දතාව හා විමංසනය උල්ලංඝණය කර ඇත. බ්‍රාහ්මණ ආගමේ එන ප්‍රමුඛතම ඉගැන්වීම වන්නේ නිර්මාණවාදය යි. විශ්වය හා ප්‍රජාව හෙවත් ලෝකය හා සත්ත්වයා මහා බ්‍රහ්මයා තම සිතැඟි පරිදි මවා ඇත. එසේ මවන ලද මහා බ්‍රහ්මයා සර්වබලධාරී, සර්වව්‍යාපී, සර්වදර්ශී, සර්වඥ සර්වතෝභද්‍ර, සර්ව සාධාරණ, සාර්ව භෞම, අපෞරුෂ, අසහාය, අසමසම යන ගුණයන්ගෙන් සමන්විතය. පුද්ගලයකු කුලීන හෝ කුලහීන තත්ත්වයට පත්වන්නේ මහාබ්‍රහ්මයාගේ අභිමතයට අනුවයි. වැදගත් හෝ නොවැදගත් අයකු වන්නේ ද, උසස් හෝ පහත් අයෙකු වන්නේ ද, සුරූපී හෝ විරූපී අයකු වන්නේ ද මහා බ්‍රහ්මයාගේ කැමැත්තට අනුව යි.

බ්‍රාහ්මණ මතයට අනුව පුද්ගලයාගේ සෑම අංශයක් ම තීරණය වන්නේ දේව කැමැත්තට අනුවය. මේ අනුව මිනිසා උපතින් ම පරාධීනයකු බවට පත්කොට ඇත. එයට හේතුව නම් පුද්ගලයාට තමාගේ අභිමතය පරිදි කිසිදු තීරණයකට එළඹීමට හෝ ක්‍රියා කිරීමට නොහැකි වීම යි. පුද්ගල ශක්‍යතාවන් සියල්ල ම අදෘශ්‍යමාන බලවේගයකට පාවා දී ඇත. පුරිස වීර්යය, බල පරාක්‍රමය, පුරුෂකාරය, ආදී කිසිවක් නොමැත. නිර්මාණවාදය තුළින් පුද්ගලයාට නිදහස්ව, නිවහල්ව, ස්වෛරීව, ස්වතන්ත්‍රව, ස්වාධීනව, ස්වච්ඡන්දතාවෙන් හා විමංසනයෙන් යුක්තව තීරණ ගැනීමට හෝ ක්‍රියා කිරීමට ඇති හැකියාව අහිමි කර ඇත. පුද්ගලයා උපතින් ම පරාධීන, පරතන්ත්‍ර, අයෙක් බවට පත්කොට ඇත.

## ස්වධර්ම සංකල්පය

සත්ත්වයා හා ලෝකය නිර්මාණය කිරීමෙන් නොනැවතුණු බමුණන් ඒ ඒ කුලයන්ට අදාළ කාර්යයන් වෙන වෙන ම පවරන ලදී. සමාජයේ ඉහළ ම ගෞරවය ලැබෙන කාර්යයන් තමන් වෙත

තතු කර ගන්නා ලදි. ඒ ඒ කුලවලට අයත් කාර්යයන් ස්වධර්ම ලෙස දක්වා ඇත. ස්වධර්ම සංකල්පය මගින් අපේක්ෂා කලේ ද පුද්ගලයා එක්තරා රාමුවකට සීමා කිරීමකි. මහා බ්‍රහ්මයා විසින් වෙන්කර දක්වන ලද කාර්යයන්ට අමතරව වෙනත් කාර්යයන් කිරීමට තබා ඒ පිළිබඳ විමසීමට හෝ කිසිදු ඉඩක් නොවීය. සෑම දෙනා ම කිසිදු විමසීමකින් තොරව මහා බ්‍රහ්මයා විසින් පනවන ලද කාර්යභාරයන් ඉටු කළ යුතු විය.

**බ්‍රාහ්මණ වර්ණය**

i. ඉගෙනීම
ii. ඉගැන්වීම
iii. යාග කිරීම
iv. යාග කරවීම
v. දන්දීම
vi. දන් පිළිගැන්වීම[12]

**ක්ෂත්‍රිය වර්ණය**

i. ප්‍රජා පාලනය
ii. දන්දීම
iii. යාග කිරීම
iv. වේද අධ්‍යයනය
v. කාමයෙහි නොඇලීම[13]

**වෛශ්‍ය වර්ණය**

i. පශු පාලනය
ii. දන්දීම
iii. යාග කිරීම
iv. වේද අධ්‍යයනය
v. වෙළෙඳාම
vi. මුදල් පොළියට දීම
vii. කෘෂි කර්මාන්තය[14]

සර්ව බලධාරී මහා බ්‍රහ්මයා විසින් ඒ ඒ කුලයන්ට පවරන ලද කාර්යයන් ඒ අයුරින් ම සිදු කළ යුතු විය. කිසිවකුට ඒ සම්බන්ධව ප්‍රශ්න කිරීමට හෝ විමසීමට ඉඩක් නොවීය. ස්වධර්ම සංකල්පයෙන් ද බමුණන් අපේක්ෂා කළේ පුද්ගල නිදහස සීමා කොට වීමංසනයට ද ඉවතට සීමා කිරීමයි.

## ශූද්‍ර වර්ණය

නිර්මාණවාදය තුළින් එකල සමාජයේ පහත් ම තත්ත්වය ලැබුණේ ශූද්‍රයන්ට යි. ඔවුන් මහා බ්‍රහ්මයාගේ දෙපතුල්වලින් හටගත් බැවින් පහත් ම කුලය විය.[15] උසස් කුලවලට හිමි වූ කිසි ම වරප්‍රසාදයක් ශූද්‍රයන්ට හිමි නොවීය. වේදය ඉගෙනීම සපුරා තහනම් විය. යම් ශූද්‍රයකු වේදය කියවුවහොත් ඔහුගේ දිව කපා දැමිණ. වේදය ඇසුවහොත් කණේ ලාකඩ වත් කෙරිණ. වේදය ඉගෙන ගතහොත් මරණයට පත් කරන ලදි. ශූද්‍රයකු මරා දැමීම බල්ලකු බළලකු මරා දැමීම හා සමාන ය. එහෙත් ශූද්‍රයකු බමුණකුට විදුරු පෙතින් හෝ ගැසුවහොත් ජන්ම 21 නරකාදියේ උපදියි. ශූද්‍රයකුට බමුණකු සමග එකට ගමන් කිරීම හෝ හිඳගැනීම තහනම් විය. බමුණකු සමග එකට වාඩි වුවහොත් හංවඩු ගසා රටින් නෙරපිය යුතු ය. පසුපස ප්‍රදේශය කැප්පවිය යුතු ය. යම් හෙයකින් බමුණකු දෙසට කෙල ගැසුවහොත් දෙතොල කැප්පවිය යුතු ය. බ්‍රාහ්මණයෙකුට මුත්‍රා කළහොත් ලිංගය ද කපා දැමිය යුතු ය. අපහාසාත්මක ලෙස බමුණකුගේ නාම ජාතිය සඳහන් කොට නිග්‍රහ කරන්නාගේ මුඛය තුළට ගිනියම් කළ යකඩ උළක් දැමිය යුතු ය. ශක්තියෙන් බමුණෙක් දෙසට අතක් එසවූයේ නම් එම අත ද පාදයක් එසවූයේ නම් එම පාදය ද කපා දැමිය යුතු ය. ශූද්‍රයන්ට මුදල් එක්රැස් කිරීම සපුරා තහනම් විය. යමෙක් ළඟ මුදල් ඇත්නම් රජකු විසින් පැහැර ගත යුතු ය. නැතිනම් බමුණකු විසින් පැහැර ගත යුතු ය. යාග කර්ම කිරීමේ නිදහස ශූද්‍රයන්ට නොවීය. අවම වශයෙන් යාග කරන ස්ථානයකට යාම පවා තහනම් විය. ආගමික, සාමාජික, ආර්ථික, දේශපාලනික හා අධ්‍යාපනික යන සෑම අංශයකින් වුව ද නිදහසක් නොලද ශූද්‍රයන්ගේ එක ම

අභිලාසය විය යුත්තේ උසස් යැයි සම්මත කුලවතුන්ට බැල මෙහෙකම් කිරීම යි. ජීවිත කාලය තුළ දී ඉඳුල් ආහාර අනුභව කරමින්, ආභරණ නොපළඳිමින්, වැරහැලි ඇඳුම් අඳිමින් ගත කළ යුතු ය. මේ අනුව පැහැදිලි වන්නේ පහත්ය, නීචය, හීනය යන සම්මතය ලත් සියලු ම දේ පමණක් ශුද්‍රයන්ට උරුම වූ බව යි. සමාජයේ පහත් ම තත්ත්වය උරුම වූ ශුද්‍ර වංශිකයන්ට චින්තන නිදහසට හා විමංසනයට කිසිදු ඉඩක් නොවිය. ස්වකීය අභිමතය පරිදි සිතා මතා තීරණ ගැනීමට හෝ ක්‍රියා කිරීමට කිසිදු ඉඩක් නොවිය. ශුද්‍රයා හැමවිට ම බමුණන්ට යටත්ව සිටිය යුතු අයෙක් ලෙස සලකන ලදි.

## ආශ්‍රම ධර්ම

පුද්ගලයාට නිදහස්ව, නිවහල්ව, සිතීමට හා විමසීමට ඇති ඉඩකඩ අවහිර කරන ලද බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර තවත් ඉගැන්වීමකි ආශ්‍රම ධර්ම. පුද්ගලයාගේ ජීවිත කාලය අවස්ථා හතරකට බෙදා දක්වන බමුණෝ ඒ ඒ යුගයන්ට අනුව ජීවත් විය යුතු බව අවධාරණය කළහ.

i. බ්‍රහ්මචාරි යුගය
ii. ගෘහස්ථ යුගය
iii. වානප්‍රස්ථ යුගය
iv. සන්‍යාසි යුගය

යනු ආශ්‍රම ධර්ම යි. මෙම යුග හතර ගත කළ යුතු ආකාරය මනුස්මෘතියේ සඳහන් වන්නේ මෙසේ ය.

ශෛෂෙ වේභ්‍යස්ථ විද්‍යානාම්
යෞවනේ විෂයෛශිනාම්
වාර්ධකේ මුනි වෘත්තීනාම්
යෝගේ නාන්තේ තනුත්‍යජාම්

බ්‍රහ්මචාරි යුගයේ දී අධ්‍යාපන කටයුතුවල නිරත විය යුතු ය. ඉතා චාම් ජීවිතයක් ගත කරමින් ත්‍රිවේදය ඉගෙන ගත යුතු විය.

දෙවන ගෘහස්ථ අවදියේ දී විවාහ වී බිරිඳ හා දරුවන් සමග ලෞකික ජීවිතයක් ගත කළ යුතු ය. බ්‍රාහ්මණ ගෘහස්ථයා විසින් ඉටුකළ යුතු යුතුකම් රාශියක් මනුස්මෘතියේ දැක්වේ.

i. යාග කර්ම කරමින් දෙවියන් සතුටු කිරීම
ii. වේදය මනා ලෙස ඉගැන්වීමෙන් දෙවියන් සතුටු කිරීම
iii. මතක පූජාවන් පවත්වා මළවුන් සතුටු කිරීම
iv. දන් දීමෙන් මිනිසුන් සතුටු කිරීම

ඉන් අනතුරුව එළඹෙන්නේ වානප්‍රස්ත යුගය යි. ගිහිගෙයි බන්ධනවලින් මිදී වනගතවීම මෙම යුගයේ දී සිදුකෙරේ. සමහර අවස්ථාවල දී බිරිඳ සහ දරුවන් ද සමග වනගත වෙයි. ඉන් අනතුරුව එළඹෙන සන්‍යාසී යුගයේ දී සම්පූර්ණ වශයෙන් ම ආධ්‍යාත්මික ජීවිතයකට යොමු විය යුතු ය. සිඟාගත් ආහාරයකින් යැපෙමින්, ආගමික වත් පිළිවෙත් පුරමින්, භාවනානුයෝගීව පුණ්‍ය ක්‍රියාවල නිරත වෙමින් ජීවත් විය යුතු ය. ආශ්‍රම ධර්ම තුළින් පුද්ගලයාගේ ජීවිත කාලය ම එක්තරා රාමුවකට සීමාකර තැබීමට උත්සහ ගෙන ඇති බව පෙනේ. ආශ්‍රම ධර්මවලින් අපේක්ෂා කළේ ද පුද්ගලයාට නිදහස්ව, නිවහල්ව, ස්වෛරීව, ස්වතන්ත්‍රව, ස්වච්ඡන්දතාවෙන් හා විමංසනයෙන් ක්‍රියා කිරීමට ඇති ඉඩකඩ අහිමි කිරීමකි.

## යාගය

බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව යාගය අනිවාර්ය අංගයක් විය. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හා වෛශ්‍ය යන කුල තුනට අයත් සෑම දෙනාට ම යාග කිරීම අනිවාර්යය විය. යාග පැවැත්වීම් සම්බන්ධ තොරතුරු යජුර් වේදයේ සඳහන් වෙයි. මුඛ පරම්පරාවෙන් ආචාර්ය - ශිෂ්‍ය දෙපක්ෂය විසින් පවත්වාගෙන ආ වේද පාඨ හා ස්තෝත්‍ර සාම සහ යජුර් වේදයන් හි සඳහන් වෙයි.[16] උපතේ සිට මරණය දක්වා සෑම වැදගත් අවස්ථාවක දී ම යාග කිරීම අත්‍යවශ්‍ය විය. මෙසේ පවත්වන යාග ගෘහ්‍යකර්ම නම් විය. මවුකුස පිළිසිඳ ගැනීම, බිහිවීම, රන්කිරි කට ගෑම, ඉඳුල් කැවීම, ආවාහ විවාහ වීම, මරණය ආදී

ජීවිතයේ විශේෂ අවස්ථා 24 ක දී යාග කළ යුතු ය. යාගයකින් අපේක්ෂා කළේ ලෞකික දියුණුව සහ පාරලෞකික විමුක්තිය ලබා ගැනීම යි. දරු සම්පත් ලැබීම, සතුරු උපද්‍රව මැඩලීම, සරුසාර අස්වැන්නක් ලැබීම, යන ලෞකික අරමුණු සාධනය කරගැනීම සඳහා යාග පවත්වන ලදි. පාරලෞකික වශයෙන් බ්‍රහ්ම සහව්‍යතාව ළඟා කරගැනීම සඳහා යාගය අත්‍යවශ්‍ය ම සංස්කාර විධියක් විය. යාග කර්ම පැවැත්වීමේ දී යජමානක හෙවත් යාගය කරවන්නාට කැමති පරිදි යාග කිරීමට ඉඩක් නොවීය. බ්‍රාහ්මණ පූජකයන්ගේ සහය ලබාගැනීම අත්‍යවශ්‍ය ම විය. ඔවුන්ගේ සහභාගීත්වයෙන් තොරව කරන යාගය අරුත් සුන්, ඵල රහිත එකක් බව බමුණෝ සඳහන් කළහ. යාගයට සම්බන්ධ වන පූජකයන්ට විශාල වශයෙන් දක්ෂිණා හෙවත් පඬුරු ලබා දිය යුතු ය. යාග කර්මවලට සහභාගී වන පූජකයෝ සතර දෙනෙක් වෙති.[17]

i. හෝතෘ
ii. උද්ගාතෘ
iii. අධ්වර්යු
iv. යඥකාරක

සිය ජීවිත කාලය තුළ දී පැවැත්විය යුතු යාග කර්ම කිහිපයක් යජුර් වේදයේ සඳහන් වෙයි.[18]

i. දර්ශන පූර්ණ යාගය - අමාවක පසළොස්වක දිනවල කරන යාගය
ii. අග්නිහෝත්‍ර යාගය - දිනපතා උදේ සවස කරන යාගය
iii. චාතුර්මාත්ස්‍ය යාගය - අවුරුද්ද මුළුල්ලේ ම කරන යාගය
iv. අශ්වමේධ යාගය - අසුන් සිය ගණනක් ඝාතනය කොට රුධිරය ගින්නට දමා පවත්වන යාගය
v. පුරුෂ මේධ යාගය - පුරුෂයන් ඝාතනය කොට කරන යාගය
vi. රාජශූය යාගය - රජුගේ අභිෂේක අවස්ථාවේ දී කරන යාගය

vii. සෝම යාගය - එකදිගට දින කිහිපයක් පවත්වන යාගය

viii. සෞත්‍රාමණි යාගය - බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන කුලවතුන්ට කිරීමට හැකි වූ යාගය

ix. සර්වමේධ යාගය - යාග කරන්නා සතු සියලු ම සම්පත් වැයකොට කරන යාගය

යාගය ඉතා කුරිරු එකක් විය. පුරුෂමේධ යාගයට මිනිසුන් 184 දෙනෙක් පමණ යොදා ගනී. සෑම කුලයකට ම අයත් පුරුෂයන් සිය ගණනක් රැස්කොට ඝාතනය කොට කරන යාගය පුරුෂ මේධ යාගය යි.[19] බමුණු ඉගැන්වීමට අනුව යාග පැවැත්වීම අනිවාර්ය අංගයක් විය. රාජසූය, පුරුෂමේධ, සම්මාපාශ, අශ්වමේධ, වාජපේය, නිරග්ගල යන යාග රාජවංශිකයන් විසින් අනිවාර්යයෙන් ම කළ යුතු විය. සත්ත්වයන්ට ජීවත්වීමේ අයිතිය යාග කිරීම තුළින් සපුරා උල්ලංඝණය කර ඇත. පුද්ගල ශක්තිය අදෘශ්‍යමාන බලවේගයකට පාවා දෙමින් විශාල වශයෙන් පුරුෂයන් මරණයට පත්කොට ඇත. තමා කරන යාගය වුව ද සිය අභිමතය පරිදි ඉටු කිරීමට කිසිදු ඉඩක් නොවිය. ස්වච්ඡන්දතාවෙන් හා විමංසනයෙන් ක්‍රියා කිරීමට ඉඩ ලැබෙන ඕනෑම ආගමක හෝ දර්ශනයක අනිවාර්ය කරන ලද සංස්කාර විධීන් දැකිය නොහැකිය. යාග කිරීම තුළින් අහිංසක මිනිසුන් මරා දමමින් කරන විනාශය නිසා මිනිසුන්ට සතුටින් ජීවත් වීමේ අයිතිය අහිමි කර ඇත. බමුණන්ගේ කීමට අනුව ක්‍රියා කිරීමට කිසිවකුට නිදහසක් නොවූ අතර පුද්ගලයා පරාධීනයකු බවට පත්කර ඇත. විමංසනයක් කිසිසේත් ම දැකිය නොහැකි දහමක් ලෙස බමුණු දහම දැක්විය හැකිය.

## විමංසනයට ඉඩක් නොලැබුණු කාන්තා සමාජය

භාරතීය වනිතා ඉතිහාසයේ අඳුරුතම යුගය ලෙස සැලකෙන්නේ බ්‍රාහ්මණ යුගය යි. වෛදික යුගයේ දී වනිතාවට හිමිව තිබූ නිදහස බ්‍රාහ්මණ යුගය වනවිට සහමුලින් ම අහිමි කර ඇත. අධ්‍යාපනික, ආර්ථික, දේශපාලනික හා ආගමික යන කිසිදු

අංශයක නිදහසක් වනිතාවට හිමි නොවිනි. ඇය අනුවණය, අඥබාලය, චපලය, දුර්වලය, අදූරදර්ශීය, අපිරිසිදුය, යනුවෙන් බමුණෝ ප්‍රකාශ කළහ. එබැවින් කාන්තාවට කිසිදු නිදහසක් ලබා නොදිය යුතු ය. ස්වාධීනව, ස්වච්ඡන්දතාවෙන් ක්‍රියා කිරීමට ඉඩක් වනිතාවට නොදිය යුතු ය යන්න බ්‍රාහ්මණ ඉගැන්වීම යි. කාන්තාව සිය ජීවිත කාලය පුරාවට ම පුරුෂයාට යටත්ව ජීවත් විය යුතු ය. බාල කාලයේ තම පියා යටතේ ද, තරුණ කාලයේ සැමියා යටතේ ද ජීවත් විය යුතු ය.[20] ජීවිතයේ කිසිදු අවදියක ස්වාධීනව ජීවත්වීමට ඉඩක් නොදිය යුතු බව මින් අදහස් කෙරේ. කාන්තාවට වරදෙහි බැඳීම සඳහා නියමිත තැනක් නැත. නියමිත වෙලාවක් නැත. නියමිත පුරුෂයෙක් ද නැත.[21] චපල දුර්වල පිළිවෙත්වලින් යුක්ත බව මෙයින් අදහස් කෙරේ.

කාන්තාවගේ නුවණ ද්වංගුල පඤ්ඤා යනුවෙන් පැහැදිලි කර ඇත. එනම් ඇඟිලි දෙකේ නුවණක් වනිතාවට ඇත යන්න එහි අදහස යි. අට්ටික්කා ගස්වල මල් පිපෙන්නේ නැත. සුදු කපුටන් නැත. මාළුන්ට පාද නැත. එහෙත් ඒවා ඇතැයි කවරෙක් හෝ කීවොත් එය පිළිගන්නේ වී නමුදු ස්ත්‍රියක් පවසන බසක් නොපිළිගත යුතු ය.[22] කාන්තාව පිළිබඳ බමුණන් දැක්වූ අදහස්වලට අනුව ඇය කිසිසේත් ම විශ්වාස කළ යුතු නොවේ. වනිතාවගේ ආත්ම ශක්තිය සපුරා බිඳ දමා ඇත. කාන්තාව පිළිබඳ තවදුරටත් කරුණු දක්වන බමුණෝ, කාන්තාවගේ මුහුණ පියුමක් සේ පියකරු ය. වචනය සඳුන් මෙන් සිසිල් ය. දිව අග මී පැණි මෙන් රසවත් ය. නමුත් හදවතේ ඇත්තේ හලාහල විෂය පමණි.[23] එබැවින් වනිතාවට කිසිදු කරුණාවක් දයාවක් නොදැක්විය යුතු ය. කාන්තාවගේ බස් කිසිසේත් ම නොපිළිගත යුතු ය. කාන්තාවක් දැකීම සිත විකල් කිරීමට හේතු වේ. ස්පර්ශ කිරීම ධන විනාශයට හේතු වේ. කාන්තාවක් සමඟ සයනය කිරීම මරණය ලැබීමට හේතු වේ. එම නිසා ස්ත්‍රිය ප්‍රත්‍යක්ෂ වශයෙන් ම රාක්ෂසියකි.[24]

වැඩිවියට පත්වීමත් සමඟ ම විවාහ කරදෙන කාන්තාව තමන්ට පෙර සැමියා මිය ගිය හොත් ඔහු දවන දර සෑයට පැන

සියදිවි නසා ගත යුතු ය. එය සති පූජාව නමින් හඳුන්වයි. නොඑසේ නම් දිවි ඇති තෙක් වැන්දඹු ස්ත්‍රියක් ලෙස සිටිය යුතු ය. වැරහැලි ඇඳුම් ඇඳිමින්. ඉඳුල් ආහාර අනුභව කරමින් ජීවිතය ගතකළ යුතු ය. සැමියාගෙන් කෙතරම් වද වේදනා පැමිණියත් ඒවා විඳ දරාගත යුතු ය. කාන්තාව සිය ජීවිත කාලය පුරා ම සැමියා පිනවමින් දරුවන් හදා වඩා ගැනීම කළ යුතු ය. රැකී රක්ෂා කිරීම තහනම් විය. ආගමික පුද පූජාවලට සහභාගී වීම සපුරා තහනම් විය. ඉහත සඳහන් කරන ලද්දේ බමුණු දහම විසින් වනිතාවට හිමිකර දී ඇති අඳුරු තත්ත්වය යි. වනිතාවට සිය ජීවිතයේ කිසිම කලෙක ස්වාධීනව, ස්වෛරීව, ස්වතන්ත්‍රව, ස්වච්ඡන්දතාවෙන් යුක්තව ක්‍රියා කිරීමට ඉඩක් නොලැබුණි. සැමදා ම තම සැමියාට යටත්ව වාසය කළ යුතුය. තමාට වන කරදර පිළිබඳ ව විමසීමට කිසිදු අවසරයක් නොවීය. වීමංසනයට කිසිදු ඉඩක් ලබා නොදුන් බමුණෝ වනිතාව සිරකාරියක් බවට පත්කර තිබිණි.

ඉහත සඳහන් කරන ලද බ්‍රාහ්මණ ඉගැන්වීම් දෙස බැලීමේ දී නිගමනය කළ හැක්කේ ප්‍රාග් බෞද්ධ ආගමික චින්තාවන් තුළ වීමංසනයට කිසිදු ඉඩක් නොලැබුණු බව යි. සාමාජික, ආගමික, ආදී සෑම අංශයකින් ම මිනිස් චින්තනය අදෘශ්‍යමාන බලවේගයකට පාවා දී ඇත. මිනිසාට ස්ව අභිමතය පරිදි ක්‍රියා කිරීමට ඉඩ ලබා නොදුන් බමුණෝ පුද්ගල ශක්තීන් සියල්ල ම අදෘශ්‍යමාන බලවේගයකට පාවා දී ඇත. දෙවියන් ඉදිරියේ මිනිසා දණ නමන පරාධීන පුද්ගලයකු බවට පත් කර ඇත.

## බුද්ධිවාදී චින්තකයෝ

තර්කය, නිදහස් චින්තනය හා වීමංසනය පදනම් කොටගෙන විශ්වයේ ඇති සමස්තය පිළිබඳ අවබෝධ කර ගැනීමට උනන්දු වූ පිරිස බුද්ධිවාදීන් ලෙස හැඳින්වේ. මිනිස් බුද්ධිය මෙහෙයවා ලෝකය හා සත්ත්වයා පිළිබඳ යථාර්ථය දැකීමට උත්සාහ කළ මොවුන් ගතානුගතික චින්තන රටාවෙන් ඉවත්ව නව චින්තනයක් ගොඩනැඟීමට උත්සාහ කළහ. ඒ සඳහා තර්කය ප්‍රමුඛත්වයෙහිලා සලකන ලදි. විචාර බුද්ධියට හා වීමංසනයට ඉඩ දී තර්කය උපයෝගී

කරගෙන මතවාද ගොඩනැගීමට එඩිතර වූහ.[25] ඔවුන් සිය ඥාන මාර්ගය ලෙස සලකන ලද්දේ තර්කයයි. තර්කය මගින් ලබන ඥානය සම්පූර්ණ එකක් ලෙස සලකන ලද ශාස්තෘවරුන් සිටි බව මජ්ඣිම නිකායේ සන්දක සූත්‍රයෙ[26] හා දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙ[27] සඳහන් වෙයි. ''මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණකු තාර්කික විමංසනයක පිහිටා ආත්මයත්, ලෝකයත් සාස්වත යැයි ප්‍රකාශ කිරීමට උත්සාහ ගෙන ඇත'' මෙසේ තර්කය ඥාන මාර්ගයක් ලෙස යොදාගත් තාර්කිකයන් කොටස් හතරකට බෙදිය හැකිය.[28]

i. අනුස්සවිකා තක්කිකා
(අනුශ්‍රවය හෙවත් වේදය මුල්කොට තර්ක කරන අය)

ii. ඣායී තක්කිකා
(කිසියම් ධ්‍යානයක් ලබා ඒ අනුව තර්ක කරන පිරිස)

iii. ජාතිස්සර තක්කිකා
(පෙර ජාති සිහි කරන නුවණ ලබා ඒ අනුව තර්ක කරන පිරිස)

iv. සුද්ධ තක්කිකා
(ව්‍යවහාරික සාධක මගින් තර්ක කරන පිරිස)

මෙවැනි තර්ක ක්‍රම භාවිත කරමින් වාද විවාද කිරීමට පෙළඹීම බුද්ධිවාදීන් ගේ ප්‍රධාන ලක්ෂණය යි. සිය මතය ම නිවැරදි යැයි ප්‍රකාශ කරමින් එය හුවා දැක්වීමට ක්‍රියා කිරීම බුද්ධිවාදීන්ගේ ලක්ෂණය යි. ප්‍රාග් බෞද්ධ භාරතීය සමාජයේ බුද්ධිවාදී චින්තකයන් වාසය කළ යුග දෙකක් විය.[29]

i. ආරණ්‍යක යුගය

ii. උපනිෂද් යුගය

ශ්‍රැතිය සම්පූර්ණයෙන් ම වාගේ ප්‍රතික්ෂේප කළ මොවුහු ස්වච්ඡන්දතාව හා විමංසනය ගරු කළ පිරිසකි.

## ආරණ්‍යක යුගය

බ්‍රාහ්මණ යුගයෙන් පසුව එළඹි යුගය ආරණ්‍යක යුගය යි. මෙම යුගය වනවිට බ්‍රාහ්මණයන් විසින් හඳුන්වා දුන් විවිධ සංකල්ප තුළින් දැඩි පීඩාවට හා කළකිරීමට පත් පිරිස් ඒවාට විරුද්ධව අදහස් ඉදිරිපත් කිරීමට පමණක් නොව ක්‍රියා කිරීමට ද පෙළඹී ඇත. බ්‍රාහ්මණ ඉගැන්වීම් නිර්දය ලෙස විවේචනයට ලක් කළහ. යාගය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කළ ඔවුහු යාගයන්ගේ ගුඪ ස්වරූපය පැහැදිලි කළහ. බමුණන් විසින් විමුක්තිය ලබා ගැනීම සඳහා හඳුන්වා දුන් යාගය ප්‍රතික්ෂේප කර, ඥාන මාර්ගයක් ඔස්සේ විමුක්තිය ලබා ගැනීමේ අරමුණින්, වාද විවාද කරමින්, ආරණ්‍යගතව, භාවනානුයෝගීව සිත දියුණු කිරීමට මෙම යුගයේ චින්තකයන් උත්සාහ ගන්නා ලදි. එසේ ආරණ්‍යගත වූවත් ඍෂිවරුන් ලෙස හැඳින්වීය. මෙම යුගය වනවිට අශ්වමේධ වැනි යාගයන් වෙනුවට අශ්වයාගේ හිස, ඇස් වශයෙන් සූර්යයා මෙනෙහි කර භාවනාවක යෙදීම නියම කරන ලදි. යාග කිරීම තුළින් විමුක්තිය ලබාගත හැකිය යන විශ්වාසය නිෂ්ඵල යැයි අවබෝධ කරගත් මෙකල චින්තකයෝ භාවනාවෙන් සිත දියුණු කිරීමට උත්සාහ ගත් බව පෙනේ. යථාර්ථය හෙවත් විමුක්තිය සෙවීමට මෙකළ වැඩි උනන්දුවක් දක්වා ඇත. භාවනාව මගින් ධ්‍යාන ආදිය ද ලබා ගත් දාර්ශනික අංශයෙන් වඩාත් දියුණු යුගයක් විය. ශ්‍රැතිය පදනම් කොටගත් බ්‍රාහ්මණ චින්තනයෙන් වියුක්තව ස්වාධීනව, ස්වෛරීව, ස්වතන්ත්‍රව, ස්වච්ඡන්දතාවෙන් හා වීමංසනයෙන් ක්‍රියා කිරීමට පෙළඹී යුගයකි. මේ නිසා ආරණ්‍යක යුගයේ දී චින්තනය නව මගකට යොමු විය. ශ්‍රැතිය තවදුරටත් පිළිගැනීමට තරම් අන්ධ නොවූ මොවුහු බමුණන්ගේ ඉගැන්වීම් පිළිබඳ ව ප්‍රශ්න කිරීමට පෙළඹී ඇත. චින්තනයට හා වීමංසනයට යම් ඉඩක් ලැබීම නිසා නිදහස් සංකල්පනා මෙම යුගයේ දී වැඩි වැඩියෙන් ඇතිවිය. ආරණ්‍යක යුගයේ වීමංසනයට ඉතා උසස් තත්ත්වයක් ලැබුණු බව මේ තුළින් පැහැදිලි වේ.

## උපනිෂද් යුගය

ආරණ්‍යක යුගයේ අවසාන භාගයේ දී උපනිෂද් යුගය ඇරඹිණි. උපනිෂද් නම් ගුරුවරයා සමීපයේ හිඳ ශිෂ්‍යයා විසින් අතිශය භක්තියෙන් උගත යුතු රහස් ඉගැන්වීම ය. උප+නි යන උපසර්ග දෙක මුල්කොට සද් ධාතුවෙන් නිපන් උපනිෂද් යන පදයෙන් සමීපයේ වාඩි වී ඉගෙනීමෙන් ලබන දැනුම යන අරුත ලබා දෙයි. වෛදික සාහිත්‍යයේ අවසාන කොටස උපනිෂද් බැවින් එයට වේදාන්ත දර්ශනය යන නම ද භාවිත කොට තිබේ. උපනිෂද් යන වචනයට භාෂ්‍යයන් සපයන ශංකරාචාර්ය තුමා, තෛත්තරීය උපනිෂද් ග්‍රන්ථයට කරන ලද හැඳින්වීමේ දී මෙසේ සඳහන් කරයි.

> "බ්‍රහ්මයා පිළිබඳ ඥානය උපනිෂද් වේ. ඒ සඳහා කැපකරන්නවුන්ගේ ප්‍රතිසන්ධි, ජාති, ජරා, ව්‍යාධි, මරණාදියෙන් නිදහස් නොවන ඒ සැම විනාශ කරන, ඒ මගින් බ්‍රහ්මචාරීන් පරම බ්‍රහ්මයන් කරා ගෙන යන හෙයින් හෝ, එහි පරම දෙවියන් වැඩ වෙසෙන හෙයින් මේ උපනිෂද් නාමයට හේතු වේ."[30]

මේ අනුව උපනිෂද් යන වචනයට අර්ථ විවරණ දෙකක් ඉදිරිපත් කරයි.[31]

i. අඥානකම නැති කරන අරුතින් උපනිෂද් නාමය යෙදේ.
ii. බ්‍රහ්මන් තත්ත්වය කරා පමුණුවන අරුතින් උපනිෂද් නාමය යෙදේ.

උපනිෂද් ධර්මය ප්‍රසිද්ධ ලෙස සාමාන්‍ය ජනතාවට උගන්වන්නේ නැත. ඒ බව උපනිෂදයන්හි සඳහන් වෙයි. ගුරුකුලයෙහි අවුරුදු සයක් නේවාසික නො වූ, ගුරුවරයකු වීමට නොරිසි, අතවැසියකු නො වූ, කිසිවකුට උපනිෂද් නො ඉගැන්විය යුතු යැයි ඓතරේය ආරණ්‍යකය කියයි.[32] උපනිෂද් ඉගෙනීමට අවශ්‍ය කරන සුදුසුකම් උපනිෂද්වල ම දැක්වේ.

"දරුව ගිනි මෙලැවීම පිණිස දර ගෙන එව!

තොපට උගන්වමි. තොපි සත්‍යයෙන් පිටත නොගියෙක් වෙහිය.

ඒ ගුරුදේවයාණෝ ද සත්‍යකාම හඳාරා තම සිසු සතුන් අතුරෙහි තබමින් රෝගී වූ ද කෘෂ වූ ද සාරසියයක් ගවයින් ඔහු අතට දෙමින් පවසන්නේ

දරුව, මේ ගවයින් සාරසියය ප්‍රවේශම් කොට ගනුව.[33]

ගුරුවරයා සමීපයේ සිටිමින් ගුරුවරයාට කීකරුව, දර සෙවීම, ගිනි දැල්වීම, වතුර ගෙන ඒම ආදී කටයුතු කිරීම උපනිෂද් ඉගෙනීමට අවශ්‍ය සුදුසුකම් විය. ඒ බව ඉහත පාඨයෙන් මනාව පැහැදිලි වේ. පසුව සත්‍යකාම දරුවා එම ගවයන් සංඛ්‍යාව දහසක් දක්වා වර්ධනය කොටගෙන වසර ගණනාවකින් පසු ආරාමයට පැමිණ සිටීමෙන් පසුව ඔහුට උපනිෂද් උගන්වන ලද බව ඡාන්දෝග්‍ය උපනිෂදයේ සඳහන් වෙයි.

උපනිෂද් ධර්මය රහස් ධර්මය කි. ඒ බව උපනිෂද් හැඳින්වීමට භාවිත කර ඇති නම්වලින් පැහැදිලි වේ. රහස්‍යම්, ගුහ්‍යම්, පරමගුහ්‍යම්, ගුහ්‍යතමම් යන වචන භාවිත කර ඇත්තේ උපනිෂද් ශබ්දයට පර්යාය පද වශයෙනි.[34]

උපනිෂද් යුගය වනවිට බ්‍රාහ්මණ ඉගැන්වීම් දැඩි දෝස දර්ශනයට ලක්විය. බ්‍රාහ්මණ යුගයේ මිනිසුන් අදෘශ්‍යමාන බලවේගයන් ඉදිරියේ දණින් වැටී සිටියහ. උපනිෂද් යුගය වනවිට එසේ දණින් වැටී සිටි මිනිසුන් නැගී සිටිමින් නිදහස්ව, නිවහල්ව, ස්වාධීනව, ස්වෛරීව, ස්වතන්ත්‍රව, ස්වච්ඡන්දතාවෙන් ක්‍රියා කරන්නට පෙළඹිණි. දෙවියන්වහන්සේ පිළිබඳ පවා ප්‍රශ්න කිරීමට හා විමසීමට පටන් ගත්හ. උපනිෂද් යුගයේ දී ගුරුවරයා ශිෂ්‍යයා තම සමීපයේ තබා ගනිමින් ඉගැන්විය. මෙතෙක් කාලයක් තිස්සේ අන්ධ භක්තියෙන් පිළිගත් සියල්ල, තාත්විකත්වයෙන් හා විමංසන බුද්ධියෙන් පිළිගැනීමට උත්සාහ කරන ලද ආකාරය උපනිෂද් දර්ශනයෙන් පැහැදිලි වේ.

උපනිෂද්වල දැකිය හැක්කේ ස්වාධීන චින්තන ක්‍රමයකි. බමුණන්ගේ දේව නිර්මාණවාදයට පටහැනිව යමින් දාර්ශනික සංකල්ප දෙස යොමුවීමක් උපනිෂද්වල දැකිය හැකිය. එයට හේතුව වූයේ මෙම යුගයේ චින්තකයන් ස්වාධීන පිරිසක් වීමයි. ආත්මන්, බ්‍රහ්මන්, කර්මය, පුනරුත්පත්තිය, ආත්මවාද යන දාර්ශනික සංකල්ප උපනිෂද්වල සාකච්ඡාවට බඳුන් වී ඇත. උපනිෂද් යුගයේ දී වීමංසනය හා ප්‍රශ්න කිරීම වඩාත් දැකිය හැකිය. බමුණන්ගේ නිර්මාණවාදය පිළිබඳ ව විමසු අවස්ථාවක් මෙසේ දැක්විය හැකිය.

> "අපි කුමන තැනෙකින් උපත ලැබුවෝ වෙමු ද? අපි කොතැන්හි ජීවත් වන්නෝ වෙමු ද? බ්‍රහ්මදත්තයෙනි, කියනු මැනවි, වේදනාව හෝ ප්‍රීතිය හෝ ලබමින් කවරක්හුගේ ආඥාව පරිදි මෙහි ජීවත් වන්නෝ වෙමු ද? කාලය ස්වභාව ධර්මය, භාග්‍යයෝ හෝ ද්‍රව්‍යයන් හේතුව සේ සැලකිය යුතු ද? නැතහොත් ඒ මහා පුරුෂෝත්තමයා හේතුව සේ සැලකිය යුතු ද? [35]

ලෝකය නිර්මාණය කළා යැයි බමුණෝ පවසන ලද බ්‍රහ්මන් පිළිබඳ ව ද සැකයෙන් විමසූ අවස්ථාවක් ලෙස ඉහත උදාහරණය සඳහන් කළ හැකිය. විශ්වයේ ආරම්භය හා පැවැත්ම පිළිබඳව ද උපනිෂද් යුගයේ දී විමසා තිබේ.

> බ්‍රහ්මවාදීහු ඔවුනොවුන් මෙසේ විමැසූහ. මේ විශ්වයේ හේතුව කිමෙක් ද? ඒ බ්‍රහ්ම වන්නේ ද? අපි කිනම් තැනකින් පැමිණියෝ වෙමු ද? කුමක් හෙයින් අපි ජීවත්වන්නමු ද? අපි අවසානයේ දී කොතැන්හි සංප්‍රතිෂ්ඨාපනය කරමු ද? කවරක්හුගේ ආදේශයෙන් අපි සුවෙන් හා දුකින් වෙළුනේ වෙමු ද?[36]

උපනිෂද්වල දී වීමංසනයට ඉඩ දුන් තවත් අවස්ථාවක් කේන උපනිෂදයෙන් හමු වේ. එක් ශිෂ්‍ය මානවකයකු ගුරුවරයා ළඟට පැමිණ මෙසේ විමසයි.

කවරෙක්හුගේ ආදේශයෙන් චිත්තය සිතන්නේ ද?
කවරෙක්හුගේ ආදේශයෙන් ශරීරය ජීවත් වන්නේ ද?
කවරෙක්හුගේ ආදේශයෙන් ජිහ්වය භාෂණය කරන්නේ ද?
ඇසට හෝ කණට හෝ හොඳ දේවල් ලක් කරනු ලබන්නේ කවරකු විසින් ද?[37]

ඉහත සඳහන් කරන ලද ආකාරයේ දාර්ශනික ප්‍රශ්න උපනිෂද් චින්තනය පුරා ම දැකගත හැකිය. එසේ විමසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම දෙස බලන විට උපනිෂද්වල ඇති ශ්‍රේෂ්ඨත්වය මනාව පැහැදිලි වේ. ලොව ඇති ජීවි අජීවි සියල්ල අනිත්‍ය බව උපනිෂද්වල සඳහන් වෙයි.

"ලෞකික සැප වූ කලී ජරා මරණින් සිඳ දමනු ලබන්නේ ඒ සැම අනිත්‍යය"

උපනිෂද්වල බොහෝවිට දැකිය හැක්කේ බ්‍රාහ්මණ ඉගැන්වීම් පිළිබඳ විවේචනය. බමුණන්ගේ යාගය ද නිර්දය ලෙස විවේචනයට ලක් කර ඇත. යාග හෝම විධි පැවැත්වීමෙහි ඇති නිෂ්ඵලතාව උපනිෂද් හි සඳහන් වන්නේ මෙසේ ය.

"මේ යාග නමැති පහුර සවි ශක්ති නැති ඒවාය. අටළොස් දෙනෙකුගෙන් යුක්ත වූ මේ යාගය හොඳ යැයි පිළිගත් මෝඩයෝ වෙද්ද ඔවුහු නැවත නැවත ජරාවට හා මරණයට පත් වෙති".[38]

උපනිෂද් යුගයේ විසූ පඬිවරුන් නිදහස් චින්තනය හා විමංසනය ගරු කළ බව දැක්වෙන තවත් අවස්ථාවක් උපනිෂදයන් හි හමු වේ.

"අවිද්‍යාව තුළ වෙසෙමින් තුමූ ධීරයෝ යැයි පණ්ඩිතයෝ යයි සිතන ඔවුහු අන්ධයන් අනුව යන අන්ධයන් මෙන් දුක් විඳිමින් සැරි සරති"[39]

මෙම පාඨයෙන් පැහැදිලි වන්නේ සාම්ප්‍රදායික බමුණු මතවලට එරෙහිව දක්වන ලද අදහස් ය.

කර්මය හා පුනරුත්පත්තිය වැනි දාර්ශනික සංකල්ප පිළිබඳ විමසීම ද උපනිෂද් යුගයේ පැවති බව පෙනේ. නිදහස් චින්තනයක් පැවති බැවින් එකල චින්තකයෝ බොහෝ විට දාර්ශනික සංකල්ප පිළිබඳ විමසීමට යොමුව ඇති බව සිතා ගත හැකිය. පුද්ගලයා කරනු ලබන ක්‍රියාව හොඳ නරක වශයෙන් දෙයාකාර වෙයි. අකුසල කර්මයක් කළ විට ලැබෙන්නේ අයහපත් ප්‍රතිඵල යි. කුසල කර්මයන්ට ලැබෙන්නේ හොඳ ප්‍රතිඵල යි. මේ අදහස උපනිෂද් දර්ශනය තුළ විමංසනයට බඳුන් වී ඇත.

> "හොඳ කරන්නේ හොඳ වෙයි. පව් කරන්නේ පාපී වෙයි. පුණ්‍ය ක්‍රියාවෙන් පුණ්‍ය වෙයි. සමහරු මෙම පුරුෂයා කාමමය වේ යැයි කියත් (එහෙත්) පුරුෂයා යමක් කරනු කැමැත්තේ වේ ද, ඔහුගේ අධිෂ්ඨානය එය ම වෙයි. අධිෂ්ඨානය යම්සේ ද එසේ වූ කර්මය ම කෙරෙයි. කරනුයේ යම් කර්මයක් ද එයට පැමිණේ."[40]

හොඳ නරක, යහපත අයහපත, කුසල් අකුසල් ආදී සදාචාරාත්මක සංකල්ප පිළිබඳව ද උපනිෂද්වල කරුණු සඳහන් වෙයි. උසස් පහත් ආත්ම ලැබීම සම්බන්ධව ද උපනිෂද්වල තොරතුරු සඳහන් වෙයි. බමුණන් සඳහන් කළේ මහා බ්‍රහ්මයා විසින් සත්ත්වයා නිර්මාණය කරන ලද බව යි. එම අදහස නිර්දය ලෙස විවේචනය කරන උපනිෂද් පඬිවරු කර්මය අනුව ඊළඟ භවය තීරණය වන බව සඳහන් කර ඇත.

> "මෙලොව දී කරන යහපත් ක්‍රියාවල ප්‍රතිඵලයෙන් වහා ම යහපත් උත්පත්තියකට යෙයි. බ්‍රාහ්මණ ක්ෂත්‍රිය, වෛශ්‍ය, යන ආත්මවල උත්පත්තියකට යෙයි. අයහපත් කර්මවල ප්‍රතිඵලය ඇත්තෝ සුනඛ, චණ්ඩාල, සූකර යෝනිවලට වහා උත්පත්ති වශයෙන් පත්වෙති."[41]

උසස් පහත් වශයෙන් උත්පත්තිය ලබන්නේ කර්මයට අනුව යි. එය කාගේ හෝ අභිමතය පරිදි සිදු වූවක් නොවේ. එබැවින

පුද්ගලයා පිළිබඳ වගකීම ඔහුට ම ලබා දී ඇත. හොඳ නරක තෝරා ගැනීමේ නිදහස පුද්ගලයාට ම හිමි වී තිබීම තුළින් ස්වාධීනත්වය ආරක්ෂා වී ඇත. උපනිෂද්වල සඳහන් කරුණු පිළිබඳ ව ප්‍රශ්න කිරීමට හා විමසීමට ඉඩ ලබා දී තිබීම නිසා දාර්ශනිකමය වශයෙන් යම් දියුණු තත්ත්වයක් ඇති වූ බව පෙනේ.

මෝඩයා සහ ප්‍රඥාවන්තයා අතර වෙනස පැහැදිලි කරන උපනිෂද් සංකල්පනාවල ඇත්තේ ඉතා ශ්‍රේෂ්ඨ උපදේශයන් ය.

> "හොඳ හා සතුට යන දෙක ම මිනිසා වෙත පැමිණේ. නුවණැත්තා මේ දෙක හොඳින් පරීක්ෂා කොට එහි වෙනස දැන, හොඳ සතුටට වඩා ශ්‍රේෂ්ඨ බව අවබෝධ කොට ගනියි. එහෙත් අනුවණයා තෘෂ්ණාවෙන් මුලාවට පත්ව සතුට හොඳට වඩා උසස් කොට සලකයි"[42]

නුවණැත්තාගේ ස්වභාවය හා අනුවණයාගේ ස්වභාවය උපනිෂද් මුනිවරුන් දුටු ආකාරය ඉහත පාඨය තුළින් මනාව අවබෝධ කරගත හැකිය. දැනුමට, අධ්‍යාපනයට වඩා ඉන්ද්‍රියානුභූතිය උසස් බව උපනිෂද් යුගයේ දී පිළිගත් මතයකි. අන් සෑම මාර්ගයකින් ම ලබා ගන්නා වූ දැනුමට වඩා ඉන්ද්‍රියානුභූතියෙන් ලබන දැනුම උසස් කොට සලකා ඇත.

> "දෙවියන්, ඉගෙනීමෙන් ම ආත්මය අවබෝධ කළ නොහැක්කේය. බුද්ධියෙන් සියුම් ලෙස දැකීමෙන් හෝ අවබෝධ කළ නොහැක්කේය. එහෙත් කවරෙක් ඔහු සඳහා කැපකොට සිටින්නේ ද, ඒ ඔහු විසින් ම ආත්මය අවබෝධ කොට ගත්තේය"[43]

උපනිෂද් ධර්මය තුළ වීමංසනයට ලැබුණු ස්ථානය මනාව අවබෝධ කරගැනීම සඳහා තව උදාහරණ කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

"වසරක් මුළුල්ලෙහි ම බ්‍රහ්මචාරීව ශ්‍රද්ධාශීලිව උග්‍ර තපස් කොට අනතුරුව මා වෙත පැමිණ තමන් කැමති පැනයක් විචාරව, පිළිවදන් දෙන්නට හැක්කේ ද එකල පිළිවදන් දෙමි"[44]

තම ශිෂ්‍යයන්ට ප්‍රශ්න විචාරීමට ඉඩදුන් අවස්ථාවක් ඉහත සඳහන් වේ. ගුරුවරයා තමාගේ හැකියාව හා දැනුම පරිදි ඒවාට පිළිතුරු ලබා දී ඇති බව ද ඉහත පාඨයෙන් සනාථ වේ. පිප්ඵලද ඍෂිවරයා සමීපයට සත්‍ය සොයාගෙන පැමිණි පිරිස අතරින් කබන්ධිය නමැත්තා ප්‍රශ්නයක් විමසයි.

"ගුරු දේවයිනි, සත්ත්වයා කෙසේ නම් ඇතිවී ද?"

තවත් වරෙක භාර්ගව ගුරුවරයා වෙත පැමිණි ශිෂ්‍යයකු ද මෙසේ විමසයි.

"පින්වත් ගුරු දේවයිනි බල කොපමණ මෙම ශරීරය අල්ලා සිටිනුයේ ද? ඒ අතරින් කුමක් එහි ව්‍යාප්තව පවතී ද? කුමක් ප්‍රධාන වන්නේ ද?[45]

කෞශල්‍ය නැමති මානවකයෙක් උපනිෂද් ගුරුවරයකු සමීපයට පැමිණ අසන ලද ප්‍රශ්නය ද විමංසනයට ඉඩ දුන් අවස්ථාවක් මෙන් ම, දාර්ශනිකමය වශයෙන් වැදගත් අවස්ථාවක් ලෙස ද සඳහන් කළ හැකිය.

"ප්‍රාණය කිමෙකින් බිහි වූයේ ද? හේ කෙසේ නම් ශරීර ගත වේ ද? තමන් විසින් ම තමා බෙදිමින් කෙසේ නම් එහි ජිවත් වෙයි ද? කෙසේ නම් ඉවත යන්නේ ද? පිටත ඇත්තා වූ දේ කෙසේ නම් දකී ද? කෙසේ නම් තමන් හා ශරීරය ද ඉන්ද්‍රියයන් හා චිත්තය ද අල්ලා සිටී ද?"[46]

"මනුෂ්‍යයාගේ ශරීරය සුසුප්තව පවත්නා කල්හි එම සුසුප්තයට අන්තරව කුමක් ඇත්තේ ද? කවරෙක් අවදිව සිටී ද? කවරෙක් ස්වප්නය කරයි ද? එකල්හි කවරෙක් ප්‍රීති සුවය විඳියි ද?"[47]

උපනිෂද්දහම් ඉගෙනීමට අනුගාමිකයන් දැනුවත් කරන නිදසුනක් කඨෝපනිෂදයෙන් හමු වේ.

> "නැඟිටිව ! අවදිවව ! ශාස්තෘන්ගේ පාදයන් වෙත
> ගොස් එය උගනිව..."[48]

උපනිෂද් යුගයේ ජීවත් වූ චින්තකයන් සෑම විට ම නිදහසේ සිතන්නට පෙළඹී ඇති බව මේ අනුව පැහැදිලි වේ. තමාට අවබෝධ කරගත නොහැකි දේ ගුරුවරයාගෙන් විමසා දැන ගනිමින් ඒවා නිරාකරණය කර ගත්හ. ගුරුවරයා සමඟ පවා වාද විවාද කරමින්, විමසමින්, විචාරමින්, ශිෂ්‍යයන් අධ්‍යාපනය ලබා ගත් බව ඉහත උදාහරණ තුළින් මනාව පැහැදිලි වේ. නිදහස් චින්තනයේ ප්‍රතිඵලයක් වශයෙන් යහපත වෙත යොමු වීමට බොහෝ දෙනෙක් උත්සාහ ගෙන ඇත. උපනිෂද් චින්තකයන්ගේ දිවග නිතර ම තිබූ එක් පාඨයක් උපුටා දැක්විය හැකිය.

> අසතො මා සද් ගමෙය්‍ය
> තමසො මා ජ්‍යෝතිර් ගමෙය්‍ය
> මෘත්‍යෝර් මා අමෘතම් ගමෙය්‍ය[49]

මා දොසින් නිදොස කරා ගෙනයේවා ! අඳුරින් එළිය කරා ගෙනයේවා ! මරණින් අමරණීයත්වයට ගෙනයේවා ! යන්න මුළු උපනිෂද් ධර්මය පුරා ම දිවයන ප්‍රධානතම සංකල්පය යි. හොඳ, නරක, අඳුර, එළිය, යහපත, අයහපත ආදී වශයෙන් තෝරා බේරා ගැනීමට පුද්ගලයාට හැකියාව ලැබේ නම් එතැන විමංසනයක් ඇත. ස්වච්ඡන්දතාවක් ඇත.

## සමකාලීන භාරතීය චින්තනයෙහි විමංසන සංකල්පය

ක්‍රි. පූ. හයවන සියවසේ භාරතීය සමාජය ඉතා සංකීර්ණ විය. ආගමික හා දාර්ශනික වශයෙන් බලන විට ද ඉතා සංකීර්ණ මතවාදයන් පැවතිනි. ආගමික අංශයේ බලය හිමිකර ගෙන තිබුණේ බ්‍රාහ්මණයන් විසිනි. බමුණන්ගේ අන්තගාමී පිළිවෙත්වලට එරෙහිව

නව සංකල්ප ඉදිරිපත් කරමින් මානව චින්තනය තුළ මහත් විප්ලවයක් ඇති කිරීමට සමත් වූ පිරිස ශ්‍රමණ යන නාමයෙන් හඳුන්වන ලදි. බමුණන් විසින් සර්වබලධාරී දෙවියන් වෙත පාවා දී තිබූ පුද්ගල ශක්තිය, මනුෂ්‍යයා වෙතට පවරා දුන්නේ ශ්‍රමණ සාම්ප්‍රදායිකයන් විසිනි. සමකාලීන සාමයික පරිසරය තුළ පැවති විවිධ සංවිධාන බුදුරජාණන්වහන්සේ විසින් හඳුන්වා දෙන ලද්දේ දිට්ඨි යන වචනයෙනි. එබඳු වූ දෘෂ්ටි 62ක් දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වෙයි.[50] ඒවා මෙසේ සාරාංශ කොට දැක්විය හැකිය.

| | | |
|---|---|---|
| i. | සස්සතවාද | 04 |
| ii. | ඒකච්ච සස්සතවාද | 04 |
| iii. | අන්තානන්තිකවාද | 04 |
| iv. | අමරාවික්ඛේපවාද | 04 |
| v. | අධිච්චසමුප්පන්නවාද | 02 |
| vi. | සඤ්ඤීවාද | 16 |
| vii. | අසඤ්ඤීවාද | 08 |
| viii. | නේවසඤ්ඤීනාසඤ්ඤීවාද | 08 |
| ix. | උච්ඡේදවාද | 07 |
| x. | පරම දිට්ඨධම්ම නිබ්බානවාද | 05 |

මේවා දෙසැටක් දෘෂ්ටි යැයි සඳහන් කරන ලද නමුත් සූත්‍රයෙහි සඳහන් වන්නේ වාද යන නමිනි. මෙම වාද 62 ප්‍රධාන කොටස් දෙකකට අන්තර්ගත කළ හැකිය.[51]

i. ශාස්වතවාද
ii. උච්ඡේදවාද

මේ හැටදෙක අතරින් අවසානයේ දක්වන ලද දෘෂ්ටි දොළස උච්ඡේද දෘෂ්ටියෙහි ද, ඉතිරි සියල්ල ශාස්වත දෘෂ්ටියෙහි ද වැටෙති. මෙම දෘෂ්ටි 62 නැවතත්

i. පූර්වාන්තකල්පිත
ii. අපරාන්ත කල්පිත[52]

[illegible] කොටස් දෙකකට බෙදේ. පූර්ව භවයන් ආශ්‍රය කොට පවත්නා දෘෂ්ටි 18ක් පූර්වාන්ත කල්පිත දාෂ්ටි ගණයට අයත් වේ. අනාගත භවයන් අපේක්ෂා කොට පවත්නා ඉතිරි දෘෂ්ටි 44 අපරාන්ත කල්පිත නම් වේ. පුද්ගලයා දෘෂ්ටිගත වන ආකාර තුනක් බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වේ.[53]

i. ඒතං මම අභිනිවේස පරාමාස දෘෂ්ටිය හෙවත් තෘෂ්ණාව නිසා දෘෂ්ටිගත වීම.

ii. ඒසෝ හමස්මි අභිනිවේස පරාමාස දෘෂ්ටිය හෙවත් මානයෙන් දෘෂ්ටිගත වීම.

iii. ඒසෝ මෙ අත්තා අභිනිවේස පරාමාස දාෂ්ටිය හෙවත් මෝහයෙන් දෘෂ්ටිගත වීම.

ඉහත සඳහන් ආකාරයට සත්ත්වයා කිසියම් මිථ්‍යා දෘෂ්ටියකට අන්තර්ගත වන්නේ තෘෂ්ණාව, මානය හා මෝහය යන දූර්වල චිත්තවේග නිසා ය. එවැනි චිත්තවේග පදනම් කොටගෙන දෘෂ්ටිගත වන සත්ත්වයා අන්තගාමීව ක්‍රියා කරයි. තමන් එල්බ ගත්තා වූ දෘෂ්ටියට අනුව දෘෂ්ටි 62කට අන්තර්ගත ව ඇත. එම දෘෂ්ටි හැට දෙක නැවත වර්ගීකරණයකට ලක් කිරීමක් ත්‍රිපිටකයේ දැකිය හැකිය.[54]

i. පුබ්බේකත හේතුවාදීහු (සබ්බේව පුබ්බේකත හේතු)
ii. ඊශ්වර නිර්මාණවාදීහු (සබ්බං ඉස්සර නිම්මාන හේතු)
iii. අකිරියවාදීහු (සබ්බේව අහේතු අප්පච්චයතා)

යම් පුද්ගලයෙක් සැපක් දූකක් හෝ උපේක්ෂාවක් හෝ විඳී නම් ඒ සියල්ල පෙර ආත්මවල දී කළ කර්ම බලයෙන් සිදුවෙති ය යන විශ්වාසය පුබ්බේකතහේතුවාදය යි. යම්කිසි පුද්ගලයෙක් සැපක් දුකක් හෝ උපේක්ෂාවක් විඳී නම් ඒ සියල්ල ඊශ්වර නිර්මාණ හේතුවෙන් හෙවත් ලෝකය මැවූ දෙවියන්ගේ කැමැත්තෙන් සිදුවෙති යි යන විශ්වාසය ඊශ්වර නිර්මාණවාදය යි. කුසලාකුසල කර්මයන්ගේ විපාක නැතැයි යන විශ්වාසය ඇති අය අකිරියවාදීහු නම් වෙති.

බුද්ධකාලීන භාරතීය ආගමික පරිසරයේ ජීවත් වූ දෙසැටක් දෘෂ්ටීන් සත්‍ය හා ඥානය සෙවීමට විවිධ ක්‍රම භාවිත කරන ලද බව බෞද්ධ සූත්‍ර ධර්ම විවරණය කිරීමෙන් පැහැදිලි වේ. මජ්ඣිම නිකායේ සංගාරව සූත්‍රයේ එවැනි මාර්ග තුනක් දැක්වෙයි. [55]

i. අනුස්සුතිකා
ii. තක්කවීමංසා
iii. සයං අභිඤ්ඤා සච්ඡිකත්වා

යනුවෙන් ඥානය ලබා ගන්නා ක්‍රම තුනක් දැක්වෙයි. මෙම ක්‍රම තුන අතරින් තර්කයෙන් වීමංසනයට බැස ඥානය ලබා ගැනීමේ ක්‍රමයක් පැවති බව පෙනේ. තර්කය ප්‍රධානතම ඥාන මාර්ගයක් වුව ද තර්කයෙන් වීමංසනයට විශාල ඉඩක් ලැබුණේ ද යන්න විශ්වාස කළ නොහැකිය. චංකී සූත්‍රයෙහි තවත් ඥාන මාර්ග පහක් සඳහන් වෙයි.[56]

i. සද්ධා
ii. රුචි
iii. අනුස්සව
iv. ආකාර පරිවිතක්ක
v. දිට්ඨිනිජ්ඣානක්ඛන්ති

බුද්ධ කාලීන සමාජයේ පැවති තවත් ඥාන මාර්ග දහයක් කාලාම සූත්‍රයේ සඳහන් වෙයි.[57]

i. අනුස්සව
ii. පරම්පරාය
iii. ඉතිකිරාය
iv. පිටකසම්පදාය
v. තක්කහේතු
vi. නයහේතු
vii. ආකාරපරිවිතක්ක

viii. දිට්ඨිනිජ්ඣානක්ඛන්ති

ix. භබ්බරූපතාය

x. සමණෝ නො ගරු

මෙම ඥාන මාර්ග දෙස බැලීමෙන් පැහැදිලි වන්නේ සමකාලීන යුගය වනවිට පුද්ගලයාගේ චින්තන නිදහසට එතරම් බාධා කිරීමක් තර නොමැති බවයි. සමකාලීන සාමයික ඉගැන්වීම්වල පැවති චින්තන ක්‍රමය ඉහත කරුණු දහයෙන් එකකට හෝ සම්බන්ධ වී ඇත. තත්කාලීන චින්තනය සකස් වී ඇති තවත් ක්‍රම හතරක් අචේල කස්සප සූත්‍රයෙහි සඳහන් වෙයි.[58] එහි දැක්වෙන ආකාරයට එම පිරිස යම් දුරකට බුද්ධිය මෙහෙයවා ස්වාධීනව සිතීමට හා විමසීමට උත්සාහ කරන ලදි.

i. සයං කත වාද - හේතුව හා ඵලය දෙකක් නොව එකකි.
ii. පරංකත වාද - හේතුව හා ඵලය එකක් නොව දෙකකි.
iii. සයං කත පරං කත වාද - හේතුව හා ඵලය එකක් සේ ම දෙකකි.
iv. අසයංකත අපරංකත වාද - හේතුව හා ඵලය එකක් නොවන්නා සේ ම දෙකක් ද නොවේ.

ඉහත කාරණා හතර පිළිබඳ විමසීමේ දී පැහැදිලි වන්නේ චින්තනය යම් දුරකට ස්වාධීන මට්ටමක පවතින්නට ඇති බව යි. විශේෂයෙන් ම වීමංසනයට යම් දුරට ඉඩක් බුද්ධිවාදී දාර්ශනික සංකල්පවල ඇත. දාර්ශනිකමය වශයෙන් සලකා බලන විට වඩාත් දියුණු චින්තන ක්‍රමයක් ද පැවති බව මේ තුළින් පැහැදිලි වෙයි. එහෙත් එම චින්තන ක්‍රමය එතරම් ස්වාධීන නොවූවකි. එබැවින් විවිධ දෘෂ්ටීන් අනුගමනය කළ බොහෝ අනුගාමිකයන් මහත් අසරණතාවකට පත්ව ඇති අයුරු කාලාම සූත්‍රයෙන් පැහැදිලි වෙයි.

## ශ්‍රමණ සම්ප්‍රදායය

සමකාලීන දාර්ශනික චින්තනය බ්‍රාහ්මණ අන්තගාමීත්වයෙන් විමුක්ත කොට ස්වාධීන චින්තන ක්‍රමයක් බවට පත් කිරීමට වෙර

දැරූ පිරිස ශ්‍රමණයන් වශයෙන් හඳුන්වා ඇත. ශ්‍රමණ සම්ප්‍රදායයට අයත් පිරිස නව චින්තනයක් ගොඩ නැගීමට උත්සාහ දරා ඇත. ඔවුන්ගේ ඉගැන්වීම් තුළ චින්තනයට හා විමංසනයට ලැබෙන ඉඩ කෙබඳු ද යන්න සොයාබැලීම මෙහි දී අපේක්ෂා කෙරේ. සමකාලීන අන්‍ය සාමයික සිද්ධාන්ත මෙසේ සඳහන් කළ හැකිය.

i. ෂඩ් ශාස්තෘවරු
ii. ආජීවක
iii. පරිබ්‍රාජක
iv. අචේලක
v. ජටිල

මෙබඳු සාමයික පරිසරයක් තුළ පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ ව පමණක් නොව, චින්තනයට හා විමංසනයට ලබා දුන් ඉඩකඩ විමසා බැලීම ඉතා වැදගත් වෙයි. කෙතරම් දුරකට පුද්ගලයාට සිතා මතා ක්‍රියා කිරීමේ අයිතියක් සමකාලීන සාමයික සිද්ධාන්තයන්ගෙන් ලැබුණේ ද යන්න විමසා බැලීම මෙහි දී අපේක්ෂා කෙරේ.

## ෂඩ් ශාස්තෘවරු

බුදුරජාණන්වහන්සේ ජීවමාන කාලයෙහි දඹදිව ප්‍රකට ව සිටි ආගමික ශාස්තෘවරු සය දෙනෙක් වූහ. බෞද්ධ සූත්‍ර අතර දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි ඒ බව සඳහන් වේ. බ්‍රාහ්මණ චින්තනයටත් සංස්කෘතියටත් එරෙහිව අදහස් ඉදිරිපත් කළ ආචාර්යවරුන් සය දෙනා ෂඩ් ශාස්තෘ යන නාමයෙන් හඳුන්වා ඇත. එම හය දෙනා නම්,

i. පූර්ණ කස්සප
ii. මක්ඛලී ගෝසාල
iii. අජිත කේෂකම්බල
iv. පකුධ කච්චායන

ඉ. සංජය බෙල්ලට්ඨිපුත්ත

ඊ. නිගණ්ඨනාථපුත්ත යනුවෙනි.

**පූර්ණ කස්සප**

බුදුරජාණන්වහන්සේගේ සමකාලීනයකු වන මෙතුමා ෂඩ් ශාස්තෘවරුන් අතර පැරණිතම ශාස්තෘවරයා ය. බුද්ධ පරිනිර්වාණයට වර්ෂ 29 කට පෙර එනම් ක්‍රි. පූ. 572 දී අභාවප්‍රාප්ත වූ බව කියවේ. නමුත් ඒ. කේ. වෝඩර් සඳහන් කරන්නේ පූර්ණ කස්සපයන් මිය ගියේ ක්‍රි. පූ. 503 දී බව යි. බුද්ධ කාලයේ ජීවත් වූ ඉතා ප්‍රසිද්ධ ශාස්තෘවරයකු වූ මෙතුමා හැඳින්වීමට සර්වඥ, සර්වදර්ශී, යන නම් භාවිත කර ඇත. මෙතුමා අපරිශේෂ ඥාන දර්ශනයක් ඇති ශාස්තෘවරයකුව සිටි බව බෞද්ධ සූත්‍රයන්හි සඳහන් වෙයි.[59]

අනන්ත ඥානයෙන් අනන්තවත් වූ ලෝකය දරන්නා වූ [illegible]. බුද්ධ කාලය වනවිට ඉතා ප්‍රචලිත වූ මෙම ආචාර්යවරයා බොහෝ අනුගාමිකයන් පිරිවරාගත්, පැවිදි ගණයා ඇති, බොහෝ පිරිසකට ආචාර්ය වූ කීර්තිමත් වූ, අන්‍ය ලබ්ධිකයන් විසින් සාධු ජන සම්මත කරන ලද ශාස්තෘවරයකු ලෙස ප්‍රකට වී යැයි දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වෙයි.[60] අජාසත් රජුගේ කාලයේ දී මෙතුමා ජීවත්ව සිටි බවට සාමඤ්ඤඵල සූත්‍රය සාධක කරයි.

පූර්ණ කස්සපගේ ඉගැන්වීම අකිරියවාදයකි. පාප ක්‍රියා තමා ම කරන්නහුට ද, අනුන් ලවා කරවන්නහුට ද, අනුන්ගේ අත් පා [illegible] සිඳින්නහුට ද, සිඳවන්නහුට ද, අනුන් දඬු මුගුරු ආදියෙන් තලන්නහුට ද, පෙළවන්නහුට ද, අනුන් සතු දේ පැහැර ගන්නහුට ද, අනුන් ලවා පැහැර ගන්වන්නහුට ද, ආහාර වැලැක්වීම ආදියෙන් අනුන් වෙහෙසන්නහුට ද, අනුන් ලවා වෙහෙසවන්නහුට ද, අනුන් කම්පිත කරන්නහුට ද, අනුන් ලවා කම්පිත කරවන්නහුට ද, පණ නසන්නහුට ද, නස්වන්නහුට ද, ගෙවල් බිඳින්නහුට ද, බිඳවන්නහුට ද, පරඹුවන් කරා යන්නහුට ද, බොරු කියන්නහුට ද, කිසිදු පාපයක් සිදු නොවේ. යමෙක් ඉතා තියුණු ආයුධයක් ගෙන සියලු ම සතුන්

මරා එක ම මස් ගොඩක් කරන්නේ නමුදු ඒ හේතුවෙන් සිදුවන පාපයක් නැත. පාපයාගේ පැමිණීමක් ද නැත.[61] සතුන් මරමින්, මරවමින්, සිඳිමින්, සිඳුවමින්, පෙළමින්, පෙළවමින් ගංගා නදියේ උතුරු කෙළවරේ සිට දකුණු කෙළවරට යන්නේ නමුදු ඒ හේතුවෙන් පවක් සිදු නොවේ. පාපයාගේ පැමිණීමක් ද නැත.[62]

පුද්ගලයා විසින් කරනු ලබන නරක ක්‍රියාවලට විපාකයක් නැත්තා සේ ම හොඳ ක්‍රියාවලින් සිදුවන කුසලයකුත් නැත. දන් දෙමින්, දෙවමින්, යාග කරමින්, කරවමින්, ගංගා නදියෙහි දකුණු කෙළවර දක්වා යන්නේ නමුදු ඒ හේතුවෙන් කිසිදු පිනක් සිදු නොවේ. පිනෙහි පැමිණීමක් ද නැත. දීමෙන් ඉඳුරන් දැමීමෙන්, සීල සමාදානයෙන්, සත්‍යය කතා කිරීමෙන් ද සිදුවන පිනක් නැත. පිනක පැමිණීමක් ද නැත.

පූරණ කස්සපගේ අකිරියවාදයට අනුව මිනිසා විසින් කරනු ලබන සියලු ක්‍රියා ප්‍රතිඵල රහිත ය. නරක ක්‍රියාවන්ට ලැබෙන නරක විපාකයක් ද නැත. හොඳ ක්‍රියාවන්ට ලැබෙන හොඳ ප්‍රතිඵලයකුදු නැත. මේ අනුව පුද්ගලයා කරන ක්‍රියාවන්හි වගකීම පුද්ගලයා සතු නොවේ. ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් නැත්නම් එම ක්‍රියාවන්හි කිසිදු වැදගත්කමක් නැත. හොඳ නරක යැයි වෙන්කර ගැනීමට ස්වච්ඡන්දතාවක් නැත. කිසිදු විමසීමකින් තොරව පිළිගත යුත්තේ පුද්ගල ක්‍රියාවන් ප්‍රතිඵල රහිතය යන්න යි. පුද්ගලයා විසින් කරනු ලබන ක්‍රියාවට වග කියන්නෙක් නැත. එනිසා විමංසනයට අවසර නැති දහමක් ලෙස පූර්ණ කස්සපගේ අකිරියවාදය හැඳින්විය හැකිය.

පූර්ණ කස්සපගේ ඉගැන්වීම එක් අතකින් අහේතුවාදයකි. පූර්ණ කස්සප පිළිබඳ සංයුක්ත නිකායේ මෙවැනි අදහසක් දක්නට ලැබේ. අභය සූත්‍රයෙහි පූර්ණ කස්සප සියල්ල අහේතු අප්‍රත්‍යව සිදුවන බව ප්‍රකාශ කරන්නේ යැයි බුදුරජාණන්වහන්සේ හමුවෙහි දී අභයරාජ කුමාරයා පවසයි.[63] අහේතුවාදය යනු හේතු ප්‍රත්‍යයන් ගෙන් තොරව සත්ත්වයාගේ විසුද්ධිය ඇති වන්නේ ය යන මතය යි. කෙලෙසීම ඇතිවන්නේ ද හේතු ප්‍රත්‍යයන්ගෙන් තොරව ය.

මෙතුමා විසින් ඉදිරිපත් කරන ලද අකිරියවාදී ඉගැන්වීම තුළ පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අගය කිරීමක් දැකිය නොහැකිය. චින්තන නිදහස මෙන් ම විමංසනයට ද කිසිදු ඉඩක් නොලැබෙන දහමක් ලෙස මෙම දර්ශනය හඳුන්වා දිය හැකිය.

## මක්ඛලි ගෝසාල

බුද්ධකාලීන භාරතීය සමාජයේ පැවති ආජීවක නිකායේ ප්‍රාරම්භකයා වශයෙන් මක්ඛලී ගෝසාල පිළිගැනේ. වසර 24 පමණ තාපසයකු ලෙස කටයුතු කළ මෙතුමා වසර හයක් ගත කළේ ජෛන මහාවීර තුමා ආශ්‍රයේය. දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයට අනුව මක්ඛලී ගෝසාල නියතිවාදියෙකි. ඔහුගේ ඉගැන්වීම සාමඤ්ඤඵල සූත්‍රයේ මෙසේ සඳහන් වෙයි.

සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුවක් ප්‍රත්‍යයක් නැත. හේතු ප්‍රත්‍යයන්ගෙන් තොරව සත්ත්වයෝ කෙලෙසෙති.[64] සත්ත්වයන්ගේ පිරිසිදු වීමට ද හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත.[65] තමාගේ යහපත සඳහා තමා විසින් කළ යුතු කාර්යයක් නැත. අනුන්ගේ යහපත සඳහා කළයුතු කර්මයක් ද නැත. තමා කළ කර්මයෙහි විපාක නැත.[66] ඒ අනුව පැහැදිලි වන්නේ මක්බලී ගෝසාලයන් පුරුෂ ශක්තිය, පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය, අගය කොට නැති බව යි. බලය කියා දෙයක් නැත. පුරුෂ ශක්තිය කියා දෙයක් නැත. පුරුෂ පරාක්‍රමය කියා දෙයක් නැත. සියලු සත්වයෝ ම, සෑම ප්‍රාණීහු ම, සෑම භූතයෝ ම, සෑම ජීවයෝ ම, දුර්වලය. අප්‍රාණිකය. කිසිදු ශක්තියක් වීර්යයක් ඇත්තේ ම නැත.

i. නියති
ii. සංගති
iii. ස්වභාව

යන ලක්ෂණ තුනින් සත්ත්වයෝ පරිණාමයට පත් වෙති. මක්බලී ගෝසාලගේ ඉහත ඉගැන්වීම්වලට අනුව පුද්ගලයා කිසිදු බලයකින්, ශක්තියකින් තොර කෙනෙකි. එබැවින් ස්වච්ඡන්දතාවක

විමංසනයක් කිසිසේත් ම අවශ්‍ය නැත. නියතිවාදය යනු සියල්ල පූර්ව නියතිය මගින් සිදුවන බව පිළිගැනීම යි. සියල්ල පූර්ව නිශ්චිත නම් පුද්ගලයා විසින් සිතා මතා කළ යුක්තක් නැත. එවිට ස්වච්ඡන්දතාවක් නැත. ස්වච්ඡන්දතාව ප්‍රතික්ෂේප වූ විටෙක කිසිසේත් ම විමංසනයක් දැකිය නොහැකිය.

සත්ත්වයන් උපදින අභිජාති සයකි. සත්ත්වයා එම සයෙහි අනිවාර්යයෙන් ම ඉපදිය යුතු ය. එම අභිජාතීන් හි නොයෙක් අයුරින් සුව දුක් විඳිය යුතු ය. බාලයෝත් පණ්ඩිතයෝත් කල්ප 84,000 සසර සැරිසරා විමුක්තිය ලද යුතු ය.[67] යම් සේ නූල් බෝලයක් පර්වතයක හෝ, ගස් මුදුනක සිට දමා ගැසූ කල දිග හැරෙමින් නූලෙහි දිග ඇති තාක් ගොස් තව දුරටත් නොයයි ද සසර පැවැත්ම ද එසේ ම ය.[68] කල්ප 84,000 කින් සසර ගමන අවසන් වන අතර ඉන් මතු නැවත ඉපදීමක් නැත. සසර ගමන් කරන කාලය තුළ සිල් රැකීමෙන්, ව්‍රතයෙන්, තපසින් හෝ බඹසර විසීමෙන් ඇති ප්‍රයෝජනයක් නැත. කර්මයෙහි අඩු වැඩිවීමක් ද නැත. යමක් ද්‍රෝණයෙන් මැන ප්‍රමාණවත් කරන්නාක් මෙන් සැප දුක් දෙක කෙළවර වෙයි. සසර ගමනෙහි අඩු වැඩිවීමක් නැත. නැගීමක් බැසීමක් නැත.

මිනිසා සතු කිසි ම බලයක් නැත. වෙන්නට නියමිත දේ නියත වශයෙන් ම සිදු වේ. සිදු නොවන දේ කිසිදු විටෙක සිදු නොවේ. එබැවින් ඉටු නොවන දේ ගැනීමට උත්සාහකිරීම නිශ්ඵල දෙයකි. සියල්ල නියතියකට අනුව සිදුවන බැවින් පුද්ගල ශක්තියෙන් ඇති ඵලයක් නැත. කර්මය හා විපාකය ප්‍රතික්ෂේප කරන මොහු පුද්ගලයාට කිසිදු සරණක් නොමැති බවත් තමන්ට සහායවීමට හෝ අනුන්ට සහායවීමට මිනිසා සතු හැකියාවක් නොමැති බවත් සඳහන් කරයි. නිදහස හා වගකීම අර්ථවත් නොකරන අකිරියවාදයක් වන මෙම ඉගැන්වීම බුදුරජාණන්වහන්සේගේ දැඩි දෝෂ දර්ශනයට ලක් වී ඇත. මිනිසා මිථ්‍යා මගට යොමුකර විපතට හෙළන කෙමනක් හැටියට මෙම දර්ශනය සලකයි. මක්ඛලී නම් හිස් පුරුෂයා තරම් බොහෝ ජනයාට අනර්ථය, අහිත, දුක් පිණිස මග කියන

එබඳු පුද්ගලයකු නොදකිමි යි බුදුරජාණන්වහන්සේ වදාරා ඇත.[69] මක්ඛලිගෝසාලගේ නියතිවාදී ඉගැන්වීම තුළ මිනිසාට ස්වච්ඡන්දතාවක් නැත. වීමංසනයට ඉඩක් ද නැත. නිදහස හා කැමැත්ත අගය කොට නැත. පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය පිළිබඳ ඇසුරින් අගය කිරීමක් කර නැති බව පැහැදිලි වේ.

## අජිත කේසකම්බල

බෞද්ධ හා ජෛන මූලාශ්‍රවලට අනුව අජිත කේසකම්බල උච්ඡේදවාදියකු, නාස්තිකවාදියකු මෙන් ම භෞතිකවාදියකු ලෙස ද හැඳින්විය හැකිය. මොහු ඉතා අන්තගාමී දස වස්තුක මිථ්‍යා දෘෂ්ටියක් ඉදිරිපත් කරන ලදි.[70]

i. නත්ථි දින්නං - දුන් දෙයෙහි විපාක නැත.
ii. නත්ථි යිට්ඨං - යාගයෙහි විපාක නැත.
iii. නත්ථි හුතං - හෝමයෙහි විපාක නැත.
iv. නත්ථි සුකට දුක්ඛටානං කම්මානං ඵලං විපාකො - යහපත් හෝ අයහපත් කර්මයන්ගේ ඵල විපාක නැත.
v. නත්ථි අයං ලොකො - මෙලොවක් නැත.
vi. නත්ථි පරලෝකො - පරලොවක් නැත.
vii. නත්ථි මාතා - මවක් නැත.
viii. නත්ථි පිතා - පියෙක් නැත.
ix. නත්ථි සත්තා ඕපපාතිකා - ඕපපාතික සත්ත්වයෝ නැත.
x. නත්ථි ලෝකේ සමණබ්‍රාහ්මණා - ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් නැත.

ඔහුගේ දර්ශනය අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත්ය යනාදී වශයෙන් දස වස්තුව මිථ්‍යා දෘෂ්ටිය ඉදිරිපත් කිරීමෙන් පැහැදිලි වන්නේ හොඳ නරක ප්‍රතික්ෂේප කර ඇති බව මව පියා වශයෙන් කිසිවකු නැති බව දක්වීම යි.

අජිතට අනුව පුද්ගල ශරීරය සකස් වී ඇත්තේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයන් ගෙනි. එසේ සකස් වූ යම් විටෙක මේ ශරීරය කළුරිය කළේ නම් එවිට පඨවි ධාතුව බාහිර පඨවි ධාතු රැස කරා ගමන් කරයි. මෙසේ අනෙක් ධාතූන් ද බාහිර ලොව ඇති ධාතූන් සමග සමෝදානය වෙති.[71] ඇස් ආදී ඉන්ද්‍රියයන් අහසට යති. මළ සිරුර සොහොනට ගෙන යයි. දානය මෝඩයන් විසින් කරන ක්‍රියාවකි. පරලොවක් ඇත යනා දී ආස්තිකවාදය හිස් ප්‍රලාපයකි. බොරුවකි. අනුවණයෝ ද නුවණැත්තෝ ද කය බිඳීමෙන් විනාශ වෙති. නැවත ඉපදීමක් නැත.

අජිතගේ මෙම ඉගැන්වීම සමාජයට ඉතා අහිතකරය. හොඳ, නරක, කුසල, අකුසල, පිං, පව් ආදිය පිළිනොගැනීම නිසා මෙයින් සමාජයට සිදුවන හානිය අති මහත්ය. ඉතා අන්තගාමී ඉගැන්වීමක් වූ මෙය පුද්ගලයාගේ චින්තන නිදහසට මහත් බාධාකාරී වූ දර්ශනයකි. තම අභිමතය පරිදි ක්‍රියා කිරීමට පුද්ගලයාට කිසිදු ඉඩක් නොමැති අතර වීමංසනයට ද ඉඩක් නොලැබෙන දහමකි. සියල්ල නියතියකට අනුව සිදුවන්නේ යැයි කීමෙන් පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අගය නොකළ බව මනාව පැහැදිලි වෙයි.

## පකුධ කච්චායන

මෙතුමාගේ ඉගැන්වීම ද අකිරියවාදයකි. සත්ත්වයාත් ලෝකයත් සදාකාලිකය යන අදහසින් ශාස්වත දෘෂ්ටිය ප්‍රකාශ කළ අයෙකි. සත්ත්වයෙක් යනු සප්ත පදාර්ථයක සමවායකි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යන සප්ත පදාර්ථයන්ගෙන් සමන්විත සත්ත්වයා අවිනාශීය. නො වෙනස්වන සුළුය. සදාකාලිකය. ඉහත සඳහන් පදාර්ථ කිසිවකු විසින් කරන ලද්දේ නොවේ (අකටා) කිසිවකුගේ නිර්මාණයක් ද නොවේ (අනිම්මිතා) වෙනත් අයුරකින් මවනු ලැබූ දේ ද නොවේ (අනිම්මාතා) පර්වතයක් සේ ස්ථිරය (කූටට්ඨා) ඉන්ද්‍රඛීලයක් සේ ස්ථාවරය (එසිකට්ඨායිට්ඨිතා)[72] එබැවින් මරන්නෙක්, මරවන්නෙක් හෝ

මැරෙන්නෙක් නැත. සතකු මැරීම යනු එකට එකතුව පවතින ධාතු පුඤ්ජයක් අතුරින් ආයුධයක් යැවීම පමණි. එබැවින් පාපයක් සිදු නොවේ.[73] එමගින් පවත්නා වූ දෙයක විනාශයක් හෝ නො පවත්නා වූ යමක් අමුතුවෙන් හටගැනීමක් හෝ සිදු නොවෙයි (**සතො නත්ථි විනාසො අසතො නත්ථි සම්භවො**).

පකුධ කච්චායන විසින් ඉදිරිපත් කරන ලද මෙම දර්ශනය එක් අතකින් අකිරියවාදයකි. පුද්ගලයා කරන ක්‍රියාවෙහි ප්‍රතිඵලයක් නැත. පින් පව්, මෙලොව, පරලොව, හොඳ, නරක කියා දෙයක් නැත. පුරුෂ ශක්තියක්, බලයක්, පරාක්‍රමයක් නැත. උත්සාහය වීර්යය, ධෛර්යය වැනි දේ නිෂ්ඵලය. කරන ක්‍රියාවක වගකීම පුද්ගලයාට පැවරෙන්නේ ද නැත. එබැවින් මෙම දහම අධි භෞතිකවාදයක් ලෙස ද සඳහන් කළ හැකිය. පුද්ගලයාට ස්වාධීන ව, ස්වෛරී ව, ස්වතන්ත්‍ර ව, ස්වයං අභිමතයෙන් ක්‍රියා කිරීමට කිසිදු ඉඩක් නැත. සමකාලීන දාර්ශනිකයන් අතර පකුධ කච්චායනගේ මෙම ඉගැන්වීම වඩාත් ප්‍රචලිත වුවත් සමාජයට අහිතකර ඉගැන්වීමකි. පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අගය නොකළ මෙවැනි ඉගැන්වීම් තුළ කිසිසේත් ම විමංසනයක් අපේක්ෂා කළ නොහැක.

## සංජය බෙල්ලට්ඨිපුත්ත

සංජය බෙල්ලට්ඨිපුත්තතුමා ඉදිරිපත් කළ දර්ශනය සංශයවාදය යි. බෞද්ධ සූත්‍ර දේශනාවන්ට අනුව මෙතුමා ද බොහෝ ප්‍රචලිතව සිටි ශාස්තෘවරයෙකි. මොහුගේ ඉගැන්වීම අමරාවික්ඛෙපවාදය නම් වේ. බෞද්ධ සූත්‍රවල ඇතැම් තැනක සංජයගේ ඉගැන්වීම වාචාවික්ඛෙපවාදය යනුවෙන් හඳුන්වා ඇත.[74] තමා ප්‍රකාශ කරන දේ කිසිදු ස්ථාවරයක නොපිහිටා ප්‍රකාශ කරන බැවින් මෙතුමා වික්ෂේපවාදියකු ලෙස ප්‍රකටව ඇත. කිසිදු ස්ථාවරයක පිහිටා සිටීම ප්‍රතික්ෂේප කිරීම නිසා මොහු අඥාන පුද්ගලයකු ලෙස ද බෞද්ධ සූත්‍රවල හඳුන්වා ඇත. යම් යම් ප්‍රශ්න විචාල කල නිශ්චිත පිළිතුරක් නොදී ආඳකු සෙ ලිස්සා යන පිළිතුරු

දෙන නිසා මෙතුමා ගේ දර්ශනය අමරාවික්ඛේපවාදය ලෙස හැඳින්වේ. ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසූ විට ලබා දෙන පිළිතුරු පස් ආකාරය,[75]

i. **ඒවං තිපි මෙ නො** - මම මෙසේ යැයි නොකියමි.

ii. **තථාතිපි මෙ නො** - මම එසේ යැයි ද නොකියමි.

iii. **අඤ්ඤථා තිපි මෙ නො** - මම අන් ලෙසකින් යැයි ද නොකියමි.

iv. **නො තිපි මෙ නො** - මම නැතැයි ද නොකියමි.

v. **නො නො තිපි මෙ නො** - මම නැත්තේ නැතැයි යනුවෙන් ද නොකියමි.

මෙම ක්‍රම පහ හඳුන්වන්නේ පංච නිශේධන ක්‍රමය යන නමිනි. මෙය තත් කාලීන භාරතීය සමාජයේ පැවති තර්ක ක්‍රමයකි. සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙන පරිදි මොහු පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඉදිරිපත් වී නැත.[76]

i. පරලොවක් ඇත්ද?

ii. පරලොවක් නැත්ද?

iii. පරලොවක් ඇත්තේත් නැත්තේත් වේද?

iv. පරලොවක් ඇත්තේත් නොවේද? නැත්තේත් නොවේද?

v. ඕපපාතික සත්ත්වයෝ සිටිත්ද?

vi. ඕපපාතික සත්ත්වයෝ නොසිටිත්ද?

vii. ඕපපාතික සත්ත්වයෝ ඇත්තේත් නොවේද? නැත්තේත් නොවෙත්ද?

viii. පින් පව් කර්මඵල විපාක තිබේද?

ix. පින් පව් කර්මඵල විපාක නොමැතිද?

x. පින් පව් කර්මඵල විපාක ඇත්තේත් නැත්තේත් වේද?

xi. පින් පව් කර්මඵල විපාක ඇත්තේත් නොවේද? නැත්තේත් නොවේද?

vii. සත්ත්වයා මරණින් මතු වෙයිද?

viii. සත්ත්වයා මරණින් මතු නොවෙයිද?

ix. සත්ත්වයා මරණින් මතු වන්නේත් නොවෙන්නේත් වේද?

x. සත්ත්වයා මරණින් මතු නොවන්නේත් නොම නොවන්නේත් වේද?

සංජයගෙන් මෙම ප්‍රශ්න අසන ලද්දේ නම් ඔහු ඒවාට නිශ්චිත පිළිතුරක් නොදෙයි. පංච නිෂේධන ක්‍රමයෙන් එකක් ප්‍රකාශ කර ප්‍රශ්නයෙන් ලිස්සායාම ඔහුගේ ස්වභාවය යි. අසන අදාළ ප්‍රශ්නය, සහ වෙලාව අනුව සිතට එන පිළිතුරක් ලබා දීම ඔහුගේ ස්වභාවය විය. පරලොවක් ඇතැයි මට සිතුනොත් ඇතැයි කියමි. එහෙත් පරලොවක් ඇතැයි යනුවෙන් අදහසක් ද මා තුළ නැත. පරලොවක් නැතැයි කියා අදහසකුත් මා තුළ නැත. පරලොවක් ඇත්තේත් නැත්තේත් වේ යැයි කියා හෝ පරලොවක් නොමැත්තේත් නොම නැත්තේත් වේ යයි කියා හෝ අදහසකුත් මට නැත. යනාදී වශයෙන් පිළිතුරු ලබා දීම ඔහුගේ ස්වභාවය විය.

මේ අනුව පැහැදිලි වන්නේ මොහු කිසිදු ස්ථාවරයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කළ බව යි. එසේ නිශ්චිත පිළිතුරක් නොදීමට හේතු කිහිපයක් බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වෙයි. ඒ අනුව අමරාවික්ඛේපවාදීන් සිව් කොටසක් ගැන එහි සඳහන් වෙයි.

i. බොරු කීමේ පාපයට හසු වෙතැයි බියෙන් නිශ්චිත පිළිතුරක් නොදී සිටි පිරිස[77]
**(මුසාවාද භයා මුසාවාද පරිජේගුච්ඡා)**

ii. කිසියම් දෘෂ්ටියකට වැටේ යැයි බියෙන් නිශ්චිත පිළිතුරක් නොදී සිටි පිරිස[78]
**(උපාදාන භයා උපාදාන පරිජේගුච්ඡා)**

iii. වාද විවාදවලට එළඹීමට සිදුවෙතැයි බියෙන් පිළිතුරු නොදී සිටි පිරිස[79]
**(අනුයෝග භයා අනුයෝග පරිජේගුච්ඡා)**

iv. තමාගේ මෝඩ බව හෙළිවෙතැයි බියෙන් නිගමනවලට නොඑළඹි පිරිස[86]
(මන්දා මොමූ හත්තා)

දීඝනිකායේ බ්‍රහ්මජාල හා සාමඤ්ඤඵල සූත්‍රයන්හි සඳහන් වන පරිදි සිව් වැදෑරුම් වූ අමරාවික්ඛේපවාදීන් අතර අඥාන භාවය හේතු කොටගෙන නිශ්චිත පිළිතුරු දීමෙන් වැලකී සිටි අයෙකු ලෙස සංජය බෙල්ලට්ඨිපුත්ත සඳහන් වේ. එතුමාගේ ස්වභාවය අජාසත් රජතුමා බුදුරජාණන්වහන්සේට ප්‍රකාශ කලේ මෙසේයි.

තස්ස මයිහං භන්තේ එතදහොසි අයඤ්ච
ඉමෙසං සමණබ්‍රාහ්මණානං සබ්බ බාලෝ සබ්බ
මූළ්හෝ කතමහි නාම සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං
පුට්ඨො සමානො වික්ඛේපං බ්‍යාකරිස්සති[81]

බුද්ධ කාලීන භාරතීය දර්ශන ක්ෂේත්‍රයෙහි මෙවැනි ප්‍රශ්න විචාරීමේ අවස්ථා පැවති අතර දාර්ශනික අතින් ද යම් දියුණු මට්ටමක් පැවතුනි. එකල චින්තකයන් අතර පැවති තර්ක ක්‍රම කිහිපයක් මොහුගේ දර්ශනය තුළින් ප්‍රකට වෙයි. මෙම දර්ශනය යම් දුරකට තාර්කිකය. එහෙත් අන්තගාමීය. පුද්ගල නිදහස, ස්වච්ඡන්දතාව අගය නොකළ බව මෙම දර්ශනයෙන් ද පැහැදිලි වේ. විමංසනයට එතරම් ඉඩක් නොලැබුණු මෙතුමාගේ දර්ශනය පාරලෞකික සංකල්පයන්ගෙන් පිරි එකක් ලෙස සඳහන් කළ හැකිය. පංචනය ක්‍රමය යොදාගෙන කිසිදු ස්ථාවරයක නොපිහිටා විවෘත මනසකින් පාරලෞකික ප්‍රශ්න දෙස බැලීමට සංජය උත්සහ ගෙන ඇත. සංජයගේ මෙම ඉගැන්වීම භාරතීය දාර්ශනික චින්තනය නව මගකට යොමු කිරීමට සමත් විය. අසන ලද ප්‍රශ්නයට නිසි පිළිතුරක් ලබා නොදීම නිසා ඇති ප්‍රශ්නය අසන්නාට විමංසනයට ඉඩක් ලැබී ඇති බව පෙනේ. නමුත් ස්වාධීනව විවෘත මනසකින් සිතීමට හා විමසීමට සම්පූර්ණ නිදහස ලැබුණු බව සිතිය නොහැකි ය.

## නිගණ්ඨනාථපුත්ත

වර්ධමාන මහාවීර යන නමින් ජෛන ග්‍රන්ථවල හඳුන්වන්නේ මෙතුමා ය. ශරීරයට දැඩි දුක් දීමෙන් විමුක්තිය ලබා ගැනීම ජෛනයන්ගේ අභිප්‍රාය විය. මෙතුමා කිරියවාදියෙකි. මහාවීරතුමන්ගේ දර්ශනය ප්‍රධාන සංකල්ප කිහිපයක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය.

i. පරමඅවිහිංසාවාදය
ii. කර්මවාදය
iii. ස්‍යාද්වාදය
iv. ආත්මවාදය

යනාදි වශයෙනි. මෙතුමා හඳුන්වා දී ඇති පංච ශීලය සදාචාරවත් සමාජයක් ගොඩ නැගීම විෂයෙහි ඉතා වැදගත් වෙයි.

i. ප්‍රාණඝාත විරති
ii. අදින්නාදාන විරති
iii. අබ්‍රහ්මචරියා විරති
iv. මුසාවාද විරති
v. සර්ව විරති

පරම අවිහිංසාවාදය මත පදනම් වූ පළමුවන ශික්ෂාපදය සෑම දෙනා ම ආරක්ෂා කළ යුතු විය. කතා කරන විට දී පවා ඒකේන්ද්‍රිය ජීවීන් මරණයට පත් වේ යැයි බියෙන් මුඛවාඩම් බැඳගෙන කතා කිරීම ජෛනයන්ගේ සිරිත විය. ගස් වැල්වලට පවා ජීවයක් ඇතැයි ප්‍රකාශ කළ ඔවුහු ඒවා විනාශ කිරීම මහත් අකුසලයක් බව දැක්විය. මාර්ගයේ ගමන්කරන විට අතුගාමින් ගමන් කළේ පයට පෑගී ඉතා කුඩා ජීවීන් මරණයට පත්වේ යන හැඟීමෙනි.

ෂඩ් ශාස්තෘවරුන් අතර කර්මය පිළිගත් එක ම ශාස්තෘවරයා මෙතුමා යි. පුබ්බේකතහේතුවාදයක් වූ මොහුගේ කර්ම සංකල්පය බෞද්ධ කර්ම සංකල්පයට බෙහෙවින් වෙනස් විය. සියලු සැප

දුක් පූර්ව කර්ම හේතුවෙන් සිදු වේ යන විශ්වාසය පුබ්බේකතහේතු-වාදය යි. සියල්ල පූර්ව කර්මය විසින් ම තීරණය කරන්නේ නම් පුද්ගලයා අවබෝධයෙන් කරන ක්‍රියා නිෂ්ඵලය. මෙම අදහස නිසා ස්වච්ඡන්දතාව හා වීමංසනය ප්‍රතික්ෂේප වෙයි. මෙතුමා කර්මය හැඳින්වූයේ දණ්ඩ යන වචනයෙනි.

i. කාය දණ්ඩ

ii. වචී දණ්ඩ

iii. මනෝ දණ්ඩ

මහාවීරතුමා පිළිගත්තේ සෑම ක්‍රියාවකට ම මූලික වන්නේ ශරීරය බවයි. එබැවින් කාය දණ්ඩය ශ්‍රේෂ්ට වේ. කර්මක්‍ෂය කිරීමේ මාර්ගය ලෙස මොහු දක්වන්නේ අත්තකිලමථානුයෝගය යි. මේ තුළින් අතීත කර්මක්‍ෂය කළ හැකිය. වර්තමාන කර්මක්‍ෂය කිරීමට චතුයාම සංවරය ක්‍රියාවට නැංවිය යුතු ය.[22]

i. සබ්බවාරි වාරිතෝ

ii. සබ්බවාරි යුතෝ

iii. සබ්බවාරි ධුතෝ

iv. සබ්බවාරි ඵුටෝ

මෙතුමා කර්මය පිළිගත්තේ නොවෙනස්වන පදාර්ථයක් ලෙසිනි. එම පදාර්ථය කිසි ලෙසකිනුදු විපරිනාමයට බඳුන් නොවේ. සදාකාලිකය.

i. ජීව - ආත්මය

ii. අජීව - ආත්මයෙන් වෙන් වූ වස්තු

iii. ආශ්‍රව - කෙලෙස්

iv. බන්ධ - ආශ්‍රවයන්ගෙන් බැඳීම

v. සංවර - ආශ්‍රවයන් නැවැත්වීම

vi. නිර්ජර - ජන්මාන්තර කර්මයන් ක්‍ෂය කිරීම

vii. මෝක්‍ෂ - කේවලත්වයට පත්වීම

මහාවීරතුමා ද ස්‍යාද්වාදයක් ඉදිරිපත් කළේය. විශේෂයෙන් ම තත් කාලීන සමාජයේ පැවති තර්ක ක්‍රමයකි සප්තභංගීනය ක්‍රමය.[83]

i. **ස්‍යාත් අස්ති** - එසේ විය හැකිය
ii. **ස්‍යාත් නාස්ති** - එසේ නොවිය හැකිය
iii. **ස්‍යාත් අස්ති නාස්ති** - එසේ විය හැකි ද නොහැකි ද වේ.
iv. **ස්‍යාත් අවක්තව්‍යං** - එසේ වේ යැයි නොකිව හැකිය.
v. **ස්‍යාත් අස්ති අවක්තව්‍යං** - ඇත යන්නක් වේ යැයි නොකිව හැකිය.
vi. **ස්‍යාත් නාස්ති අවක්තව්‍යං** - නැත යන්නක් වේ යැයි නොකිව හැකිය.
vii. **ස්‍යාත් අස්තිච නාස්තිච අවක්තව්‍යං** - ඇත්තේත් වේ නැත්තේත් වේ යැයි නොකිව හැකිය.

යමෙක් ප්‍රශ්නයක් ඇසූ විට ඒ දෙස කෝණ සතකින් බලා ලිස්සා යාමේ පිළිතුරක් ලබාදීම මෙතුමා ගේ ක්‍රමය යි. මෙම සප්ත භංගිනය ක්‍රමය ජෛන තර්ක ශාස්ත්‍රය ලෙස හැඳින්වේ. එක් ප්‍රශ්නයක් දෙස දෘෂ්ටිකෝණ රාශියකින් බලා පිළිතුරු දෙන අතර කුමන පිළිතුරක් දුන්නත් එය සත්‍ය බව ඔවුහු පිළිගත්හ. ප්‍රශ්නය අසන පුද්ගලයාට නිදහසේ සිතන්නට ඉඩදීමක් මෙහි දී දැකිය නොහැකිය. ජෛන දහමට අනුව ඥානය දෙයාකාර ය.


i. **ප්‍රත්‍යක්ෂ ඥානය**
ii. **පරෝක්ෂ ඥානය**

ආත්මය ම පදනම් වී අනෙක් කිසිවක සහයෙන් තොරව ලබා ගන්නා වූ ඥානය ප්‍රත්‍යක්ෂ ඥානය යි. ආත්ම සාපේක්ෂ ඥානය, මුඛ ප්‍රත්‍යක්ෂ ඥානය යන් නම්වලින් හඳුන්වන්නේ ද ප්‍රත්‍යක්ෂ ඥානය යි.[84] ඉන්ද්‍රිය හා මනස ඇසුරුකොට ලබා ගන්නා වූ ඥානය, පරෝක්ෂ ඥානය යි. මෙය ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යනුවෙන් ද හැඳින්වේ.[85] පරෝක්ෂ ඥානය දෙවැදෑරුම් ය.[86]

i. මති

ii. ශ්‍රැති

ජෛනදහමේ ඥානය පිළිබඳ අදහස මෙසේ රූප සටහනකින් දැක්විය හැකිය.




ඉහත සඳහන් කරන ලද රූපසටහනට අනුව ජෛන ඥාන විභාගවාදය වඩාත් පැතුරුණු එකකි. තර්කය මගින් ඥානය ලබා ගැනීමේ මෙතරම් දියුණු තත්ත්වයක් ජෛන දහමේ පැවතීම තුළින් එහි ඇති දාර්ශනික වටිනාකම මනාව පැහැදිලි වෙයි. එහෙත් චින්තන නිදහසට සහ වීමංසනයට අවකාශයක් ජෛන දහමෙන් ද නොලැබේ. ඥානය ලබා ගන්නා ඥාන මාර්ගයක් ලෙස තර්කය අගය කොට ඇති ජෛන දහම හොඳ නරක ආදී ක්‍රියාවෙහි වගකීම පුද්ගලයාට ම ලබා දෙයි. තමා කරන ලද ක්‍රියාවේ වගකීම තමා විසින් ම භාරගත යුතුය යන අදහස ජෛන කර්ම සංකල්පය තුළින් ලබා දෙයි. එහෙත් පුද්ගලයාට නිදහස් ව, නිවහල් ව, ස්වෛරී ව, ස්වතන්ත්‍ර ව, ක්‍රියා කිරීමේ හැකියාව ජෛනදහමින් ලබා දී නැත.

අනෙක් අතට ප්‍රශ්න කිරීමට හා වීමංසනයට ජෛනදහමේ අවකාශය ලබා නොදුන් අවස්ථා බොහෝ දක්නට ඇත. මහාවීරතුමා

සියල්ල දත් සර්වඥයකු ලෙස ජෛනදහම පිළිගනී. එබැවින් එතුමා පිළිබඳ ව සැකකිරීමට හෝ විමසීමට ශ්‍රාවකයාට අවකාශයක් ලබා දී නැත. එතුමාගේ සර්වඥත්වය කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව සියලු දෙනා ම පිළිගත යුතු විය.[87]

ජෛන කර්ම සංකල්පය පිළිබඳ බුදුරජාණන්වහන්සේගේ ආකල්පය මීට වඩා වෙනස් ස්වරූපයක් ගනී. පෙර කරන ලද කර්ම සමාදානය තුළින් සිඳ දැමිය හැකිය යන්න ජෛනයන්ගේ අදහස යි. මේ පිළිබඳ ව විචාරය කරන බුදුරජාණන්වහන්සේ තමන් පෙර කරන ලද දුක් ගැන තමා දන්නවා දැයි ප්‍රශ්න කරයි. තමන් නොදන්නා බවත් නිගණ්ඨනාථපුත්ත සර්වඥ නිසාත්, එතුමා කියන නිසාත්, එතුමාගේ කීම බොරුවිය නොහැකි නිසාත් පිළිගන්නා බව දක්වා ඇත.[88] මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ජෛනදහම ශාස්තෘත්වය පිළිබඳ විමසීමට කිසිදු ඉඩක් ලබා දී නොමැති බව යි.

## පරිබ්‍රාජක

පරිබ්‍රාජක (පරි+වජ+ති) තැන තැන ඇවිදීම පරිබ්‍රාජකයා ගේ ලක්‍ෂණයයි.[89] පරිබ්‍රාජක යන්න විවරණය කරන අටුවාව "පරිසමන්තෝ බජතීති පරිබ්‍රාජකෝ" තැන තැන ඇවිදීම නිසා පරිබ්‍රාජක වූ බව සඳහන් කරයි. P.T.S. විවරණයට අනුව Paribbajaka (From Pari + Vraj) a wandering man, a wanderer, wandering religious mendicant යනුවෙන් දක්වා ඇත. තැන තැන ඇවිදින්නා, තැන තැන ඇවිදින භික්‍ෂුව පරිබ්‍රාජකයෙක් ලෙස හඳුන්වා ඇත.[90] පරිබ්‍රාජකයෝ තැනින් තැන ඇවිදිමින් වාද විවාද කිරීම ප්‍රධාන ආගමිකකාර්යය කරගත් පිරිසකි. වාද විවාද මගින් තම තමන්ගේ මතය ජනතාව අතර ප්‍රචාරය කළහ. වාදය වඩාත් ප්‍රියකළ පරිබ්‍රාජකයෝ තර්කය ප්‍රධාන ඥාන මාර්ගය කර ගත්හ. ඒ තුළින් යම් දුරකට නිදහසේ සිතන්නට පෙළඹුණු බව පෙනේ. චින්තන නිදහස සහ විමංසනය යම් දුරකට ගරු කළ ඔවුන් වාදයෙන් ජය ගැනීම උසස් කොට සලකා ඇත. ලෝකය සාස්වත ද, අසාස්වත ද ලෝකය අන්තවත් ද, අනන්තවත් ද, ජීවය හා ශරීරය එකක් ද,

මරණින් මතු ආත්මය පවතින්නේද නැද්ද යනාදී කරුණු පිළිබඳ ව නිතර ම වාද විවාද කළහ. එවැනි පාරභෞතික ප්‍රශ්න කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ ඔවුන් ඒ පිළිබඳ ව වාද විවාද කරමින් ඈත තැන ඇවිදිමින් දිවි ගෙවූහ.

පරිබ්‍රාජකයෝ තමන්ගේ දාර්ශනික මතවාදයන් පිළිබඳ බුදුරජාණන්වහන්සේ සමඟ ද වාද විවාද කළහ. උත්තිය පරිබ්‍රාජකයා දස අව්‍යාකෘත ප්‍රශ්න සම්බන්ධයෙන් බුදුරජාණන්වහන්සේගේ ස්ථාවරය විමසා සිටියහ.[91] කෝකනද පරිබ්‍රාජකයා ද ආනන්ද තෙරුන්ගෙන් දස අව්‍යාකෘත ප්‍රශ්න පිළිබඳ ව බුදුරජාණන්-වහන්සේගේ මතය විමසා සිටියහ.[92] මෙවැනි පාරභෞතික ප්‍රශ්න සම්බන්ධයෙන් බොහෝ පරිබ්‍රාජකයන් විමර්ශනය කළ බව මේ තුළින් පැහැදිලි වේ. බොහෝ විට පරිබ්‍රාජකයන් විමංසනය ගරු කළ අතර සමහර අවස්ථාවල ශ්‍රාවකයන් බවට පත්වූහ. පෝතලී පුත්‍ර පරිබ්‍රාජකයා සමිද්ධි නම් නවක භික්ෂුවගෙන් කර්මඵල පිළිබඳ බුදුන්ගේ ස්ථාවරය විමසා සිටියහ.[93] මහා වච්ඡගොත්ත පරිබ්‍රාජකයා ද කුසලාකුසල පිළිබඳ බුදුන්ගේ ස්ථාවරය විමසා සිටියහ.[94] සමහර පරිබ්‍රාජකයන් මෙසේ ප්‍රශ්න විමසා ඒවාට ලැබුණු පිළිතුරු නිසා බුදුන් කෙරෙහි පැහැදී බෞද්ධ ශ්‍රාවකයන් බවට පත්විය. අග්ගිවච්ඡ ගොත්ත පිරිවැජියා බුදුරජාණන්වහන්සේ සමඟ කරන ලද සාකච්ඡාවෙන් පැහැදී බුදුන් සරණ ගියේය.[95] දීඝනඛ, මණ්ඩිස්ස, ජාලිය, පොට්ඨපාද, අජිත, සුභද්ද ආදී අය බුදුන් සරණ ගොස් පැවිදි විය. මෝලිය, සීවක, චූලසකුලුදායි, මාගන්ධිය, සභිය, වරධරා, අන්නභාර, සුභද්‍ර, සංජය සන්දක, සුසීම වැනි අය බුද්ධ කාලයේ දී වඩාත් ප්‍රචලිත වී ඇත.

පරිබ්‍රාජකයන්ට නිශ්චිත වශයෙන් දර්ශනයක් නොවීය. ඔවුන් විවිධාකාරයේ පාරභෞතික ප්‍රශ්නවලට විසඳුම් සෙවීය. මාගන්දිය සූත්‍ර අට්ඨකථාවේ පරිබ්‍රාජක දර්ශනය ඉතා කෙටියෙන් විස්තර කර ඇත. ඇස වැඩිය යුත්තකි, නොදුටු රූප දැකිය යුතු ය. දුටු රූප අත්හැර දැමිය යුතු ය. මේ ආදී වශයෙන් කණ, නාසය, දිව, ශරීරය යන පංචස්කන්ධය පිළිබඳ විග්‍රහයක් දක්නට ලැබේ.[96] සමස්තයක

වශයෙන් ගෙන බලනවිට පරිබ්‍රාජකයන් සාම්ප්‍රදායික චින්තනයෙන බැහැර වූ පිරිසකි. නිදහස් මතධාරී පිරිසක් වූ ඔවුන් චින්තනය හා විමංසනය උසස්කොට සලකන ලදි. විවිධ ප්‍රශ්නවලට විසඳුම් සොයමින් සංචාරක ජීවිතයක් ගතකළ ශ්‍රමණ පිරිසකි. සමකාලීන සාමයික චින්තනය නව මගකට යොමු කිරීමට පරිබ්‍රාජකයන් සමත් විය.

## අචේලක

ශ්‍රමණ සම්ප්‍රදායට අයත් වස්ත්‍ර නොදැරූ පිරිස අචේලක නම් විය. අංගුත්තර නිකාය අට්ඨකථාව අනුව (**අචෙලකෝති නිච්චේලෝ නග්ගෝ**) යනුවෙන් ඒ බව සඳහන් වෙයි. අචේලකයෝ උග්‍ර අත්තකිලමථානු යෝගීහුය. කොළ, දළු, මුල් ආදිය ආහාරයට ගත් මොවුහු ගස්වල පොතුවලින් සාදන ලද වස්ත්‍ර දරන ලදි. අජව්‍රත, ගෝව්‍රත, කුක්කුරව්‍රත, සුනඛව්‍රත වැනි දැඩි ව්‍රත සමාදානය අගය කළහ. බල්ලන්, එළුවන් මෙන් සතර ගාතයෙන් ඇවිදිමින්, බිම දැමූ ආහාර අනුභව කරමින්, අළු ගොඩක ලගිමින්, සුනඛ ව්‍රතය රැකි අචේලක සාධුවරයකු ලෙස කෝරක්ඛත්තිය හඳුන්වා දිය හැකිය.

අචේලකයන් අනුගමනය කරන ලද එකම ධර්ම මාර්ගය වූයේ ව්‍රත සමාදානය යි. එමගින් විමුක්තිය සෙවීම අචේලකයන්ගේ පරම නිෂ්ටාව විය. නිදහසේ, ස්වාධීනව, සිතා මතා ක්‍රියා කළ ඔවුන් සංචාරක දිවියක් ගත කළහ. තත්කාලීන සාමයික පරිසරය තුළ නිදහස් චින්තනය ගරු කළ ශ්‍රමණ කොට්ඨාසයක් ලෙස අචේලකයන් හැඳින්වීම යුක්ති යුක්තය.

## ජටිල

සමකාලීන ආගමික පරිසරයේ සිටි ශ්‍රමණ සම්ප්‍රදායට අයත් තවත් ආගමික කණ්ඩායමකි ජටිලයෝ. හිසෙහි ජටාවක් බැඳීම ඔවුන්ගේ මූලික ලක්‍ෂණය යි. **ජටාධාරිනෝ තාපසා** යන අපදාන පාළි පාඨයෙන් ඒ බව පැහැදිලි වෙයි.[97] ගිනි දෙවියන් පිදීම ප්‍රමුඛතම ආගමික කාර්යය විය. යාග කිරීම හා උදක පාරිශුද්ධිය ද ඔවුන්ගේ ආගමික කාර්යයන්ට අයත් විය.[98] ජටිලයන් පිළිබඳ බුදුන්ගේ

ආකල්පය ධම්මපදයේ මෙසේ සඳහන් වෙයි. ජටාවෙන් සහ දිවිසමින් කළ සළුවෙන් යුක්ත වූ පමණින් ජටිලයන් නොවන බව උන්වහන්සේ අවධාරණය කළහ.[99] එවැනි දේ තුළින් බාහිර පවිත්‍රතාව ඇතිවන නමුත් අභ්‍යන්තරය කෙලෙස්වලින් ගහණය යන්න බුද්ධදේශනාව යි. මොවුන් ද සාම්ප්‍රදායිකත්වයෙන් මිදී නව මගකට යොමු වීමට උත්සාහ ගත් පිරිසකි. වාද විවාද කරමින් ඒ ඒ තැන ඇවිදිමින් කටයුතු කළ මොවුන් ද නිදහස් චින්තනය යම් දුරකට ගරු කළ පිරිසකි.

## අනුභූතිවාදී චින්තකයෝ

මිනිසා සහ ලෝකය පිළිබඳ යථාර්ථය හෙවත් යථාර්තවාදී ඥානය ලබා ගත හැක්කේ අනුභූතිය මගින් යැයි ප්‍රකාශ කළ පිරිස අනුභූතිවාදීන් ලෙස දැක්වේ. ඥානය ලබාගත හැක්කේ ඉන්ද්‍රියබද්ධ මනසින් පමණක් ය යන විශ්වාසය ඔවුන් තුළ විය. තර්කය අනුව අනුමාන කර ඥානය ලබා ගැනීම මොවුන්ගේ විශිෂ්ට ලක්‍ෂණය යි. මධ්‍යකාලීන හා පශ්චාත් කාලීන උපනිෂද් චින්තකයෝ මෙ ගණයට ඇතුලත් වෙති. ශ්‍රැති ග්‍රන්ථ පහත් කොට සැලකූ මොවුහු ඒවා හැඳින්වීමට අපරාවිද්‍යා යන නම යෙදූහ.[100] මොවුන්ගේ ඥාන මාර්ගය යෝගී ප්‍රත්‍යක්‍ෂය විය. ප්‍රත්‍යක්‍ෂය කොටස් දෙකකි.

i. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය
ii. අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය

ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ෂඩ් ඉන්ද්‍රියන් මගින් දැනුම හෙවත් ඥානය ලබා ගැනීම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය නම් වේ. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ මජ්ඣිම නිකායේ, මධුපිණ්ඩික සූත්‍රයේ මෙසේ සඳහන් වේ. ඇසත්, රූපයත් අතර සම්බන්ධතාවෙන් මනසින් අරමුණු ස්පර්ශ කිරීම සිදු වේ. ඒ ස්පර්ශය ප්‍රත්‍යය කර ගෙන සුව-දුක් වශයෙන් වින්දන හැඩ ගැසෙයි [101] යනාදි වශයෙන් දැක්වේ. මේ ආකාරයෙන් ඉන්ද්‍රියයන් හයෙන් ම ඥානය ලබා ගැනීම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය යි.

ධ්‍යාන සමාපත්තීන්ට සම වැද අභිඥාවන් උපදවා ඒ ඇසුරු කොට ලබන්නා වූ ඥානය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය නම් වේ. මෙය ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය ඉක්ම වූ තත්ත්වයකි. එබැවින් අතීන්ද්‍රිය යැයි ව්‍යවහාර කරනු ලැබේ. අනුභූතිවාදී චින්තකයෝ මෙම ක්‍රම දෙක මගින් ඥානය ලබා ගැනීමට උත්සාහ කරන ලද පිරිසකි. තත්කාලීන සමාජ පරිසරය තුළ සමහර ආගමිකයන් ඉන්ද්‍රිය හා අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය ගරුකොට සැලකූහ. මෙසේ කටයුතු කළ පිරිස අනුභූතිවාදීන් ලෙස හැඳින්විය හැකිය.

# 3

# නිදහස් චින්තනය හා විමංසනය පිළිබඳ දේවවාදී ආගමික ඉගැන්වීම්

මිනිසා සහජයෙන් ම සමාජ සත්ත්වයෙකි. විවිධ සමාජ සංස්ථාවන් ඔහු වටා ගොඩනැගී ඇත. මිනිසා වටා ගොඩනැගුණු සමාජ සංස්ථා (Social Institutions) අතරින් ආගමික සංස්ථාව මිනිසා තරම් ම පැරණි යැයි කිව හැකිය. ආගම යන වචනය වෙනුවට ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන්නේ Religion යන වචනය යි. මෙය ලතින් භාෂාවේ Rel(i)gio නම් වචනයෙන් බිඳී ආවකි. එයින් අදහස් වන්නේ එකට බැඳීම, සංයෝග වීම, වැනි අරුත් ය. ඕනෑ ම ජන කොටසකට ම, ශිෂ්ටාචාරයකට ම ආගමක් තිබූ බව පැරණි ආගම් ඉතිහාසය දෙස බලන විට පැහැදිලි වේ. ආගම තරම් පැතුරුණු (Widespread) අර්ථවත් (Significant) හා චමත්කාරජනක (Impressive) දෙයක් ලොව තවත් නැති තරම් ය.[1] මිනිසා පරිසරයේ ම ජීවත්වන පාරිසරික සත්ත්වයෙකි. තමා අවට පරිසරයේ බලපෑමට යටත් වන්නෙකි. එම නිසා ආදි කාලයේ පටන් ම මිනිසා තුළ පැවති මානසික තත්ත්වයක් නම් තමා කිසියම් බලවේගයකින් පාලනය වනවා යන්න යි. ඊට අමතරව ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වය දෙස බැලූ මිනිසාට එම වස්තූන් අවබෝධ කර ගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිසා එම

වස්තූන්ට වැඳුම් පිදුම් කිරීමට පෙළඹිණි. මේ අනුව ආගම බිහි වූ බව විශ්වාස කෙරේ. බිය නැමති චිත්තවේගය ආගමේ සම්භවයට (Origin) ප්‍රධාන වශයෙන් හේතු විය.

> බහුංවෙ සරණං යන්ති
> පබ්බතානි වනානිච
> ආරාම රුක්ඛ චේතියානි
> මනුස්සා භය තජ්ජිතා[2]

බියෙන් තැතිගත් මිනිස්සු ගස් ගල් වන පර්වතවලට වන්දනාමාන කරන බව, පිහිට ප්‍රාර්ථනා කරන බව මෙයින් අර්ථවත් වේ. ස්වභාවික වස්තූන්ගෙන් ඔවුනට පැමිණිය හැකි උවදුරුවලින් මිදී මෙලොව පරලොව සැප විඳීම සඳහා ආගමික විශ්වාසයන්ට නැඹුරු වී ඇත.

මෙලෙස ස්වභාව ධර්මය දේවත්වයෙන් පිදීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් බහු දේවවාදයක් (Polytheism) ඇති විය. කලක් යන විට බොහෝ දෙවිවරුන් ඇදහීම වෙනුවට සර්ව බලධාරී (Omnipotence) එක ම දෙවි කෙනෙක් (One and only God) ඇදහීමට පෙළඹිණි. ඒ වනාහි ඒකදේවවාදය යි (Monotheism). මෙසේ එක ම දෙවි කෙනෙක් පිළිබඳ විශ්වාසය මත ගොඩනැගුණු ආගම් දේවවාදී ආගම් (Theistic Religions) ලෙස හැඳින්විය හැකිය. ඉහත දැක් වූ ආකාරයට ලෝක ඉතිහාසයේ නොයෙක් හේතූන් පදනම් කොටගෙන විවිධාකාර ආගම් බිහි වූ බව පෙනේ. එම ආගම්,

i. දේවවාදී ආගම් (Theistic Religions)
ii. අදේවවාදී ආගම් (Atheistic Religions)

වශයෙන් කොටස්වලට බෙදිය හැකිය.[3] දේවවාදී ආගම් යනු ලොව ඇති පරම සත්‍ය (Absolute truth) වන සර්ව බලධාරී එකම දෙවියන්වහන්සේ යන කේන්ද්‍රීය සංකල්පය මත ගොඩනැගුණු ආගම් ය. මෙම එක ම දෙවියන්වහන්සේ වනාහි මිනිසා ඇතුළු සමස්ත ලෝකය මවා පාලනය කරන සර්වබලධාරී (Omnipotence)

සර්වඥ (Omniscience) සර්වතෝභද්‍ර (All goodness) සර්වත්‍රවර්ති (Omnipresence) උතුමෙකි. එසේ එක ම දෙවි කෙනකු පිළිබඳ විශ්වාසය මත ගොඩනැගුණු දේවවාදී ආගම් කිහිපයක් දැකිය හැකි ය.

i. සරථුස්ත්‍ර ආගම
ii. යුදෙව් ආගම
iii. ක්‍රිස්තියානි ආගම
iv. ඉස්ලාම් ආගම වශයෙනි.

ආගම අර්ථවත් දේව වාක්‍යය සේ විශ්වාස කරන ලද නමුත් ශ්‍රැතිවාදයත් ඊශ්වර සංකල්පයත් නිසා මිනිස් චින්තනය හා සම්බන්ධ වී තිබේ. දේව භාෂිතය ශ්‍රැතියෙහි ඇතුලත් ව ඇතැයි පිළිගැනීම දේවවාදී ආගම්වල දැකිය හැකි ලක්‍ෂණයකි. සර්වබලධාරී දෙවියන්ගේ අධිපතීත්වයට හා ශ්‍රැතියට මූලිකත්වයක් ලැබීම නිසා බොහෝ දේවවාදී ආගම්වල මිනිසාගේ නිදහස් චින්තනයට හා විමංසනයට ඉඩක් ලැබී නැත. විචාරයට, විවේචනයට හා ප්‍රශ්න කිරීමට කිසිදු ඉඩක් නැති අවිචාරවත් අන්ධ භක්තිය (Blind faith) මේ සඳහා හේතු වී ඇත. ඉහත සඳහන් කරන ලද දේවවාදී ආගම් හතරෙහි කෙතෙක් දුරට චින්තන නිදහසට හා විමංසනයට ඉඩක් ලැබී ඇත් ද යන්න විමසා බැලීම මෙහි දී අධ්‍යයනය කෙරේ.

## සරථුස්ත්‍ර ආගම

පැරණි ඉරාණයේ තිබූ ප්‍රධානතම ආගම වූයේ සරථුස්ත්‍ර ආගම යි. මෙම ආගමේ නිර්මාතෘවරයා (Founder) වූයේ සරථුස්ත්‍රතුමා ය. සරථුස්ත්‍රාගමික විශ්වාසයට අනුව මෙතුමා වාසය කර ඇත්තේ ක්‍රි. පූ. 1000 දී පමණ ය.[3] එහෙත් දැනට පිළිගත් මතය වන්නේ එතුමා ක්‍රි. පූ. 7 වන ශත වර්ෂයේ දී බටහිර ඉරාණයේ උපත ලැබූවෙක් ය යන්න යි.[4] දොග්දෝවා මව වූ අතර පෞරුෂාස්ප පියා විය. මස්දා ඇදහිල්ලෙ හි සඳහන් වන පරිදි සරථුස්ත්‍රතුමා අහුරමස්දා නමැති සර්වඥ සර්වත්‍රවර්තී දෙවියන් විසින් සිය ධර්ම දූතයා වශයෙන් තෝරා ගෙන දෙව්ලොව සිට මිනිස් ලොවට

එවන ලද්දේය. මුල් කාලයේ දී මෙතුමාට තම ධර්මය දේශනා කිරීමේ දී විවිධ අපහසුතාවලට මුහුණ දීමට සිදුවිය. මුල් කාලයේ දී මස්දා ධර්මය පිළිගත්තේ ඔහුගේ මස්සිනා කෙනෙක් පමණි. මායාකාරයෙකැ යි චෝදනා කර සිරගත කළ මෙතුමා සිරගෙදර දී විවිධ ප්‍රාතිහාර්යය දැක්වී ය. ඒවා දුටු විෂ්තාෂ්ප රජු ඒ කෙරෙහි පැහැදී මස්දා ධර්මය වැළඳ ගත් අතර රජු අනුගමනය කළ රටවැසියෝ ද මස්දා ධර්මය වැළඳ ගත්හ. සර්වබලධාරී ප්‍රධාන දෙවිකෙනකු වූ අහුරමස්දා ඇදහීමට ප්‍රිය කළ සියල්ලෝ ම මස්දා ධර්මය පිළිගත්තේය. දේශනයෙහි පමණක් නොව සටන් මගින් ද සිය දහම ප්‍රචලිත කිරීමට ඔවුන් ක්‍රියා කර තිබේ.

## අහුරමස්දා

සරථුස්ත්‍ර දහමේ එන ප්‍රධානතම ඉගැන්වීම වන්නේ අහුරමස්දා පිළිබඳ සංකල්පය යි. එතුමා එක ම පරම දෙවියා ය. ඒ අනුව සරථුස්ත්‍ර දහම ඒකදේවවාදී දාර්ශනික පදනමක් මත ගොඩනැගුණක් බව පැහැදිලි ය. එතුමා හැඳින්වීම සඳහා සර්වඥ, සර්වතෝභද්‍ර, සර්වව්‍යාපී, සර්වදර්ශී, සර්වත්‍රවර්තී යන වචන භාවිත කොට තිබේ. අහුරමස්දාට ප්‍රේම කළ යුතු ය. අහුරමස්දා නැතිව අහුරමස්දාගෙන් පරිබාහිරව, අහුරමස්දාගේ දැනීමෙන් තොරව, දැකීමෙන් තොරව ලොවෙහි කිසිවක් සිදු නොවේ. ලොවෙහි ශ්‍රේෂ්ඨතමයා උන්වහන්සේය. උන්වහන්සේට වඩා වැඩි මහල්ලෙක් හෝ ශ්‍රේෂ්ඨයෙක් විශ්වයේ නැත. උන්වහන්සේ සදාකාලික ය.

අතිමානුෂික බලධාරී වූ උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වූ මහා ආත්මයාණෝ ය. සකල විශ්වයෙහි නිර්මාපකයා ද උන්වහන්සේ ය. ඉර, හඳ, තාරකා, අඳුර, එළිය, දිවා, රෑ, පැමිණෙන්නේ උන්වහන්සේ වෙතිනි. ලොව සියල්ල සිදුවන්නේ උන්වහන්සේගේ කැමැත්ත පරිද්දෙනි. මනුෂ්‍යයා වෙත ජීවිතය, රූපය, සහ ආහාරය ද ලබාදෙනුයේ උන්වහන්සේ විසිනි.[6] බාහිර ලෝකය පාලනය කරන පරම බලධාරියා අහුරමස්දා ය. ත්‍යාගදායකයා මෙන් ම දඬුවම් දායකයා ද වන්නේ මෙතුමා ය. එම එක ම දෙවියන් විශ්වාස කිරීම, අනුගමනය කිරීම තුළින් සදාකාලික ස්වර්ගයේ

දොරටු විවර කරගත හැකිය යන්න සරථුස්ත්‍ර දහමේ විශ්වාසය යි. එම දෙවියන් පිළිබඳ ව කිසිවකුට විමසීමට අයිතියක් නොවීය. අසුරමස්දා විසින් ප්‍රකාශ කරන ලද සියල්ල විමසීමකින් තොරව පිළිගත යුතු විය.

## විශ්ව නිර්මාණය

විශ්වය පිළිබඳ ඉගැන්වීම ද දේවාවාදී පදනමක් මත සකස් වී ඇත. විශ්වය ත්, ඊට අයත් සියලු ම වස්තූන් මෙන් ම පුද්ගලයන් ද අහුරමස්දාගේ ම තීරණය මත නිර්මාණය කර ඇත. ආත්මය (Self) භෞතික සිරුර (Physical Body) සහ ප්‍රාණය (Vital Energy) යන කරුණු එක් කරමින් පූර්ණ මිනිසකු බිහි කළේය.[7] සදාචාරමය වගකීම හොඳ, නරක දෙකින් එකක් තෝරා ගැනීමේ නිදහස මිනිසාට ලැබෙන්නේ ආත්මය මගිනි. බුද්ධිය හෙවත් ප්‍රඥාව (Wisdom) චින්තනය (Thought) වචනය (Word) ක්‍රියාව (Deed) අධිෂ්ඨානය (Will) කැමැත්ත (Desire) ආදී අංශයන් පිළිබඳ ව ද සාකච්ඡා කර ඇත.

මිනිසාගේ මරණින් මතු ජීවිතය තීරණය කිරීමේ වගකීම ඇත්තේ ද අහුරමස්දා දෙවියන්වහන්සේටය. මරණින් මතු ජීවිතය කොටස් තුනකින් යුක්ත ය.

i. සදාතනික ස්වර්ගය
ii. නිරාගත ජීවිතය
iii. අන්තරාභවය

ධාර්මිකව ජීවත් වූ අය අහුරමස්දා සමීපයටත්, පව්කාරයෝ නිරයටත්, හොඳ නරක සම සමව ඇත්තෝ, අන්තරාභවයටත්, ගමන් කරති. එය Hamisgavan යනුවෙන් දක්වා ඇත. මෙහි දී අපට වැදගත් වන්නේ නිරාගත ජීවිතය පිළිබඳ සාකච්ඡා කිරීම යි. සරථුස්ත්‍ර දහමට අනුව නිරාගත ජීවිතය සදාකාලික වූවක් නොවේ. අපාගත වීමෙන් වසර 12000 කින් පසු අවසාන විනිශ්චය දිනයක් එළඹේ. එම දිනයේ දී නිරාගත වූ අයගේ ආත්මය ද නැවත

උත්ථානය වෙයි. ආත්ම සියල්ල අහුරමස්දා සමීපයට කැඳවන අතර එහි දී අහුරමස්දාගේ අභිමතය පරිදි ශෝධිත ආත්ම (Purified Souls) තත්ත්වයට පත් වී සැනසුම ලබති. සියල්ලන්ට ම අහුරමස්දාගේ සමීපයට ගමන් කළ හැකි ය. මෙයින් පැහැදිලි වන්නේ පාපය යනු තාවකාලික එකක් ය යන්න යි. සරටුස්ත්‍ර දහමට අනුව මරණින් මතු ජීවිතය තීරණය කරනු ලබන්නේ ද අහුරමස්දා විසිනි. සාමාන්‍ය ජනතාවට තීරණය කිරීමේ අයිතියක් හිමි නොවී ය. ඒ තුළින් පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය බාහිර බලවේගයකට පාවා දී ඇත.

සදාචාරාත්මක අංශය ගැන කතා කරන සරටුස්ත්‍ර දහම හොඳ නරක යන සංකල්ප දෙක පදනම් කරගෙන සදාචාරය ගොඩනැගීමට උත්සහ ගෙන ඇත. නමුත් මෙහි ඇති ප්‍රශ්නය වන්නේ පුද්ගලයාගේ චින්තන නිදහසට හා විමංසනයට ඉඩක් ලැබී තිබේ ද යන්න යි. අහුරමස්දා දෙවියන් විසින් ම මිනිසා නිර්මාණය කොට පාලනය කරන්නේ නම් මිනිසාට ස්වාධීනව ස්වතන්ත්‍රව ක්‍රියා කළ හැකිද? යන ප්‍රශ්න මතු වේ. උපතේ සිට මරණය දක්වා සෑම ක්‍රියාවක් ම තීරණය කරන්නේ අහුරමස්දා නමැති දෙවියන්වහන්සේය. මේ පදනම මත සරටුස්ත්‍ර දහම තුළ ස්වඡන්දතාවට හා විමංසනයට ඉඩක් ලැබේ ද යන ගැටළුව නිරාකරණය කරගත යුතු ය. අහුරමස්දා කේන්ද්‍රකොටගත් දේව නිර්මාණවාදී පරිසරයක් තුළ, මිනිසාට ස්වච්ඡන්දතාවක් හෙවත් තම සිතැඟි පරිදි තම ක්‍රියාවන් තෝරා බේරාගෙන ක්‍රියාත්මක කිරීමේ හැකියාවක්, නිදහසක් තිබේ ද? යන ප්‍රශ්නයට සරටුස්ත්‍ර දහම දෙන පිළිතුර වන්නේ මිනිසා දිව්‍යමය පූර්ව නියතියකට (Divine Pre-determination) යටත් නොවන බවය. අහුරමස්දා දෙවියන්වහන්සේ මිනිසා මවා පාලනය කරන නමුත් මිනිසාට පූර්ණ වශයෙන් ස්වච්ඡන්දතාවට හා විමංසනයට ඉඩක් ලැබේ. මිනිසා යනු හොඳ පිළිබඳව පරමත්වය නියෝජනය කරන අහුරමස්දාගේ නියෝජිතයා ය. මිනිසාට තෝරා ගැනීමේ නිදහස දෙයාකාරයකින් උරුම වී ඇත.

i. යහපත හෙවත් හොඳ ක්‍රියා සිදුකොට ස්වර්ගයට යාම
ii. නරක හෙවත් පාප ක්‍රියා සිදුකොට මරණින් මතු නිරාගත වීම

යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගැනීමේ අයිතිය උරුම වී ඇත. ඔහුට ඒ සඳහා පූර්ණ නිදහසක් හා ස්වච්ඡන්දතාවක් ඇත.

ලොව බොහෝ ආගම්වල සේ ම සරදුස්ත්‍ර දහමේ ද විමංසනයට සම්පූර්ණ ඉඩක් නොලැබී ඇත්තේ නිර්මාණවාදය නිසා ය. ඉහත සඳහන් විකල්ප දෙක පවා දෙවියන්වහන්සේගේ කැමැත්තට යටත් ය. එබැවින් පූර්ණ නිදහසක් හිමි වූවා යැයි පිළිගත නොහැකිය. අනෙක් දේවවාදී ආගම් සමඟ සංසන්දනාත්මක ව බලන විට සරදුස්ත්‍ර දහමේ චින්තනයට හා විමංසනයට යම් ඉඩක් ලැබී ඇති බව සිතිය හැකි ය. නමුත් බුදුදහම හා සසඳා මීට එතරම් දුරට විමසීමට ඉඩක් ලැබී නැති බව අවධාරණය කළ යුතුය.

## යුදෙව් ආගම

දේවවාදී ආගම් අතර යුදෙව් දහමට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. සෙමිටික් ආගම් ගණයට වැටෙන ආගම් කිහිපයක් ඇත.[8] ඒ අතර,

i. යුදෙව්
ii. ක්‍රිස්තියානි
iii. ඉස්ලාම්

යන ආගම් තුන ප්‍රධාන වේ. මෙ අතරින් පැරණිතම ආගම යුදෙව් ආගම යි. හීබ්‍රෑ දහම යනු ද මෙම දහමට ම තවත් නමකි.[9] යුදෙව් ජාතිය ආරම්භ වූයේ ආබ්‍රහම්ගෙනි. යාවේ දෙවියන් පිළිබඳ ව ඇති විශ්වාසය යුදෙව් දහමේ ප්‍රමුඛතම ඉගැන්වීම යි. යාවේ දෙවිඳුන් මුල්මවරට හමු වූ තැනැත්තා ආබ්‍රහම් ය. එම හමුවේ දී ප්‍රකාශ කර ඇත්තේ මෙසේය.

"නුඹේ මව් බිම ද, නුඹේ නෑදෑයන් ද, නුඹේ පියාගේ ගෘහය ද අත්හැර දමා මා පෙන්වන්නට යන දේශයට යන්න. මම නුඹ මගින් සුවිසල් ජාතියක් බිහි කරන්නෙමි. මම නුඹට ආසිරි පතන්නෙමි. නුඹේ නාමය ආසිරි පැතීමේ නාමයක් ලෙස ලොව සුපතල කරන්නෙමි. නුඹට ආසිරි පතන්නන්ට මම ද ආසිරි පතමි. නුඹට දොස් නගන්නන්ට මම ද දොස් තබමි. නුඹ මගෙන් ආසිරි ලබන අයුරින් මින්මතු සියලු සත්ත්වයෝ ද ආසිරි ලබනු ඇත". යනුවෙනි.[10]

අනූනව වියැති ආබ්‍රහම් හා අනූවියැති සාරා නම් වඳ බිරියට දෙවියන්වහන්සේගේ මැදිහත්වීම මත ලැබුණු ඊසාක් නම් පුත්‍රයාගෙන් පැවත එන පරපුර යුදෙව් ජාතිය යි. ඔවුන් විසින් නිර්මාණය කර ගන්නා ලද ආගම යුදෙව් ආගම (Judaism) ලෙස හඳුන්වා ගත්හ. යුදෙව් දහමේ කේන්ද්‍රීය ඉගැන්වීම් කිහිපයක් දැක්විය හැකිය.

දෙවියන්වහන්සේ පිළිබඳ සංකල්පය ප්‍රධානතම ඉගැන්වීම ලෙස නම් කළ හැකිය. යුදෙව් දහමේ ද පරම ඒකදේවවාදී සංකල්පයක් ඉදිරිපත් වෙයි. එම එක ම දෙවියා යහ්වේ (Yahwe) නමින් හැඳින්වේ. එම දෙවියන්වහන්සේ පිළිබඳ ව පූර්ණ විශ්වාසය තබා ක්‍රියා කළ යුතුය. සමස්ත යුදෙව් දහම ගොඩ නැගී ඇත්තේ මේ ඒකදේවවාදී චින්තාකල්පය මතය. මෙකී දහමට අනුව දෙවියන්වහන්සේ පුද්ගල ස්වරූපී (Peronal) කෙනෙකි. එහෙත් එම ස්වරූපය සාමාන්‍ය මිනිසා තුළ ඇති පුද්ගලත්වය වැනි දෙයක් නොවේ. එය අනිර්වචනීය ineffable පෞරුෂ ස්වභාවයකින් යුත් තත්ත්වයකි. එයින් අදහස් කරන්නේ සාමාන්‍ය මිනිසුන්ට දෙවියන්වහන්සේගේ යථා ස්වරූපය අවබෝධ කර ගත නොහැකි බව යි.

**මම යම් සේ සිටිම් ද එසේ ම සිටිමි.**

යුදෙව් ආගමේ සඳහන් වන දෙවියන්වහන්සේ ද සර්වබලධාරී, සර්වඥ, සර්වතෝභද්‍ර යනාදී ගුණයන්ගෙන් පරිමිත

උතුමෙකි. මිනිසුන් නිර්මාණය කිරීමේ හැකියාව මෙන්ම යාඥා කළවුන්ට පිහිටවීමේ හැකියාව ද එතුමා සතු ය. ඒකදේවවාදී සංකල්පය කෙතරම් දුරට පැවතියා ද යන්න පැහැදිලි වන අවස්ථාවක් ලෙස බයිබලයේ දෙවියන්වහන්සේ පිළිබඳ සඳහන් වන අවස්ථා 7000 පමණ තිබීම දැක්විය හැකි ය.[11]

යුදෙව් දෙවියන්වහන්සේ අත්‍යන්තයෙන් ම පාරිශුද්ධ උතුමෙකි.

i. ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය **(Spritual Eminence)**

ii. ආචාරාත්මක පාරප්‍රාප්තිය **(Moral Excellence)**

මෙබඳු ලක්‍ෂණයන්ගෙන් සමන්විත දෙවියන්වහන්සේ පරම පාරිශුද්ධ උතුමෙකි. සර්ව බලධාරී දෙවියන් විසින් ලෝකය හා සත්ත්වයා නිර්මාණය කළේ යැයි පැවසෙන නිර්මාණවාදය මෙම දහමේ ප්‍රධාන ඉගැන්වීමකි. දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි මිනිස් වර්ගයා ඇතුළු සමස්ත ප්‍රජාව ම මවන ලදි. සොබාදහම ද ස්වකීය නිර්මාණ ක්‍රියාවලියෙහි ප්‍රධාන අංගයක් විය. ලෝකය දෙවියන්වහන්සේ මත රඳා පවතී. එතුමා අන් සියල්ලන්ට ම වඩා ශ්‍රේෂ්ඨයහ. ස්වාධීනව ස්වතන්ත්‍රව ක්‍රියාත්මක වන සදාතනික කෙනෙකි. එතුමා අපේක්‍ෂා කරන ඕනෑම මොහොතක ලෝකය විනාශ වනු ඇතැයි යුදෙව්වෝ විශ්වාස කරති. ලොව සිදුවන ස්වාභාවික විපත් පවා දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව සිදුවන ඒවාය. එයට හේතුව වන්නේ මිනිසා දුසිරිතට හා පාපයට නැඹුරු වීමයි.[12]

> තව සත් දවසකින් දහවල් සතලිසක් ද රෑ සතලිසක් ද පොළොව පිට වැසි වස්වන්නෙමි, මා විසින් සාදන ලද ජීවමාන සියල්ල භූමිය මතුපිටින් නැතිකර දමන්නෙමියි කී සේක.[13]

ලෝකය හා සත්ත්වයා නිර්මාණයකිරීම සම්බන්ධයෙන් තොරතුරු ශුද්ධ වූ බයිබලයේ දැක්වෙන්නේ මෙසේ ය.

> අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ. ඔවුහු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහි ද, ආකාශයෙහි පක්ෂීන් කෙරෙහි ද, තිරිසනුන් කෙරෙහි ද, මුළු පොළොව කෙරෙහි ද, පොළොව පිට බඩ ගා යන සියල්ලන් කෙරෙහි ද, ආණ්ඩු කෙරෙත්වා යි කී සේක.[14]

මනුෂ්‍යයා මැවූ ආකාරය පිළිබඳ ව සඳහන් කරන ශුද්ධ වූ බයිබලය "භූමියෙහි දූවිල්ලෙන් මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙළු සේක".[15] පුරුෂයා නිර්මාණය කිරීමෙන් අනතුරුව ස්ත්‍රිය නිර්මාණය කළ බව දැක්වේ. ඒ පිළිබඳ බයිබලයේ එන අදහස මෙසේ ය.

> ස්වාමි වූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයා බර වූ නින්දකට පැමිණ වූ සේක. ඔහු නිදාගත්තේය. උන්වහන්සේ ඔහුගේ ඉළ ඇටවලින් එකක් ගෙන ඒ ස්ථානය මාංසයෙන් පිර වූ සේක.[16]

ඉහත සඳහන් කරන ලද ආකාරයට මනුෂ්‍යයා නිර්මාණය කිරීමේ සියලු ම ගෞරවය හිමිවන්නේ දෙවියන්වහන්සේට ය. දෙවියන්වහන්සේ විසින් නිර්මාණය කළ පුරුෂයා දෙවියන්වහන්සේට අවනත විය යුතු ය. ගරු කළ යුතු ය. මිනිසා පාලනය කරන එක ම ගාමක බලවේගය දෙවියන්වහන්සේ ය. නමුත් ස්ත්‍රිය මැවීමේ දී ඇයට පුරුෂයාට මෙන් දිව්‍යමය උත්පත්තියක් හිමිකොට නොදෙයි. එබැවින් පුරුෂයාට සමාන අයිතිවාසිකමක් ස්ත්‍රියට ලබා දී නැති බව මේ තුළින් පැහැදිලි වේ.

මිනිසා වටා ඇති සොබාදහම, පරිසරය හා සංසන්දනය කරන විට මිනිසා පහත් ය. සොබාදහමේ සිද්ධීන් පාලනය කිරීමේ හැකියාවක් මිනිසාට නැත. ඔහු සොබා දහමට යටත් ය. සොබා දහමත් සමග සසඳන විට මිනිසා දුබල ය. බෙලහීන ය. සොබාදහමට අනුව සසඳන විට මිනිසා පහත් වුවත් දෙවියන්වහන්සේ විසින්

මිනිසා මවා ඇත්තේ නිදහස් සත්ත්වයකු ලෙසය.[17] මිනිසාට තම ජීවිත කාලය තුළ අනුගමනය කළ හැකි ක්‍රමවේද දෙකකි.

i. දෙවියන්වහන්සේට අවනතව ක්‍රියා කිරීම.

ii. දෙවියන්වහන්සේට එරෙහිව ක්‍රියා කිරීම.

මෙම දෙකින් එකක් තෝරා ගැනීමේ අයිතිය මිනිසා සතුය. මෙම විකල්ප දෙකින් මිනිසා තෝරා ගන්නා විකල්පයට අනුව ඔහුගේ ඉදිරි ජීවිතය තීරණය වේ. දිවි හිමියෙන් දෙවියන්වහන්සේට යටහත් පහත්ව, ගරු කරමින්, පක්ෂපාතීව, බැඳීමෙන් හා ප්‍රේමයෙන් ක්‍රියා කිරීම මිනිසා සතු පරම යුතුකම යි. මිනිස් දිවියේ ප්‍රධානතම වගකීම විය යුත්තේ දෙවියන්වහන්සේ අනුගමනය කිරීම යි.

යුදෙව් දහමට අනුව මිනිසා විසින් නිශ්චිත වශයෙන් අනුගමනය කළ යුතු නීති රීති මාලාවක් ඇත. දෙවියන්වහන්සේ විසින් මෝසෙස්ගේ මාර්ගයෙන් යුදෙව් ජනයා වෙත මෙම නීති රීති හෙළිදරව් කර ඇත. එම නීති මාලාව දස පනත (Ten Commandment) නමින් හඳුන්වයි.[18]

> "මම වනාහි වහල්කමේ ගෙයින් (හෙවත් මිසර දේශයෙන්) නුඹ පිටතට ගෙනාවා වූ නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේය".

1. මා හැර අන් දෙවිවරුන් ඇතුව නොසිටුව
2. අහසෙහිවත්, පොළොවෙහිවත්, ජලයෙහිවත් තිබෙන කිසි ම දෙයක සමානත්වයක් හෝ සාදා නොගනුව, ඊට නමස්කාර නොකරව, සේවය නොකරව, මක් නිසාද නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේ වන මම අන්‍ය භක්ති නොඉවසන්නාවූ ය.
3. නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේගේ නාමය නිකරුණේ ව්‍යවහාර නොකරව
4. සබත් දවස ශුද්ධ ලෙස පවත්වන්ට සිහිකර ගනුව
5. නුඹේ පියාටත්, නුඹේ මව්ටත් ගෞරව කරව

6. මිනී නොමරව
7. කාම මිථ්‍යාචාරය නොකරව
8. සොරකම් නොකරව
9. නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව
10. නුඹේ අසල්වැසියාගේ ගෙට ආශා නොවව

මෙම නීති රීති දහයෙන් පළමු හතර ම දෙවියන්වහන්සේගේ පරමත්වය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගෙන ඇත. යුදෙව් දහමේ මූලික සංකල්පයක් වන ඒකදේවවාදී සංකල්පය අනිවාර්යයෙන් ම පිළිගත යුතු හා ඇදහිය යුතු මූලධර්මයක් ලෙස නීතිගත කොට ඇත. මේ තුළින් පුද්ගලයාගේ චින්තන නිදහස හා විමංසනය උල්ලංඝනය වී ඇත. ස්වාධීන ව, ස්වෛරී ව, ස්වතන්ත්‍ර ව සිතීමට හෝ විමසීමට කිසිදු ඉඩක් පුද්ගලයාට හිමි වී නැති බව මේ තුළින් ගම්‍යමාන වේ. තමන් කැමති ආගමක් හෝ දර්ශනයක් ඇදහීමට අයිතිය තිබිය යුතුය. ඒ අයිතිය අහිමි කර ඇත. අනෙක් අතට දෙවියන්වහන්සේ පිළිබඳ හෝ දේව වාක්‍ය පිළිබඳ විමසීමට කිසිදු ඉඩක් ලැබී නැත.

නිදහස් චින්තනයට හෝ විමංසනයට ඉඩ ලැබෙන කිසිදු ආගමක නීතිරීති පද්ධතියකින් සිය අනුගාමිකයන් කොටුකර තැබීමට උත්සාහ කර නැත. උදාහරණයක් ලෙස බුදුදහම ගත හැකිය. බුදු දහමේ කිසිදු තැනක නීති රීති දක්නට නැත. ඇත්තේ ශික්ෂාපද පමණකි. සිය අභිමතය පරිදි තෝරා බේරාගෙන ක්‍රියාත්මක කිරීමට හෝ නොකිරීමට අයිතිය පුද්ගලයාට ලබා දී ඇත. නමුත් යුදෙව් දහමේ එබඳු දෘෂ්ටියක් දක්නට නැත. මරණින් මතු දිව්‍ය සහව්‍යතාවට පත්වීමට නම් ඉහත කී නීතිරීති අනුගමනය කරමින් දෙවියන්වහන්සේ වෙත කීකරුව, අවංකව ක්‍රියා කළ යුතු ය.

පිං, පව්, කුසල්, අකුසල්, යහපත, අයහපත, ආදී සදාචාර සංකල්ප යුදෙව් දහමේ දී විවරණය කර තිබෙන්නේ කිසියම් ස්වාධීන පදනමකට අනුවය. නරක හෙවත් පාපය යන්න විවරණය කරන්නේ දෙවියන්වහන්සේට අකීකරු වීම, එරෙහි වීම, උන්වහන්සේ විසින්

පනවන ලද නීති රීති සමුදාය උල්ලංඝනය කිරීම යන අර්ථයෙනි. දෙවියන්වහන්සේට කීකරුව, නීති රීති සුරකිමින් ක්‍රියා කිරීම හොඳ ලෙස අර්ථකතනය කර ඇත. මිනිසාට හොඳ නරක දෙකින් කවරක් හෝ තෝරාගැනීමේ ස්වාධීන අයිතිය නිතැතින් ම හිමි වේ. නමුත් ඒ සෑම තීරණයක ම අවසාන විනිශ්චය ලබාදීමේ බලය දෙවියන්වහන්සේ සතුය. මෙයින් පැහැදිලි වන්නේ ලොව විද්‍යමාන සෑම පදාර්ථයක් ම අදෘශ්‍යමාන බලවේගයකට පාවාදී ඇති බව යි.

## ක්‍රිස්තියානි ආගම

ලොව විද්‍යමාන ආගම් අතර වඩාත් ව්‍යාප්ත වූත් බොහෝ අනුගාමිකයන්ගෙන් (Followers) සමන්විත වූත් ආගම ක්‍රිස්තියානි ආගම යි.[19] යුදෙව් දහමේ අන්තගාමී ඉගැන්වීම් වලින් වඩාත් පීඩිතව සිටි ජනයාගේ චින්තනය නව මගකට යොමු කරමින් ක්‍රිස්තියානි දහම ලොව පහළ විය. මෙම යුගය වනවිට සාම්ප්‍රදායික යුදෙව් දහමට හා පූජකත්වයට එරෙහිව කතා කරන හා ක්‍රියා කරන අයට හිමි වුණේ මරණය යි. මෙබඳු පරිසරයක් තුළ බෙත්ලෙහෙමේ ගවහලක කුඩා කුමාරයෙක් ඉපදුණේය. යෝසෙප් නම් වූ වඩු කාර්මිකයා හා කන්‍යා මරිය තුමිය එතුමාගේ මව්පියෝ වූහ. එම කුමරා හඳුන්වන ලද්දේ ජේසු යන නමිනි. නමුත් ශුභාරංචි ග්‍රන්ථවල දැක්වෙන්නේ ජේසු කුමරාගේ උපත දිව්‍යමය සිද්ධියක් ලෙසිනි. යෝසෙප්ට දාව නොව සර්වබලධාරී දෙවියන් වහන්සේට දාව කන්‍යා මරිය තුමිය මෙම දරුවා බිහිකළ බව සඳහන් වේ.[20]

ළමා කාලයේ සිට ම ඉතා ආශාවෙන් පල්ලියට (Church) යමින් දෙවියන්ට යාඥා කළ මේ කුමරා දිනක් දේව මන්දිරය ඇතුළත අතරමං විය. දෙමව්පියන් මේ පිළිබඳ ව විමසූ විට ඔහු ප්‍රකාශ කළේ,

> **"මා ගැන ඔතරම් සෙව්වේ ඇයි? මගේ පියාණන්ගේ ගෘහයෙහි මා සිටින්ට ඕනෑ බව ඔබ දෙදෙනා දැනගෙන සිටියේ නැද්ද? [21] යනුවෙනි.**

ජේසු කුමරාගේ තරුණ කාලය පිළිබඳ එතරම් සඳහන් නොවුණත් තිස් දෙවැනිවියේ දී පමණ යොහාන් බෞතීස්ත නම් දේවධර්මාචාර්යවරයා සමීපයට ගොස් ධර්මය ඉගෙන අනතුරුව බෞතීස්මය (Baptism) ලබාගත් බව ද සඳහන් වෙයි . එයින් පසුව දේශන පවත්වමින් ඒ ඒ ස්ථානවල දී ධර්මය දේශනා කර ඇත. මුල් කාලයේ දී ජේසු තුමන්ට එතරම් ප්‍රියතාවක් හා විශ්වාසයක් නොතැබූහ. ඕල්මාදකාරයෙකැයි චෝදනා කළේය. ඉතා කෙටි කාලයකින් එම අදහස වෙනස් වූ අතර බොහෝ දෙනෙක් එතුමාගේ දර්ශනය පිළිගත්හ. සාම්ප්‍රදායික යුදෙව් අදහස්වලට එරෙහිව යුදෙව් සමාජයට ඉතා වැදගත් උපදෙස් ලබා දෙමින් වසර තුනක් පමණ සිය ධර්ම දූත ව්‍යාපාරය පවත්වාගෙන ගියේය. පල්ලියට ගිය එතුමාට දක්නට ලැබුණේ අති ශෝචනීය තත්ත්වයකි. එනම් පල්ලිය වෙළෙඳ පොලක් බවට පත්ව තිබූ සෙයකි. සියලු ජාතීන්ට යාඥා ගෘහයක් විය යුතු ගෘහය වෙළෙඳාම් පොළක් කර නොගනිල්ලා යනුවෙන් බැන වදිමින් කස පහර දෙන්නට විය.[22]

ඉතා සීඝ්‍රයෙන් ධර්ම දූත ව්‍යාපාරය ක්‍රියාත්මක වීමත් සමඟ ම බොහෝ දෙනෙක් කිතු දහම වැළඳ ගත්හ. එම නිසා යුදෙව්වන් තුළ ඇති වූයේ දැඩි විරසක බවකි. එහි ප්‍රතිඵලයක් ලෙස ජේසු තුමාට මරණ දණ්ඩනය නියම විය. කුරුසයෙහි ඇණ ගසා මැරීමට තීන්දු වූ අතර මරණයට ගෙන යන අවස්ථාවේ දී එතුමා සඳහන් කළේ,

යෙරුසලමේ දූවරුනි, මා නිසා නොහඬන්න. නුඹලා ඇඬිය යුත්තේ මා ගැන නොව නුඹලාගේ ම දරුවන් ගැනය[23] යනුවෙනි. මෙහි දී යම් දුරකට විමසීමට අවස්ථාවක් හිමිකර දී ඇත. සිතන්නට යමක් ඉදිරිපත් කර ඇති බව පැහැදිලි වේ.

ක්‍රිස්තියානි ධර්මයට අනුව ජේසුතුමා දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ (Son of God) ය. මෙලොව ජීවත් වන්නා වූ සියලු ම දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයින් ලෙස සලකති. එහෙත් ජේසුස් වහන්සේ අතිශ්‍රේෂ්ඨයහ. දෙවියන්වහන්සේගේ දිව්‍යමය පණිවිඩය (Divine Message) මිනිසාට සන්නිවේදනය කිරීම සඳහා

පැමිණි දිව්‍යමය මිනිසෙක් (Divine Man) ලෙස මෙතුමා හඳුන්වයි. සියලු දෙනාගේ ම විමුක්තිදායකයාණෝ (Savior) මෙතුමාය. විමුක්තිය ඇත්තේ දෙවියන්වහන්සේ තුළ පමණි. එම නිසා මිනිසාට කිසි කලෙකත්, කිසිලෙසකිනුත් සිය අභිමතය පරිදි දිව්‍ය සභව්‍යතාව ලද නොහැකිය. දෙවියන්වහන්සේ සමීපයට ගමන් කළ හැක්කේ ජේසු තුමාගේ මාර්ගයෙනි.

> "මාර්ගය ද සත්‍යය ද, ජීවනය ද මම වෙමි. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත. නුඹලා මා ඇඳිනගත්තා නම් මාගේ පියාණන්වහන්සේත් හඳුනනවා ඇත."[24]

මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ දෙවියන්වහන්සේ සහ ජේසුතුමා යනු දෙදෙනකු නොව එක් අයකු බව යි. එබැවින් දෙවියන්වහන්සේට පමණක් නොව ජේසු තුමාට ද අවනතව ක්‍රියා කළ යුතු ය.

කිතුනු දහම ද ඒක දේවවාදී කේන්ද්‍රිය පදනමකින් සකස් වූ දහමකි. දෙවියන්වහන්සේ වනාහි සියලු බල දරන්නා වූ උත්තමයාණන් වහන්සේ ය. එබැවින් මුළු සිතින් ද, හදවතින් ද, බුද්ධියෙන් ද, වීර්යයෙන් ද, දෙවියන්වහන්සේට ප්‍රේම කළ යුතු ය යන්න ප්‍රධානතම ඉගැන්වීම යි. ලෝක නිර්මාපකයා (Creator) දෙවියන්වහන්සේ ය. එසේ නිර්මාණය කළ ලෝකය පාලනය කරන්නේ එතුමාගේ කැමැත්තට අනුවයි. ලෝකයෙහි විනාශය සිදුවන්නේ ද දෙවියන්වහන්සේගේ අනුමැතිය අනුව යි. එබැවින් දෙවියන්-වහන්සේ හැඳින්වීමට පර්යාය වචන රාශියක් භාවිත කොට ඇත.[25]

| | |
|---|---|
| සර්වබලධාරී | - Omnipotence |
| සර්වඥ | - Omniscience |
| සර්වතෝභද්‍ර | - All Goodness |
| සර්වව්‍යාපී | - Omnipresence |

සදාතනික - Eternity
අන්තර්වර්ති - Immanence
ලෝකෝත්තර - Transcendence

දෙවියන්වහන්සේ අනිර්වචනීය ය. කිසිවකුටත් කිසි ම කලෙක දෙවියන්වහන්සේගේ සැබෑ ස්වරූපය අවබෝධ කරගත නොහැකිය. දෙවියන්වහන්සේ සියලු ම මානව සත්ත්වයා වෙත ප්‍රේමය පතුරවන උත්තමයාණෝය. එතුමාගේ ප්‍රේමය සියල්ලන්ට ම පොදුය.

> උන්වහන්සේ දුදනන්ට හා සුදනන්ට තමන්ගේ හිරු උදාකරවන සේක. දැමිටුවන්ට හා අදැමිටුවන්ට වැසි වස්වන සේක.[26]

මිනිසා කරන සෑම පාප ක්‍රියාවකට ම සමාව දෙයි. පාප කර්මවලින් මිදීමට නම් දෙවියන්වහන්සේ ඉදිරියෙහි පව් සමා කරගත යුතු ය. එසේ මානව වර්ගයා වෙත අපරිමිත කරුණාවෙන් ක්‍රියා කරන දෙවියන්වහන්සේට කීකරුව අවනතව කටයුතු කිරීමට සියල්ලෝ ම බැඳී සිටිති. කිසිවෙකුටත් එයින් බැහැරව ස්වාධීනව ක්‍රියා කළ නොහැකිය.

ක්‍රිස්තු ධර්මයේ එන සියලුම ඉගැන්වීම් ප්‍රධාන ශීර්ෂ දෙකක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය.

i. මුළු බුද්ධියෙන් ද, මුළු හෘදයෙන් ද මුළු ශක්තියෙන් ද දෙවියන්වහන්සේට ප්‍රේම කළ යුතුය.
ii. තමාට මෙන් තමාගේ අසල්වැසියාට ප්‍රේම කළ යුතුය.

සදාචාරය සම්බන්ධව කතා කරන විට සුවිශේෂ කාරණයක් කිතුනු දහමේ ඇත. පුද්ගලයාගේ පාරිශුද්ධත්වය හා අපිරිසිදු බවට හේතු වන්නේ ඔහුගේ චර්යාවන් ම බව ශුද්ධ වූ බයිබලයේ සඳහන් වෙයි. නරක ක්‍රියා හා සිතිවිලි තුළින් අපිරිසිදු වන ආකාරයත්, යහපත් ක්‍රියා සහ සිතිවිලි තුළින් පිරිසිදු වන ආකාරයත් මෙසේ දක්වා ඇත.

කටින් පිටවන දේ නික්මෙන්නේ සිතින්ය. මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ එයින්ය. මක්නිසාද නපුරු සිතිවිලි, මිනී මැරුම්, කාම මිථ්‍යාචාරකම්, වෛශ්‍යාකම්, සොරකම්, බොරු සාක්ෂි දීම් සහ අපහාස කිරීමේ සිතින් නික්මෙන්නේය. මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ මේ දේවලින් ය. නමුත් නොසේදූ අත්වලින් කෑවාට මනුෂ්‍යයා අපවිත්‍ර වන්නේ නැතැයි කී සේක.[27]

පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අගය කරමින් චින්තනයට හා විමංසනයට ඉඩ ලබා දුන් අවස්ථාවක් ලෙස මෙය හැඳින්විය හැකි ය. කිතුනු දහමේ මිනිසාට විමසීමට ඉඩදුන් තවත් අවස්ථාවක් යොහාන්හි දක්නට ලැබේ. වරක් දුරාචාරයේ හැසිරෙන එක්තරා ස්ත්‍රියක් දෙවියන්වහන්සේ වෙත ගෙන එන ලදී. ව්‍යවස්ථාවට අනුව වැරදිකාරියට උරුම වී තිබුණේ ගල් ගසා මැරීමේ දඬුවමයි. මිනිසුන් එක් වී ඇයට ගල් ගැසීමට සූදානම් වූ අවස්ථාවේ දී දෙවියන්වහන්සේ සඳහන් කළේ,

"නුඹලා අතරෙන් පව් නැත්තා ඈට පළමුකොට ගලක් ගසාවායි කීය. නැවතත් නැමී ඇඟිල්ලෙන් බිම ලිවූ සේක. ඔවුහු ඒ අසා වැඩිමහල්ලා පටන් බාලයා දක්වා එකිනෙකා පිටතට ගියේය.[28]

ඉහත සඳහන් පාඨය දෙස බැලීමේ දී අත්තූපනායික ධර්මපරියාය සිහිපත් වේ. අන් අයට අවවාද කිරීමට හෝ දඬුවම් කිරීමට පෙර තමා නිවැරදි අයෙක් බවට පත්විය යුතුය. ඕනෑම පුහුදුන් කෙනෙකු අතින් වැරදි සිදුවිය හැකිය. අනෙක් අතට යම් ක්‍රියාවක් කිරීමට පෙර එයින් ලැබෙන ප්‍රතිඵලය විමසා බලා තීරණය කිරීමට අනුබල දෙයි. විමංසනයට යම් ඉඩක් ලැබුණු අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකිය.

පාපයට දඬුවම ලබා දෙන්නේ දෙවියන්වහන්සේ විසිනි. එක් මනුෂ්‍යයකු විසින් කරන ලද පාප ක්‍රියාවකට මුළු මහත් මනුෂ්‍ය වර්ගයා ම දඬුවම් විඳිය යුතුය යන්න කිතුනු දහමේ

ඉගැන්වීමයි. සියලු මනුෂ්‍ය වර්ගයාට ම මරණය හා දුක (Death and Suffering) උරුම විය. එහි කිසිදු සාධාරණත්වයක් නැත. එනම් එක් අයකු විසින් කරන ලද වරදකට මුළු මහත් මානව සංහතියට ම දඬුවම් විඳීමට සිදුවීම අසාධාරණය.

අන් අය වීමංසනයට ලක් කළ යුතු ආකාරය ද ශුද්ධ වූ බයිබලයේ සඳහන් වේ. ඔබ අන් අය විනිශ්චය කරන්නේ නම් ඔබ ද යම් අවස්ථාවක අන් අයගේ විනිශ්චයට ලක්වේ. අන් අය මනින්නේ නම් අන් අයගේ මැනීමට ඔබ ද ලක් වේ. එම නිසා පළමුව තමා පිළිබඳ විමසීමට ලක් කළ යුතුය. තමා විනිශ්චය කොට නිවැරදි නම් අන් අය විනිශ්චය කළාට කම් නැත. වීමංසනය, විනිශ්චය පිළිබඳ ව බයිබලයේ දැක්වෙන වැදගත් ම අවස්ථාව ලෙස මෙය හැඳින්විය හැකිය.

> නුඹේ ඇසේ තිබෙන දැවය නොසලකා, නුඹේ සහෝදරයාගේ ඇසේ තිබෙන රොඩ්ඩ කුමට බලන්නෙහි ද?... වංචාකාරය, පළමුකොට නුඹේ ඇසෙන් දැවය පහ කරන්න. එවිට නුඹේ සහෝදරයාගේ ඇසෙන් රොඩ්ඩ පහ කරන්ට නුඹට හොඳ හැටි පෙනෙන්නේය.[29]

සෙවීම විමර්ශනය කිරීම අගය කරන ලද තවත් අවස්ථාවක් බයිබලයේ දැක්වේ.

ඉල්ලන්න, එවිට නුඹලාට දෙනු ලැබේ. සොයන්න, එවිට නුඹලාට සම්බ වේ,...[30] යම් දෙයක් ඇසූ පමණින් නොපිළිගත යුතුය. දුටු පමණින් නොපිළිගත යුතුය යන අදහස යම් දුරකට අගය කළ ස්ථානයක් ලෙස මෙය දැක්විය හැකිය.

> ඇසීමෙන් නුඹලා අසන නමුත් කිසිසේත් තේරුම් නොගන්නහුය. බලමින් ම සිටින නමුත් නුඹලා කිසිසේත් නොපැහැදෙන්නහුය. මක්නිසාද යම් හෙයකින් තමුන්ගේ ඇස්වලින් නොදැක, කන්වලින් නොඅසා සිතින් තේරුම් නොගෙන,...[31]

ජේසුස්වහන්සේ සර්වබලධාරී දෙවියන්වහන්සේගේ වක්තෘවරයා ය. එම නිසා උන්වහන්සේ හා සමාන වන්නේය යන අදහස නිසා ජේසුතුමා පිළිබඳ විමසීමට ඉඩක් නොවීය. නමුත් එක් අවස්ථාවක එතුමාගේ බලය පිළිබඳ ප්‍රශ්න කිරීමක් ශුද්ධ වූ බයිබලයේ දක්නට ලැබේ.

නුඹ මේ දේ කරන්නේ මොන බලයකින් ද? මේ බලය නුඹට දුන්නේ කවුදැයි ඇසූ සේක.[32] නැවත එම ප්‍රශ්න ඇසූ පූජකයන්ගෙන් පෙරලා ප්‍රශ්න කළ ජේසුතුමා විමසන්නේ

යොහන්ගේ බව්තීස්මය වූයේ කොතැනින් ද? ස්වර්ගයෙහි ද? නොහොත් මනුෂ්‍යයන්ගෙන්දැ යි ඇසූ සේක.[33] යනුවෙනි. එවිට එම ප්‍රශ්නයට ලැබුණු පිළිතුරත් සමඟ ජේසුතුමා තමාගෙන් අසන ලද පැනයට පිළිතුරු නොදෙයි.

මේ දේවල් අසවල් බලයෙන් කරමියි මමත් නුඹලාට නොකියමියි ඔවුන්ට කී සේක.[34]

ප්‍රශ්න විචාරීමට හෝ විමසීමට කිසිදු ඉඩක් ලබා නොදුන් කිතු දහමේ යම් හෙයකින් යම් කෙනෙක් ප්‍රශ්නයක් ඇසුවහොත් එයට පිළිතුරු නොදී සිටි අවස්ථාවකි මේ. අනුගාමිකයන් සිය වක්තෘවරයා පිළිබඳව විමසීමට ලක් කරන ලද මෙවැනි අවස්ථා බොහෝ ඇත. තර්ක විතර්ක කිරීම ද තිබී ඇති බව මෙයින් පැහැදිලි වේ.

ශුද්ධ බයිබලයට අනුව යම් යම් අවස්ථාවල ජේසුස් වහන්සේ ද පරීක්ෂාවට ලක්කර ඇත. සාතන් විසින් ජේසුස් වහන්සේ දින හතළිහක් තිස්සේ පරීක්ෂාවට ලක් කළ බව ශුද්ධ බයිබලයේ සඳහන් වෙයි.

> උන්වහන්සේ සාතන් විසින් පරීක්ෂාකරනු ලබමින් සතළිස් දවසක් වනාන්තරයේ සිටි සේක.[35]
>
> නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේ පරීක්ෂා නොකරවයි කියා තිබේ යැයි කී සේක. යක්ෂයා පරීක්ෂා සියල්ල නිමවා, කලකට උන්වහන්සේගෙන් ඉවත්ව ගියේ ය.[36]

පුද්ගලයා විසින් කරනු ලබන සෑම ක්‍රියාවකට ම ප්‍රතිඵලයක් හෝ විපාකයක් ලැබෙනවා යන්න කිතුනු දහම ද පිළිගෙන ඇත. පාප ක්‍රියා කරන පුද්ගලයාට ද නිරාගතව දුක් විඳීමට සිදුවන බවත් හොඳ ක්‍රියා කරන පුද්ගලයාට ස්වර්ගයෙහි සැප විඳිමට සිදුවන බවත් සඳහන් වේ.

> "පොළොවෙහි රැස් කරන වස්තුව වෙනුවට ස්වර්ගයෙහි වස්තුව රැස් කරගන්න".
>
> "සියළු හොඳ ගස් එල දරයි. නමුත් නරක ගහ නරක එල දරයි. හොඳ ගහක නරක එලවත් නරක ගහක හොඳ එලවත් හටගන්ට බැරිය."[37]
>
> "ඔබේ පරිත්‍යාග රහසින් කරන්න. එය දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක දෙන සේක"[38]

ඉහත සඳහන් කරන ලද පාඨවලින් පැහැදිලි වන්නේ පුද්ගලයා විසින් කරනු ලබන ක්‍රියාවලට ප්‍රතිවිපාක ලැබෙන බව ද කිතු දහම පිළිගෙන ඇති බවය. හොඳ, නරක, කුසලය, අකුසලය තීරණය කරන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුවයි. දෙවියන්-වහන්සේට අකීකරු වූ ද, එරෙහි වූ ද, නීතිරීති උල්ලංඝණය කරන්නා වූ ද, ක්‍රියා පාප ක්‍රියා ලෙස අර්ථ විවරණය කොට ඇත. දෙවියන්වහන්සේට කීකරුව භයපක්ෂපාතිත්වයෙන් යුතුව ක්‍රියා කිරීම හොඳ, යහපත යන්නෙන් අදහස් කර ඇත.

සදාචාරය සම්බන්ධව වැදගත් කරුණු රාශියක් කිතුණු දහමේ දැකිය හැකි වුවත් ඒවායෙහි අවසාන විනිශ්චය හෙවත් තීරක බලවේගය හිමි වී ඇත්තේ දෙවියන්වහන්සේට ය. දේව කේන්ද්‍රීය මෙන් ම නියතිවාදී පදනමකින් ද යුක්ත වන සදාචාර මූලධර්ම පද්ධතියක් කිතු දහමේ දැකිය හැකිය. දෙවියන්වහන්සේ විසින් ම ක්‍රියාවන් හා ක්‍රියා එලයන් පිළිබඳ ව විනිශ්චයක් ලබා දී ඇත. එම විනිශ්චයට එරෙහිවීමට හෝ ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට කිසිදු අයිතියක් මනුෂ්‍යයාට ලබා දී නැත.

කිතුණු ඉගැන්වීම තුළ මිනිසාගේ ස්වාධීන චින්තනයට සහ විමංසනයට එතරම් ඉඩක් නොලැබුණත් තෝරාගැනීමේ නිදහස (Freedom of choice) පමණක් ලබා දී ඇත. යම් ක්‍රියාවක් හොඳ ද? නරක ද? යනුවෙන් තීරණය කිරීමේ නිදහස මිනිසාට ලබා දී ඇත. නමුත් තෝරා ගැනීමේ නිර්ණායක එතරම් සාධාරණ නැත. දෙවියන්වහන්සේගේ අණට අවනත ව කරන නරක දෙයක් වුව ද හොඳ ලෙස ද, අවනත නොවී කරන යහපත් දෙයක් වුව ද නරක ලෙස ද විවරණය කර ඇත. මේ අනුව මිනිසාට තෝරා ගැනීමට අවසර ලැබෙන්නේ විකල්ප දෙකක් පමණි.

i. දෙවියන්වහන්සේට කීකරු වී උන්වහන්සේගේ නීති රීති සුරකිමින් හොඳ ප්‍රගුණ කර ස්වර්ග ගත වීම.
ii. දෙවියන්වහන්සේට අකීකරුව නීති රීති උල්ලංඝණය කරමින් නරක ප්‍රගුණ කොට අපාගත වීම.

මේ දෙකෙන් එකක් තෝරා ගැනීමට නිදහස ලබා දී ඇත. එසේ නමුත් එම නිදහස ද පරිපූර්ණ එකක් නොවේ. එයට හේතුව නම් තෝරාගත හැකි විකල්ප දෙක ම දේව කේන්ද්‍රීය පදනමකට යටත් වීමයි.

කිතුණු දහමට අනුව පාපය යනු සදාකාලික එකක් නොවේ. පව් කමා කර ගැනීමෙන් (Redeption) සියලු පව් දුරු කළ හැකිය. කෙතරම් පාපී දූෂිත අයකුට වුව ද තමන් විසින් කරන ලද පව්කම් පිළිගෙන දෙවියන්වහන්සේට සමීප වීමෙන් පව් කමා කරගත හැකය. දෙවියන්වහන්සේ විසින් කමා කිරීමෙන් පසු ව එම පුද්ගලයා පාපයට අදාළ අකුසලයෙන් සම්පූර්ණයෙන් ම නිදහස් වේ.

> මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා කරන්නාහු නම් නුඹලාගේ ස්වර්ගීය වූ පියාණන් වහන්සේ නුඹලාටත් කමා කරන සේක. නමුත් නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා නොකරන්නාහු නම් නුඹලාගේ පියාණන්වහන්සේ නුඹලාගේ වරද කමා නොකරන සේක.[39]

> නුඹලා ප්‍රවේශම් වන්න නුඹේ සහෝදරයා පව් කළොත් ඔහුට තරවටු කරන්න. ඔහු පසුතැවිලි වේ නම් ඔහුට කමාවෙන්න. ඔහු දවසකට හත් වරක් නුඹට විරුද්ධව පව්කොට, සත්වරක් නුඹ වෙතට හැරී මම පසු තැවිලි වෙමි යි කීවොත් ඔහුට කමාවන්නැයි කී සේක.[40]

ඕනෑම පාපකාරී පුද්ගලයකුට තමා කරන ලද ක්‍රියාව කමා කරගත හැකි නම් පුද්ගලයා කරන ක්‍රියාවෙහි වැදගත්කමක් නැත. හොඳ, නරක, කුසල, අකුසල, සෑම ක්‍රියාවකට ම ලැබෙන්නේ සමාන තත්ත්වයකි. මෙවැනි ඉගැන්වීම් තුළින් පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය වඩාත් පහත් මට්ටමකට පත්කොට තිබේ. අකිරියවාදී ඉගැන්වීමට බොහෝ දුරට සමාන මෙවැනි අදහස් ඇති ආගම් තුළින් විමංසනයක් කිසිසේත් ම අපේක්ෂා කළ නොහැකිය.

කිතුණු දහමෙහි මිනිසාගේ පරම නිශ්ඨාව හඳුන්වා දීමට වචන කිහිපයක් යොදාගෙන ඇත.

i. ගැලවීම (Salvation)
ii. අමරණීයත්වය (Immortality)
iii. සදාකාලික ජීවිතය (Life Eternal)
iv. විමුක්තිය (Redemption)

ඉහත සඳහන් කරන ලද තත්ත්වයට පත් වීමට ඇති එක ම මාවත වන්නේ දෙවියන්වහන්සේට කීකරුව උන්වහන්සේගේ කැමැත්තට අනුව එම ධර්ම මාර්ගය අනුගමනය කිරීමයි. දෙවියන්වහන්සේගෙන් වියුක්තව නිදහස්ව, නිවහල්ව, ස්වෛරීව, ස්වතන්ත්‍රව, සිතීමට හෝ විමසීමට වැඩි ඉඩක් නොමැත. කිසිදු විමසීමකින් තොරව දේව වාක්‍යවලට ගරු කරමින් ක්‍රියා කිරීම තුළින් සදාකාලික සැපත වූ ස්වර්ගයට ගමන් කළ හැකිය යන්න කිතුණු දහමේ ඉගැන්වීම යි.

## ඉස්ලාම් ආගම

ලොව බිහි වූ ආගම් අතර ලාබාල තම ආගම ඉස්ලාම් ආගමයි. ඉස්ලාම් යනු අරාබි වචනයකි.[41] අවනත වීම, යටහත් වීම, හෝ කීකරු වීම යනාදී අරුත් එහි ගැබ්ව තිබේ.[42] ආගමික අර්ථයෙන් ගත්විට අල්ලාහ්ට මුළුමනින් ම අවනත වීම, කීකරු වීම, යටහත් වීම යන අදහස් ලබා දෙයි. විශ්වයේ පවතින ඉතා කුඩා දූවිලි අංශුවේ සිට මහා පරිමාණ වස්තූන් දක්වා ඇති සෑම දෙයක් ම පාලනය කරන්නේ අල්ලාහ් ය. උන්වහන්සේ මැවුම්කරුවාණෝ ය. පාලකයා ද උන්වහන්සේ ය. ආරක්ෂකයා වූ උන්වහන්සේ සර්ව බලධාරීය. එබැවින් අල්ලාහ් නම් එක ම (One and only God) දෙවියන්වහන්සේට අවනත වීම ඉස්ලාම් දහමේ මූලික ප්‍රඥප්තිය යි.

මවනු ලැබූ සියල්ලක් ම අල්ලාහ්ගේ නියමය වන ඉස්ලාමයට අවනත බැවින් මුළු විශ්ව මණ්ඩලය ම ඉස්ලාම් 'වේ' යනු ඔවුන්ගේ ආකල්පය යි. හිරු, සඳ, තාරකා, පෘථිවිය, ආදී සියල්ල ම ඉස්ලාමිය. තව ද වාතය, ජලය, ගස්, ගල්, සිව්පාවුන් ද ඉස්ලාමිය. එයට හේතුව ලෙස දක්වන්නේ ඒ සියල්ල අල්ලාහ් විසින් නිර්මාණය කරනු ලැබීම යි. එබැවින් විශ්වයේ ඇති සෑම වස්තුවක්මත්, සෑම පුද්ගලයෙක්මත් අල්ලාහ්ට යටත් විය යුතුය. අවනත විය යුතුය, හිස නැමිය යුතුය. දෙවියන්වහන්සේට අවනත වීම, උනවහන්සේ විසින් පනවන ලද නීති රීතිවලට කීකරු වීම, උන්වහන්සේගේ ආඥාවට යටත්ව බැඳී ක්‍රියා කිරීම ඉස්ලාම් යන්නෙහි අර්ථය යි.

ඉස්ලාම් යන වචනයේ විග්‍රහයෙන් ම පැහැදිලි වන්නේ චින්තනයට හා විමංසනයට ඉඩක් ඉස්ලාම් දහම තුළ දැකිය නොහැකි බවයි. අන්ධ භක්තියෙන් හා විශ්වාසයෙන් යුක්තව අල්ලාහ්ට අවනතව ක්‍රියා කළ යුතු ය. ප්‍රශ්න කිරීමට හෝ විමසීමට කිසිදු ඉඩක් නොමැත.

ඉස්ලාම් දහම ප්‍රභවය වූවායැයි සැලකෙන්නේ ක්‍රි. වර්ෂයෙන් හයවන සියවසේ දී ය. ලොව විද්‍යමාන ප්‍රධාන ආගම් අතරින් ලාබාලතම දහම වූ ඉස්ලාම් දහම ප්‍රභවය වූයේ අරාබියේ ය. මුහම්මද්

නබි නායකතුමාණෝ ඉස්ලාම් ආගමේ වක්තෘවරයා ලෙස පිළිගනී. එබැවින් මහම්මදාගම (Mahammedanism) යන නම ද භාවිත කර ඇත.[43] මුහම්මද්තුමා පිළිබඳව අනුගාමිකයන් තුළ පැවති විශ්වාසය කෙබඳු ද යන්න පහත ප්‍රකාශනයෙන් පැහැදිලි වේ.

> "මට මඟ පෙන්වන්නා ද, මා සෘජු මගෙහි ගෙන යන්නා ද එක් කෙනෙක් පමණි. ඒ මුහම්මද්තුමාණෝ ය. මම අල්ලාහ්ට දාසයකු වී, වහලකු වී. මුහම්මද් තුමාණන්ට කීකරු වී ජීවිතයේ මුහුණපාන ගැටළු සියල්ලට ම විසඳුම ලෙස මුහම්මද්තුමාණන්ගේ මාර්ගෝපදේශකත්වය භාර ගත්තෙමි.[44]

තම විශ්වාසය ගෞරවය, සහ ඇදහීම අල්ලාහ් දෙවියන් කෙරෙහි පවත්වා ගෙන යන්නා සැබෑ ඉස්ලාම් භක්තිකයකු ලෙස සැලකිය හැකි ය. ඉස්ලාම් දහමේ එන ප්‍රධානතම ඉගැන්වීම වන්නේ සර්වබලධාරී අල්ලාහ් පිළිබඳ භක්තිය (ෂහාදා) හා විශ්වාසය යි. ස්වර්ගය හා පෘථිවිය නිර්මාණය කළා වූ එක ම දෙවියන්වහන්සේ අල්ලාහ් ය. මුහම්මද්තුමා වනාහි අල්ලාහ් දෙවියන්ගේ අනාගත වක්තෘවරයා ය.[45] **ලා ඉලාහ ඉල්ලිල්ලාහු මුහම්මද් උර් රසූල්ලාහ්** යන කුරාන් පාඨයෙන් ඒ බව පැහැදිලි වේ. සර්ව බලධාරී එක ම දෙවියන් වූ අල්ලාහ් විශ්වාසය කේන්ද්‍ර කොටගත් තවත් ඉගැන්වීම් කිහිපයක් ඉස්ලාම් ධර්මයේ දැකිය හැකි ය.[46]

i. දේව දූතයන් පිළිබඳ විශ්වාසය
ii. කුරාණය පිළිබඳ විශ්වාසය
iii. වක්තෘවරු පිළිබඳ ඉගැන්වීම
iv. අවසාන විනිශ්චය
v. ස්වර්ගය හා අපාය පිළිබඳ ඉගැන්වීම

## සර්වබලධාරී අල්ලාහ්

සමස්ත ඉස්ලාමීය චින්තනය සකස් වී ඇත්තේ සර්ව බලධාරී අල්ලාහ් නම් එක ම දෙවියන්වහන්සේ පිළිබඳ විශ්වාසය මත ය.

ඉස්ලාම් දහමට අනුව අල්ලාහ් වටා සියලු ම බලය (Power) සහ අධිකාරිය (Authority) ගොඩනැගී ඇත. බලය විමධ්‍යගත කිරීමක් ඉස්ලාම් දහමේ දැකිය නොහැකිය. අල්ලාහ්ට සමාන කිසිදු පුද්ගලයකු හෝ වස්තුවක් ලොව නැත. අල්ලාහ් සතු බලයන් කිසිදු කෙනකු තුළ දැකිය නොහැකි ය. ඉහත සඳහන් කරුණුවලට අනුව ඉස්ලාම් දහම

i. ඒකදේවවාදයක් (Uncompromised Monotheism)
ii. පරම ඒකදේවවාදයක් (Absolute Monotheism)
iii. විධිමත් ඒකදේවවාදයක් (Strict Monotheism)

යනුවෙන් සඳහන් කළ හැකිය. අල්ලාහ් සර්ව බලධාරී දෙවියා වශයෙන් පමණක් නොව අන් අයට පිහිට විය හැකි එක ම දෙවියා ය. "ලා ඉලාඃ ඉල් අල්ලාඃ" යන කුරාන් පාඨයෙන් ඒ බව පැහැදිලි වෙයි. අල්ලාහ් හැර වෙන කිසිවකුටත් වන්දනා කළ යුතු නැත. ශුද්ධ වූ කුරාණය ආරම්භ වන්නේ,

> ලෝකාධිපති වූ අල්ලාහ්ට ස්තුති ප්‍රශංසා වේවා. මහා ත්‍යාගිවන්ත වූ ද, අති කරුණාවන්ත වූ ද, විනිශ්චය දිනයේ අධිපතිවරයාණන් වූ ද, ඔබට පමණක් අපි වන්දනා කරමු. ඔබගෙන් පමණක් උපකාර යදිමු. නියම මාර්ගය අපට පෙන්වාලුව මැනව.[47]

ඉස්ලාම් ධර්මයෙහි පදනම සර්වබලධාරී අල්ලාහ් කෙරෙහි පවත්වන භක්ති පූර්වක ගෞරවය හා විශ්වාසය යි. ශුද්ධ වූ කුරාණයේ සෑම අකුරක් ම, වචනයක් ම දැක්වෙන්නේ අල්ලාහ් ගැන ය. අල්ලාහ්ගේ බලය, ශක්තිය මෙන් ම අනිවාර්යයෙන් ම අවනත විය යුතු බව සනාථ වන පාඨ කිහිපයක් මෙසේ උපුටා දැක්විය හැකිය.

> ...අල්ලාහ්ට අභිමත වී නම් ඔවුන්ගේ ශ්‍රවණය හා ඔවුන්ගේ දෘෂ්ටිය නැති කරන්නට ද හැකි ය. නිසැකව ම අල්ලාහ් සියලු දේ කෙරෙහි අති බල සම්පන්න ය.[48]

(මිනිසුනි!) නුඹලා කෙසේ අල්ලාහ් ප්‍රතික්ෂේප කරන්නාහු ද (ඔහු නුඹලා නිර්මාණය කරන්නට පෙර) නුඹලා ප්‍රාණ රහිතව සිටියාහු ය. ඔහු එවිට නුඹලාට ජීවය දුන්නේ ය. තව ද (නුඹලාගේ නියමිත ජීවන කාලය අවසන් වූ විට) ඔහු නුඹලා මරණයට පත් කරනු ඇත. තව ද (මරණින් පසු යළි විනිශ්චය දින දී අල්ලාහ් නැවත) නුඹලාට ප්‍රාණය දෙනු ඇත. ඉන්පසු නුඹලා ඔහු වෙතට ම පමුණුවනු ලබන්නාහු ය.[49]

"අල්ලාහ් හැර (වෙන කිසිවකු හෝ කිසිවෙක්) නැමදුම් නොකරනුයි ද......."[50]

"....තව ද ඔවුහු විශ්වාස කර (අල්ලාහ්ට බිය බැතිමත් වන්නේ නම් අල්ලාහ්ගෙන් ලැබෙන තිළිණ වඩාත් යහපත් වනු ඇත. [51]

තව ද නුඹලා අල්ලාහ්ට අවනත වනු. ඔහුට කිසිවක් හෝ කිසිවකු ආදේශ නොකරනු

"නුඹලා කෘතඥ වන්නේ නම් විශ්වාසකයින් වන්නේ නම් අල්ලාහ් නුඹලාට දඬුවම් දෙන්නේ මන්ද? අල්ලාහ් කෘතඥමය, සියල්ල මැනවින් දන්නේම ය.

ඉහත සඳහන් අයුරින් මුළු මහත් ශුද්ධ කුරාණය පුරාම ඇත්තේ අල්ලාහ් කෙරෙහි භක්තිය දනවන පාඨයන් ය. අනෙක් දේවවාදී ආගම්වල මෙන් ම ඉස්ලාම් ආගමෙහි ද සඳහන්වන එක ම දෙවියන්වහන්සේ සර්වබලධාරී, සර්වඥ, සර්වතෝභද්‍ර, සර්වත්‍රවර්තී යන ගුණාංගයන්ගෙන් සමන්විත ය. ඉස්ලාම් ධර්මය පුරා ම දිවයන කේන්ද්‍රීය ඉගැන්වීම වන්නේ අල්ලාහ් පිළිබඳ විශ්වාසය යි. අල්ලාහ් කෙරෙහි අපරිමිත අචල භක්තිය හා අවනතභාවය දක්වන තැනැත්තා පමණක් අල්ලාහ්ගේ කැමැත්තට යටත් වෙයි. මේ අනුව ඉස්ලාම් ධර්මයේ ශුද්ධ ග්‍රන්ථය වන කුරාණයෙහි සඳහන් දේව වාක්‍යයන් පිළිබඳ ප්‍රශ්න කිරීමට අයිතියක් නැත. කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගත යුතුය. ඉස්ලාම් ආගම පිළිගැනීම යනු

තමන් අල්ලාහ්ට භාර වීම හා සමාන දෙයකි. අල්ලාහ්ට එරෙහි වීමට හෝ උන්වහන්සේ පිළිබඳව ප්‍රශ්න කිරීමට කිසිවකුට අයිතියක් නැත.

මිනිසා පිළිබඳ ඉස්ලාම් මතය විමසා බැලීම මෙහිදී වැදගත් වෙයි. අල්ලාහ් යනු සත්ත්වයා නිර්මාණය කළ නිර්මාපකයාය (Creator). දූවිල්ලෙන් (Dust) හා ලේ කැටිවලින් (Clots of blood) පුරුෂයා සහ ස්ත්‍රිය යන දෙදෙනා ම මැවී ය. මිනිසා නිර්මාණය කර ඇත්තේ දෙවියන්වහන්සේගේ අභිමතාර්ථ සාධනය කර ගැනීමේ පරමාර්ථයෙනි. ඒ නිසා මිනිසා නිතර ම බිය පක්ෂපාතීත්වයෙන් හා අවනතව ක්‍රියා කළ යුතු ය. මිනිසාට ස්වාධීනව, සෛවරීව, ස්වතන්ත්‍රව, ස්වච්ඡන්දතාවයෙන් හා විමංසනයෙන් ක්‍රියා කිරීමට අයිතියක් නැත.

මිනිසා දේව දූතයන්ට වඩා උසස් බව අල්කුරාණයේ සඳහන් වේ. දේව දූතයන්ට වඩා උසස් වන්නේ අවබෝධයෙන්, ඥානයෙන්, ස්මෘතියෙන් යුක්ත නිසාත් ස්වාභිමතය හා ස්වච්ඡන්දතාව යන ලක්ෂණ සහජයෙන් ම උරුම වී ඇති නිසාත් ය.

> ආදම්ට (විශ්වයේ) සියලු ම (දැයෙහි) නාමයන් ඔහු ඉගැන්වූයේ ය. ඉන්පසු (අල්ලාහ්) ඒවා (සියලු දැය ම) මලක්වරුන් (සුර දූතයින්) ඉදිරියෙහි එළවා (මිනිසා නියෝජිතයකු ලෙස පත් කිරීම අවුල් වියවුල්වලට හේතුවන්නේ යැයි සිතන) නුඹලා සත්‍යවාදීහු නම් නුඹලා මේවායේ නාමයන් මට දන්වනුයි පැවසූවේය.

එසේ උසස් වූ මනුෂ්‍යයාට අල්ලාහ් විසින් පනවන ලද ආඥා පිළිගෙන, ඒවාට යටත්ව සේවය කරමින්, යහපත් ක්‍රියා කරමින්, උසස් තත්ත්වයට පත්වීමේ ශක්‍යතාව හා නිදහස උරුම වී ඇත. අන් අය අතර කෙතරම් උසස් බවක් හිමි වුව ද දෙවියන්වහන්සේ අභිමුඛයෙහි දී කිසිදු වටිනාකමක් හිමි වී නැත. අසම්පූර්ණ පුද්ගලයෙක් ලෙස මිනිසා සලකනු ලැබේ. දෙවියන්වහන්සේ විසින් පනවන ලද රාමුවක් යටතේ පුද්ගලයා ක්‍රියා කළ යුතු ය. මිනිසා පිළිබඳව කරන සෑම විනිශ්චයක් ම සිදු

වන්නේ දෙවියන්වහන්සේගේ අභිමතයට අනුවයි. මිනිසාගේ පරම යුතුකම වන්නේ කිසිදු ප්‍රශ්න කිරීමකින් හා විමසීමකින් තොරව එකී විනිශ්චයන් ගෞරවයෙන් පිළිගැනීම යි.

ඉස්ලාම් දහමට අනුව මිනිසාට හොඳ නරක තෝරා ගැනීමේ නිදහස උරුම වී ඇත. තමා කරන ක්‍රියාව පිළිබඳ තීරණය කිරීමේ වගකීම ඔහු සතුය. එහෙත් එම නිදහස සම්පූර්ණ වූ නිදහසක් නොවේ. මිනිසාට නිදහස ඇත්තේ දෙවියන්වහන්සේ විසින් පනවන ලද නීති මාලාවට යටත්ව හොඳ නරක තීරණය කිරීමට පමණි. එසේ පනවන ලද නීති මාලාව රැකීම හෝ නොරැකීම පිළිබඳව තීරණය කිරීමට පමණක් අයිතියක් ඇත.

ඉස්ලාම් දහම මුහම්මද් නබි නායකතුමන් විසින් දේශනා කරන ලද අධිෂ්ඨාන ප්‍රතිපත්ති හයකින් ද, ක්‍රියා ප්‍රතිපත්ති පහකින් ද සමන්විත ය.

## අධිෂ්ඨාන ප්‍රතිපත්ති 6

i. අල්ලාහ් නම් වූ එක ම සර්වබලධාරී දෙවියන්වහන්සේ පමණක් විශ්වාස කිරීම

ii. අප්‍රමාණ දේව දූතයන් ඇති බව විශ්වාස කිරීම

iii. කලින්කල පහළ වන නබිනායකයන්වහන්සේලාට දෙවියන්වහන්සේ විසින් වදාළ බව සිහිකිරීම

iv. සියලු ම නබි නායක තුමන්ලා අල්ලාහ් නම් වූ එක ම දෙවියන්වහන්සේ විසින් එවන ලද ශාස්තෘන් වහන්සේලා ලෙස විශ්වාස කිරීම

v. අවසාන දේව විනිශ්චය පිළිබඳ සම්පූර්ණ විශ්වාසය තැබීම

vi. පින් පව් දෙක දෙවියන්වහන්සේගේ ඉගැන්වීමක් බැවින් කරන ලද ක්‍රියාවට හොඳ හෝ නරක ප්‍රතිඵල ඇති බව විශ්වාස කිරීම.

ඉහත සඳහන් ප්‍රතිපත්ති 6 ම විශ්වාසය මත පදනම් වී ඇති බව පැහැදිලි ය. එම ප්‍රතිපත්තීන් අනිවාර්යයෙන් ම පිළිගත යුතු ය. විශ්වාස කළ යුතු ය. මන්දයත් සර්වබලධාරී දෙවියන්වහන්සේ විසින් කරන ලද ආඥාවන් බැවිනි. එබැවින් කිසිදු විමසීමකින් තොරව විශ්වාස කළ යුතු ය.

## ක්‍රියා ප්‍රතිපත්ති 5

i. අල්ලාහ් හැර අන් දෙවි කෙනෙක් නැත යන්න විශ්වාස කිරීම

ii. දවසට පස් වතාවක් බැගින් දිනපතා ම අල්ලාහ් දෙවියන්ට යාඥා කිරීම (සලාත්)

iii; ධනවතා තම වස්තුවෙන් 2% පමණ ප්‍රමාණයක් දුප්පතුන් වෙනුවෙන් දන්දීම (සකාත්)

iv. අවුරුද්දේ නවවන මාසය වන රාමසාන් මාසයේ දී උපවාසයේ යෙදීම

v. තම ජීවිත කාලයෙහි එක්වරක් හෝ මක්කම ගොස් හජ් වන්දනාවේ යෙදීම

සලාත් නමින් හැඳින්වෙන යාඥාව ඉස්ලාම් දහමේ අනිවාර්ය අංගයකි. දිනකට පස් වරක් යාඥා කළ යුතු ය. එයින් අපේක්ෂා කෙරෙන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි භය පක්ෂපාතිත්වය වර්ධනය කිරීම, දිව්‍යමය නීති පද්ධතිය සුරැකීම, හා දෙවියන්-වහන්සේ හා ආධ්‍යාත්මිකව සම්බන්ධවීම යන අරමුණු සාධනය කර ගැනීමයි. දෙවියන්වහන්සේ හා සම්බන්ධ විය හැකි එක ම මාර්ගය යාඥාවයි යනුවෙන් ප්‍රකාශ කරමින් අනුගාමිකයන් එක්තරා රාමුවකට සීමා කර ඇත.

ඉස්ලාම් දහමේ ඇති අන්තගාමී බව මෙන් ම චින්තන හා විමංසන නිදහස අවහිර කරන ලද බව හෙළිවන තවත් ඉගැන්වීමකි ශුද්ධ යුද්ධය. සැබෑ නිදහස නම් තමා කැමති ආගමක් ඇදහීමට ඇති අයිතියයි. ඉස්ලාම් ආගමේ දී එම නිදහස අහිමි කර ඇත.

(Jihad) ජිහාද් නමින් හැඳින්වෙන්නේ එම ශුද්ධ යුද්ධයයි. අල්ලාහ් වෙනුවෙන් හෝ එතුමා ඉදිරිපත් කළ පණිවිඩය වෙනුවෙන් තම දිවි පරදුවට තබා යුධ කිරීමට අනුබල දී ඇත. ඉස්ලාම් ධර්මයට එරෙහි වන්නාවූත්, එය නොපිළිගන්නාවූත් සියලු ම අදේවවාදීන් මරා දැමීමට අනුබල දී ඇත. ජිහාද් නම් වූ ශුද්ධ යුද්ධයට සම්බන්ධ වී මිය යන සියළු දෙනා ම ආගම වෙනුවෙන් දිවි පුදන්නවුන් ලෙස සලකා ඇත. එසේ ම ශුද්ධ යුද්ධයේදී මරණයට පත්වන අය නියත වශයෙන් ම දෙව්ලොව උපදින බව ද සඳහන් වෙයි.

මනුෂ්‍යයාගේ චින්තන ශක්තිය හා විමංසන හැකියාව අදෘෂ්‍යමාන බලවේගයකට පාවා දුන් අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. එසේ ම සිය අභිමතය පරිදි කැමති ආගමක් හෝ දර්ශනයක් ඇදහීමේ අයිතිය උල්ලංඝණය කිරීමකි.

ලොව ජීවත්වන සත්ත්වයන් අතර විවිධ විෂම ස්වභාවයක් දැකිය හැකිය. උස් පහත්, දුප්පත් පොහොසත්, ධනවත් බලවත්, රෝගී, නිරෝගී, වශයෙන් පුද්ගලයා අතර විෂම බවක් ඇත. එසේ වීමට හේතුව ලෙස ඉස්ලාම් දහම අවධාරණය කරන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත බවයි. දෙවියන්වහන්සේ අසාධාරණ ලෙස විවිධත්වයක් ඇති කළේ ඇයි? යනාදී වශයෙන් විමසීමට කිසිදු අවසරයක් නැත. කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව ම පිළිගත යුතුය. ඒ තත්ත්වයන් උරුම වී ඇත්තේ දෙවියන්වහන්සේගේ අභිමතය පරිදි බැවින් සියල්ලෝ ම පිළිගත යුතුය. එසේ ම තමාට ලද තත්ත්වයට අනුව ජීවිතය පවත්වා ගෙන යා යුතුය යන්න ඉස්ලාම් දහමේ ඉගැන්වීමයි.

සමස්තයක් වශයෙන් ගෙන බලන විට ඉස්ලාම් ආගමේ විමංසනයට ඉඩක් නොලැබේ. ඒ බව උක්ත උදාහරණ පිළිබඳව විමසීමේ දී මනාව පැහැදිලි වේ. පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වය අදෘශ්‍යමාන බලවේගයකට පාවා දුන් දහමක් ලෙස ඉස්ලාම් දහම සඳහන් කළ හැකිය.

4

# නිදහස් චින්තනය හා වීමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය

## බෞද්ධ චින්තනක්‍රමයේ ස්වභාවය

බෞද්ධ චින්තනයේ ස්වභාවය විමසුම් ඇසින් බලන විට සෞන්දර්යය, නිර්මාණය, තර්කනය, වීමංසනය එහි මූලික ලක්‍ෂණය යි.[1] නායකත්වය, අනුගාමිකත්වය යන දෙකින් තොරව තමන් විසින් ම යථාර්ථාවබෝධය ඇති කරගත යුතු බව පිළිගත් බෞද්ධ චින්තනය පුද්ගල කේන්ද්‍රීය වූවකි.[2] බුදුරජාණන්වහන්සේ සිය දේශනාවන් තුළ පුද්ගලයා ශ්‍රේෂ්ඨත්වයට පත්කොට ඇත. තමාට පිහිට තමා ම යි. වෙනත් පිහිටක් සරණක් නැත. තමා මනාව දැමුණු කල්හි දුර්ලභ වූ පිහිටක් ලබන්නේ ය.[3] තමන් ම පිහිට කොට ගෙන, තමන් ම සරණ කොට ගෙන අන්‍ය සරණක් අපේක්‍ෂා නො කර ම වාසය කරන්න[4] යනුවෙන් දේශනා කරන ලදි. තමා ම කරන ලද ක්‍රියා නිසා පිරිසිදු හෝ අපිරිසිදු බවට පත්වන බව දේශනා කළේ පුද්ගල කේන්ද්‍රීය චින්තනය අගය කරනු වස් ය.[5] අත්ත වග්ගය පුරා ම පුද්ගල කේන්ද්‍රීයත්වය අගය කර ඇත. පුද්ගලයා තමා පළමුකොට සුදුසු පුද්ගලයකු බවට පත්විය යුතු ය. අන් අයට අවවාද කළ යුත්තේ තමා සුදුස්සෙක් වීමෙන් පසුව ය.[6] මේ අනුව පැහැදිලි වන්නේ බෞද්ධ චින්තනය පදනම් වී ඇත්තේ පළමුව

ස්වකීය අභිවෘද්ධිය මත බව යි. බෞද්ධ චින්තනයට අනුව පුද්ගලයා ම ශ්‍රේෂ්ඨ කොට සලකා ඇත.

අදෘශ්‍යමාන දෙවියකු ළඟ නොව පුද්ගල විමුක්තිය එක් එක් පුද්ගලයා සතු ය. හේතු ප්‍රත්‍යයන් නිසා සාපේක්ෂකව පහළ වූ චින්තනය එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයෙකුට කිසියම් ප්‍රමාණයකින් ලබාගත හැකි ය. බෞද්ධ චින්තනයෙහි උත්කෘෂ්ඨ අවස්ථාව අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යි. යමක් ප්‍රත්‍යක්ෂයෙන් ම දැකීම බෞද්ධ චින්තන ක්‍රමයේ ස්වභාවය යි. යථෝක්ත මූල ධර්මයන් මත ගොඩනැගුණු බෞද්ධ චින්තනය මුළුමනින් ම ස්වාධීන වූව කි. එම ස්වාධීනත්වය කාලාම සූත්‍රයෙන් මනාව පැහැදිලි වෙයි. ස්වාධීනව සිතා මතා විමසා ක්‍රියා කිරීමට ඇති ඉඩකඩ කාලාම සූත්‍රයෙන් අනාවරණය වේ. බෞද්ධ චින්තනය තමා විසින් හදවතට එකඟව අව්‍යාජ හැඟීමට අනුව හොඳ නරක පිළිබඳ තීරණ ගැනීමේ සම්පූර්ණ වගකීම පුද්ගලයා වෙත පවරා ඇත.

ස්වච්ඡන්දතාව යන නමින් ආචාර විද්‍යාවේ උගන්වන සිය කැමැත්තට අනුව වගකීමෙන් යුතුව ක්‍රියා කිරීමේ ක්‍රමය කාලාම සූත්‍රයෙන් උගන්වයි. බෞද්ධ චින්තන ක්‍රමයට අනුව ස්වයං තීරණ ගැනීමේ අයිතිය හා වගකීම ඔහු සතුවන අතර එයට මාර්ගෝපදේශකත්වය ලබාගත යුතු වේ.[7] මේ සඳහා අවශ්‍ය මඟපෙන්වීම බෞද්ධ චින්තනය මගින් සිදුකර ඇත. එහෙත් අනුන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් තොරව ස්වාධීනව ක්‍රියා කිරීමට තමා තුළ හැකියාවක් ඇත්නම් එසේ කිරීමට ද බුදුදහමෙන් ඉඩ සලසා දී තිබේ.

හැම පුද්ගලයෙක් ම බුද්ධිමතෙක්, විශාරදයෙක් නො වුණත් හොඳ නරක වෙන් කර ගැනීමේ ශක්තිය හැම පුද්ගලයා සතුව ම ඇත. ඊනෑ ම කෙනෙකුට සිය ජීවිතයේ දී ඇතිවන ගැටළු නිරාකරණය කරගැනීමේ දී අවශ්‍ය පිටුවහල ද මේ බෞද්ධ චින්තන ක්‍රමය තුළින් ලබා ගත හැකි ය. මෙකී හැකියාවෙන් ඵල නෙලා ගැනීමට අවස්ථාව සලසා දීම බෞද්ධ චින්තනයේ ස්වභාවය යි.

ධම්මචරියාව හෙවත් සමචරියාව බෞද්ධ චින්තනයේ තවත් එක් පියවරකි. අධම්මචරියා සහ විෂමචරියා එහි ප්‍රතිවිරුද්ධ අංශය යි. පුද්ගල ක්‍රියාකලාපය හේතු කොටගෙන ආධ්‍යාත්මික හා සාමාජික යන උභයාංශයන්හි සිදු වන දූෂණය විෂමචරියාව යි. පුද්ගලයාගේ විෂම ක්‍රියාව නිසා සිදුවන දුර්විපාක හේතු කොටගෙන පුද්ගලයා තුළත් සමාජය තුළත් දූෂණ විෂමතා පහළ වෙයි. බෞද්ධ චින්තනයෙහි දක්නට ලැබෙන අංශ තුන කි.

i. ආගමික චින්තනය
ii. දාර්ශනික චින්තනය
iii. ආචාර විද්‍යාත්මක චින්තනය යනුවෙනි[8]

ආගමික චින්තනයේ දී ශ්‍රද්ධාවට, භක්තියට හා ගෞරවයට ප්‍රමුඛ ස්ථානය ලැබේ. ඇදහිලි හා විශ්වාස පද්ධතියකින් සමන්විත ආගමික චින්තනය ආමිස පූජාවන්ගෙන් හා ප්‍රතිපත්ති පූජාවන්ගෙන් ද යුක්ත ය. ආගමික චින්තනය බොහෝ විට සකස් වී ඇත්තේ ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධාව පදනම් කොට ගනිමිනි. ලොව පැවැත්මට වාතය, ජලය සහ උෂ්ණය අවශ්‍ය වන්නා සේ බෞද්ධ චින්තනයට ශ්‍රද්ධාව බුද්ධිය හා චර්යාධර්ම අවශ්‍ය වේ. ශ්‍රද්ධාව ආගමික චින්තනයේ පදනම යි. එබැවින් පුද්ගලයා ආගමික චින්තනයට යොමු වීම ආරම්භ වන්නේ ශ්‍රද්ධාවෙනි.[9] ආගමික චින්තනයේ බීජය වන්නේත් ධනය වන්නේත් ශ්‍රද්ධාව යි.[10] මේ අනුව ආගමික චින්තනයේ දී ප්‍රමුඛත්වය ලැබෙන්නේ ශ්‍රද්ධාවට බව පැහැදිලි වේ.

බුද්ධියට හෙවත් ඥානයට ප්‍රමුඛත්වය හිමි වන්නේ දාර්ශනික චින්තනය යි. දර්ශනය යනු දැකීම යන වචනයෙන් ගොඩ නැගී ඇති පදයකි. බුද්ධිය මෙහෙයවා එහි යථා ස්වරූපය දැකීමේ අර්ථයෙන් දර්ශනය යන වචනය යෙදී ඇත. මෙසේ වූ දර්ශනය බටහිර දාර්ශනිකයන් විසින් අංශ පහක් ඔස්සේ සාකච්ඡා කර ඇත. දර්ශනයේ උප විෂයයන් ලෙස මෙම කොටස් පහ දක්වා ඇත.

i. ආචාර විද්‍යාව
ii. මනෝ විද්‍යාව

iii. ඥාන විමංසාව

iv. පාරභෞතික විද්‍යාව

v. තර්ක ශාස්ත්‍රය වශයෙනි.

බටහිර දර්ශනය මෙසේ කොටස් පහක් ඔස්සේ සාකච්ඡා කරන්නා සේ ම බෞද්ධ දාර්ශනික චින්තනය ද කොටස් පහක් ඔස්සේ සාකච්ඡා කළ හැකි ය.

i. බෞද්ධ ආචාර විද්‍යාව

ii. බෞද්ධ මනෝ විද්‍යාව

iii. බෞද්ධ ඥාන විමංසාව

iv. බෞද්ධ පාරභෞතික විද්‍යාව

v. බෞද්ධ තර්ක ශාස්ත්‍රය

මෙ උප විෂය ක්ෂේත්‍රයන්ගෙන් දාර්ශනික චින්තනය සකස් වී ඇත.

බෞද්ධ චින්තාව දාර්ශනික වශයෙන් විමසා බැලීමේ දී එහි මූලික ලක්ෂණ තුනක් දැකිය හැකි ය.

i. අනිත්‍යය

ii. දුක්ඛ

iii. අනාත්ම

යන ත්‍රිලක්ෂණය යි. ජීවිතයේ සහ ලෝකයේ යථා ස්වභාවය වටහා ගැනීමේ දී මෙම ත්‍රිලක්ෂණ දේශනාව ඉතා වැදගත් වෙයි. ලොව ඇති සජීවි අජීවි සෑම පදාර්ථයක් ම වෙනස්වන සුළු ය. හේතුප්‍රත්‍ය නිසා හටගෙන ඇති සංස්කාර සියල්ල අනිත්‍යය ය. (අනිච්චා වත සංඛාරා) යමක් අනිත්‍ය නම් ඒ සියල්ල දුක් සහගතය (යදනිච්චං තං දුක්ඛං). හේතු ප්‍රත්‍ය නිසා හටගත් සියල්ල ම අනිත්‍ය හා දුක්ඛ බැවින් ආත්ම වශයෙන් ගත හැකි කිසිවක් ද නැත (සබ්බේ ධම්මා අනත්තා). සමස්තයක් ලෙස ගෙන බලන විට බෞද්ධ චින්තනය ගොඩ නැගී ඇත්තේ ලොව යථා තත්ත්වය වන ත්‍රිලක්ෂණය පදනම්

කරගෙන ය. මේ අනුව බෞද්ධ චින්තනයෙහි අවසාන පරමාර්ථය යථාභූත ඥාන දර්ශනය යි.

ලෝකයේ පැවැත්ම පිළිබඳ බෞද්ධ දර්ශනයේ එන අනාත්ම සංකල්පය, කර්මය හා පුනර්භවය පිළිබඳ ඉගැන්වීම් දෙස මතුපිටින් බලන විට ප්‍රතිවිරුද්ධ ස්වභාවයක් දක්නට ලැබේ. ලොව සියල්ල අනාත්ම නම් කර්ම කරන්නකු හෝ විපාක විඳින්නකු හෝ විය නො හැකිය.[11] යන ප්‍රශ්නය පුද්ගලවාදීන් විසින් ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රශ්නයට කදිම පිළිතුරක් හේතුඵල සිද්ධාන්ත පැහැදිලි කරන පටිච්චසමුප්පාදයෙන් ලැබේ. ලෝකයේ පැවැත්ම යනු හේතුඵලවාදය පැහැදිලි කරන සාපේක්ෂක ක්‍රියාවලිය කි. මුළු විශ්වයේ ම වාසයකරන සියලු සත්ත්වයන් හා ලොව පවත්නා භෞතික ද්‍රව්‍යාත්මක වස්තූන් සියල්ල ඒවාට ම උරුම වූ ධර්මතාවන්ට අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් ඒවායෙහි ක්‍රියාකාරිත්වයට බාහිර කාරකයක් අවශ්‍ය නො වේ. කාරකයා සහ වේදකයා අප විසින් ම සිතින් මවාගත් අයෙක් පමණි.

බෞද්ධ චින්තන ක්‍රමයෙහි තෙවන අංශය වන්නේ ආචාර විද්‍යාත්මක චින්තනය යි. ආචාර විද්‍යාත්මක චින්තනයේ දී චර්යා ධර්මවලට මූලිකත්වය ලැබී ඇත. හොඳ නරක මෙන් ම කුසල් අකුසල් පිළිබඳව ද දාර්ශනික පදනමකින් විවරණය කිරීම ආචාර විද්‍යාත්මක චින්තනයේ ප්‍රධාන ලක්ෂණය යි. කුසල් යනු කුමක්ද? අකුසල් යනු කුමක්ද? ඒවා වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට ඇති මිණුම් දඬු කවරේද? යන ප්‍රශ්නවලට විසඳුම් සෙවීම ආචාර විද්‍යාවේ දී සිදු කෙරේ. ඉහත සඳහන් කරන ලද ආචාර ධර්මයන්ට බෞද්ධ චින්තනයේ දී හිමිවන්නේ අග්‍රගණ්‍ය ස්ථානය කි. මෙකී චර්යාධර්ම හේතු කොටගෙන දුක් හෝ සැප ඇතිවන අයුරු මැනවින් පෙන්වා දී ඇත.

ඉහත සඳහන් කරන ලද ආකාරයට බෞද්ධ චින්තන ක්‍රමය අංශ කිහිපයක් ඔස්සේ දිව යනු දැකිය හැකි ය. බෞද්ධ චින්තන ක්‍රමයේ අවසාන පරමාර්ථය වන්නේ අන්තගාමීත්වයෙන්, අන්ධ භක්තියෙන් තොර විමර්ශනශීලි පුද්ගලයකු බිහි කිරීම යි. නිදහස්

චින්තනය හා විමංසනය බෞද්ධ චින්තන ක්‍රමයේ දී අගය කරන අංශ දෙක කි.

## විමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය

ලොව පහළ වූ ආගමික ශාස්තෘවරුන් බොහෝ දෙනකුගේ උත්පත්තිය සිදු වී ඇත්තේ නිර්මාණවාදී පදනමකිනි. තමන් සර්ව බලධාරී දෙවි කෙනකුගේ නිර්මාණයක් යැයි ඔවුහු පිළිගත්හ. නො එසේ නම් දෙවියන්වහන්සේ විසින් මෙලොවට එවන ලද දේව පුත්‍රයෙකැ යි පිළිගත්හ. බුදුරජාණන්වහන්සේ එබඳු ආගමික නායකයකු නො වේ. තමන් මිනිස් ලොව උපන් මිනිසෙකු මිස අන් කිසිවකු නො වන බව ප්‍රකාශ කළ එක ම ශාස්තෘවරයා බුදුරජාණන්වහන්සේ ය.[12] උන්වහන්සේ තමන් කිසිදු දෙවියකු විසින් හෝ බාහිර බලවේගයක් විසින් මෙහෙයවනු ලබන්නෙකි යි නො කීහ. තමා මනුෂ්‍ය ලෝකයේ මිනිසුන් දෙදෙනකුට දාව උපන් බව උන්වහන්සේ ප්‍රකාශ කළහ. මේ නිසා මනුෂ්‍යත්වය ශ්‍රේෂ්ඨ කොට සැලකූහ. යම් සේ දියෙහි උපන්නා වූ සුවඳවත් ලස්සන පියුම දියෙහි නො තැවරී දියෙහි ම වැඩෙයි. එපරිද්දෙන් තථාගතයන් වහන්සේ ද ලෝකයෙහි ඉපිද ලොව ඇති කෙලෙස් නමැති මඩ නො තවරා ගනිමින් පියුමක් සේ බබලමින් ලොව ජීවත් වන බව දේශනා කර ඇත.[13] බුදුරජාණන්වහන්සේ ද මනුෂ්‍ය ලෝකයෙහි ඉපදුණු මනුෂ්‍යයකු බව උන්වහන්සේ විසින් ම දේශනා කරන ලද බව මෙයින් පැහැදිලි වෙයි.

ලොව බිහි වූ විවිධ ආගමික දර්ශනයන් පිළිබඳ ව තුලනාත්මක ව විමසීමේ දී බෞද්ධ දර්ශනයට පමණක් ආවේණික ලක්ෂණයක් ලෙස විචාර පූර්වක චින්තාකල්පය හඳුන්වා දිය හැකි ය.[14] ලොව ඇති උත්තරීතර ම තත්ත්වය වන බුද්ධත්වය අවබෝධ කර ගැනීම සඳහා බුදුරජාණන්වහන්සේ ගමන් කොට ඇත්තේ විචාර පූර්වක මාර්ගයක බව මජ්ඣිම නිකායේ සංගාරව සූත්‍රයෙන් පැහැදිලි වෙයි. බුදුරජාණන්වහන්සේ මණ්ඩලකප්ප නුවර තෝදෙය්‍ය බමුණාගේ අඹ වනයෙහි වැඩ සිටින බව දැනගත් සංගාරව බමුණා බුදුරජාණන්වහන්සේ හමුවීමට පැමිණ පෙර ආත්ම භාවයන්හි

සිට ම පාරමී පුරා නිවනට පැමිණි අය අතර බුදුරජාණන්වහන්සේ ද සිටී දැයි විමසී ය.[15] එවිට බුදුරජාණන්වහන්සේ දේශනා කළේ ගිහි ගෙදර සම්බාධක සහිත බව ත්, කෙලෙස් සහිත බව ත් දුටු මා හිස් ආකාශය වන් නිදහස් පැවිද්ද ලබා ගැනීමට අපේක්‍ෂා කළ බව යි.[16]

බුද්ධචරිතය උපතේ සිට මරණය දක්වා ම විමර්ශනශීලි චරිතය කි. උන්වහන්සේ වීමංසනය ආරම්භ කරන්නේ සතර පෙර නිමිති දුටු අවස්ථාවේ දී ය. මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක්, යන සතර පෙර නිමිති දුටු සිද්ධාර්ථ කුමාරයා ඒ දෙස දාර්ශනික ඇසින් බලා විචාර පූර්වක වීමංසනයෙන් නිගමනවලට එළඹිණි. ඒ අවස්ථාව වීමංසනයේ ආරම්භය යි. ඉන් අනතුරුව සසර දුක හා පැවිද්දේ නිදහස් බව දුටු උන්වහන්සේ කාල වර්ණ කේශ කලාපයෙන් යුතු භද්‍ර යෞවන වයසේ දී දෙමාපියන් සහ බිරිඳ හඬද්දී ම කෙස් රැවුල් බහා කසාවත් හැඳ ගිහි ගෙයින් නික්ම පැවිදි භාවයට පත් වූ ආකාරය සංගාරව සූත්‍රයේ විස්තර වෙයි. මෙසේ අනගාරික ජීවිතයකට යොමු වූ උන්වහන්සේ කිං කුසල ගවේසීව සත්‍ය ගවේෂණය කරමින් ඇවිදින අතරවාරයේ දී ආලාරකාලාම තවුසා හමුවිය.[17] එතුමා හමු වී ඉතා කෙටි කාලයකින් ආකිඤ්චඤ්ඤායතනය දක්වා එතුමා දන්නා සියලු ම ශිල්ප ශාස්ත්‍ර උගත්හ.

විමර්ශනශීලි වූ බෝසතුන් තමා උගත් ධර්මය නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, වූපසමය පිණිස, නිර්වාණය පිණිස හේතු නො වන බව දැන සත්‍යය සොයමින් තව දුරටත් ආචාර්යවරු සොයා ගියහ.[18] උද්දකරාම පුත්ත තවුසා සමීපයට ගොස් නේවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා ඔහුගෙන් එම දහම ද තමා සොයන සත්‍ය නො වන බව අවබෝධ කොට ගෙන එතැනින් ද ඉවත් ව ගියහ. තව දුරටත් විමර්ශනශීලි වූ බෝසතුන් ස්වයංභූඥානයෙන් පරම සත්‍ය අවබෝධ කරගැනීමේ අදහසින් සේනානි නම් නියම් ගමට ගොස් බෝ රුක මුල වැඩ සිටිමින් අත්ථකිලමතානුයෝගය වඩන්නට විය. අප්‍රාණික ධ්‍යානය වැඩූ

උන්වහන්සේ මුවින් සහ නාසයෙන් ආශ්වාස ප්‍රශ්වාස නො කළහ. එවිට උන්වහන්සේට දැනුනේ බලවත් පුරුෂයෙක් කඩු සිලෙකින් මුදුන පෙළන්නාක් මෙන් හැඟීමක් බව උන්වහන්සේ දේශනා කළහ. මෙසේ ශරීරයට දැඩි දුක් දෙමින් භාවනා කරන අතරවාරයේ දී ආහාර නො ගැනීම නිසා අප්‍රාණිකව වැටුණු අවස්ථා එමට ය. ඒ දුටු සමහර දෙවියෝ ශ්‍රමණ භවත් ගෞතමයන් කළුරිය කළහ යි කීහ.[19] මෙසේ ශරීරයට දැඩි දුක් දීමෙන් සත්‍ය සොයා ගැනීම අසීරු බව අවබෝධ කරගත් උන්වහන්සේ කාමසුඛල්ලිකානුයෝගය අනුගමනය කිරීමට පෙළඹිණි. එවිට පස්වග තවුසන් ද උන්වහන්සේ අත්හැර ගියහ.[20] ඉන් අනතුරුව අන්තයන් ද්වයෙන් ම බැහැර වූ උන්වහන්සේ මැදුම් පිළිවෙත අනුගමනය කළහ. එසේ භාවනා කළ උන්වහන්සේ පිළිවෙලින් ප්‍රථම ද්විතීය, තෘතීය හා චතුර්ථ ධ්‍යාන උපදවා ගත්හ.

විමර්ශනශීලි බෝසතාණන්වහන්සේ පුබ්බේනිවාසානුස්සති ඥානය, චුතූපපාතඥානය, ආසවක්ඛයඥානය යන ත්‍රිවිද්‍යා අවබෝධ කරගෙන නිවන් පසක් කර ගත්හ. බෝසතාණන්වහන්සේ අවබෝධ කරගත් බුද්ධත්වය කෙටි කලකින් ලබා ගන්නා ලද්දක් නො වේ. සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් සසර පෙරුම් දම් පිරීමෙන් අවබෝධ කරගන්නා ලද තත්ත්වයකි. එතරම් කලක් විමර්ශනශීලීව සසර ගමන් කළ උන්වහන්සේගේ බුද්ධත්වය විමංසනයේ අග්‍ර ඵලයක් ලෙස සඳහන් කළ හැකි ය.

ඉතා කටුක මාවතක් ඔස්සේ ගමන් කරමින් තමා අපේක්ෂා කළ සත්‍යය අවබෝධ කරගනු වස් විමංසනයෙන් ක්‍රියා කළහ. එසේ සත්‍යය අවබෝධ කරගත් උන්වහන්සේ දම්සක් පැවැත්වීම සඳහා ඉසිපතනය බලා වඩින අතරමග දී උපක නම් ආජීවකයා හමුවිය. බුදුරජාණන්වහන්සේගේ ශ්‍රී ශෝභාව දුටු උපක උන් වහන්සේට සමීපව "ඇවැත්නි ඔබ දමනය කරන ලද ඉඳුරන් ඇත්තෙකි. බබලන ශරීරයකින් යුක්ත ය. ඔබ කවරකු උදෙසා පැවිදි වූයේ ද? කවරකුගේ ධර්මයක් අදහන්නේ ද? ඔබේ ශාස්තෘවරයා කවරෙක් ද යනුවෙන් විමසා සිටියහ. එයට පිළිතුරු

වශයෙන් බුදුරජාණන්වහන්සේ පවසන්නේ මට ආචාර්යවරයෙක් නැත. මා හා සමාන කළ හැකි කිසිවෙක් ද ලොව නැත. මම රහත් වෙමි. උත්තරීතර වූ ශාස්තෲවරයා වෙමි. සැනසුනා වූ නිවුණා වූ සම්මා සම්බුදුන් වෙමි[21] යනුවෙනි. බුදුරජාණන්වහන්සේ ස්වකීය පෞරුෂත්වය කෙසේ අගය කළේ ද යන්න මේ තුළින් මනාව පැහැදිලි වේ. බුදුරජාණන්වහන්සේ මට ඇදුරකු නැතැයි කීම යමෙකුට ගැටළුවක් විය හැකි ය. බුදුවීමට හෝ බුදු වූ පසු උන්වහන්සේට ඇදුරෙක් සිටියේ නැත. බෝසත් කල්හි නොමැති බවක් මින් නො හැඟේ. බුදුරජාණන්වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමත් සමඟ චතුසත්‍ය ධර්මය අවබෝධ කර ගත්හ. එය සාමුක්කංසික ධර්ම දේශනා හෙවත් තමා ම ඔසවා ගත් ධර්ම දේශනා යැ යි කියනු ලැබේ. මෙය විවරණය කරන අටුවාචාරීන්-වහන්සේලා න මෙ ආචරියො අත්ථි ලොකුත්තර ධම්මෙ මය්හං ආචරියො නාම නත්ථි යනුවෙන් සඳහන් කරති. මට ඇදුරෙක් නැතැයි යනු ලෝකෝත්තර ධර්ම විෂයයෙහි ආචාර්යවරයෙක් නැත යන්න යි.

බුදුරජාණන්වහන්සේ සර්වඥ විය. එහෙත් උන්වහන්සේ සිය ජීවිත කාලය තුළ අන්‍යමත ඉවසීම හෙවත් විමසීම උතුම් කොට සලකන ලදි. විනය ප්‍රඥප්තීන් පනවන විට තමන් අසල බුද්ධිමතුන් සිටියහොත් ඒ ඒ කරුණු පිළිබඳ ඒ ඒ අයගෙන් විමසන ලදි. දෙවන පාරාජිකා ශික්ෂාපදය පැනවීම මෙයට කදිම නිදසුන කි. සොරකම පිළිබඳ රාජ දඬුවම කෙබඳු දැ යි පුරාණ අමාත්‍යයකු වූ භික්ෂුවකගෙන් විමසා ඒ අනුව දෙවන පාරාජිකා ශික්ෂාව පනවන ලදි. මෙයින් පැහැදිලි වන්නේ බුදුරජාණන්වහන්සේ කෙතරම් දුරට වීමංසනය ගරු කළේ ද යන්න යි.

වීමංසනය බුද්ධචරිතයෙන් හෙළිවන තවත් අවස්ථාවක් දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වෙයි. තමන් අවබෝධ කරගත් ධර්මය නො සඟවා තම ශ්‍රාවකයන්ට දේශනා කිරීම උන්වහන්සේගේ ශාස්තෘත්වයේ ඇති විශිෂ්ට ලක්ෂණයකි. ශිෂ්‍යයන් කෙරෙහි ආදරය ඇති, ඔවුන්ගේ දියුණුව අපේක්ෂා කරන

ශාස්තෘවරයකු තුළ මේ ගුණය තිබිය යුතුම ය.[22] වරක් බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන් අමතා "ආනන්දයෙනි, මා විසින් අභ්‍යන්තර හා බාහිර යැයි දහම් දෙසන ලදි. ආනන්දයෙනි, ධර්ම විෂයයෙහි තථාගතයන්ගේ ආචාර්ය මුෂ්ටියක් නැත[23] යනුවෙන් දේශිතය. නමුත් බුදුරජාණන්වහන්සේ සමහර අවස්ථාවල ශ්‍රාවකයන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු නො දුන්හ. අව්‍යාකෘත ප්‍රශ්න නමින් ප්‍රශ්න දහයක් විමසූ චූලමාලුංක්‍යපුත්ත තෙරුන්ට විසඳුම් ලබා දුන්නේ නැත. එබඳු ප්‍රශ්න විමුක්ති සාධනය විෂයයෙහි උපස්ථම්භක නො වන බැවින් ඒවාට පිළිතුරු නො දුන්හ. පුද්ගලයාට විමුක්තිය අවබෝධ කරවීමට අවශ්‍ය සියලු ම ධර්මයන් උන්වහන්සේ දේශනා කරන ලදි.

බුදුරජාණන්වහන්සේ නිතර ම අපේක්ෂා කළේ තම ශ්‍රාවකයන් තමන්ගෙන් ප්‍රශ්න විමසාවි යනුවෙනි. පරිනිර්වාණ මංචකයේ දී පවා බුදුරජාණන්වහන්සේ තම ශ්‍රාවකයන්ට විමසීමට ඉඩ සලසා දුන්හ. බුදුකෙනකුන් ලොව පහළ වන්නේ කලාතුරකින් යැයි දැනගත් සුභද්‍රට තමා තුළ තිබූ සැකයක් විසඳාගැනීමට අවශ්‍ය විය. ඒ බව අනඳ තෙරුන්ට තෙවරක් දන්වා සිටියත් උන්වහන්සේ අවසර නො දුන්නේ බුදුරජාණන්වහන්සේ වෙහෙසට පත්කිරීම නො මනා බැවිනි. දිවැසින් මේ සිද්ධිය දුටු බුදුරදුන් සුභද්‍රට කතා කොට ඔහුගේ සැකය දුරු කරන ලදි.[24] තවත් අවස්ථාවක පිරිනිවන් මංචකයේ වැඩහුන් බුදුරජාණන්වහන්සේ භික්ෂූන් අමතා තෙවරක් ප්‍රකාශ කළේ "මහණෙනි, බුදුන් කෙරෙහි හෝ ධර්මය කෙරෙහි හෝ, සංඝයා කෙරෙහි හෝ විමතියක් ඇත්නම් එය විමසන්න. ශාස්තෘ කෙනෙක් හමු වී සිටිය දීත් එසේ විචාරීමට නො හැකි විණැයි පසුව කණගාටු නො වන්න යනුවෙනි.[25] බුදුරජාණන්-වහන්සේ කෙතරම් විමංසනයට ගරු කළේ ද යන්න මෙම ප්‍රකාශය තුළින් පැහැදිලි වෙයි. මෙසේ තෙවරක් ප්‍රකාශ කරද් දී ත් භික්ෂූන් නිහඬව සිටිනවා දුටු බුදුරජාණන්වහන්සේ යම් භික්ෂුවක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ඇති ගෞරවය නිසා නො විමසන්නේ නම් මිත්‍රයෙකු ලවා හෝ විමසන්න. තමන් වහන්සේ ඒ ඕනෑම ප්‍රශ්නයකට ඉතා කැමැත්තෙන් පිළිතුරු දෙන්නෙමි යි වදාළහ.[26]

ඉහත සඳහන් මහාපරිනිබ්බාන සූත්‍රාගත ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වන්නේ බුදුරජාණන්වහන්සේ විමංසනයට අනුබල දුන් බව යි. තමන් වහන්සේ පිරිනිවන් මඤ්චකයේ ඉතා අපහසුවෙන් සිටින අවස්ථාවේ වුව ද විමසීමට ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇත. බුදුරජාණන්වහන්සේ නිතර ම අපේක්ෂා කළේ තම ශ්‍රාවකයන්ට විමුක්තිය අවබෝධ කරවීමට ය. ඒ බව ගණේගම සරණංකර නාහිමියන් විසින් රචිත බුදුහාමුදුරුවෝ නම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් වෙයි.

"අනික් සියලු ම ශාස්තෘවරයෝත් ගැලවුම්කරුවෝත්, මැවුම්කරුවෝත්, නායකයෝත්, තමන් සමාන තවත් කෙනෙකුගේ ඇතිවීමක් හෝ පහළවීමක් හෝ නො දැක්වූහ. නො කැමති වූහ. නො පැතූහ. එහෙත් අපේ බුදුහාමුදුරුවෝ ලෝකයේ හැම කෙනෙකුත් ම තමන් සමාන බුදුවරුන් වෙතොත් ඒ තරමට කැමති වූහ. ඒ තත්ත්වය ලබාගන්නා ක්‍රම ඉගැන්වූහ. තමන් ලැබූ ශ්‍රේෂ්ඨත්වය, තමන් ලැබූ සම්‍යග් සම්බුද්ධත්වය, අන් හැම දෙනාට ම ලැබේවා යනු උන්වහන්සේගේ අවංක ප්‍රාර්ථනාව විය. උත්සාහ ගනිතොත්, වීර්යය වඩතොත් පෙරුම් පුරතොත් හැම කෙනෙකුන්ට ම බුදුවරුන් විය හැකි යැයි උන්වහන්සේ වදාළහ. [27]

බුදුරජාණන්වහන්සේ කිසිවිටෙකත් තම ශ්‍රාවකයන් මෙහෙයවීමට උත්සාහ නො කළේය. හැම පුද්ගලයකු ම තමා ගැන වගකිව යුතු ය යන අදහස උන්වහන්සේ තුළ නිතර ම තිබිණි. භික්ෂු සංඝයා පරිහරණය කිරීමට තමන් කිසි විටෙකත් අදහස් නො කළ බව ද, ඔවුන් තමන් උදෙසා නො විසිය යුතු බව ද මහා පරිනිබ්බාන සූත්‍රයේ දී වදාළහ.[28]

බුදුරජාණන්වහන්සේ තම ශ්‍රාවකයන්ට මග පෙන්වීමෙන් අපේක්ෂා කළේ ඔවුන් ව්‍යක්ත, විනීත විසාරද, බහුශ්‍රැත, ධර්මධර, විනයධර, ධර්මානුධර්ම ප්‍රතිපන්න වූ, සාමීචිප්‍රතිපන්න, අනුධම්මචාරී, පිරිසක් බවට පත් කිරීම යි.[29] තව ද සිය ශ්‍රාවකයන් ස්වකීය

ආචාර්යවාදය ඉගෙන කියන්නාහු ද, දෙසන්නාහු ද, පනවන්නාහු ද, පිහිටුවන්නාහු ද, විවෘතකොට දක්වන්නාහු ද, බෙදා දක්වන්නාහු ද, අන්‍යමතයන් සකාරණව මැඩලිය හැකි පිරිසක් බවට පත්වනවා දැකීම බුදුන්වහන්සේගේ එක ම අභිප්‍රාය විය.[30] එම නිසා උන්වහන්සේ නිතර ම දේශනා කළේ තම ධර්මය නුවණැත්තන්ට මිස අනුවණයන්ට නො වන බව යි. **පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස** යන පාඨයෙන් ඒ බව පැහැදිලි වෙයි. බුදුදහම ප්‍රඥාගෝචර, බුද්ධිගෝචර දහම කි. සාමාන්‍ය අයට අවබෝධ කරගැනීමට අපහසු දහම කි. විචාර පූර්වක චින්තාකල්පයකින් යුත් විමර්ශනශීලී අයට පමණක් අවබෝධ කොටගත හැකි දහමක් ය යන්න බුදුරජාණන්වහන්සේගේ දේශනාව යි. **පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි** යන දීඝනිකායාගත පාඨයෙන් පැවසෙන්නේ ද බුදුදහමේ සත්‍යය නැණවතුන් විසින් ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කළ යුතු බව යි. විචාර බුද්ධියෙන්, වීමංසනයෙන් යුක්ත තැනැත්තා මෙහි දී නැණවතා ලෙස දක්වා ඇත. අවිචාරවත් ලෙස ආදානග්‍රාහීව කටයුතු කරන පුද්ගලයන්ට බුදුදහම අවබෝධ කරගත නො හැකි බව මෙම දේශනාවන්ගෙන් පැහැදිලි ය. බුදුරජාණන්වහන්සේ කිසි විටෙකත් තම ධර්මය වසා තැබීමට උත්සාහ කළේ නැත. නිතර ම අපේක්ෂා කළේ ධර්මයේ විවෘත භාවය යි. ලොව විද්‍යමාන අන් බොහෝ ධර්මයන් විවෘත වන තරමට අගය වටිනාකම අඩු ය. නමුත් බුදුදහම ඊට හාත්පසින් ම වෙනස් ය. බුදුරජාණන්වහන්සේ දේශනා කළේ තමන් වහන්සේ විසින් දේශිත ධර්මය හා විනය විවෘතවන තරමට බබලන බවත් ය.[31] බුදුදහම විවෘත වීමට නම් ඒ පිළිබඳ ව සැක උපදවාගෙන ප්‍රශ්න කළ යුතු ය. තම ශ්‍රාවකයන්ට ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට බුදුරජාණන්වහන්සේ අවසර ලබා දුන්නේ ඒ තුළින් බුදුදහම විවෘත වන බැවිනි. ඇතැම් ශාස්තෘවරු එසේ ප්‍රශ්න අසනවාට අකමැති විය. නමුත් බුදුරජාණන්වහන්සේගේ ක්‍රමය මීට හාත්පසින් ම වෙනස් විය. සභිය පිරිවැජියාගේ පුවත මෙයට කදිම නිදසුනකි. දෙවියෙක් සභිය පිරිවැජියා වෙතට පැමිණ ප්‍රශ්න කිහිපයක් කියා දී ඒවා විසඳීමට සමත් ගුරුවරයකු ළඟ පැවිදිවන ලෙස දන්වා ගියේ ය.

සභිය එවකට භාරතයේ සිටි ෂඩ් ශාස්තෘන් ආදී වයෝවෘද්ධ ආචාර්යවරු සමීපයට ගියේ ය. ඇතැම් අය ප්‍රශ්න කිරීමට ඉඩ නො දුන්හ. ඇතැම් අය ප්‍රශ්න අසනවාට අකමැති වූහ. ඇතැම් අය පිළිතුරු නො දුන්හ. ඇතමුන් කිපුණහ. ඇතැමුන් දොස් පැවරූහ. ඇතමුන් නො සතුටු වචන හා ඉරියව් දැක්වූහ.[32] එවිට සභිය පරිබ්‍රාජකයා මෙවැනි ශාස්තෘවරුන්ගෙන් ප්‍රශ්න කරනවාට වඩා තමන් පරිබ්‍රාජක වේශය අත්හැර ගිහිවීම හොඳ යැ යි සිතමින් සිටින විට බුදුරජාණන්වහන්සේ මතක් විය. වයසින් බාල වුවත් උන්වහන්සේ වෙත යෑම සුදුසු යැ යි සිතා හමුවීමට ගියේ ය. බුදුරජාණන්වහන්සේගේ පා වැඳ තම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්නේ දැයි විමසා සිටියේ ය. එවිට බුදුරජාණන්වහන්සේ සභිය ඔබ බොහෝ දුර සිට ප්‍රශ්න කිරීමට මා වෙත පැමිණියේ ය. එබැවින් ඕනෑ තරම් ප්‍රශ්න අසන්න ඒ ප්‍රශ්න එකින් එකට පිළිවෙලින් ධර්මානුරූපව, අර්ථානුරූපව පිළිතුරු දෙමියි වදාළහ.[33] බුදුරජාණන්වහන්සේගේ මෙම ප්‍රකාශය ඇසූ සැනින් ම සභියගේ සිත මහත් සොම්නසට පත් විය. එවිට ඔහු ප්‍රකාශ කළේ "අච්ඡරියං වත භො අබ්භුතං වත භො" යනුවෙනි. දේශනාව අවසානයේ දී සභිය තෙරුවන් සරණගිය උපාසකයෙක් බවට පත් විය. බුදුරජාණන්වහන්සේ ප්‍රශ්න කිරීමට සහ විමසීමට ඉඩදුන් තවත් වැදගත් ම අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකි ය.

ඇතැම් පුද්ගලයෝ බුදුරජාණන්වහන්සේ ප්‍රශ්න කිරීමට දුන් නිදහස ප්‍රයෝජනයට ගනිමින් උන්වහන්සේ වෙහෙසට පත් කිරීමේ අදහසින් ප්‍රශ්න කර ඇත. උපාලි ගෘහපතියා එබඳු පුද්ගලයෙ කි. බුදුදහමේ විමංසනයට හිමිවන අග්‍රගණ්‍ය ස්ථානය අවබෝධ කරගැනීමට උපාලි සූත්‍රය අතිශයින් ම වැදගත් වෙයි. නිගණ්ඨනාථ-පුත්තගේ ශ්‍රාවකයකු වූ උපාලි දිනක් බුදුරජාණන්වහන්සේ සමග වාද කිරීමට ගියේ ය. යම් සේ බලවත් පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවකුගේ ලොම් ගෙන ආකර්ෂණ, පරික්ෂණ සම්පරීක්ෂණ කරන පරිද්දෙන් මම ද ශ්‍රමණ භවත් ගෞතමයන් සමග වාද කරමි යි සිතා බුදුරජාණන්වහන්සේ අභිමුවට ගොස් වාද කළහ. වාදයට බට උපාලි අසන ලද ප්‍රශ්නවලට උපමා භාවිත කරමින්

බුදුරජාණන්වහන්සේ පිළිතුරු දුන්හ. පළමු උපමාවෙන් ම පැහැදුණු උපාලි බුදුරජාණන්වහන්සේ ප්‍රශ්න විසඳන ආකාරය ඇසීමට ආශාවෙන් තව දුරටත් ප්‍රශ්න කළහ. අවසානයේ දී බුදුන් සරණ ගිය උපාසකයකු බවට පත් විය. තෙරුවන් සරණ ගිය ඔහු ප්‍රකාශ කළේ ස්වාමීනි, යහපති යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නාසේ ද, වසා තබන ලද්දක් විවෘත කරන්නා සේ ද, මග නො දන්නෙකුට මාර්ගය කියා දෙන්නාසේ ද, අන්ධකාරයට පහනක් දැල්වූවා සේ ද, ඔබ වහන්සේ නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනා කරන ලදි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් මා උපාසකයකු වශයෙන් පිළිගන්නා සේක්වා[34] යනුවෙනි. එවිට බුදුරජාණන්වහන්සේ දේශනා කළේ ගැහැවිය විමසා කරව, විමසා කිරීම තොප වැනි ප්‍රසිද්ධ පුරුෂයනට යහපත් වෙයි යනුවෙන් තෙවරක් ම ප්‍රකාශ කළහ.[35]

## උපාලි සූත්‍රය

උපාලි බෞද්ධ උපාසකයෙක් ලෙස පිළිගත් බුදුරජාණන්වහන්සේ උපාලිට තවත් උපදේශයක් ලබා දුන්නේ ය. ගෘහපතිය තොපගේ ගෙය බොහෝ දවස් නිගණ්ඨයන්ට පැන් පොකුණක් මෙන් විය. එබැවින් ඔබේ නිවසට එන නිගණ්ඨයන්ට පිණ්ඩපාතය දීම නොකඩවා කරගෙන යන ලෙස අවවාද කළහ.[36] මෙම අවවාදය ඇසූ උපාලට තව දුරටත් බුදුරජාණන්වහන්සේ කෙරෙහි ප්‍රසාදයක් ඇතිවිය. මට ම දන් දිය යුත්තේ ය. අන්‍යයන්ට නො දිය යුතු ය. මාගේ සව්වනට ම දිය යුතු ය. අනුන්ගේ සව්වන්ට නො දිය යුතුය. මට ම දෙන ලද්ද මහත් ඵල ය. අන්‍ය සව්වන්ට දෙන ලද්ද මහත්ඵල නො වේ යනුවෙන් අන්‍ය ශාස්තෘවරු කල්පනා කරති. එහෙත් ගෞතම බුදුරජාණන්වහන්සේ නිගණ්ඨයන් කෙරෙහි දන් දීමට ද මා යොමු කරවති.[37] මෙසේ කල්පනා කළ උපාලි, බුදුරජාණන්වහන්සේ කෙරෙහි අපරිමිත ගෞරවයක් ඇතිකර ගත්තේය. බුදුරජාණන්වහන්සේ සහ උපාල ගෘහපතියා, අතර සිදු වූ මෙම වාදයෙන් ද, සීහ සේනාපතියා සහ බුදුරජාණන්වහන්සේ අතර පැවති වාදයෙන් ද බුදුරජාණන්වහන්සේ විමංසනය හා චින්තන නිදහස පිළිබඳ කෙබඳු ආකල්පයක් දැරුවේ ද යන්න මනාව පැහැදිලි වෙයි.

## වීමංසක සූත්‍රය

වීමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය කුමක් ද යන්න අවබෝධ කරගත හැකි වැදගත් ම සූත්‍ර දේශනාව වන්නේ මජ්ඣිම නිකායේ වීමංසක සූත්‍රය යි. සූත්‍රයේ නමින් ම ඒ බව මනාව පැහැදිලි වෙයි. එම සූත්‍රයේ දී බුදුරජාණන්වහන්සේ කිසි ම ආගමික ශාස්තෘවරයකු ලබා නො දුන් නිදහසක් වීමංසනයට ලබා දී ඇත. බොහෝ ආගම්වල ශාස්තෘත්වය පිළිබඳ ව ප්‍රශ්න කිරීමට හෝ විමසීමට කිසිදු ඉඩක් ලබා දී නැත. නමුත් බුදුරජාණන්වහන්සේ එම දුර්ලභ අවස්ථාව ද තම ශ්‍රාවකයන්ට ලබා දී ඇත. එම ශාස්තෘත්වය පිළිබඳ ව පවා ප්‍රශ්න කිරීමට ශ්‍රාවකයන්ට අනුබල දී ඇත. තථාගතයන් වහන්සේ සම්මා සම්බුද්ධ වෙයිද? නො වෙයිදැ යි දැන ගැනීම පිණිස වීමංසක භික්ෂුව තමන් වහන්සේ පවා සමන්වේෂණය කළ යුතු ය යන්න බුදුරජාණන්වහන්සේගේ අවවාදය විය.[38] එම අවවාදය ඇසූ භික්ෂූන් වහන්සේලා අපගේ ධර්මය භාග්‍යවතුන්වහන්සේ ශාස්තෘකොට ඇත්තේ ය. භාග්‍යවතුන්-වහන්සේ පිහිටකොට ඇත්තේ ය. එම ධර්මය භාග්‍යවතුන්වහන්සේට වැටහේ නම් මැනවි යනුවෙන් ප්‍රකාශ කර ඇත. එවිට බුදුරජාණන්-වහන්සේ තවදුරටත් ශ්‍රාවකයන්ට විමසීමට අනුබල දෙමින් දෙවැදෑරුම් ධර්මයක ලා තථාගතයන් වහන්සේ වීමංසනය කරන ලෙස වදාළහ.[39]

i. චක්ෂුර් විඥෙය්‍ය
ii. ශ්‍රෝත විඥෙය්‍ය

ඇසින් හා කණින් සිදුවන කෙලෙස් ධර්මයන් තථාගතයන් තුළ ඇද්ද? නැද්ද? යන ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමට තථාගතයන්වහන්සේ පිළිබඳ විමසිය යුතු ය. වීමංසකයන් දෙදෙනකු සිටින බව වීමංසක සූත්‍රයේ සඳහන් වෙයි.

i. ග්‍රන්ථි වීමංසකයා (සාධන විමසන්නා)
ii. මූල වීමංසකයා (ශාස්තෘවරයාගෙන් ම අසා විමසන්නා)

මෙම වීමංසකයන් දෙදෙනාගෙන් මූල වීමංසකයා හෙවත් ශාස්තෘන්වහන්සේගෙන් ම අසා විමසන්නා තථාගතයන්වහන්සේ පහත සඳහන් පරිදි විමසිය යුතු ය.

මූල වීමංසකයා : ක්ලේශ සම්ප්‍රයුක්ත වූ චක්ෂු ශ්‍රෝත විඥෙය්‍ය වූ යම් ධර්ම කෙනෙක් ඇත්ද? ඒ ධර්මයෝ තථාගතයන්වහන්සේට ඇද්ද? හෝ නැද්ද?

බුදුරජාණන්වහන්සේ : එම ධර්මයේ තථාගතයන්වහන්සේට නැත.

මූල වීමංසකයා : ව්‍යාතිමිශ්‍ර වූ චක්ෂුශ්‍රෝත විඥෙය්‍ය වූ යම් ධර්ම කෙනෙක් ඇද්ද ඒ ධර්මයෝ තථාගතයන්වහන්සේට ඇද්ද? හෝ නැද්ද?

බුදුරජාණන්වහන්සේ : එම ධර්මයෝ තථාගතයන්වහන්සේට නැත.

මූල වීමංසකයා : පාරිශුද්ධ වූ චක්ෂුශ්‍රෝත විඥෙය්‍ය යම් ධර්ම කෙනෙක් ඇද්ද එම ධර්මයෝ තථාගතයන්වහන්සේට ඇද්ද? හෝ නැද්ද?

බුදුරජාණන්වහන්සේ : එබඳු වූ ධර්මයෝ තථාගතයන්වහන්සේට ඇත. තථාගතයන් වහන්සේ එය මාර්ගය කොට ඇතියහ. එය ගෝචර කොට ඇත. ඒ නිසා තෘෂ්ණා රහිත ය.

මෙසේ බුදුරජාණන්වහන්සේ ස්වකීය ශාස්තෘත්වය පවා විමසීමට තම ශ්‍රාවකයාට අනුබල දී ඇත. ශ්‍රාවකයා මෙබඳු වූ ශාස්තෘන් වහන්සේ වෙත ධර්ම ශ්‍රවණය සඳහා එළඹෙන්නට සුදුසු ය.[40] එබඳු වූ ශාස්තෘන්වහන්සේ පින් පව්වල විපාක දක්වමින් පැහැදිලි ධර්මයක් දේශනා කරයි. එම ධර්මය මනාව අසන වීමංසක භික්ෂුව ධර්මය අවබෝධ කොට ගෙන නිවනට පත් වෙයි. භාග්‍යවතුන්වහන්සේ සම්මා සම්බුද්ධ වෙති යි උන්වහන්සේ කෙරෙහි පහදිති. ධර්මය ස්වාක්ඛාත යැයි පහදියි. සංඝයා සුපිළිපන් යැයි පහදිති. යමෙක් එසේ සඳහන් කළ පමණින් නො පිළිගෙන

එසේ කීමට හේතු සාධක කවරේ ද? ප්‍රමාණ කවරේදැ යි විමසිය යුතු ය යනුවෙන් දේශනා කරන බුදුරජාණන්වහන්සේ ශ්‍රාවකයා තවදුරටත් වීමංසනයට යොමු කරවයි. එවිට වීමංසක භික්ෂුව ප්‍රකාශ කරන්නේ "මම ධර්ම ශ්‍රවණය සඳහා භාග්‍යවතුන් කරා එළඹියෙමි. භාග්‍යවරුන් වහන්සේ ධර්මය ප්‍රණීතකොට පුණ්‍ය පාප ධර්ම මනාකොට දේශනා කළහ. එම ධර්මය ඇසූ මම ප්‍රතිවේදකොට නිෂ්ටාවට පැමිණියෙමි. එබැවින් තථාගතයෝ සම්මා සම්බුද්ධ යැයි ද, ධර්මය ස්වාක්ඛාත යැයි ද, සංඝයා සුපිළිපන් යැයි ද පිළිගතිමි යනුවෙනි. බුදුරජාණන්වහන්සේ තමන් වහන්සේ පිළිබඳ ව පමණක් නොව තම ධර්මය සහ සංඝරත්නය පිළිබඳව ද විමසිය යුතු බව මෙම සූත්‍රයේ දී දේශනා කර ඇත. වීමංසනය තුළින් පුද්ගලයා යථාභූතඥානදර්ශනය දක්වා ම යොමු කරවන ලද ආකාරය වීමංසක සූත්‍රයෙන් පැහැදිලි වෙයි.

## අරියපරියේසන සූත්‍රය

පර්යේෂණය බුදුරජාණන්වහන්සේ වඩාත් අගය කළ දෙයකි. සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් සසර සැරිසරා ගෞතම නමින් බුද්ධත්වයට පත්වුණේ පර්යේෂණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. බුදුරජාණන්වහන්සේ අභිනිෂ්ක්‍රමණය කිරීමේ සිට බුද්ධත්වය දක්වා විමර්ශනශීලි හා පර්යේෂණාත්මක ස්වරූපයෙන් ගමන් කළ ආකාරය මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයෙන් පැහැදිලි වෙයි. එම සූත්‍රයට අනුව පර්යේෂණ ක්‍රම දෙක කි.[41]

i. අනාර්ය පර්යේෂණය
ii. ආර්ය පර්යේෂණය වශයෙනි

මෙලොව ජීවත්වන ඇතැම් පුරුෂයෙක් ජාතිය ස්වභාව කොට ඇත්තේ ජාති ධර්මයක් ම සොයයි. ජරාව ස්වභාව කොට ඇත්තේ ජරා ධර්මයක් ම සොයයි. ව්‍යාධිය ස්වභාවකොට ඇත්තේ ව්‍යාධි ධර්මයක් ම සොයයි. මරණය ස්වභාව කොට ඇත්තේ මරණ ධර්මයක් ම සොයයි. සෝකය ස්වභාව කොට ඇත්තේ සෝක ධර්මයක් ම සොයයි. තමා කෙලෙසන ස්වභාව ඇත්තේ

කෙලෙසන ස්වභාවයක් ම සොයයි. මෙය අනාර්ය පර්යේෂණය නමින් හැඳින්වේ. මෙහි ජාති, ජරා, ව්‍යාධි, මරණ සෝක ධර්ම යනු අඹු දරුවන් දැසි දසුන් එළු, බැටළුවන්, කුකුළන්, ඌරන්, ඇත්, ගව, අස්, වෙළඹ ආදිය යි. රන් රිදී පමණක් නොව මුළු පංච කාම ගුණ උපධීහු ම ධර්මයෝ වෙති. තෘෂ්ණාවෙන් මුසපත් වූ සත්ත්වයා එම ජාති, ජරා, ව්‍යාධි, මරණ සෝක ආදී ධර්මයන් ම සොයයි. මෙය අනාර්ය පර්යේෂණය නම් වේ.

## චූල්ලහත්ථිපදෝපම සූත්‍රය

බුදුරජාණන්වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමට උපස්ථම්භක කොට ගත්තේ ආර්ය පර්යේෂණය යි. මේ ලෝකයෙහි යම් පුද්ගලයකු ජාති ධර්ම වූයේ ජාති ධර්මයෙහි ආදීනව දැන ජාතියක් නැති උතුම් වූ නිර්වාණය සොයයි ද එය අනාර්ය පර්යේෂණය යි.[42] මේ ආදී වශයෙන් ජරා, ව්‍යාධි, මරණ, සෝක ආදී ධර්මයන් හි ආදීනව දැන ජරාවක් නැති, ව්‍යාධියක් නැති, මරණයක් නැති, සෝකයක් නැති අනුත්තර වූ යෝගක්ෂේම සංඛ්‍යාත නිර්වාණය සොයයි ද එය ආර්ය පර්යේෂණය නම් වේ. අනාර්ය පර්යේෂණය බැහැර කරන බුදුරජාණන්වහන්සේ ආර්ය පර්යේෂණය උසස් කොට, සලකා ඇත. බුදුරජාණන්වහන්සේ බුද්ධත්වය සාක්‍ෂාත් කරගත්තේ මෙම ආර්ය පර්යේෂණය අනුගමනය කිරීමෙනි.

බුදුරජාණන්වහන්සේගේ වීමංසනය පිළිබඳ ආකල්පය පැහැදිලිවන කදිම දේශනාවකි මජ්ඣිම නිකායේ චූල්ලහත්ථිපදෝපම සූත්‍රය. දක්‍ෂ නාගවනිකයා හෙවත් ඇතුන් අල්ලන්නා ලොකු ඇත් පියවරක් දුටු පමණින් එය මහ ඇත් රජෙකුගේ යැයි නිගමනය නො කරයි. එයට හේතුව එබඳු පියවර ඇති වාමනිකා නම් ඇතිනි වර්ගයක් සිටීම යි. තවදුරටත් ඉදිරියට යන නාගවනිකයා වඩාත් ලොකු ඇත් පියවර මෙන් ම අසල ගසක සත් අට රියනක් පෙදෙසෙහි පිට ඉලූ තැන් ද දකියි. එහෙත් ඒ පියවර මහා ඇත් රාජයකුගේ යැ යි නිගමනය නො කරයි. එයට හේතුව නිගමනයකට නො එන්නේ එබඳු සලකුණු ඇති උච්චාකාලාරිකා නම් ඇතිනි ගණයක් සිටීම ය. තවදුරටත් ඉවසිල්ලෙන් යන නාගවනිකයා

ලොකු ඇත් පියවර හා ඇඟ ඇතිල්ලූ ලකුණු පමණක් නොව බිඳ දමා ඇති කොළ අතු ආදිය ද දකියි. නමුත් එබඳු සලකුණු ඇති උච්චාකණේරුකා නම් ඇතිනි ගණයක් ද සිටින බැවිනි. දක්ෂ නාගවනිකයා තවදුරටත් වනයේ ඉදිරියට ගමන් කරයි. වඩාත් ලොකු ඇත් පියවර, ඇඟ ඇතිල්ලූ ලකුණු සහ බිඳ දැමූ කොළ ආදිය සමග ඇත් රජු ද සියැසින් ම දැක ගනී.[43] එමෙන් නිවැරදි අවබෝධය සඳහා බැඳීම් සහ පෙළඹීම් අමතක කොට ඉක්මන් නො වී තමාට ප්‍රත්‍යක්ෂ වන තුරු ම විමසිල්ලෙන් බැලීමට පුරුදු විය යුතු බැව් මෙම සූත්‍රයේ දී බුදුරජාණන්වහන්සේ පැහැදිලි කළහ. නූතන විද්‍යාත්මක චින්තනයේ දී යමක් පිළිගැනීම සඳහා පහත සඳහන් ක්‍රම තුන උපයෝගී කරගනු ලැබේ.

i. පරීක්ෂණ
ii. නිරීක්ෂණ
iii. නිගමන

එක්වර ම නිගමනවලට නො එළඹී පරීක්ෂණ හා නිරීක්ෂණ ක්‍රියාවලියක් මගින් නිගමනවලට එළඹීම නූතන විද්‍යාවේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය යි. බුදුදහමේ දැක්වෙන වීමංසන සංකල්පය ගොඩනැඟී ඇත්තේ ද එබඳු විද්‍යාත්මක පදනමක් මත ය. චූල්ලහත්ථිපදෝපම සූත්‍රය එයට කදිම නිදසුනකි. එම සූත්‍රයේ සඳහන් කරුණු සකස් වී ඇත්තේ පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන ක්‍රියාවලියක් ඔස්සේ ය.

බුදුසමයේ විචාර පූර්වක චින්තාකල්පයට හා වීමංසනයට ලබා දුන් ඉඩකඩ තවදුරටත් විමර්ශනය කර බැලීමේ දී මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රය වඩාත් වැදගත් වෙයි. තම ශ්‍රාවකයන් හැමවිට ම තමා කෙරෙහි ම විසිය යුතු බවත් තම ධර්මය ම උසස් කොට සැලකිය යුතු බවත් බුදුරජාණන්වහන්සේ කිසිසේත් ම අපේක්ෂා නො කළහ. ශ්‍රාවකයන්ට තමා දේශිත ධර්මය උපයෝගී කොට ගෙන විමුක්තිය සාක්ෂාත් කර ගැනීමට අනුබල දුන් බුදුරජාණන්වහන්සේ දේශනා කළේ "මහණෙනි පහුර උපමා කොට ඇති දහම් දෙසන්නෙමි. එය එතෙරවීම පිණිස මිස කරනබා

ගෙනයාම පිණිස නො වේ''[44] යනුවෙනි. මහණෙනි, එක්තරා පුරුෂයෙක් දිගු ගමනක් යාමට පිටත් වෙයි. ඔහුට ජලයෙන් පිරි ගඟක් හමුවෙයි. ගඟින් මෙතෙර බිය සැක සහිත බැවින් බිය සැක රහිත එතෙරට යාමට අවශ්‍ය වුව ත් ගඟින් එතෙර වීමට නැවක් හෝ හෙයක් නො වන්නේ ය. ඔහු ලී දඬු, අතු, කොළ කඩා එකතු කොට පසුරක් තනා එහි ආධාරයෙන් ගඟින් එතෙර වෙයි. ඉක්බිති එතෙර වූ ඔහුට මෙබඳු සිතක් පහළ විය. "මේ පසුර මට ඉතා පිහිට විය. මම මේ පසුර නිසා සුවසේ එතෙර වූයෙමි. එහෙයින් මේ පසුර හිස මත හෝ කරමත තබාගෙන යන තැනකට ගියොත් වටී යනුවෙනි. එවිට බුදුරජාණන්වහන්සේ භික්ෂූන් අමතා මහණෙනි, ඔබ කුමක් සිතන්නහු ද? මෙසේ කරන පුරුෂයා ඒ පසුරට යුතුකම් කරන්නේ වේ ද? යනුවෙන් විචාළහ. භික්ෂූන්ගේ පිළිතුර වූයේ නැත ස්වාමිනි, ඒ පුරුෂයා කෙසේ කළොත් ඒ පසුරට යුතුකම් කළා වේ ද? යන්න යි. තමාට පසුරෙන් වූ සහය ගැන සිතා මා මේ පසුර ගොඩ ඇද දමා හෝ දියෙහි පා කර හැර කැමති තැනකට යන්නේ නම් යෙහෙකි යනුවෙන් සිතා එසේ කළොත් එය පසුරට කරන වටිනා ම සැලකිල්ල ලෙස වදාළහ. පසුර උපමාකොට ධර්මය දේශනා කරන බුදුරජාණන්වහන්සේ ධර්මය ද සසර සයුරින් එතෙරවීමට මිස තවදුරටත් කර තබාගෙන යා යුතු නැතැයි දේශනා කළහ. මෙහි දී අවධාරණය කර ඇත්තේ ධර්මය කෙරෙහි පවා විචාරශීලි ආකල්පයකින්, හා විමංසනයෙන් බැලිය යුතු බව යි. ධර්මය ස්වකීය විමුක්තිය සාධනය කර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගත යුතු ය යන ආකල්පය බුදුරජාණන්වහන්සේ තුළ විය. බුදුරජාණන්වහන්සේ විමංසනයට ලබා දුන් නිදහස මෙම සූත්‍රයෙන් ද මනාව පැහැදිලි වෙයි.

## මහාපරිනිබ්බාන සූත්‍රය

බුදුසමයේ විමංසන සංකල්පය මනාව ප්‍රතීයමාන වන තවත් ඉගැන්වීමකි මහාපදේශ දේශනාව. දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ දී මහාපදේශ හතරක් දේශනා කර ඇත.[45] යමෙක් මෙය ධර්මය යැයි ද, මෙය විනය යැයි ද, මෙය ශාස්තෘන්වහන්සේගේ

අනුශාසනාව යැයි ද, භාග්‍යවතුන්වහන්සේ හමුවෙහි සිට මා විසින් අසන ලද්දේ යැයි ද, පිළිගන්නා ලද්දේ යැයි ද, කියන්නේ නමුදු එපමණකින් ම ඔහුගේ වචනය නො පිළිගත යුතු ය. ප්‍රතික්ෂේප නො කළ යුතු ය. ඒ පිළිබඳ මනාව ඉගෙන සූත්‍රයෙහි බහාලිය යුතු ය. විනයෙහි සැසඳිය යුතු ය.[46] සූත්‍රයෙහි බහාලා විනයෙහි සසඳා, එය සූත්‍ර හා විනය සමග සැසඳේ නම් බුද්ධ දේශනාවකැයි පිළිගත යුතු අතර නො ගැළපේ නම් බැහැර කළ යුතු ය.[47]

## දෙවන මහාපදේශය

යමෙක් මෙය ධර්මය යි මෙය විනය යි ශාස්තෘන්වහන්සේගේ අනුශාසනය මේ යැයි තෙරනමක හමුයෙහි සිට මා විසින් අසන ලද්දේ යැයි ද පිළිගන්නා ලද්දේ යැයි ද කියන්නේ නමුදු එපමණකින් ඔහුගේ වචන ය නො පිළිගත යුතු ය. බැහැර නො කළ යුතු ය. ඒ පිළිබඳ මනාව ඉගෙන සූත්‍රයෙහි බහා බැලිය යුතු ය. විනය සමග සසඳා බැලිය යුතු ය. එවිට එය සූත්‍ර හා විනය සමඟ ගැළපේ නම් බුද්ධ දේශනාවක් ලෙස පිළිගත යුතු අතර නො ගැළපේ නම් බැහැර කළ යුතුය.

## තෙවන මහාපදේශය

අසවල් ආරාමයෙහි බහුශ්‍රැත, ධර්මධර, විනයධර, මාතිකාධර, බොහෝ භික්ෂූන් වෙසෙත්. එම භික්ෂූන් විසින් ධර්මය විනය ශාස්තෘන් වහන්සේගේ දේශනාව මේ යැයි ප්‍රකාශ කරනු මා අසා ඇත; පිළිගෙන ඇත; යැයි යමෙක් ප්‍රකාශ කළ ද එක්වර ම නො පිළිගත යුතු ය. පිළිකෙව් නො කළ යුතු ය. සූත්‍රයෙහි බහා විනයෙහි සසඳා බලා ඒ සමග ගැළපේ නම් පමණක් පිළිගත යුතු ය. නො ගැළපේ නම් බැහැර කළ යුතු ය.

## සිව්වන මහාපදේශය

අසවල් ආරාමයෙහි බහුශ්‍රැත, ධර්මධර, විනයධර, මාතිකාධර භික්ෂුවක් වාසය කරයි. ධර්මය විනය හා ශාස්තෘ දේශනාව මේ යැයි උන්වහන්සේ පවසනු මා අසා ඇත; පිළිගෙන ඇත; යනුවෙන් යමෙක් ප්‍රකාශ කළ පමණින් නො පිළගත යුතු ය. බැහැර නො කළ

යුතු ය. සූත්‍රයෙහි බහාලා විනයෙහි සසඳා ඒ සමඟ ගැළපේ නම් පමණක් පිළිගත යුතු ය. නො ගැළපේ නම් ප්‍රතික්ෂේප කළ යුතු ය.

සූත්‍ර හා විනය පිටකයන්හි දැක්වෙන මේ මහාපදේශ හතර අනුගමනය කිරීම තුළින් ඕනෑම දෙයක් ධර්මය හා විනය සමග ගැළපේ ද? නො ගැළපේ ද? යන්න විමසා දැනගත හැකි ය. සූත්‍ර පිටකයේ සඳහන් මහාපදේශ සතර කෙටියෙන් මෙසේ දැක්විය හැකි ය.

i. බුද්ධාපදේශ
ii. සංඝාපදේශ
iii. සම්බහුලත්ථේරාපදේශ
iv. ඒකත්ථේරාපදේශ

බුදුරජාණන්වහන්සේගේ දේශනාවක් වුව ද විමසීමකින් තොරව එකවර නොපිළිගත යුතු ය යන්න මහාපදේශයන්ගෙන් දෙන අවවාදය යි. බුද්ධ දේශනාවන් පවා විමසීමට ඉඩදුන් අවස්ථාවක් ලෙස මහාපදේශ දේශනාව සඳහන් කළ හැකි ය. විනය පිටකයෙහි මහාවග්ගපාළියෙහි ද මහාපදේශ සතරක් දැක්වෙයි.[48]

1. අක්කප්පිය 2. අකප්පියානුලොම
3. කප්පිය 4. කප්පියානුලොම

මෙම ක්‍රම හතර සූත්‍රාගත ධර්ම විෂයයෙහි ද විනයාගත විනය විෂයයෙහි ද සසඳා බලන අයුරු පැහැදිලිව දක්වා ඇත. බුද්ධඝෝෂ හිමියෝ සමන්තපාසාදිකාවේ දී තවත් මහාපදේශ හතරක් දක්වති.[49]

1. සුත්ත 2. සුත්තානුලෝම
3. ආචරියවාද 4. අත්තනෝමති

මෙම මහාපදේශ මගින් ඉතා වැදගත් විමංසන ක්‍රමයක් පැහැදිලි වෙයි. ධර්ම, විනය, හා ශාස්තෘ අනුශාසනාව පිළිබඳ එක්

එක් ආචාර්යවරු දක්වන අදහස් එක හෙළා නොපිළිගත යුතු ය. ඒවා ධර්මය හා විනය සමග සසඳා බලා විමර්ශනය කොට මනාව අවබෝධ කරගැනීම මහාපදේශයන්ගෙන් දෙන උපදේශය යි. බුදුරජාණන්වහන්සේ විචාර පූර්වක වීමංසනය අගයකළ බව මහාපදේශයන් පිළිබඳ දේශනාවෙන් පැහැදිලි වෙයි. විචාර පූර්වක වීමංසනයට මෙබඳු නිදහසක් ලබා දුන් ආගමක් හෝ දර්ශනයක් ලොව කිසිඳු තැනක දක්නට නොමැත.

## රාහුලෝවාද සූත්‍රය

බුදුරජාණන්වහන්සේගේ ධර්ම දේශනා විලාසය උපමාවෙන් ඔපවත් වූ ආකාරය මජ්ඣිම නිකායේ බොහෝ සූත්‍ර දෙස අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වේ. ඉතා කුඩා උපමාවකින් ගැඹුරු ධර්ම කාරණා අවබෝධ කරවීමට බුදුපියාණන්වහන්සේ සමත් වූහ. වීමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි වන තවත් සූත්‍ර දේශනාවකි මජ්ඣිම නිකායේ අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය. රාහුල හිමියන් වැඩ සිටි ආරාමයට වැඩම කළ බුදුරජාණන්වහන්සේ කැටපතක් පෙන්වා එහි ඇති ප්‍රයෝජනය කුමක්දැයි රාහුල හිමියන්ගෙන් විමසා සිටියහ. පරීක්ෂා කොට බැලීම, පිරික්ෂා දැන ගැනීම, දැක ගැනීම, ප්‍රයෝජනය බව උන්වහන්සේ ප්‍රකාශ කළේ ය. එහි දී බුදුපියාණන්වහන්සේ දේශනා කළේ සිතින් කයින් හා වචනයෙන් පරීක්ෂා කොට කටයුතු කළ යුතු බව යි. සිතින් කයින් හා වචනයෙන් යම් ක්‍රියාවක් කිරීමට පෙර අවස්ථා කිහිපයක් ම විමසා බලා, පරීක්ෂා කොට, කරන ලෙස උන්වහන්සේ වදාළහ.[30] මේ තුළින් සිතා මතා විමසා සොයා බලා ක්‍රියා කිරීමේ නිදහස පුද්ගලයාට ලබා දී ඇත. තිදොරින් යමක් කිරීමට පෙර ඒ පිළිබඳ ව නැවත නැවතත් විමසා බැලිය යුත්තේ මන්දැයි බුදුරජාණන්වහන්සේ රාහුල හිමියන්ට දේශනා කළහ.

තමා කරන ක්‍රියාව තමාට දුක් පිණිස පවතින්නේදැ යි විමසා බැලිය යුතු ය. අනුන්ට දුක් පිණිස පවතින්නේදැ යි විමසා බැලිය යුතු ය. තමන් හා අනුන් යන උභය පාර්ශ්වයට ම අහිත පිණිස දුක් පිණිස පවතින්නේදැයි විමසා බැලිය යුතු ය, යන්න බුද්ධ දේශනාව

යි. තමන්ටත් අනුන්ටත් බාධාවක් කරදරයක් අහිතක් නොවන ක්‍රියා යහපත් කුසල ක්‍රියා බව සඳහන් කළ බුදුරජාණන්වහන්සේ එවැනි ක්‍රියා කරන ලෙස අවවාද කළහ.[51] ඕනෑම ක්‍රියාවක් කිරීමට පෙර විමසා බැලීම වැදගත් වන බව මේ තුළින් පැහැදිලි වෙයි. එසේ විමසා පරීක්‍ෂා කොට කිරීම තුළින් පුද්ගලයා කරනු ලබන ක්‍රියාව වඩාත් යහපත් බවට පත් වේ.

මේ අයුරින් බුදුසමයේ විචාර පූර්වක වීමංසනයට ප්‍රමුඛත්වය ලැබුණ ද කිසිදු ක්‍රියාවක් සිය අභිමතය පරිදි කිරීමේ අයිතියක් ද නැත. එහි දී පුද්ගලයා යම්කිසි සීමාවකට යටත් විය යුතු ය. විචාරශීලිත්වයෙන් යුතුව වුවත් යම් ක්‍රියාවක් කිරීමට පෙර විමසා බැලිය යුතු කරුණු තුනක් ඇත. ඒවා ආධිපතෙය්‍ය ධර්ම ලෙස හැඳින්වේ.

i. අත්තාධිපතෙය්‍ය
ii. ධම්මාධිපතෙය්‍ය
iii. ලෝකාධිපතෙය්‍ය යනුවෙනි.

සිතින් කයින් හා වචනයෙන් යමක් කිරීමට පෙර එය තමන්ට හිත පිණිස පවතී දැ යි විමසිය යුතු ය. ඉන්පසුව එම ක්‍රියාව ම ධර්මය සමඟ ගැළපේ දැයි විමසා බැලිය යුතු ය. ඉන් අනතුරුව ලෝකයාගේ හිත සුව පිණිස පවතින්නේදැ යි විමසා බැලිය යුතු ය. වීමංසනයේ අවස්ථා තුනක් ලෙස මෙම කරුණු තුන සඳහන් කළ හැකි ය. ලෝකාධිපතෙය්‍ය යන්න මෙහි දී වඩාත් වැදගත් කොට සලකා ඇත. නිගණ්ඨයන්ගේ ඉල්ලීම පරිදි වස් ශික්‍ෂාපදය පැනවීම උදාහරණ ලෙස දැක්විය හැකිය.[52] එහෙත් ලෝකයාගේ මතය කුමක් වුවත් අත්තනෝමතිය වඩාත් ම නිවැරදි යැයි හැඟේ නම් එය ක්‍රියාත්මක කිරීමට බුදුසමයෙන් බාධාවක් නැත. මජ්ඣිම නිකායේ අභයරාජකුමාර සූත්‍රය උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

මහාවීරතුමාගේ ශ්‍රාවකයකු වූ අභයරාජකුමාරයා දිනක් ගුරුවරයාගේ ද අනුබලය පරිදි බුදුරජාණන්වහන්සේ සමග වාද කිරීමට ගියේ ය. තම ගුරුවරයාගේ ඉල්ලීම පරිදි බුදුරජාණන්-

වහන්සේ සමග වාද කොට උන්වහන්සේ පරාජයට පත් කිරීමේ අදහසින් බුදුරජාණන්වහන්සේ අභිමුවට ගිය කුමාරයා, තථාගතයන් වහන්සේ අන්‍යයන්ට අප්‍රිය අමනාප වචන කතා කරන්නේදැයි විමසා සිටියහ.[53] එවිට බුදුන්වහන්සේ ඔහුගේ ඇකයේ හොවාගෙන සිටි දරුවා පෙන්වා පෙරලා ප්‍රශ්න කරයි. "මේ කුමාරයා ඔබගේ ප්‍රමාදය නිසා හෝ කිරි මවගේ ප්‍රමාදය නිසා කාෂ්ටකයක් හෝ කැබිලිත්තක් මුවෙහි දමා ගතහොත් කුමක් කරන්නේදැයි විමසා සිටියහ." කෙසේ හෝ එය ඉවත් කරන බව කුමාරයා ප්‍රකාශ කර සිටියහ. එක් අතකින් නොහැකි වුවහොත් වම් අතින් ඔළුව අල්ලා දකුණු අතින් ලේ ගලද්දි හෝ අරන් ඉවතට දමන බවත් එයට හේතුව තමා තුළ දරුවා කෙරෙහි පවතින ආදරය සහ කරුණාව බවත් දක්වා සිටියහ. එලෙසින් ම තථාගතයන්වහන්සේ තම ශ්‍රාවකයන් යහමගට ගැනීමේ අදහසින් එබඳු සැඩ පරුෂ වචන ප්‍රකාශ කරන බව බුදුරජාණන්වහන්සේ දේශනා කළේ ය.[54] චේතනාව යහපත් නම් එය සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගනු ලබන මාධ්‍ය දරුණු වුව ද ගැටලුවක් නැත. අනෙක් අතට ලෝකයා කෙසේ ඒ ගැන දුටුවත් එය යහපත් යැයි තමාට හැඟේ නම් විමසා බලා කිරීමේ නිදහස පුද්ගලයාට ලබා දී ඇති බව මේ තුළින් මනාව ප්‍රතීයමාන වේ.

## කාලාම සූත්‍රය

බුදුරජාණන්වහන්සේ හැමවිට ම අත්තගාමිත්වය ප්‍රතික්ෂේප කළේ ය. මධ්‍යස්ථ ප්‍රතිපදාවක සිටිමින් ධර්මය දේශනා කිරීම උන්වහන්සේගේ ඒකායන පරමාර්ථය විය.[55] දෘෂ්ටිගත වීම උන්වහන්සේ කිසි විටෙකත් අපේක්ෂා නොකළහ. බුදුදහම තුළ අනිවාර්යයෙන් ම පිළිගත යුතු යැයි සම්මත කිසිදු නීති රීති සමුදායක් නැත. බුදුරජාණන්වහන්සේ එවැනි වූ අන්තයන් ප්‍රතික්ෂේප කළ අතර නිදහසේ සිතීමටත්, විමසීමටත්, සාකච්ඡා කිරීමටත්, ප්‍රශ්න කිරීමටත්, ඉඩ ලබා දුන්හ. එපමණක් නොව ඕනෑම දෙයකට විරුද්ධ වීමට ද ඉඩකඩ සලසා දුන්හ. යථෝක්ත අදහස මනාව ප්‍රකට වන කදිම දේශනාවක් ලෙස කාලාම සූත්‍රය සඳහන් කළ හැකි ය.

තත්කාලීන සමාජයේ පිළිගනු ලැබූ ඥාන මාර්ග දහයක් කාලාම සූත්‍රයේ දී ප්‍රතික්ෂේප කර තිබේ. බුදුදහමේ චින්තනයට හා විමංසනයට හිමිවුණු අග්‍රගන්‍ය ස්ථානය මෙම සූත්‍රය තුළින් මොනවට පැහැදිලි වෙයි.

වරක් බුදුරජාණන්වහන්සේ කොසොල් රට කේසපුත්ත නම් නියම් ගමට වැඩියහ. එහි වාසය කළ ජනතාව කාලාම යන නමින් හඳුන්වා තිබුණි. බුදුරජාණන්වහන්සේ හමුවට පැමිණි ඔවුහු මෙසේ සඳහන් කර සිටියහ. ස්වාමීනි කේසපුත්තයනට එන මහණ බමුණෝ තමන්ගේ ලබ්ධියම කියති. පසසති. අන්‍ය ලබ්ධීන් ගරහති. හෙළා දකිති. බැහැර කරති. ස්වාමීනි මේ මහණ බමුණන්ගෙන් කවරෙක් සත්‍ය කියත් ද? කවරෙක් බොරු කියත් ද? අපට ඒ පිළිබඳ සැකයක් හා විමතියක් ඇතිවේ, යනුවෙන් ප්‍රකාශ කර සිටියහ. මෙහි දී බුදුරජාණන්වහන්සේ කාලාමයෙනි, ඔබ සැක කිරීමත් විමතියට පත්වීමත් සුදුසු ය. එසේ සැක කළ යුතු සහ විමතියට පත්විය යුතු අවස්ථාවක ඔබ තුළ සැකයක් සහ විමතියක් ඇති වී ඇත, යනුවෙන් දේශනා කළහ.[56] යමක් පිළිගත යුතු සහ ප්‍රතික්ෂේප කළ යුතු ආකාරය ඉන් අනතුරුව දේශනා කළහ. තත් කාලීන සමාජයේ පැවති දෘෂ්ටිගත ඥාන මාර්ග දහයක් ප්‍රතික්ෂේප කළ උන්වහන්සේ එම වැරදි දහයෙන් යුතුව යමක් නොපිළිගත යුතු බව දැක්වූහ.

> **එථ තුම්හෙ කාලාමා, මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටක සම්පදානෙන, මා තක්කහේතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කේන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති** [57]

යනුවෙන් බැහැර කළ යුතු දෘෂ්ටීන් දහයක් දේශනා කළහ.

## මා අනුස්සවේන

බුද්ධකාලීන මහණ බමුණන් අතර පැවති ප්‍රකට ම ඥාන මාර්ගය අනුශ්‍රවය යි.[58] මුළු මහත් වෛදික චින්තනය ම සකස් වී ඇත්තේ ශ්‍රැතිය පදනම් කොටගෙන යි. වෛදික චින්තනයෙහි

සඳහන් වන්නේ දේව භාෂිත යි. එබැවින් ඒවා පිළිබඳ ව ගෞරවයෙන් භක්තියෙන් විශ්වාසයෙන් ක්‍රියා කළ යුතු ය. කිසිදු අයුරකින් හෝ ඒ පිළිබඳව සැක පහළ නොකළ යුතු ය. කිසිදු පැකිලීමකින් තොරව දේව භාෂිත ඒ ආකාරයෙන් ම පිළිගැනීම අනුස්සවය යි. වේදය ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ලැබූ දෙයකි. බුදුරජාණන්වහන්සේ අනුශ්‍රව යන්නෙන් දේශනා කළේ එසේ සියල්ල කිසිදු විචාරයකින් තොරව පිළිගැනීමටයි. අනුශ්‍රවයෙන් ආ පමණින් යම් මතයක් නොපිළිගත යුතු ය යන්න බුදුරජාණන්වහන්සේගේ උපදේශය යි. ආරංචි මාර්ගයෙන් හෙවත් ඇසූ පමණින් යමක් නොපිළිගන්නා ලෙස මෙයින් අවධාරණය කරන ලදි.

## මා පරම්පරාය

පරපුරෙන් පරපුරට අවිච්ඡින්නව පැවත ආ පමණින් ද යමක් නොපිළිගත යුතු ය. පුද්ගලයා බොහෝ විට තම පරම්පරාවෙන් අඛණ්ඩව පැවත ගෙන ආ දේවල් පිළිබඳ ව කල්පනා කොට ඒවා ඉදිරියට පවත්වා ගෙන යාමට වෙර දරති. වේදය පිළිගත යුත්තේ අඛණ්ඩව පැවත එන නිසාය යන්න බමුණන්ගේ විශ්වාසය විය. අනාදිමත් කාලයක සිට පරපුරෙන් පරපුරට පැවත ගෙන ආ බැවින් ඒ අයුරින් ම පිළිගත යුතු විය. ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රශ්න කිරීමට කිසිවෙකුට අයිතියක් නොවී ය. බුදුරජාණන්වහන්සේ මෙම ක්‍රමය ද ප්‍රතික්ෂේප කළහ. එසේ පරපුරින් පරපුරට ආ පමණින් නොපිළිගත යුතු බව උන්වහන්සේ අවධාරණය කළහ.

## මා ඉතිකිරාය

මිනිසුන් අතර යම් කිසි දෙයක් සම්බන්ධයෙන් කට කතා පැවතියත් ඒවා සත්‍ය ලෙස නොපිළිගත යුතු ය. කටකතා කිසිසේත් ම පිළිගැනීම අපහසු ය. එයට හේතුව ඒවායෙහි සත්‍ය දැන ගැනීමට අපහසු වීම යි. එකිනෙකා තම කණට වැටුණු දේ ඒ අයුරින් ම නොව තවත් එකතු කර තවත් කෙනකුට කියයි. මෙසේ වීමේ දී අවසාන වශයෙන් ලැබෙන්නේ වැරදි නිගමනයකි. එබැවින් කටලු කතා නොපිළිගත යුතු ය යන්න බුදුරජාණන්වහන්සේගේ දේශනාව විය.

## මා පිටකසම්පදානේන

ආගමික ග්‍රන්ථවල තිබූ පමණින් යම් මතයක් පිළිනොගත යුතු බව මින් අදහස් කෙරේ. බෞද්ධ හෝ වේවා ඕනෑම ආගමික ග්‍රන්ථයක සඳහන් කරුණු ඒ අයුරින් ම නොපිළිගත යුතු ය. විචාරශීලිව විමසා බලා පිළිගත යුතු ය යන්න මෙහි දී අදහස් කර ඇත. ලොව පිළිගත් බොහෝ ආගමික ග්‍රන්ථ ගැන ප්‍රශ්න කිරීමට කිසිඳු අයිතියක් නැත. ඒවායෙහි සඳහන්වන්නේ දේව භාෂිත බැවින් ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමට කිසිවකුට අයිතියක් නැත. නමුත් බුදුරජාණන්වහන්සේ තම ධර්මය අඩංගු පිටක ග්‍රන්ථ පවා විමසීමට ලක් කරන ලෙස අවවාද කරමින් මෙම ඥාන මාර්ගය ද බැහැර කර ඇත.

## මා තක්කහේතු

තර්ක විතර්ක කර එළඹගත් කරුණු එක්වර ම සත්‍ය ලෙස නොපිළිගත යුතු ය යන්න මෙයින් අදහස් වෙයි. තර්කයට එකඟ වුවත් නොපිළිගත යුතු ය. තර්කය වැදගත් ඥාන මාර්ගයක් වුව ද තර්කයෙන් ලැබෙන නිගමන සර්ව සම්පූර්ණ නොවේ. එබැවින් බුදුදහම තර්කය ද ප්‍රතික්ෂේප කර ඇත. එබැවින් තර්කයට එකඟ වුව ද එකහෙලා ම නොපිළිගත යුතු ය යනු බුදුරජාණන්වහන්සේගේ අවවාදය යි.

## මා නයහේතු

න්‍යායකට ගැළපෙන පමණින් ද යමක් එකහෙලා පිළිගැනීම බුදුසමයෙන් අගය නොකරයි. ඒකාකාර ක්‍රියා පිළිවෙතකට අනුව, පැවත ආ ක්‍රමය න්‍යාය නම් වේ. තත් කාලීන සමාජයේ එබඳු න්‍යාය වාදයන් පැවති බව ජෛනයන්ගේ සප්තභංගීනය වාදයෙන් පෙනේ. ජෛනයන්ගේ මෙම නය ක්‍රමය අනේකාන්තවාදයක් ලෙස දැක්වේ. න්‍යාය අනුගමනය කළ ද න්‍යාය යථාර්ථාවබෝධය පිණිස හේතු නොවන බැවින් කාලාම සූත්‍රයේ දී ප්‍රතික්ෂේප කර ඇත.

## මා ආකාරපරිවිතක්කේන

ආකාර යනු මතුපිට ඇති ලක්ෂණයි. පරිවිතක්ක යනු ප්‍රත්‍යවේක්ෂා කිරීම යි. යමක් පිළිබඳ ගැඹුරු ලෙස පරීක්ෂා නොකොට මතු පිටට පෙනෙන පරිදි පිළිගැනීම මෙයින් අදහස් කෙරේ. මතුපිටට පෙනන අයුරින් ම යමක් සත්‍යයැ යි පිළිගත නොහැකි ය. එයට හේතුව මතුපිටින් පෙනෙන අර්ථයට වඩා වැඩි අර්ථයක් අභ්‍යන්තරව තිබිය හැකි බැවිනි. යමක් බාහිරින් දුටු පමණින් නිශ්චිත නිගමනයකට පැමිණීමට බුදුසමයෙන් අනුබලයක් නොලැබේ.

## මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා

තමා කලින් පිළිගත් දෘෂ්ටියකට ගැළපෙන නිසා යමක් පිළිගැනීම ද වැරදි බව මෙයින් පැවසේ. එසේ ස්වාභිමතයට හා දෘෂ්ටියට ගැළපෙන බැවින් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ප්‍රඥා ගෝචර නොවේ. කෙනකුට යම් දෘෂ්ටියක් රුචි වූ පරිද්දෙන් අන් අයට ද එසේ නොවේ. එබැවින් ඒ සියල්ල ම නිරවද්‍ය විය නොහැකිය. බුදුදහම කිසිසේත් ම දෘෂ්ටිගත වීම අගයකොට සලකා නැත.

## මා භබ්බරූපතාය

යමක් ප්‍රකාශ කරන පුද්ගලයාගේ යහපත්කම සලකා ද නොපිළිගත යුතු ය. කෙනෙකු ශීලයෙන්, ගුණයෙන් යහපත් වූ පමණින් ඔහු කියන දේ සත්‍යය ම විය නොහැකි ය. එසේ පිළිගැනීම අන්ධ භක්තිය හෙවත් විශ්වාසය ලෙස සලකයි. එසේ පිළිගැනීම ද බුදුදහමින් ප්‍රතික්ෂේප කෙරේ.

## මා සමණො නො ගරූ

යමක් ප්‍රකාශ කරන පුද්ගලයා හෝ ශ්‍රමණයන්වහන්සේ අප විසින් ගරු කටයුතු කෙනෙකි. තමාගේ ගුරුවරයා කියන දේ නිසා සත්‍යයැ යි විශ්වාස කළ යුතු ය යන අදහස මින් ප්‍රතික්ෂේපකර ඇත. ජෛනයන් විසින් ඔහුගේ ශාස්තෘවරයා සර්වඥයෙක් ලෙස

සලකා එතුමා කියන සියල්ල සත්‍ය ලෙස පිළිගත යුතු යැ යි විශ්වාස කළහ. මෙබඳු අදහස් බුදුරජාණන්වහන්සේ එකහෙළා ප්‍රතික්ෂේප කරන ලද අතර ශාස්තෘත්වය පවා විමසීමට ඉඩ ලබා දුන්නේ එ බැවිනි.

මෙම කරුණු දහය දෙස විචාරශීලිව බැලීමේ දී පැහැදිලි වන්නේ බුදුරජාණන්වහන්සේ කිසිදු මතයක් එක හෙළා ම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ලබා දී නැති බව යි. ඒ පිළිබඳ ව හොඳින් විමසා බලා සත්‍යාසත්‍යතාවය නිගමනය කිරීම අගය කර ඇත. එසේ නම් යමක් පිළිගත යුත්තේ කෙසේ ද? යන්න ද? උන්වහන්සේ දේශනා කර ඇත. කාලාමයෙනි මේ දේ අකුසල් ය, මේ දේ සාවද්‍ය ය, මේ දේ ප්‍රබුද්ධ නැණවතුන් විසින් ගර්හිත ය. සපුරන ලද සමාදන් වන ලද මේ දේ අහිත පිණිස දුක පිණිස පවතී ය යි යම් විටෙක නුඹලාට ම වැටහේ නම් එවිට ඒ දේ අත්හළ යුතු ය.[59] එසේ ම යම් විටෙක මේ දේ කුසල ය, යහපත් ය, නිවැරදි ය යනුවෙන් ඔබට ම වැටහේ නම් එය පිළිගත යුතු ය.

මෙයින් පැහැදිලි වන්නේ යමක් තමා විසින් ම ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කර ගැනීම වැදගත් බව බුදුරජාණන්වහන්සේ දේශනා කර ඇති බව ය. අනුමානයෙන් ලබන අවබෝධය සම්පූර්ණ එකක් නොවේ. එ බැවින් හොඳින් විමසා බලා ප්‍රත්‍යක්ෂයෙන් ම දැන ගැනීම තුළින් සත්‍යාසත්‍යතාව අවබෝධ කර ගැනීම බෞද්ධ වීමංසනයේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය.

ලොව විද්‍යමාන බොහෝ ආගම් විශ්වාසය හා භක්තිය මත පදනම් වී ඇත. බුදුදහම විවෘත දහමකි. එබැවින් උන්වහන්සේ දේශනා කළේ එව බලව (**එහි පස්සික**) යනුවෙනි. ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් හෝ භක්තියෙන් ධර්මය එකහෙළාම පිළිනොගෙන විචාර බුද්ධියෙන් හා වීමංසනයෙන් සොයා බලා අවබෝධ කරගත යුතු බව උන්වහන්සේ බොහෝ විට අවධාරණය කළහ. බෞද්ධ උපාසකයකුවීමේ මූලික ම පියවර වන්නේ ශ්‍රද්ධාව යි. බුදුසමය තුළ ශ්‍රද්ධාව ප්‍රභේද දෙකකින් යුක්ත ය.

i. අමූලිකා ශ්‍රද්ධා - අන්ධ භක්තියෙන් යුක්ත පැහැදීම
ii. ආකාරවතී ශ්‍රද්ධා - විචාරශීලිත්වය තුළින් ඇතිවන නිවැරැදි පැහැදීම

අමූලිකා ශ්‍රද්ධාව බුදුදහම ප්‍රතික්ෂේප කරන අතර ආකාරවතී ශ්‍රද්ධාව අගය කොට සලකා ඇත. අන්ධ භක්තිය පදනම් වූ අවිචාරවත් ශ්‍රද්ධාව අමූලිකා ශ්‍රද්ධා යනුවෙන් හැඳින්වෙයි. අමූලිකා ශ්‍රද්ධාවෙන් යුක්ත පුද්ගලයාට විමුක්තිය සාධනය කරගත නොහැකි ය. බුදුදහම එබඳු වූ අන්ධ භක්තිය එකහෙළා ප්‍රතික්ෂේප කරන අතර ආකාරවතී ශ්‍රද්ධාවම උසස් කොට සලකා ඇත.

ආකාරවතී ශ්‍රද්ධාව යනු නොසැලෙන සුළු, නොබිඳෙන සුළු, නොවෙනස්වන සුළු තර්කානුකූල සහේතුක ශ්‍රද්ධාව යි. අටුවා විවරණයට අනුව... **ආකාරවතීති කාරණං කාරණී පරියේසිත්වා ගහිතත්තා....** කරුණින් කරුණ සොයා බලා, කිසියම් පදනමක පිහිටා ඒ තුළින් ඇතිවන ප්‍රසාදයයි. අචල ශ්‍රද්ධාව, ලෙස හඳුන්වන්නේ ද මෙය යි. ආකාරවතී ශ්‍රද්ධාව ඇතිවන්නේ අවබෝධයෙනි. බුදුදහම අගය කරන්නේ විචාර පූර්වක ආකල්පය මත පදනම් වුණු ආකාරවතී ශ්‍රද්ධාවයි. ශ්‍රද්ධාව ද විමංසනයේ එක් පියවරක් ලෙස මේ අනුව පැහැදිලි වෙයි.

විමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය මනාව අවබෝධ කර ගැනීම වස් බුදුරජාණන්වහන්සේ පුද්ගල ශක්තිය අගය කළ අයුරු විමසා බැලීම ද ඉතා වැදගත් වෙයි. පුද්ගලයාගේ ශක්තිය බාහිර බලවේගයකට පාවා නොදුන් බුදුරජාණන්වහන්සේ මිනිසාගේ ස්වාමීත්වය මිනිසාට පවරා දී තිබේ. පුද්ගල පෞරුෂය අතිශය ශ්‍රේෂ්ඨ කොට සලන ලද උන්වහන්සේ ස්වකීය විමුක්තිය සාධනය කරගත යුත්තේ තමා විසින් ම බව අවධාරණය කළහ. තමාට තමාගේ පිහිට සරණ හැර වෙනත් පිහිටක් සරණක් නැත. වෙනත් ආගමික බලවේගවල නොපිහිටා තමා පහනක් කොට වාසය කරන ලෙසත් තමා ම පිහිට කොට වාසය කරන ලෙසත් දක්වා සිටියේ පුද්ගල පෞරුෂය අගය කළ බැවිනි. පිරිසිදුබව හෝ අපිරිසිදුබව ඇත්තේ තමා තුළ ම බවත් අනිකකු පිරිසිදු නොකරන

බවත් ධම්මපදයේ දී තව දුරටත් සඳහන් කර තිබේ. මෙයින් බුදුරජාණන්වහන්සේ පුද්ගල පෞරුෂය පිළිබඳව දක්වා ඇති ආකල්පය පැහැදිලි වේ. බලය වීර්යය පිළිබඳ දැඩි ලෙස විශ්වාසය තබා කටයුතු කිරීමට පුද්ගලයාට අවස්ථාව උදා කර දී තිබේ.

**අත්ථි පුරුෂ බලං**
**අත්ථි පුරුෂ ථාමං**
**අත්ථි පුරුෂ පරක්කමං**

යන වචනවලින් පැහැදිලි වන්නේ බුදුරජාණන්වහන්සේ පෞරුෂය විෂයයෙහි දැක් වූ අකල්පය යි. චේතනා, වීරිය, පධාන, උට්ඨාන, වීරිය, පරක්කම, පුරිසකාර, පුරිස පරක්කම, පුරිසථාම, බල, ඡන්ද, සංකල්ප, ආරම්භ ධාතු, නික්කම්ම ධාතු, උපක්කම ධාතු, වායාම යන වචනවලින් දක්වා ඇත්තේ ද පුද්ගල පෞරුෂයයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එන සම්මා වායාමය ද, බොජ්ඣංගධර්මවල එන වීරිය බොජ්ඣංග ද මෙයට ම උදාහරණයන්ය. මුලින් ම පුද්ගලයාට ආත්ම විශ්වාසයක් ඇති කර දී අනතුරුව විමංසනයට ඉඩ සලසා දී ඇත. ප්‍රාග් බෞද්ධ හා සමකාලීන සෑම චින්තකයකු ම පුද්ගල ශක්තිය හා පෞරුෂය ගරු නොකළහ. නමුත් බුදුරජාණන්වහන්සේ පෞරුෂයට උපරිම ස්ථානයක් ලබා දෙමින් විමංසනයට අවශ්‍ය ඉඩ කඩ සලසා දී තිබේ.

ශ්‍රේෂ්ඨ මහායන දාර්ශනිකයෙකු වූ ආර්යදේවපාදයෝ සිය ඥානසාර සමුච්චය නම් කෘතියේ දී බුදුසමයේ විචාරශීලි ආකල්පය එක් ශ්ලෝකයකින් දක්වා ඇත.

**තාපාච්ඡේදාච් ච නිකෂාත්**
**සුවර්ණමිව පණ්ඩිතෛඃ**
**පරීක්ෂ්‍ය භික්ෂවෝඃ ග්‍රාහ්‍යං**
**මද්වචො න තු ගෞරවාත්**

මහණෙනි, නුවණැති රන්කරුවා විසින් රන් කැබැල්ලක් ගෙන එය තවා කපා උරගා ඔප මට්ටම් කර රන් බව හඳුනා ගන්නා මෙන් ඔබ ද මාගේ වචනය පිරික්සීමෙන් මිස හුදු

ගෞරවයෙන් පමණක් නොපිළිගත යුතු ය. යන අදහස ඉහත ගාථාවෙන් ලබා දෙයි. බුද්දහමේ නිර්දිෂ්ට විමංසනය ද එබඳුය. බුදුරජාණන්වහන්සේ කෙරෙහි පවතින හුදු ගෞරවය නිසා ම නොපිළිගෙන විචාර බුද්ධියෙන් විමසා බලා පිළිගත යුතුය යන්න බෞද්ධ ඉගැන්වීම යි. බුදුදහමේ විමංසනයට හිමිවන ස්ථානය කෙබඳුදැයි යථෝක්ත කරුණු තුළින් මනාව පැහැදිලි වෙයි.

සත්ත්වයන් උපදින්නේ තනිවමය. මැරෙන්නේ තනිවමය. ඒ බව මනාව පසක් කළේ සදාතනදහම බුදුදහමයි. බුදුරජාණන්-වහන්සේ මෙලොව පහළ වූ අතිශ්‍රේෂ්ඨ ශාස්තෘවරයාණන්-වහන්සේය. උන්වහන්සේගේ උත්තරීතර ශාස්තෘත්වය මනාව පැහැදිලි වන අවස්ථා බුදුදහම පුරා ම දැකිය හැකිය. එවැනි එක් අවස්ථාවකි විමංසනයට ඉඩ ලැබීම බුදුරජාණන්වහන්සේ මේ ලොව මනුෂ්‍ය යුවලකට දාව උපන් කුමාරයෙක් බව මනාව දත් බැවින් තමා බාහිර බලවේගයකට ආරෝපණය කර ගැනීමට කටයුතු නොකළහ. එබඳු බුදුරජාණන්වහන්සේ සමාජයේ අන්‍යසත්ත්වයන්ට ලබා දුන්නේ ද අපරිමිත නිදහසකි.

බුදුදහමේ එන ඉගැන්වීම් අතර බුදුදහමට ම ආවේණික වූ ඉගැන්වීමකි විමංසනය. මෙම නිබන්ධය පුරා ම විමංසනය පිළිබඳ විවිධ අදහස් අන්තර්ගතව ඇත. එම අදහස් සියල්ලෙහි ම ඇත්තේ එක්තරා සමාන බවකි. ප්‍රාග් බෞද්ධ යුගයේත්, සමකාලීන යුගයේත් විමංසනයට එතරම් ඉඩක් නොලැබුණා යන්න අපට අවබෝධ වේ. එම යුග දෙක අතර උපනිෂද් යුගය වනවිට යම් දුරකට විමසීමට ඉඩකඩ ලබා දී ඇත. නමුත් සමස්තයක් වශයෙන් බලන විට පැහැදිලි වන්නේ නිශේධාර්ථයකි.

දේවවාදී ආගමික ඉගැන්වීම් පිළිබඳ ව විමසා බලන විට පැහැදිලි වන්නේ විමංසන නිදහස අහිමි කර ඇත්තේ ජන්මයෙන් ම බවයි. පුද්ගලයාගේ ඉපදීම පවා අදෘෂ්‍යමාන බලවේගයකට පාවා දී ඇති දේවවාදී ආගම්වල කිසිදු අයුරකින් විමංසනයට ඉඩක් නොවීය.

මෙබඳු පසුබිමක් තුළ බුදුදහමේ විමංසනය පිළිබඳ ආකල්පය අග්‍රගණ්‍ය එකකි. ඉහත සඳහන් කරන ලද කිසිදු ආගමකින් හෝ

දර්ශනයකින් නොලැබුණු ආකාරයේ විමංසන නිදහසක් බුදුදහමින් ලබා දී ඇත. බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය ම ගැන විමසීමේ අයිතිය හා නිදහස ශ්‍රාවකයාට ලබා දුන් එක ම දහම බුදුදහමයි. අනෙක් අතට බුදුරජාණන්වහන්සේ ගේ ශාස්තෘත්වය පවා විමසීමට ඉඩකඩ ලබා දී තිබීම බෞද්ධ විමංසනයේ ස්වභාවය පැහැදිලි කරන්නකි. කෙසේ නමුත් බුදුදහමේ එන විමංසන සංකල්පය අතිශය උතුම් එකක් බව නිගමනය කළ හැකිය. ලොව සමහර උගතුන් බුදුදහමේ විමංසනයට ඉඩක් නැතැයි ප්‍රකාශ කිරීමට උත්සාහ දරා ඇත. බුදුදහමේ විමංසනය අගය කර ඇති බව දැක්වීමට මෙතරම් උදාහරණ තිබෙද්දීත් එසේ නැතැයි කීම ගැටලුකාරී තත්ත්වයකි. කෙසේ නමුත් බුදුදහමේ ඇති ශ්‍රේෂ්ඨත්වය ලොවට විදහාපාන වැදගත් ම ලක්ෂණයක් ලෙස විමසීමට ඇති ඉඩකඩ දැක්විය හැකිය.

**සමාප්තයි.**

* මෙහි විශේෂයෙන් සඳහන් කරන තැන් හැරුණු විට භාවිත සියලු ත්‍රිපිටක ග්‍රන්ථ බුද්ධ ජයන්ති සංස්කරණයට අයත් බව සලකන්න.

* මෙහි විශේෂයෙන් සඳහන් කරන තැන් හැරුණු විට භාවිත සියලු අටුවා ග්‍රන්ථ හේවාවිතාරණ සංස්කරණයට අයත් බව සලකන්න.

01 පරිච්ඡේදය

## නිදහස් චින්තනය හා විමංසනය: හැඳින්වීම

### ආන්තික සටහන්

01. ධම්මපද පාළි, මග්ග වග්ග, 4 ගාථාව.
02. තථාගතප්ප වේදිතො ධම්මවිනයො විවටෝ විරෝචති. නො පටිච්ඡන්නෝ. (අං. නි. තික නිපාතය, භරණ්ඩු වග්ග සුත්ත)
03. නිරුත්ති දීපනිය, CSCD
04. සද්ද නීති ප්‍රකරණය, CSCD
05. පාළි සිංහල අකාරාදිය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි
06. පාළි සිංහල අකාරාදිය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි
07. නිරුත්ති දීපනිය, CSCD
08. සද්දනීතිය (සරවග්ග පඤ්චකන), CSCD
    "මාන පූජායං පෙමනෙ වීමංසායං මානෙති, මානයති, මානා, විමානෙති, විමානයති, පටිමානෙති, පටිමානයති, මානනා, සම්මානනා, විමානනා, විමානං විමානනං, මානිනෝ...."
09. සද්දනීති ප්‍රකරණය (චුරාදිගණ පරිදීපන), CSCD
    අමානනා යත්ථ සන්තෝ - සන්තානංවා විමානනා
    හීන සම්මානනා වාපි - න තත්ථ වසතිං වසෙ විමංසති,
    විමංසා, වීමංසියතීති, වීමංසියමානෝ, වීමංසන්තෝ
10. Rhys David T.W. Pali English Dictionary. Stede William.
11. Nyanatiloka. Buddhist Dictionary, Manual of Buddhist Terms and Doctrines.
12. Rev. MoscropT, Mendis BA. Sinhala English Dictionary, Second Edition, Page 215
13. Rev. Clough B., Clough's Sinhalese, English Dictionary, Page 597
14. Buddhadatta Polwatte, English Pali Dictionary, PTS, page 286

15. Ven. Piyatissa Vidurupola, The English Pali Dictionary Page 351
16. සෝරත හිමි, වැලිවිටියේ ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, ද්විතීය භාගය, පිටුව 912, විමස (ධා) විමසීමෙහි, සෙවීමෙහි, (කවි-135) සක විමසා විමසත්.
17. සිංහල ශබ්ද කෝෂය, ගිරා (212) විමැසී විමැසු, 23 කාණ්ඩය II කොටස 43 වන භාගය, පිටුව 543, විමර්ශන - (වි) සෝදිසි කරන, පරීක්‍ෂා කරන, සොයා බලන, කෝකිල, කුකවි
18. විජයතුංග, හරිස්චන්ද්‍ර, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, දෙවැනි කාණ්ඩය, පිටුව 1561
19. රේවත හිමි, බෝරුැග්ගමුවේ, සිංහල මහා අකාරාදිය, 1929 පිටුව
20. ලියනගේ, සිරි, බෞද්ධ ශබ්ද කෝෂය II
21. ලියනගේ, සිරි, නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය, පිටුව 1002
22. James William, The will to belive, An introduction to Philosophy, Page 178
23. Burnet. John, Early Greek Philosophy, Page. 196
24. Stace W.T., A Critical History of Greek Philosophy, Page 148-149
25. Zeller – Die, Philosophic der Griechan, 4th Edition
26. Arristotle, Nichomoachain Ethics
27. Dewy John – Freedom and Culture, Page 16
28. Ven. Rahula, Walpola, What the Buddha Taught, Page 54-55
**The Question of free will has occupied an important place in western thought and philosophy but according to conditioned Genesis this question does not and cannot arise in Buddhist Philosophy.**
29. Malalasekara G.P, Encyclopedia of Buddhism
**What does Buddhism have to say regarding free will? The question does not seem to have seen asked of the Buddha.**
30. Encyclopedia of Buddhism
31. කරුණාරත්න ඩබ්ලිව්. එස්., බෞද්ධ දර්ශනය හා චරණය, පිටුව 58
32. Jayathilake K.N., Ethics in Buddhist Perspective", Page. 114
33. Trevor Ling, The Buddhism, Penguin Books 1976, Page 141
34. Dharmasiri, Gunapala, A Buddhist Critique of the Christian concept of God, Page 45

35. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, vi පරිච්ඡේදය, මූලික අයිතිවාසිකම් හා නත් වැදැරුම් නිදහස, පිටුව 12.
36. තක්කෙත්වා විතක්කෙත්වා දිට්ඨිගාහිනො එතං අධිවචනං විමංසාය සමන්නාගතෝති විමංසි, විමංසා නාම තුලනා රුච්චනා, ඛමාපනා සුමංගල විලාසිනි, ප්‍රථම භාගය, බ්‍රහ්මජාල සුත්ත වණ්ණනා 77 පිට, සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, 1918 කොළඹ.
37. සීලක්ඛන්ධවග්ගටීකා - බ්‍රහ්මජාල සුත්ත (පුබ්බන්ත කප්පිකසස්සතවාද වණ්ණනා) සෝමාවතී හේවාවිතාරණ ටීකා ග්‍රන්ථ සම්පාදනය, කොළඹ 1967 - පිටුව 102
38. -එම-
39. යථාවතො ආදීනවානි සංඛානං පටිසඞ්කානං - විමංසා ඉධ පටිසඞ්ඛානං මහාවග්ග ටීකා (දීඝනිකාය) මහා සතිපට්ඨාන සුත්ත, පිටුව 525)
40. ...... තඤ්ච විචාරණා පරියාදානවසෙන දුබ්බිධෙසු විචාරණයෙව, සාව වීමංසා යෙව න විචාරො. වීමංසාව නාමෙසා භාසිතත්ථ විමංසා දීඝ නිකාය, සීලක්ඛන්ධවග්ග ටීකා (බ්‍රහ්මජාල සුත්ත) සෝමාවතී හේවාවිතාරණ ටීකා, ග්‍රන්ථ සම්පාදනය, කෙළඹ 1967
41. -එම-
42. මූලපණ්ණාසක ටීකාව (ඕපම්මවග්ගය)
43. සුත්ත නිපාතය, ජක්ක නිපාතය, පඨමපණ්ණාසකය, ධම්මික වග්ගය, නාග සුත්ත, පිටුව 108.
44. විමංසං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං විමංසා න සමාධි න විමංසා අඤ්ඤා විමංසා අඤ්ඤා සමාධි / සංයුක්ත නිකාය, මහාවග්ගය, ඉද්ධිපාද සංයුක්තය, පසාද කම්පන වර්ගය, විභංග සුත්තං, 38 පිට.
45. යස්ස සත්ථා වා ධම්මං දේසයෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරි සො තං ධම්මං සුත්වා සද්ධං පටිලභති, තත්ථ යා විමංසා උස්සාහනා තුලනා උපපරික්ඛා අයං සුතමයි පඤ්ඤා.
නෙත්තිපපකරණ පාළි (පටිනිද්දේසවාරෝ) පිටුව. 18.
46. තත්ථ අයං ගාථා කුසලා වා අකුසලා වා සච්චානි වා සච්චේකදේසෝ වා කිං දේසිතන්ති? සුත්තේ විමංසා දේසනාහාරෝ පේටකෝපදේසය (අරියසච්චප්පකාසන)
පංචම භූමි, හාර විභංගය, දේශනාහාර, පිටුව, 106.

47. -එම-

48. තත්ථ කතමෝ විචයෝ හාරෝ? යෝ කාමෙ පටිසේවති පාපං කරෙය්‍යාති යෝච කාමෙ න පටිසේවති සෝ පාපකම්මං න කරෙය්‍යාති යෝච ඉමෙහි ද්විහි භූමිහි උත්තිණ්ණෝ පාරංගතෝති යා විමංසා අයං විචයෝ -එම- (හාරසම්පාතභූමි) පිටුව, 200.

49. මහානිද්දේස අට්ඨකථාව (සුද්ධට්ඨක සුත්ත නිද්දේසය), CSCD

50. නෙත්තිපකරණ අට්ඨකථා (පටිනිද්දේස වණ්ණනා), CSCD

51. -එම-

52. "තත්ථ විමංසනං විමංසා, පාළියා පාළි අත්ථස්ස ච විමංසා, විමංසතීති වා, විමංසා, පද පදන්තරෙන පදත්ථං පදත්ථන්තරේන විචාරණා පඤ්ඤා" නෙත්තිවිභාවනීටීකා (පටිනිද්දේසවාර පාළි), CSCD

53. සාරත්ථදීපනීටීකා (වේරඤ්ජකණ්ඩ වණ්ණනා), CSCD

54. වජිරබුද්ධි ටීකාව, CSCD

55. මජ්ඣිම නිකාය 1 මහා සීහනාද සූත්‍රය, CSCD

56. දීඝ නිකාය - බ්‍රහ්මජාලසුත්ත වණ්ණනාව, CSCD

57. මනෝරථ පූරණී 2 කොටස (ධම්මික වග්ගය), CSCD

58. ...."ඉතිමෙ විමංසා නච අතිලීනා භවිස්සති, නච අතිපග්ගහිතා භවිස්සති, නච අජ්ඣත්තං සංඛිත්තා භවිස්සති, නච බහිද්ධා වික්ඛිත්තා භවිස්සති....." සංයුත්ත නිකාය, ඉද්ධිපාද සංයුත්තය, මහාවග්ගය/මොග්ගල්ලාන සූත්‍රය, පිටුව, 28. ඉද්ධිපාද සංයුත්තය

59. සත්තමෙ ලෝකචින්තාති ලෝකසන්නි වේසප්පටිසංයුත්තා විමංසා, කේනාහං කොනු බො චන්දිම සූරියන්ති ආදී
අංගුත්තර නිකාය ටීකාව (දුක - තික - චතුක්ක නිපාත), අපණ්ණකවග්ගො, CSCD

## 2. පරිච්ඡේදය

## විමංසනය පිළිබඳ භාරතීය අන්‍යසාමයික මතවාද

### ආන්තික සටහන්

01. විජේබණ්ඩාර චන්ද්‍රිම, මොරටුගම එච්. එම්. බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශ කතාව, පිටුව 35
02. Jayathileke K.N. Early Buddhist Theory of knowledge.
03. විජේබණ්ඩාර චන්ද්‍රිම, මොරටුගම එච්. එම්. ආදි බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, පිටුව 3.
04. එම.
05. රාහුල හිමි අත්තුඩාවේ, පඤ්ඤාලෝක හිමි බඹරැන්දේ, මහානාම හිමි බඹරැන්දේ, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය, පිටුව 15.
06. පඤ්ඤාලෝක හිමි, වැයිහේනේ, බෞද්ධ චින්තාවේ පසුබිම හා විකාශය, පිටුව 19.
07. එම, පිටුව 20.
08. එම, පිටුව 18.
09. තිලකසිරි ජේ, වෛදික සාහිත්‍යය, පිටුව 3.
10. ඍග් වේදය, දසවන මණ්ඩලය, පුරුෂ සූක්තය.
11. එම, 12 ගාථාව.
12. අධ්‍යාපන මධ්‍යයනං - යජනං යාජනං තථා<br>දානං ප්‍රතිග්‍රහං චෛව - බ්‍රාහ්මණානා මකල්පයත්<br>මනුස්මෘතිය 1-88
13. ප්‍රජානං රක්‍ෂණං දාන- මිජ්‍යාධ්‍යයන මෙවච<br>විෂයේෂ්ව ප්‍රශක්තිශ්ච-ක්‍ෂත්‍රියස්‍ය සමාසතඃ<br>මනුස්මෘතිය 1-89
14. පශූනං රක්‍ෂණං දාන - මිජ්‍යාධ්‍යයන මෙවච<br>වණික්පථං කුසීදංච - වෛශ්‍යස්‍ය කෘෂිමෙවච<br>මනුස්මෘතිය 1-90
15. ඒකමේවතු ශුද්‍රස්‍ය - ප්‍රභුඃ කර්ම සමාදිශත්<br>ඒතේසාමේව වර්ණානං - ශුශ්‍රෑසා මනුසූයසා<br>මනුස්මෘතිය 1-91

16. තිලකසිරි ජේ, වෛදික සාහිත්‍යය, පිටුව 34.

17. එම, පිටුව 35.

18. එම, පිටුව 40.

19. එම, පිටුව 41.

20. බාල්යේ පිතුර් වශේ තිෂ්යේත් - පාණී ග්‍රාහස්‍ය යෞවනේඃ
පුත්‍රානං භර්තරි ප්‍රේතේ - නභජේත් ස්ත්‍රී ස්වතන්ත්‍රතාම්
මනුස්මෘතිය

21. ස්ථානං නාස්ති ක්ෂණං නාස්ති - නාස්ති ප්‍රාර්ථයිතා ජනඃ
තේන නාරද නාරිනං - ස්ත්‍රීත්ව මුපජායතේ
එම.

22. ඖදුම්බර භවං පුෂ්පං - ස්වේත වර්ණස්‍ය කාකයෝඃ
මත්ස්‍ය පාදං ජලේ පශ්යේත් - ස්ත්‍රී වාක්‍යං න විශ්වසේත්
එම.

23. මුඛ පද්ම දලාකාරං - වාචා චන්දන සීතලං
මධු තිෂ්ඨති ජිව්හාග්‍රේ - හෘදයේතු හලාහලං
එම.

24. දර්ශනං චිත්ත වෛකල්‍යං - ස්පර්ශං ධන නාසනං
සයනේ මරණං කුර්යාත් - ස්ත්‍රී ප්‍රත්‍යක්ෂ රාක්ෂසි
එම.

25. විජේබණ්ඩාර චන්ද්‍රිම, මොරටුගම එච්. එම්. ආදී බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, පිටුව 04.

26. පුන ච පරං සන්‍දක, ඉධෙ කච්චො සත්ථා
තක්කී හොති විමංසී
මජ්ඣිම නිකාය II, සන්දක සූත්‍රය, පිටුව 322.

27. ඉධ භික්ඛවෙ එකච්චො සමණෙවා බ්‍රාහ්මණෙවා
තක්කී හෝති වීමංසී හේ තක්ක පරියාහතං
වීමංසානු චරිතං, සයං පටිභානං ඒවමාහ,
සස්සතො අන්තවා ලොකො ච....
දීඝ නිකාය, සීලක්ඛන්ධ වග්ගය, බ්‍රහ්මජාල සූත්‍රය, පිටුව, 26.

28. දීඝ නිකාය අට්ඨකතාව, බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනාව.

29. විජේබණ්ඩාර චන්ද්‍රිම, මොරටුවගම එච්. එම්. ආදි බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, පිටුව 04.

30. දොන් සෙනෙවිරත්න, සී. ඒ. උපනිෂද්, ප්‍රස්තාවනා.

31. වීරසිංහ. එස්. ජී. එම්. උපනිෂද් දර්ශනය, පිටුව 02.

32. රාහුල හිමි අත්තුඩාවේ, පඤ්ඤාලෝක හිමි බඹරැන්දේ, මහානාම හිමි බඹරැන්දේ, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය, පිටුව 22.
33. දොන් සෙනෙවිරත්න සී. ඒ. උපනිෂද් ඡාන්දෝග්‍ය උපනිෂදය, පිටුව 04.
34. වීරසිංහ එස්. ජී. එම්., උපනිෂද් දර්ශනය පිටුව 03.
35. දොන් සෙනෙවිරත්න සී. ඒ. උපනිෂද්, ශ්වේතාශ්වතර උපනිෂදය, පිටුව 167.
36. එම.
37. එම, කේන උපනිෂද්, පිටුව 139.
38. එම, මුණ්ඩකෝපනිෂද්.
39. එම.
40. එම, බෘහදාරණ්‍යක උපනිෂද් 4-4-5.
41. ඡාන්දෝග්‍ය උපනිෂද්, 5-10-6.
42. කඨෝපනිෂදය, පිටුව 151.
43. කඨෝපනිෂදය, පිටුව 155.
44. ප්‍රශ්නෝපනිෂදය, පිටුව 125.
45. එම, පිටුව 127.
46. එම, පිටුව 131.
47. එම, පිටුව 131.
48. කඨෝපනිෂද්, පිටුව 157.
49. බෘහදාරණ්‍යක උපනිෂද්, 1-3-27.
50. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණ බ්‍රාහ්මණා පුබ්බන්ත කප්පිකා ච අපරන්ත කප්පිකා ච... අනෙක විහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨීය, වත්‍ථුහි...
    දීඝ නිකාය, සීලක්ඛන්ධ වග්ගය, බ්‍රහ්මජාල සූත්‍රය, 70 පිටුව.
51. බුද්ධදත්ත හිමි පොල්වත්තේ, ථෙරවාද බෞද්ධ දර්ශනය, පිටුව 94.
52. ධම්මරතන හිමි තාරාවිල, පඤ්ඤාලෝක හිමි හැඩිපන්නල, භාරතීය දර්ශන, පිටුව 41.
53. එම, පිටුව 57.
54. අංගුත්තර නිකාය, තික නිපාතය, තිත්තායතන සූත්‍රය.
55. මජ්ඣිම නිකාය, II සංගාරව සූත්‍රය, 736-750 පිටු.

56. එම, චංකී සූත්‍රය, පිටුව 656.

57. අංගුත්තර නිකාය, තික නිපාතය, කාලාම සූත්‍රය, 336 පිටුව.

58. සංයුක්ත නිකාය, අචේල කස්සප සූත්‍රය.

59. පූරණෝ භො ගොතම කස්සපෝ, සබ්බඤ්ඤූ, සබ්බ දස්සාවී, අපරිසේස ඤාණ දස්සනං පටිජානාති.
අංගුත්තර නිකාය, iv p 428 P.T.S. 1958.

60. පූරණෝ කස්සපෝ සඞ්ගී චෙව ගණීච ගණාචරියෝ ච ඤාතො යසස්සී තිත්ථංකරො සාධු සම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතොවයො අනුප්පත්තො, දීඝ නිකාය, 1 සාමඤ්ඤඵල සූත්‍රය, පිටුව 84.

61. යො ඉමිස්සා පඨවියා පාණෙ ඒකමංසං බලං
ඒකමංසං පුඤ්ජං කරෙය්‍ය නත්ථි තතො නිදානං
පාපං, නත්ථි පාපස්ස ආගමො, දී. නි. 1. සාමඤ්ඤඵල සූත්‍රය පිටුව 84

62. දක්ඛිනං චෙ පි ගංගාතීරං ගච්ඡෙය්‍ය හනන්තො
ඝාතෙන්තො, ඡින්දන්තො, ඡේදාපෙන්තො, පචන්තො පාචෙන්තො, නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමො, එම, 66.

63. සංයුක්ත නිකාය, v පිටුව 234.

64. නත්ථි මහාරාජ හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය අහෙතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, දී. නි. සාමඤ්ඤඵල සූත්‍රය, පිටුව 92.

65. නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා, අහේතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති, එම.

66. නත්ථි අත්තකාරො, නත්ථි පරකාරො, නත්ථි පුරිසකාරො, නත්ථි බලං, නත්ථි විරියං, නත්ථි පුරිසථාමෝ, නත්ථි පුරිස පරක්කමෝ, සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා, සබ්බෙ ජීවා, අවසා අබලා අවිරියා....
දී. නි., සාමඤ්ඤඵල සූත්‍රය, පිටුව 92.

67. යානි බාලේ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ත, එම, පිටුව 94.

68. සෙය්‍යථාපි නාම සුත්තගුළෙ ඛිත්තේ නිබ්බේඨිය මානමේව පළෙති. එවමෙව බාලොච පණ්ඩිතොච සන්ධාවිත්වා, සංසරිත්වා, දුක්ඛස්සන්තං කරිස්සන්ති එම, පිටුව 94.

69. නාහං භික්ඛවෙ අඤ්ඤං ඒක පුග්ගලම්පි සමනුපස්සාමි
යො එවං බහුජන අහිතාය පටිපන්නො බහුජන අසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දේවමනුස්සානං යථයිදං භික්ඛවෙ මක්ඛලි මෝඝ පුරිසො, අං: නි: ඒකක නිපාතය.

70. දී: නි. සාමඤ්ඤඵල සූත්‍රය, පිටුව 96.

71. චාතුම්මහාභූතිකෝ අයං පුරිසො යදා කාලංකරෙය්‍ය පඨවි පඨවිකායං අනුපේති, අනුපගච්ඡති, ආපො.... තේජෝ.... වායෝ.... ආකාසං ඉන්ද්‍රියානි සංකමති බාලේච පණ්ඩිතේච කායස්ස භේදා උච්ඡිජ්ජන්ති විනස්සන්ති න හොන්ති පරම්මරණං, දී: නි: සාමඤ්ඤඵල සූත්‍රය, පිටුව 96.

72. දී: නි: සාමඤ්ඤඵල සූත්‍රය, පිටුව 99.

73. තත්ථ නත්ථි හන්තාවා සාතෙතාවා සෝතාවා සාවේතාවා විඤ්ඤාතාවා විඤ්ඤාපෙතාවා යො පි තිණ්ණේන සත්ථේන සීසං ඡින්දති. න කොචි කිඤ්චි ජීවිතා වෝරෝපේති. සත්තන්නං යෙව කායානුමන්තරෙන සත්ථං විවරමනුපතීති, එම.

74. එම, පිටුව 59.

75. එම.

76. දී: නි: I සාමඤ්ඤඵල සූත්‍රය, පිටුව 59.

77. දී.නි: බ්‍රහ්මජාල සූත්‍රය, I පිටුව 25, P.T.S. 1949.

78. දී.නි: බ්‍රහ්මජාල සූත්‍රය, I පිටුව 26, P.T.S. 1949.

79. එම.

80. එම, පිටුව 27

81. එම, සමඤ්ඤඵල සූත්‍රය, පිටුව 59, P.T.S 1949.

82. එම. පිටුව 100.

83. ධම්මරතන හිමි, නාරාවිල, පඤ්ඤාලෝක හිමි, හැඩිපන්නල, භාරතීය දර්ශන, පිටුව 243.

84. විජේරත්න, ආනන්ද, ශ්‍රමණ සම්ප්‍රදාය, පිටුව 113.

85. එම.

86. එම, පිටු 113-114.

87. විජේබණ්ඩාර චන්ද්‍රිම, මොරටුවගම එච්. එම., ආදි බෞද්ධ චින්තනය, පිටුව 5.

88. මජ්ඣිම නිකාය, II දේවදහ සූත්‍රය, පිටු 217-218.

89. සිරි සුමංගල හිමි, මඩිතියවෙල, පාළි සිංහල ශබ්ද කෝෂය, පිටුව 336.

90. Davide Rhys, The pali text society, page 430,

91. අංගුත්තර නිකාය, VI උපාළි වග්ගය, උත්තිය සූත්‍රය පිටුව 346.

92. එම, කෝකනද සූත්‍රය, පිටුව 351,

93. මජ්ඣිම නිකාය III, මහා කම්ම විභංග සූත්‍රය, පිටුව 445.

94. සාධුමෙ භවං ගෝතමෝ සංඛිත්තේන කුසලා කුසලං දෙසෙන්ති.
මැනිඃ II අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, පිටුව 121, ඤාණවිමල සංස්කරණය 1959.

95. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ඣතග්ගෙ පාණුපේතං සරණංගතන්ති, ම. නි. II අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, පිටුව 246.

96. පපඤ්ච සුදනී III, පිටුව 143.

97. අපදාන පාළි, 189 ගාථාව, 1961.

98. විජේරත්න, ආනන්ද, ශ්‍රමණ සම්ප්‍රදාය, පිටුව 52.

99. කිං තෙ ජටාහි දුම්මෙධ - කිං තෙ අජිනසාටිය, අබ්භන්තරං තෙ ගහණං - බාහිරං පරිමජ්ජසි, ධම්මපදය, බ්‍රාහ්මණ වග්ගය, 12 ගාථාව, පිටුව 233. පාළි, සිංහල, දෙමළ, ඉංග්‍රීසි සංස්කරණය.

100. විජේබණ්ඩාර, චන්දිම, මොරටුගම එච්. එම්., ආදි බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, පිටුව 04.

101. චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො ඵස්ස පච්චයා වේදනා යං වේදෙති තං සංජානාති යං සංජානාති තං විතක්කෙති යං විතක්කෙති තං පපඤ්චෙති...
මඃ නිඃ I මධුපිණ්ඩික සූත්‍රය, පිටුව 280

3 පරිච්ඡේදය

## නිදහස් චින්තනය හා විමංසනය පිළිබඳ දේවවාදී ආගමික ඉගැන්වීම්

### ආන්තික සටහන්

1. මෙත්තාරාම හිමි මුංහේනේ, ආගමේ සම්භවය හා විකාශනය පිළිබඳ විමසුමක්, පිටුව 11.
2. ධම්මපදය, බුද්ධවග්ගය, 10 ගාථාව.
3. ධම්මදස්සි හිමි, නායිම්බල, දේවධර්මවාදී ආගම්, පිටුව 1.
4. මූර්ති, ආගම හා මියගිය ලෝකය, පිටුව 128.
5. එම, පිටුව 130.
6. ධම්මදස්සි හිමි, නායිම්බල, දේවධර්මවාදී ආගම්, පිටුව 09.
7. එම, පිටුව 16.
8. එම, පිටුව 25.
9. මූර්ති, ආගම සහ මියගිය ලෝකය, පිටුව 179.
10. ශුද්ධ බයිබලය, උත්පත්ති 12 : 1-3, පිටුව 12.
11. මූර්ති, ආගම හා මියගිය ලෝකය, පිටුව 183.
12. ධම්මදස්සි හිමි, නායිම්බල, දේවධර්මවාදී ආගම්, පිටුව 41.
13. ශුද්ධ බයිබලය, උත්පත්ති 7:4 පිටුව 7
14. එම, 1:26 පිටුව 2.
15. එම, 2:7 පිටුව 2.
16. එම, 2:21-25, පිටුව 3.
17. ධම්මදස්සි හිමි, නායිම්බල, දේවධර්මවාදී ආගම්, පිටුව 49.
18. ශුද්ධ බයිබලය, නික්මයාම 20 : 1-17, පිටු 89-90.
19. "Christianity is the most wide spread and has the largest number of adherents" Smith Huston, Religious of man, page 274.
20. ශුද්ධ බයිබලය. ශු. මතෙව් 1 : 20-25, පිටුව 1-2.
21. ශුද්ධ බයිබලය. ශු. ලූක් 2 : 42-50, පිටුව 79-80.
22. ශුද්ධ බයිබලය. ශු. යොහන් 2 : 15-17, පිටුව 125.

23. ශුද්ධ බයිබලය. ශු. ලූක් 23 : 28-29 පිටුව 119
24. ශුද්ධ බයිබලය. ශු. යොහන් 14 : 6-7 පිටුව 147
25. ධම්මදස්සි හිමි, නායිම්බල, දේවධර්මවාදී ආගම්, පිටුව 63
26. ශුද්ධ බයිබලය. ශු. මතෙව් 5 : 43-44 පිටුව 8
27. එම, 15:19 පිටුව 22.
28. එම, ශු. යොහන 8:7-8, පිටුව 136.
29. එම,ශු. මතෙව් 7:1-5, පිටුව 9.
30. එම , 7:7-8, පිටුව 9.
31. එම, 13:14-15, පිටුව 19.
32. එම, 21:21-24, පිටුව 31.
33. එම, 21:25-26, පිටුව 31.
34. එම, 21:27 පිටුව, 31.
35. එම, ශු. මාර්ක්, 1:12-13, පිටුව 46.
36. එම, ශු. ලූක් 4:12-13, පිටුව 82.
37. එම, ශු. මතෙව් 7:17-19, පිටුව 9.
38. එම, 6:4 පිටුව, 7.
39. එම, 6:14-15, පිටුව 8.
40. එම, ශු. ලූක් 17:3-4, පිටුව 108.
41. මූර්ති, ආගම හා මියගිය ලෝකය, පිටුව 220.
42. අබුල් අලා සයියිද්, අල්-කුර්ආන් අර්ථ විවරණය, පළමුවෙනි වෙළුම, (පෙරවදන xiii)
43. මූර්ති, ආගම හා මියගිය ලෝකය, පිටුව 220.
44. සුරත්, 3 : 79 පිටුව 292.
45. සුරත්, 2 : 21-22.
46. ධම්මදස්සි හිමි, නායිම්බල, දේවධර්මවාදී ආගම්, පිටුව 94.
47. සුරත් 1: 1-7, පිටු 28-34.
48. සුරත් 2: 1-3, පිටුව 53.
49. සුරත් 2 : 28, පිටුව 60.
50. සුරත් 2 : 83, පිටුව 97.
51. සුරත් 2 : 103, පිටුව 110.

4 පරිච්ඡේදය

## නිදහස් චින්තනය හා වීමංසනය පිළිබඳ බෞද්ධ ආකල්පය

### ආන්තික සටහන්

01. ඤාණාවාස හිමි, හේ. බෞද්ධ චින්තන ක්‍රමයේ මූලික ලක්ෂණය ප්‍රබෝධ ශාස්ත්‍රීය සංග්‍රහය, පළමු කලාපය, 1978.

02. කරුණාරත්න ඩබ්ලිව්, එස්, බෞද්ධ දර්ශනය හා චරණය, පිටුව 10.

03. අත්තාහි අත්තනො නාථො - කොහි නාථො පරොසියා
අත්තනාව සුදන්තෙන - නාථං ලභති දුල්ලභං
ධම්මපදය, අත්ත වග්ගය 4 ගාථාව, 99 පිටුව.

04. තස්මාතිහ ආනන්ද අත්තදීපා විහරථ අත්තසරණා
අනඤ්ඤසරණා ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා
දීඝ නිකාය, මහා පරිනිබ්බාන සූත්‍රය, පිටුව 158.

05. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤෝ විසෝදයේ
ධම්මපදය, අත්ත වග්ගය 9 ගාථාව, පිටුව 101.

06. අත්තානමේව පඨමං - පතිරූපේ නිවේසයේ
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො
ධම්මපදය අත්තවග්ගය 2 ගාථාව, පිටුව 98.

07. මජ්ඣිම නිකාය, මජ්ඣිම පන්නාසකය, අපණ්ණක සූත්‍රය.

08. ඤාණාවාස හිමි හේ, බෞද්ධ චින්තන ක්‍රමයේ මූලික ලක්ෂණය, ප්‍රබෝධ ශාස්ත්‍රීය සංග්‍රහය, පළමු කලාපය, 1978.

09. සද්ධා බීජං තපෝ වුට්ඨි....
සුත්ත නිපාතය, කසීභාරද්වාජ සූත්‍රය, පිටුව 24.

10. සද්ධා ධනං සීල ධනං....
අං.නි. IV, විත්තත ධන සූත්‍රය, පිටුව 286.

11. කම්මස්ස කාරකො නත්ථි - විපාකස්ස ච වේදකො
සුද්ධ ධම්මා පවත්තන්ති - එවෙතං සම්ම දස්සනං
විසුද්ධි මාර්ගය, පඤ්භානිද්දේසය, 472 පිටුව.

12. රාහුල හිමි, වල්පොල, බුදුන් වදාළ ධර්මය, පිටුව 1.

13. යථාපි උදකෙ ජාතං - පුණ්ඩරීකං පවඩ්ඪති
නොපලිප්පති තොයෙන - සුචිගන්ධං මනොරමං
තථෙ ව ච ලොකො ජාතො - බුද්ධො ලොකෙ විහරති
නොපලිප්පති ලොකෙන - තොයෙන පදුමං යථා
ථේරගාථා, සෝළස නිපාතය, උදායිථෙර ගාථාව
700 ගාථාව, පිටුව 184.

14. ධම්මජෝති හිමි බෙලිගල්ලේ, ධම්මාරාම හිමි දම්පහල, බෞද්ධ සංස්කෘතික සංග්‍රහය, පිටුව 43.

15. මජ්ඣිම නිකාය, සංගාරව සූත්‍රය, පිටුව 736.

16. සම්බාධො ඝරාවාසො රජොපථො අබ්භෝකාසො ව පබ්බජ්ජා
මජ්ඣිම නිකාය II, මජ්ඣිම පණ්ණාසකය, භික්ඛුවග්ගය, සංගාරව සූත්‍රය, පිටුව 740.

17. සො එවං පබ්බජිතො සමානො කිං කුසල ගවේසී අනුත්තරං සන්ති වරපදං පරියෙසමානො යෙන ආළාරකාලාමො තේනුපසංකමි
එම.

18. නායං ධම්මෝ නිබ්බිදාය, න විරාගාය, න නිරොධාය, න උපසමාය, න අභිඤ්ඤාය, න සම්බොධාය, න නිබ්බානාය, සංවත්තති
එම, පිටුව 742.

19. කාලකතො සමණො ගොතමො ති ඒකච්චා දේවතා එවමාහංසු...
එම, පිටුව 753.

20. බාහුලිකො සමණො ගොතමො පධාන විබ්භන්තො ආවත්තො බාහුල්ලායාති, එම, පිටුව 756.

21. නමෙ ආචරියො අත්ථි - සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලෝකස්මිං - නත්ථි මෙ පටිපුග්ගලො
අහංහි අරහා ලොකෙ - අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මා සම්බුද්ධො - සීති භූතෝස්මි නිබ්බුතො
මජ්ඣිම නිකාය, මූල පණ්ණාසකය, අරියපරියේසන සූත්‍රය, 414 පිටුව.

22. සබ්බසිප්ප සුතං සමක්ඛායිතා භවන්ති
දීඝ නිකාය, පාථික වග්ගය, පිටුව 116.

23. දෙසිතො ආනන්ද මයා ධම්මෝ අනන්තරං අබාහිරං කරිත්වා නත්ථානන්ද, තථාගතස්ස ධම්මේසු ආචරියමුට්ඨී
දීඝ නිකාය II, මහාපරිනිබ්බාන සූත්‍රය, 158 පිටුව.

24. එම, පිටුව 242.

25. සියා ඛො පන භික්ඛවෙ ඒක භික්ඛුස්සා පි කඞ්ඛාවා විමති වා, බුද්ධෙ වා, ධම්මේ වා, සංඝෙ වා, මග්ගෙ වා පටිපදාය වා, පුච්ඡථ, භික්ඛවෙ මා පච්ඡා විප්පටිසාරිණො..., එම.

26. සියා ඛො පන භික්ඛවෙ සත්ථුගාරවෙනා පි න පුච්ඡෙය්‍යාථ සහායකො පි භික්ඛවෙ සහායකස්ස ආරෝචේතූ'ති, එම.

27. සරණංකර හිමි, ගණේගම, බුදුහාමුදුරුවෝ, පිටු 27-28.

28. තථාගතස්ස ඛො ආනන්ද න එවං හෝති අහං භික්ඛුසංඝං පරිහරිස්සාමීති වා මමුද්දේසකෝ භික්ඛු සංඝෝ ති වා
දීඝ නිකාය II, මහා පරිනිබ්බාන සූත්‍රය, පිටුව 158.

29. මෙ භික්ඛුනා සාවකා භවිස්සන්ති වියත්තා, විනීතා විසාරදා, බහුස්සුතා, ධම්මධරා, ධම්මානුධම්මපටිපන්නා, සාමීචිපටිපන්නා, අනුධම්මචාරිනො.... එම, පිටුව 162.

30. සකං ආචරියවාදං උග්ගහෙත්වා ආචික්ඛන්ති, දේසෙන්ති පඤ්ඤපෙන්ති, පට්ඨපෙන්ති, විවරන්ති, විභජන්ති උත්තානීකරොන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පටිහාරියං ධම්මං දේසෙන්ති එම.

31. චන්ද මණ්ඩලං භික්ඛවෙ විවටං විරොචති නො පටිච්ඡන්නං, සූරිය මණ්ඩලයං... නො පටිච්ඡන්නං තථාගතප්පවේදිතො ධම්ම විනයො විවටො විරෝචති නො පටිච්ඡන්නො, අංගුත්තර නිකාය, තික නිපාතය භරණ්ඩුවග්ගය, 9 සූත්‍රය.

32. තෙ සභියෙන පරිබ්බාජකේන පඤ්හෙ ඨාන සම්පායන්ති
අසම්පායන්තාකොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතු කරොන්ති
සුත්ත නිපාතය, සභිය සූත්‍රය, 152 පිටුව.

33. දූරතොව ආගතොසි සභිය පඤ්හෙ පුච්ඡිතුං අකංඛමානො තෙ සන්තකරො භවාමි පුට්ඨො අනුපුබ්බං අනුධම්මං ව්‍යාකරොමි තෙ..., එම, 154.

34. අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා, තෙල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී ති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛු සංඝඤ්ච උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපේතං සරණං ගතන්ති, මජ්ඣිම නිකාය II, ගහපති වග්ගය, උපාලි සූත්‍රය, පිටුව 70.

35. අනුවිච්චකාරං ඛො ගහපති කරොහි අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හෝතීති. ඉමිනා පහං භන්තෙ භගවතො භිය්‍යොසෝමත්තාය අත්තමනො අභිරද්ධෝ යං මං භගවා ඒවමාහ. එම.

36. දීඝරත්තං ඛො තෙ ගහපති නිගණ්ඨානං ඔපාන භූතං කුලං, යෙන නෙසං උපගතානං පිණ්ඩකං දාතබ්බං මඤ්ඤෙය්‍යාසීති, එම.

37. අථ ච පන මං භගවා නිගණ්ඨේසුපි දානෙ සමාදපෙති, එම.

38. විමංසකෙන භික්ඛවෙ භික්ඛුනා පරස්සචේතොපරියායං අජානන්තේන තථාගතෙ සමන්නේසනා කාතබ්බා සම්මාසම්බුද්ධොවා නොවා ති විඤ්ඤාණායාති...., මජ්ඣිම නිකාය, මූල පණ්ණාසකය, වීමංසක සූත්‍රය, පිටුව 744.

39. විමංසකේන භික්ඛවෙ අජානන්තේන ද්විසු ධම්මේසු තථාගතො සමන්නේසිතබ්බෝ චක්ඛු සොත විඤ්ඤෙය්‍යෙසු ධම්මේසු, එම.

40. එවංවාදිං ඛො භික්ඛවෙ සත්ථාරං අරහති සාවකො උපසංකමතුං ධම්මසවණාය, එම.

41. ද්වෙමෙ භික්ඛවෙ පරියෙසනා අරියා ච පරියේසනා අනරියා ච පරියේසනා මජ්ඣිම නිකාය I, අරියපරියේසන සූත්‍රය, පිටුව 396.

42. ඉධ භික්ඛවෙ එකච්චො අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මෙ ආදීනවං විදිත්වා අජාතං අනුත්තරං යොගක්ඛේමං නිබ්බානං පරියෙසති එම, 398 පිටුව.

43. මජ්ඣිම නිකාය I, ඔපම්මවග්ගය, චූල්ලහත්ථි පදෝපම සූත්‍රය, පිටු 426-448.

44. කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දේසිස්සාමි නිත්ථරණත්ථාය නො ගහණත්ථාය, අලගද්දූපම සූත්‍රය, පිටුව 336.

45. දීඝ නිකාය II, මහා පරිනිබ්බාන සූත්‍රය, පිටුව 192.

46. අනභිනන්දිත්වා අප්පටික්කෝසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරේතබ්බානි විනයෙ සන්දස්සේතබ්බානි එම, පිටුව 192.

47. අද්ධා ඉධං න චෙව තස්ස භගවතො වචනං ඉමස්ස භික්ඛුනො දුග්ගහිතන්ති ඉතිහෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ අද්ධා ඉදං තස්ස භගවතො වචනං ඉමස්ස ච භික්ඛුනො සුග්ගහිතන්ති ඉමං භික්ඛවෙ පඨමං මහාපදේසං ධාරේතබ්බං, එම.

48. විජේබණ්ඩාර චන්ද්‍රිම, මොරටුවගම එච්. එම්. ආදි බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, පිටුව 13.

49. එම.

50. පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා කායේන කම්මං කාතබ්බං
පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං
පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා මනසා කම්මං කාතබ්බං
මජ්ඣිම නිකාය II, භික්ඛු වග්ගය, අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය, පිටුව 132.

51. ඉදං මෙ කායකම්මං අත්තව්‍යාබාධාය පි සංවත්තෙය්‍ය, පරව්‍යාබාධාය පි සංවත්තෙය්‍ය, උභයව්‍යාබාධාය පි සංවත්තෙය්‍ය, එම.

52. අනුජානාමි භික්ඛවේ වස්සං උපගන්තුං
මහාවග්ග පාළි I, වස්සූපනායිකඛන්ධකය, 346 පිටුව.

53. භාසෙය්‍යනු බො භන්තෙ තථාගතො තං වාචං යා සා වාචා පරෙසං අප්පියං අමනාපාති, එම, ගහපති වග්ගය, 8 වෙනි අභයරාජ කුමාර සූත්‍රය, පිටුව 92.

54. යඤ්ච බො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං සා ච පරෙසං අප්පියා අමනාපා තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය තං කිස්ස හේතු අත්ථි රාජ කුමාර තථාගතස්ස සත්තේසු අනුකම්පාති, එම, පිටුව 96.

55. සබ්බමත්ථීති බො කච්චාන අයමෙකො අන්තො සබ්බං නත්ථී ති කච්චාන අයං දුතියෝ අන්තො එතෙ තෙ කච්චාන උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දේසෙති
සංයුත්ත නිකාය II, කච්ඡානවච්ඡගොත්ත සූත්‍රය, 28 පිට.

56. අලං හි වො කාලාමා කංඛිතුං අලං විචිකිච්ඡිතුං කංඛනීයෙ ච පන වො ඨානෙ විචිකිච්ඡා උප්පන්නා එථ තුම්හේ කාලාමා, මා අනුස්සරවේන....
අංගුත්තර නිකාය, තික නිපාතය, මහා වග්ගය පස්වන කාලාම සූත්‍රය, පිටුව 336.

57. එම.

58. මෙධානන්ද හිමි, දේවාලේගම, මුල් බුදු සමය සාමයික පසුබිම, පිටුව 81.

59. යදා තුම්හේ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤූගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්ත න්ති ති : අථ තුම්හෙ කාලාමා පජහෙය්‍යාථ
එම, අං.නි., තික නිපාතය, කාලාම සූත්‍රය, 336 පිටුව.

# ග්‍රන්ථ නාමාවලිය

## ප්‍රාථමික මූලාශ්‍රය


1. අංගුත්තර නිකාය පාළි
2. අපදාන පාළි
3. ථේරගාථා පාළි
4. පටිසම්භිදා මග්ග පාළි
5. මජ්ඣිම නිකාය පාළි
6. මහානිද්දේස පාළි
7. මහාවග්ග පාළි
8. සුත්තනිපාත පාළි
9. සංයුත්ත නිකාය පාළි
10. ශුද්ධ බයිබලය
    සංශෝධිත පැරණි අනුවාදය 1995
    ශ්‍රී ලංකා බයිබල් සමාගම විසින් ප්‍රකාශිතයි 1938
11. අල් කුර් ආන් අර්ථ විවරණය
    සයියිද් අබුල් ඈලා මව්දූදි තුමා විසිනි, 1, 2, 3 වෙළුම්, ශ්‍රී ලංකා ජමා අත්-ඒ-ඉස්ලාම් ප්‍රකාශනයකි. තෙවන මුද්‍රණය 2005


## අටුවා ග්‍රන්ථ


1. අංගුත්තර නිකායට්ඨකථා
2. අපදාන අට්ඨකථා
3. නෙත්තිප්පකරණපාළි
4. නෙත්තිප්පකරණ අට්ඨකථා
5. ථෙරගාථා අට්ඨකථා

6. දීඝනිකාය අට්ඨකථා

7. පේටකෝපදේසය

8. මජ්ඣිම නිකාය අට්ඨකථා

9. මහානිද්දේස අට්ඨකථා

10. සංයුත්ත නිකාය අට්ඨකථා

## ටීකා ග්‍රන්ථ

- අංගුත්තර නිකාය ටීකා
- නෙත්ති විභාවනී ටීකා
- දීඝ නිකාය ටීකා
- මජ්ඣිම නිකාය ටීකා
- වජිරබුද්ධි ටීකා
- විමතිවිනෝදනී ටීකා
- සාරත්ථදීපනී ටීකා
- සංයුත්ත නිකාය ටීකා

## ද්විතීයික මූලාශ්‍රය

1. ජයතිලක, කේ. එන්., මුල් බුදු සමයේ ඥාන විභාගය, පරිවර්තනය, හේ. මු. තිලකරත්න, ගොඩගේ සහ සහෝදරයෝ, පළමු මුද්‍රණය 2003.

2. ඥානාරාම හිමි, පාතේගම, මුල් බුදු සමය හා විවරණ ගැටළු.

3. ධම්මජෝති හිමි, බෙලිගල්ලේ, ධම්මාරාම හිමි, දම්පහල, බෞද්ධ සංස්කෘතික සංග්‍රහය, රත්න පොත් ප්‍රකාශකයෝ, පළමු මුද්‍රණය 1999.

4. ධම්මදස්සි හිමි, නායිම්බල, දේවධර්මවාදී ආගම්, කර්තෘ ප්‍රකාශන, පළමු මුද්‍රණය 2004.

5. ධම්මරතන හිමි, නාරාවිල, පඤ්ඤාලෝක හිමි, හැඩිපන්නල, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, තෙවන මුද්‍රණය 1969.

6. නානායක්කාර, සනත්, බුදු දහම සහ ශ්‍රී ලංකාවේ සෙසු ආගම්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙවන මුද්‍රණය 2001.

7. නානායක්කාර සනත්, කාලාම සූත්‍රය සහ චින්තන නිදහස, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පළමු මුද්‍රණය 2001.

8. පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, භාරතීය දර්ශන, ගොඩගේ සහ සහෝදරයෝ 1999.

9. පඤ්ඤාලෝක හිමි, වැයිහේනේ, බෞද්ධ චින්තාවේ පසුබිම හා විකාශය, ශ්‍රී දේවි ප්‍රකාශකයෝ 27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල 2001.

10. බෂාම්. ඒ. එල්., අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, තෙවන මුද්‍රණය 1996.

11. මූර්ති, ආගම හා මියගිය ලෝකය, ලේක්හවුස් සමාගම, කොළඹ 02, ප්‍රථම මුද්‍රණය 1972.

12. මෙත්තාරාම හිමි, මුංහේනේ, ආගමේ සම්භවය හා විකාශනය පිළිබඳ විමසුමක්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1993.

13. මේධානන්ද හිමි, දේවාලේගම, මුල් බුදු සමය සාමයික පසුබිම, කර්තෘ ප්‍රකාශන, ප්‍රථම මුද්‍රණය 1994.

14. රාහුල හිමි, අත්තුඩාවේ, පඤ්ඤාලෝක හිමි බඹරැන්දේ, මහානාම හිමි බඹරැන්දේ, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, තෙවන මුද්‍රණය 1992.

15. රාහුල හිමි, වල්පොල, බුදුන් වදාළ ධර්මය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නවවැනි මුද්‍රණය 1997.

16. විජේබණ්ඩාර, චන්ද්‍රිම, මොරටුවගම එච්. එම්., ආදි බෞද්ධ චින්තනය අදහස් කිහිපයක්, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, ප්‍රථම මුද්‍රණය 1995.

17. විජේබණ්ඩාර චන්දිම, මොරටුවගම එච්. එම්., බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශකතාව, ගොඩගේ සහ සහෝදරයෝ, හතරවන මුද්‍රණය 2006.

18. විජේරත්න, ආනන්ද, ශ්‍රමණ සම්ප්‍රදාය, කර්තෘ ප්‍රකාශන 2004.

19. වීරසිංහ, එස්. ජී. එම්., උපනිෂද් දර්ශනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, පළමු මුද්‍රණය 1992

20. සරණංකර හිමි, ගණේගම, බුදු හාමුදුරුවෝ, ගුණසේන සහ සමාගම, සිව්වන මුද්‍රණය 1982.

21. සෝමරංසි හිමි, උඩගලදෙණියේ බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය, සමයවර්ධනය පොත්හල, තෙවන මුද්‍රණය 1999.

22. සෙනෙවිරත්න, සී. ඒ. ඩී., උපනිෂද්, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ප්‍රථම මුද්‍රණය 1961.

23. හිරියන්න, ඇම්., ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පළමු මුද්‍රණය 1870.

24. හේවාමද්දුම අමර, (ප්‍රධාන සංස්කාරක) ධම්මපදය පාළි-සිංහල-දෙමළ-ඉංග්‍රීසි සංස්කරණය, ජාතික ඒකාබද්ධතා වැඩසටහන් ඒකකය, කොළඹ, 2002.

## English Books

1. Burnet John, Early Greek Philosophy.

2. Dharmasiri Gunapala, A Buddhist Critique of the Christian Concept of God.

3. James William, The will to believe an introduction to philosophy.

4. Jayathilaka K.N. Ethics in Buddhist Perspective.

5. Rahula Walpola, what the Buddha taught, Buddhist Culture Centre, Dehiwala, Third edition 1996.

6. Stace W. T. A Critical History of Greek Philosophy, MC Millian and Co. Ltd, London 1934.

7. Trevor ling, The Buddhism, Pengnin books 1976.


**තෘතීයික මූලාශ්‍රය**

**සඟරා**


1. මාගධී ශාස්ත්‍රීය සංග්‍රහය "92", ප්‍රධාන සංස්කරක, මොල්ලිගොඩ ධීරානන්ද හිමි, 1992, 6 කලාපය.

2. ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, වැලිවිට සරණංකර සංඝරාජ අනුස්මරණ කලාපය 2003.


**ශබ්ද කෝෂ**


1. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාළි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, (නැවත මුද්‍රණය) 1998.

2. රේවත හිමි, බෝරුග්ගමුවේ, සිංහල මහා අකාරාදිය, ප්‍රකාශනය ජේ. සුදසිංහ, 1924.

3. විජයතුංග, හරිස්චන්ද්‍ර, ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය, දෙවැනි කාණ්ඩය, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, 1984.

4. සිරි ලියනගේ, නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය, ගොඩගේ සහ සහෝදරයෝ.

5. සිරි ලියනගේ බෞද්ධ ශබ්ද කෝෂය II, කර්තෘ ප්‍රකාශන.

6. සිංහල ශබ්ද කෝෂය, 23 කාණ්ඩය, II කොටස, 43 වන භාගය, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1991.

7. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, ද්විතීය භාගය, සෝරත හිමි වැලිවිටියේ, බු:ව: 2499.

8. Buddhadattha Polwatte, English Pali Dictionary P.T.S.

9. Clough B. Clough's Sinhala English Dictionary, Asia Educational Services, New Delhi, 1982.

11. Moscrop T. Mendis B. A., Sri-satguru Publication, Delhi 1987, Second edition.

10. Encyclopedia of Buddhism, Volume V, Malalasekara G. P. State Printing, Coporation 1990.

12. Nyanatiloka, Buddhist Dictionary Buddhist Publication Society, Kandy, Sri Lanka.

13. Piyatissa Widurupola, The English Pali Dictionary, The Colombo Apo the caries company L.T.D. Colombo 1949.

14. Rhys Davids, T. W., Stede, William, Pali English Dictionary.